# ශුද්ධාත්මයාණන්වහන්සේ - 01



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 01

# ශුද්ධාත්මයාණන්වහන්සේ

**<u>හැඳින්වීම</u> :-**

දෙවි සමිඳුන් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ''ලිවීමට'' මට ඇරයුම් කළේ, මීට වසර හතකට පමණ ඉහතදී වුවත්, උන්වහන්සේගේ හඬ සැබෑලෙස හඳුනාගැනීමට අපොහොසත් වීම හේතුවෙන්, මා එවිට උන්වහන්සේට කීකරු නොවීමි. එම අවස්ථාවේදී දේව දාසයෙක් මා උදෙසා යාච්ඤා කළ විට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔහු තුළින් මට දුන් පණිවුඩය වූයේ, **'පොත් ලිවීමටත් විශේෂ වශයෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ලිවීමටත් අරඹන්න'** කියාය. මාගේ මව් බසින් ලිවීමට මට තිබූ හැකියාව ඉතා අල්පවූ බැවින්, මාගේ අඥාන නිගමනය වූයේ එම දේව දාසයා ප්‍රකාශකළේ ඔහුගේ අදහස් බවත්, මෙය දෙවියන්වහන්සේගෙන් ලැබුනාවූ මඟපෙන්වීමක් නොවන බවත්ය. එම නිසා දෙවියන්වහන්සේගේ පණිවුඩය මා නොසලකා, උන්වහන්සේට බොහෝකල් අකීකරු වීමි.

එනමුත් මාගේ දෙවිපියාණන්වහන්සේ, උන්වහන්සේගේ අසීමිත ප්‍රේමය නිසා, 2009 වසරේ රෝමවාසීන්ට ලියන ලද යැවුම් පත්‍රය ඇසුරෙන් 'බයිබල් අධ්‍යයනයන්' 24ක් ලිවීමට අපගේ කණ්ඩායමට මඟපෙන්වූසේක. රෝම, යාකොබ්, නෙහෙමියා අධ්‍යයනයන් නිමකොට පසුගිය වසරේ අගෝස්තු මාසයේ එපීස අධ්‍යයනයන් ලියමින් සිටි මට දෙවි සමිඳුන්, උන්වහන්සේ වසර හතකට පමණ පෙර දුන්නාවූ, පණිවුඩය එනම් **'විශේෂයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ලිවීමට'** දුන් කැඳවීම මතක් කළසේක. හැඩූ කඳුලින්, මාගේ අකීකරුකම ගැන උන්වහන්සේගේ සමාව අයැද සිටි මා මෙම අධ්‍යයන මාලාව ලියන්නේ උන්වහන්සේගේ පෙළඹීම අනුවය.

මෙම අධ්‍යයනය කියවන්නාවූ ප්‍රේමණීය දේව දරුව, මා මෙන් දෙවියන්වහන්සේගේ හඬ හඳුනා ගැනීමට අපොහොසත්වීමේ වරදට කිසිවිටක පත්නොවීමට වගබලාගන්න.

**යොහන් 10:4 :- ''.... බැටළුවෝද <u>ඔහුගේ හඬ හඳුනන බැවින්</u> ඔහු පස්සේ යති.''**

ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන, උන්වහන්සේගේ ක්‍රියාකිරීම ගැන, උන්වහන්සේගේ දීමනා ගැන, උන්වහන් - සේගේ ඵල සහ බව්තීස්මය වැනි දේ ගැන විවිධ මත දරන්නාවූ සභා සහ කණ්ඩායම් කිතුනු සභාව තුළ සිටීම හේතුවෙන්, බොහෝ කිතුනුවන් හට ශුද්ධාත්මයාණන් - වහන්සේ ගැන ඇත්තේ අපැහැදිලි අවබෝධයකි.

එබැවින් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන මෙම අධ්‍යයන මාලාව ඇරඹීමට මා පිවිසෙන්නේ, ශුද්ධාත්මයාණන් - වහන්සේ යනු කවුද කියා ඔබට තේරුම්කර දීමට උත්සාහ කරමිනි.

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>ශුද්ධාත්මයාණන්වහන්සේ තැනැත්තෙක් (Person) වන සේක</u>**

ශුද්ධාත්මයාණන්වහන්සේ යනු තැනැත්තෙක් නොවන බවත්, එනමින් හඳුන්වනු ලබන්නේ බලයක් බවත් විශ්වාසයක් තිබේ. මෙනමුත් දේව වචනය අනුව ඉතා පැහැදිළිව අපට පෙනීයන්නේ උන්වහන්සේ බලයක් පමණක් නොව අති බලවත් තැනැත්තෙක් බවයි.

(a) **<u>යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේට ව්‍යවහාර කරන්නේ, බොහෝ දේ ඉටුකරන්නාවූ තැනැත්තෙක් ලෙසය</u>**

(i) **යොහන් 15:26 :- "<u>නුමුත් පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹලාට එවන</u> <u>සැනසිලිකාරයාණන්වහන්සේ</u>, එනම් පියාණන්වහන්සේ වෙතින් නික්මෙන්නාවූ <u>සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ</u> ආ කල, උන්වහන්සේ මා ගැන සාක්ෂි දෙන සේක."**

(ii) **යොහන් 16:7,8 :- " [7]..... <u>උන්වහන්සේ</u> <u>නුඹලා</u> වෙතට එවන්නෙමි. [8] උන්වහන්සේ ආ කල පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අඟවා දෙනසේක."**

(iii) **යොහන් 16:13,14 :-"[13].....උන්වහන්සේ එනම් <u>සැබෑකමේ ආත්මයාණන්වහන්සේ</u> ආ කල, උන්වහන්සේ <u>මුළු</u> සත්‍ය කරා නුඹලාට මඟපෙන්වන සේක.....උන්වහන්සේ ....පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශකරනසේක. [14]උන්වහන්සේ මා ගෞරවයට පමුණුවනසේක....."**

ඉහත සඳහන් පදවල අප දකින්නාවූ එක් දෙයක් වන්නේ, යේසුස්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේට ව්‍යවහාර කරන්නේ, **සැනසිලිකාරයාණන්වහන්සේ, සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ, උන්වහන්සේ, සහ සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ලෙස බවය.** මෙලෙස සාමාන්‍ය - යෙන් අමතනු ලබන්නේ තැනැත්තෙකුට මිස බලයකට නොවන බව අප හොඳහැටි දන්නෙමු.

මෙම පදවල, පහත සඳහන් දේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් කිරීමට යන බවද යේසුස්වහන්සේ පැවසූ සේක. ඒවා නම්.

- **යේසුස්වහන්සේ ගැන සාක්ෂිදීම (යොහන් 15:26)**
- **පාපය, ධර්මිෂ්ඨකම සහ විනිශ්චය ගැන ලෝකයාට අඟවාදීම (යොහන් 16:8)**
- **මුළු සත්‍යය කරා අපට මගපෙන්වීම (යොහන් 16:13)**
- **පැමිණෙන්ට තිබෙන දේ අපට ප්‍රකාශ කිරීම (යොහන් 16:13)**
- **යේසුස්වහන්සේව ගෞරවයට පැමිණවීම (යොහන් 16:14)**

යන ක්‍රියාවල් වේ. මෙසේ ක්‍රියාකිරීමට හැකියාව ඇත්තේ බලයකට නොව තැනැත්තෙකුට බව නිසැකය.

(b) **බලයකට නැත්තාවූද තැනැත්තෙකුට ඇත්තාවූද ලක්ෂණ ශුද්ධාත්මයාණන්වහන්සේට තිබේ**

(i) **උන්වහන්සේට දැනුම තිබේ - (1 කොරින්ති 2:10,11 කියවන්න)**

(ii) **උන්වහන්සේට බලය තිබේ -**
**ක්‍රියා 1:8 :-"…..ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය…."**

(iii) **උන්වහන්සේට හැඟීම් තිබේ - රෝම 15:32 :- "….. අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසාද ආත්මයාණන්වහන්සේගේ ප්‍රේමය නිසාද නුඹලාගෙන් ඉල්ලමි."**

**එපීස 4:30 :- "දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්-වහන්සේට දුක් නොදෙල්ලා ;….."**

මෙම පද දෙක ශුද්ධාත්මයාණන්වහන්සේ ප්‍රේමකරන බවත්, උන්වහන්සේට දුක දනෙන බවත් පෙන්වාදෙයි. එනම් ශුද්ධාත්මයාණන්වහන්සේට හැඟීම් ඇති බව පෙන්වාදෙයි.

(iv) **උන්වහන්සේ කථා කරනසේක - ක්‍රියා 13:2 :- "ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට : මා විසින් බාණ්බස්ද සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලා යයි කීසේක."**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරිය,
ඉහත සඳහන් අයුරින්, ශුද්ධාත්මයාණන්වහන්සේ අපට කථාකරන, උපට උගන්වන, අපට මඟපෙන්වන, තැනැත්තෙක් බව අප සහතික ලෙස දන්නා අතර, එම දැනුම සමඟ අපට පැවරෙන්නාවූ වගකීම් දෙකක් වෙත ඔබගේ අවධානය යොමු කරන්නේ, එහි සඳහන් තීරණවලට ඔබ එළඹේයයි යන බලාපොරොත්තුවෙනි.

(A) **'උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වන සේක' (යොහන් 16:13)** යන වදන් අපට ප්‍රකාශකරන්නාවූ දේව, වචනය **'මාගේ සෙනඟ දැනගැන්ම නැති කමෙන් නාස්තිවී සිටිති' (හොෂෙයා 4:6)** කියාද ප්‍රකාශ කරයි.

දේව දරුව, මුළු සත්‍ය අපට ඉගැන්වීම උදෙසා දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේව අපට ලබාදී ඇති අතර, බොහෝ කිතුනුවන් අද දින දේව වචනය නිසිලෙස නොදැන, නිසි මඟපෙන්වීමක් නොමැතිව පරාජිත ජීවිත ගතකරනවා නොවේද ? මෙසේ සිදුවිය යුතු නැත. දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, සෑම දේව දරුවෙක්ම ජයාන්විත ජීවිත ගත කිරීම වේ. මෙය උදෙසා සත්‍ය දැනගැනීම අත්‍යවශ්‍ය වේ.

එබැවින් ශුද්ධාත්මයාණන්වහන්සේව හොඳහැටි දැන හඳුනාගෙන, උන්වහන්සේගේ මඟපෙන්වීම ලැබීම කිතුනු ජීවිතයට අනිවාර්‍යය වේ.

**දේව දරුව, ශුද්ධාත්මයාණන්වහන්සේ සමඟ සහභාගිකම වැඩි වැඩියෙන් වර්ධනය කර ගැනීමට අදම තීරණය කරන්න.**

(B) **එපීස 4 : 30 :- "…..ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා…."**

ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙන ලෙස අපට උගන්වන දේව වචනය තව දුරටත් පෙන්වාදෙන්නේ උන්වහන්සේ (අපට ප්‍රේමකරමින්) **'කිය නොහැකි කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම් කරන බවයි.' (රෝම 8:26)**

අප උදෙසා කෙඳිරිගාමින් මැදිහත්කම් කරන්නාවූ උන්වහන්සේට දුක සහ වේදනා දීමෙන් වැලකී සිටීමට අප තීරණය කරමු.

1968 වන වසරේ අවසානයේ ශුද්ධාත්මයාණන්වහන්සේ විවිධ මාර්ගවලින් මාගේ පාපය මට පෙන්වාදී, මගේ ජීවිතය දෙවියන්වහන්සේට කැපකිරීමට මා පෙළඹවූ නමුත්, මම මාගේ සිත දැඩි කරමින්, 1969 යේ මැයි මාසයේ 24 වන දින දක්වා, උන්වහන්සේ සමග පොරබැදීමි. මෙසේ මාස පහක පමණ කාලයක් පුරා, මම ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දුන්නේ මගේ මුරණ්ඩුකම නිසාය.

**දේව දරුවෙනි, ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදී ජීවත්වීමට සිතට ගනිමු.**

**2. <u>ශුද්ධාත්මයාණන්වහන්සේ ත්‍රිත්වයේ තෙවැනි තැනැත්තා වනසේක</u>**

දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් අපගේ ත්‍රිඑක දෙවියන්වහන්සේ සමන්විත වන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේ සහ යේසුස් වහන්සේ, ත්‍රිත්වය තුළ සමානතාව (Equality) දරන සේක.

ත්‍රිත්වය ගැන ගැඹුරු ඉගැන්වීමක් කිරීම මෙම අධ්‍යයනයේ අදහස නොවේ. මෙම කොටසේ අරමුණ වන්නේ, ඉතා පහසුවෙන් බයිබලයේ වෙන් වෙන්ව අපට හඳුනාගත හැකිවූ දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ යන තිදෙනා එක සමානවූද, එකට බැඳුනාවූද ත්‍රිත්ව දෙවියන්වහන්සේ වන බව පෙන්වාදීමයි. එය උදෙසා පහත සඳහන් බයිබල් පද දෙස බලමු.

(i) **ලූක් 3 : 21,22 :- " [21]..... යේසුස්වහන්සේත් බව්තීස්මය ලැබ යාච්ඤාකරන කල, අහස විවරවී, [22] ශුද්ධාත්මයාණන්වහන්සේ රූපාකාරයෙන් පරෙවියෙකු මෙන් උන්වහන්සේ පිටට බැස්ස සේක. එවිට : නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය ; නුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් නික්ම ආයේය."**

යේසුස්වන්සේ යෝර්දාන් ගඟේ යොහන් බව්තීස්තතුමා විසින් බව්තීස්ම කරන ලද අවස්ථාවේ, ශුද්ධාත්මයාණන් - වහන්සේ පරෙවියෙකු මෙන් උන්වහන්සේ මත පතිත වූ සේක, දෙවියන්වහන්සේගේ හඬද අහසෙන් නික්ම ආයේය.

මේ අයුරින්, දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ සහ ශුද්ධාත්මයාණන්වහන්සේ එකම ස්ථානයේ එකම වේලාවට වෙන් වෙන්ව ප්‍රකාශවීම අප දකිමු.

(ii) **මතෙව් 28:19 :- "එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා."**

මෙම පදයෙහි සඳහන්වන්නේ, යේසුස්වහන්සේම එදා ගෝලයන්ට දුන්නාවූ **'මහා නියෝගයෙන්'** කොටසකි. වර්තමානයේ **'ගෝලයන්ව'** සිටින්නාවූ අප මෙම නියෝගයට සෘජුවම කීකරු විය යුතුවේ.

යේසුස්වහන්සේ අපට දී ඇත්තාවූ මෙම නියෝගයෙහි, උන්වහන්සේ, දෙවියන්වහන්සේට තමන්වහන්සේට සහ ශුද්ධාත්මයාණන්වහන්සේට සම ස්ථාන දීම අප දකිමු.

(iii) **2 කොරි 13:14 :-**

**"ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවද දෙවියන් - වහන්සේගේ ප්‍රේමයද ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහභාගිකමද නුඹලා සියල්ලන් හා සමග වේවා."**

පාවුල්තුමා කොරින්තිවරුන්ට ලියැවූ දෙවැනි ලිපිය අවසන්වන්නේ ඉහත සඳහන් වචන වලිනි. පාවුල්තුමා විසින් ලියන ලද ලිපිවලින් තහවරු වන්නාවූ එක දෙයක් වන්නේ, දෙවියන්වහන්සේ ඔහුට බොහෝ දේ 'එළිදරව්' කළ බවයි. එතුමා ඉහත සඳහන් අයුරින් කොරින්ති සභාවට 'ආශිර්වාද' කිරීම මගින්, දෙවියන්වන්සේගේ ත්‍රීත්ව ස්වභාවය පිළිබඳව ඔහු දෙවියන්වහන්සේගෙන් එළිදරව්වක් ලැබූ බව පවා අපට සිතිය හැක.

(iv) **උත්පත්ති 1:1,2 :-**

**"[1] පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැවූසේක. [2]..... දෙවියන්වහන්සේගේ ආත්මය ජල මතුයෙහි හැසිරෙමින් සිටිසේක."**

**යොහන් 1:1,2 :-**

**"[1] පටන්ගැන්මෙහිදී වාක්‍යයාණෝ සිටිසේක. වාක්‍යයාණෝ දෙවියන්වහන්සේ හා සමග සිටිසේක, වාක්‍යයාණෝ දෙවියන්වහන්සේව සිටිසේක.**
**[2] උන්වහන්සේ පටන්ගැන්මෙහිදී දෙවියන්වහන්සේ සමග සිටිසේක."**

**උත්පත්ති 1:2** නි පදයෙහි 'දෙවියන්වහන්සේගේ ආත්මය' ලෙස හඳුන්වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ වන බවද, **යොහන් 1:1** නි පදයෙහි 'වාක්‍යයාණෝ' ලෙස හඳුන්වන්නේ යේසුස්වහන්සේ වන බවද ඔබ දන්නවා ඇත. ඒ අනුව ඉහත සඳහන් පද වලින් අප දකින්නේ පටන්ගැන්මෙහිදී, දෙවියන්වහන්සේද, යේසුස්වහන්සේද, ශුද්ධාත්මයාණන්වහන්සේද එකට ක්‍රියා කිරීමයි.

ඔවුන් තිදෙනා පටන්ගැන්මෙහි මෙන්ම, යේසුස් - වහන්සේගේ බව්තීස්මයෙහිද, අදද එක සමානවූද, එකට බැඳුනාවූද ත්‍රීත්ව දෙවියන්වහන්සේ බව මේ සියලු පදවලින් සනාථ වන බව අපගේ විශ්වාසයයි.

3. **<u>ශුද්ධාත්මයාණන්වහන්සේ උදෙසා බයිබලයේ සඳහන් වන්නාවූ සංකේත සහ නම් සමහරක්</u>**

(a) **සංකේත (සමහරක්)**

(i) **පරෙවියෙක් :- මතෙව් 3:16, මාර්ක් 1:10, ලූක් 3:22, යොහන් 1:32**

**මතෙව් 3:16 :- "යේසුස්වහන්සේ බව්තීස්ම ලැබ එකෙණෙහිම දියෙන් ගොඩනැගුණුසේක. බලව, අහස උන්වහන්සේට විවරවිය, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිනවාද තමන් පිටට පැමිණෙනවාද උන්වහන්සේ <u>දුටුසේක</u>."**

පරෙවියා සාමයේ සංකේතයක් ලෙස මුලු ලොවම භාවිතා කරයි. මේ අතර අපගේ ස්වාමිවූ යේසුස්වහන්සේ අපට පැවසුවේ. **'පරෙවියන් මෙන් අහිංසකව සිටීමටය.' (මතෙව් 10:16)**

දේව දරුවෙනි, අප තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩවසන සේක. උන්වහන්සේ පරෙවියෙකු මෙන් මෘදුවද, අහිංසක ලෙසද (කපටිකම්, දුෂ්ඨකම්, කෲරකම් නැතිව) ක්‍රියා කරන්නාවූ තැනන්වහන්සේ වනසේක. අප සැමද මේ ස්වභාවය අප තුළ ඇති කිරීමට (යේස්සුවහන්සේ පැවසූ ආකාරයට) ශුද්ධාත්මයාණන් - වහන්සේට ඉඩ හරිමු.

සමාදානයේ කුමාරයා ලෙසද බයිබලය යේසුස් - වහන්සේව හඳුන්වා දෙයි.

**යෙසායා 9:6 :- " මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක් දෙන ලද්දේය ; ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය, <u>සමාදානයේ කුමාරයා යයි</u> කියනු ලබන්නේය."**

එම හැඳින්වීමට ඔබින ලෙස, උන්වහන්සේගේ බව්තීස්මයේදී ශුද්ධාත්මයාණන්වහන්සේ සමාදානයේ සංකේතයක් වන්නාවූ පරෙවියෙක් ලෙස උන්වහන්සේ මත පතිත වූ සේක.

'සමාදානයේ කුමාරයා' වන්නාවූ යේසුස්වහන්සේ මෙලොවට බිහිවූ ප්‍රධානතම හේතුවක් වූයේ, පාපය නිසා දෙවියන්වහන්සේගෙන් වෙන්වී සිටි මනුෂ්‍යයා සහ දෙවියන්වහන්සේ අතර සමාදානය ඇතිකිරීමටය **(රෝම 5:1)**. මෙම සේවයේ ආරම්භයේදී ශුද්ධාත්මයාණන් - වහන්සේ පරෙවියෙක් ලෙස උන්වහන්සේ වෙත පැමිණීම අපට පෙන්වාදෙන්නේ කුමක්ද කියා වටහාගැනීම අතිශයින් වැදගත්වේ.

**යේසුස්වහන්සේ උන්වහන්සේගේ සේවය ඇරඹුවේද, ඉටුකළේද, සම්පූර්ණකලේද, මළවුන්ගෙන් නැගිටුවන ලද්දේද ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන්ය.**

දේව දරුව, දෙවියන්වහන්සේ එම ශුද්ධාත්මයාණන් - වහන්සේ ඔබට දී තිබේ. උණ්වහන්සේගේ බලයෙන් සේවය කරන්න. දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයන් අතරේ, සාමය ඇතිකරවීම උදෙසා, ශුද්ධාත්මයාණන් - වහන්සේට ඔබව පාවිච්චි කිරීමට ඉඩහරින්න. දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට දී තිබෙන්නේ, ඉහත කී සාමය ඇති කිරීමටද බව තේරුම් - ගනිමින් **'ආත්ම දිනාගන්නෙක්'** වන්න.

(ii) **සුළඟක් :- ක්‍රියා 2:2, යොහන් 3:8**

**යොහන් 3:8 :-**

**"හුළඟ කැමති කැමති තැනකට ගසයි. එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනට යන්නේද කියාවත් නුඹ දන්නේ නැත. ආත්මයාණන් - වහන්සේගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේම යයි කීසේක."**

මෙම වචන යේසුස්වහන්සේ වදාලේ නිකදේමුස්ටය. **යොහන් 3:2-21** දක්වා සඳහන්වන්නේ යේසුස් - වහන්සේගෙන් නිකදේමුස් ඇසූ ප්‍රශ්න සහ යේසුස් - වහන්සේ දුන්නාවූ පිළිතුරු වන අතර, **'යමෙක් වතුරෙන්ද ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන් - වහන්සේගේ රාජ්‍යයට ඇතුල් වෙන්ට බැරි'** බවද **(යොහන් 3:5)** යේසුස්වහන්සේ මේ අවස්ථාවේදී ප්‍රකාශ කළසේක.

දේව දරුව, අප ආත්මයාණන්ගෙන් ඉපිද දේව දරුකමට ඇතුල්වී ඇති බව අදෘෂ්‍යමානවේ. සුළඟ මෙන් කිසිවෙකුට එය නොපෙනෙනු ඇත. මෙනමුත් එසේ වීමේ ප්‍රතිඵල එනම් ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වැඩවසන අතර අපගේ ජීවිතවල ඇතිවන්නාවූ වෙනස (අපගේ කථාවේ, හැසිරීමේ, ක්‍රියාවේ, ආකල්ප යනාදියේ වෙනස) සෑම කෙනෙකුටම පෙනෙන්ට යුතුය.

**දේව දරුව, ඔබ තුළ වැඩවසන්නාවූ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ඵල, ඔබගේ ජීවිතයෙන් ප්‍රකාශවනවාද ?**

(iii) **වතුර :- යොහන් 4:14, 7:38-39**

**යොහන් 4:14 :- "නුමුත් මා දෙන වතුරෙන් බොන කිසිවෙකුට නුමුත් කිසිකලෙක පිපාසා නොවන්නේය ; මා ඔහුට දෙන වතුර ඔහු තුළෙහි සදාකාල <u>ජීවනය නික්මවන්නාවූ වතුර උල්පතක්</u> වන්නේ යයි කීසේක."**

ඉහත සඳහන් පදවල, ශුද්ධාත්මයාණන්වහන්සේගේ සංකේතයක් ලෙස, වතුර හඳුන්වනු ලැබේ. <u>වතුර</u> අපව සෝදා <u>පවිත්‍රකිරීම උදෙසා</u> අප භාවිතා කරන අතර, පිපාසිත තැනැත්තෙක් එය බීම මගින් සෑහීම සහ ශක්තිය අළුත්වීම අත්දකියි.

යේසුස්වහන්සේ ඉහත සඳහන් පදවල ඉතා වැදගත් සත්‍යයක් උගන්වනසේක. එනම් ශුද්ධාත්මයාණන් - වහන්සේ නමැති වතුර අප තුළට ආවිට, එමගින් වතුර උල්පතක් අප තුළ හටගන්නා බවයි.

**යොහන් 7:38 :- " මා කෙරෙහි අදහන්නා තුළින් ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක."**

දේව දරුව, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ වැඩවසන සේක. එබැවින් මෙවදන් අනුව ඔබ තුළින් අන් අය වෙත ශුද්ධාත්මයාණන්වහන්සේ ගලා ගිය යුතුවේ.

**ඔබගේ ජීවිතයේ මෙය සත්‍යයක්ව පවතිනවාද ?**

(iv) **ගින්නක් :- ක්‍රියා 2:3, 1 තෙස 5:19**

**ක්‍රියා 2:3 :- "ගිනි වැනිවූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය."**

**1 තෙස 5:19 :- "ආත්මයාණන්වහන්සේ නොනිවල්ලා."**

අපගේ ව්‍යවහාරය අනුව, යමක් අප නිමා දමනවාද, එය ගින්නක් හෝ ආලෝකයක්වේ. ශුද්ධාත්මයාණන් - වහන්සේ ඉහත පදවල ගින්නක් ලෙස සංකේතවත් වන අතර, එමගින් ඉතා වැදගත් මඟපෙන්වීමක් අප ලබන්නෙමු.

- යේසුස්වහන්සේ නමැති අත්තිවාරම මත අප ගොඩ - නගන්නාවූ ජීවිත, විනිශ්චය දවසේදී **ගින්නෙන් සෝදිසිකරනු ලැබේ (1 කොරි 3:11-13).**
- ගින්නෙන් අපගේ ජීවිතවල නිශ්ඵල දේ දැවී ගොස්, අනර්ග දේ <u>පවිත්‍ර වී</u> වැඩියෙන් බබලනවා ඇත.

**මා ප්‍රිය දේව දරුව, ඔබ දිනෙන් දින ශුද්ධාත්ම ගින්නෙන් තව තවත් පවිත්‍ර වෙමින් සිටිනවාද ?**

(v) **තෙල් :- ලූක් 4:18, ක්‍රියා 10:38, ලෙවී කථාව 8:12, 1 සාමු 16:13**

**ලූක් 4:18 :- ".....දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේප කළසේක."**

**ක්‍රියා 10:38 :- "දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, ....."**

**ලෙවී 8:12 :- "ඔහු ආරොන් <u>පවිත්‍රකරන පිණිස</u> ඔහුගේ හිස පිට ආලේප <u>තෛලය වත්කොට ඔහු ආලේප කළේය</u>."**

**1 සාමු 16:13 :- "එවිට සාමුවෙල් <u>තෙල් කුලාව රැගෙන</u>..... ඔහු <u>ආලේප කළේය</u>. එදින පටන් ස්වාමීන්වහන්සේගේ ආත්මය ආනුභාසම්පන්නව <u>දාවිත් කෙරෙහි පැමිණියේය</u>."**

ඉහත සඳහන් පද තුළින්, තෙල් ශුද්ධාත්මයාණන් - වහන්සේගේ සංකේතයක් ලෙස සභාව භාවිතාකිරීමේ පසුබිම පැහැදිළිව ප්‍රකාශ වෙයි.

දේව දරුවෙනි, අප සඳහන් කළාවූ **සංකේත** අතුරින් **තුනක්ම,** එනම් **වතුර, ගින්න සහ තෙල් පවිත්‍රකම පෙන්වාදෙයි.**

**අප සැමද, ශුද්ධ ආත්මයාණන්වහන්සේගේ මාළිගාවන් වන බැවින්, ශුද්ධවූද පවිත්‍රවූද ජීවිත ගත කිරීමට කැපවෙමු.**

(b) **ශුද්ධාත්මයාණන්වහන්සේ හඳුන්වන්නාවූ නම් (සමහරක්)**

(i) **ස්වාමීන්වහන්සේගේ ආත්මය - යෙසායා 11:2**

**යෙසායා 11:2 :- "ස්වාමීන්වහන්සේගේ ආත්මය එනම් ප්‍රඥාව හා නුවණේ ආත්මයද මන්ත්‍රණය හා බලයේ ආත්මයද දැනගැනීම හා ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමේ ආත්මයද උන්වහන්සේ කෙරේ පිහිටන්නේය."**

මේ පදයෙහි දැක්වෙන්නේ, යේසුස්වහන්සේ ගැන යෙසායා අනාගතවක්තෘතුමා විසින්, දෙන ලද අනාවැකියකි. දේව දරුවෙනි ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ වෙත පැමිණි විට, උන්වහන්සේට ඔබගේ ජීවිතයේ පාලනය ඔබ භාරදුන් විට, මෙම පදයේ සඳහන් **පඥාව, නුවණ, මන්ත්‍රණය, බලය, දැනගැනීම සහ දේව භයද** වර්ධනය වනවා ඇත.

(ii) **ශුද්ධකමේ ආත්මය - රෝම 1:5**

**රෝම 1:5 :- " ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන්ද ඉපිද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට....."**

මීට ප්‍රථමයෙන් අප දුටු ආකාරයට ශුද්ධාත්මයාණන් - වහන්සේ අප යොමුකරන්නේ ශුද්ධ ජීවිත ගත කිරීමටය. මෙම පදයේ උන්වහන්සේ උදෙසා යොදා ඇත්තාවූ නම, තව දුරටත් එය තහවුරු කරයි.

(iii) **සැනසිලිකාරයාණන්වහන්සේ - යොහන් 15:26, 14:17**

ශුද්ධාත්මයාණන්වහන්සේ උදෙසා භාවිතකරනු ලබන්නාවූද, යේසුස්වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දාවූද මේ නම, අප හැමට සුපුරුදු එකකි. ඒ නමින් අප තේරුම්ගන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ දුකේදී, වේදනාවේදී, ප්‍රශ්න සහ ගැටළු මැද්දේදී අපව සනසන්නාවූ, දිරිමත්කරන්නාවූ, ශක්තිමත් කරන්නාවූ තැනන්වහන්සේ බවයි.

දේව දරුව, උන්වහන්සේ ඔබගේ සැනසිලි - කාරයාණන්වහන්සේ වනසේක. **උන්වහන්සේ ඔබ තුළ වැඩ වසන බැවින් <u>ඔබද</u> <u>අනුන්ගේ දුක හඳුනන</u>, ඔවුන්ගේ <u>වේදනා දැනෙන</u> ඔවුන් <u>සනසන</u> <u>තැනැත්තෙක් විය යුතු බව</u> <u>අමතක නොකරන්න</u>.**

(iv) **සත්‍යතාවේ ආත්මයාණන්වහන්සේ, සැබෑකමේ ආත්ම - යාණන්වහන්සේ - යොහන් 14:17, 16:13**

ශුද්ධාත්මයාණන්වහන්සේ මුළු සත්‍ය කරා අපට මඟපෙන්වන සේක (**යොහන් 16:13**). මෙහි සඳහන් සත්‍යතාවේ සහ සැබෑකමේ ආත්මයාණන්වහන්සේ යන නම් වලින් පැන නැගෙන නිගමනයක් වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වැඩ වසන නිසා **සෑම අසත්‍යයද, බොරුවද. වංචාවද, අපගේ ජීවිතවලින් තුරන් විය යුතු බවය.**

(v) **ජීවනදායක ආත්මයාණන්වහන්සේ - රෝම 8:2**

**රෝම 8:2 :- "මක්නිසාද ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළවූ <u>ජීවනදායක ආත්මයාණන්වහන්සේගේ</u> ව්‍යවස්ථාව පාපයේද මරණයේද ව්‍යවස්ථාවෙන් මා නිදහස් කළසේක."**

මේ නම සම්බන්ධයෙන් **යොහන් 4:14** වන පදයද, නැවත කියවා බලන්න.

(vi) **ජීවමාන දෙවියන්වහන්සේගේ ආත්මය - 2 කොරි 3:3**

**2 කොරි 3:3 :-**

**"මක්නිසාද නුඹලා අපේ සේවය කරණකොටගෙන තීන්තවලින් නොව <u>ජීවමාන දෙවියන්වහන්සේගේ ආත්මයෙන්ද</u> ගල්ලෑලි වල නොව මාංසවූ සිත් නමැති ලෑලිවලද ලියා තිබෙන ක්‍රිස්තුස්වහන්සේගේ පත්‍රයක් බව ප්‍රකාශව තිබේ."**

දේව දරුව, ඔබගේ ජීවිතය ඔබ දැනුවත්ව හෝ නොදැනුවත්ව අන් අය කියවන්නාවූ, 'ක්‍රිස්තුස්වහන්සේගේ පත්‍රයක් ' බව තේරුම්ගන්න. එම පත්‍රය කියවන්නාවූ සැවොම ඔබගේ **'යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින අපගේ පියාණන්වහන්සේට ගෞරවය කිරීම පිණිස' (මතෙව් 5:16)** හැසිරෙන්න, ක්‍රියාකරන්න, ජීවත්වෙන්න.

(vii) **ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ - රෝම 8:9**

**රෝම 8:9 :-**

**"නුමුත් නුඹලා තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් - වහන්සේ වාසය කරනසේක් නම්, නුඹලා මාංසයෙහි නොව ආත්මයෙහි සිටින්නෝය. <u>ක්‍රිස්තුස්වහන්සේගේ ආත්ම - යාණන්වහන්සේ</u> යම් කෙනෙකුට <u>නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත</u>."**

දෙවියන්වහන්සේට ජීවිතය කැපකලාවූ සෑම කෙනෙක් තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ වැඩවසන සේක. **රෝම 8:9** වන පදය අපට පෙන්වාදෙන්නේ, එසේ ආත්මයාණන්වහන්සේගේ වැඩවිසීම නොමැති අය ක්‍රිස්තුස්වහන්සේට අයිති නොවන බවයි.

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, ඉහත සඳහන් පදය **(රෝම 8:9)** කියවන්නාවූ ඔබ, දැන් පැමිණ සිටින්නේ ඔබගේ ජීවිතයේ තීරණාත්මක ප්‍රශ්නයක් ඔබගෙන්ම අසා ගැනීමේ අවස්ථාවකටයි.

එම ප්‍රශ්නය නම් -

**ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ මට තිබෙනවාද ?**

යන ප්‍රශ්නයයි.

**රෝම 8:9** වන පදය පෙන්වාදෙන්නේ, මෙම ප්‍රශ්නයට 'එසේය' නැතහොත් 'ඔව්' කියා ඔබට තිර වශයෙන් ප්‍රකාශකළ නොහැකි නම්, **ඔබ ක්‍රිස්තුස්වහන්සේට අයිති නොවන බවයි.**

දේව දරුව, පමා නොවන්න.

ඉහත සඳහන් ප්‍රශ්නයට 'එසේය' / 'ඔව්' කියා ඔබට පිළිතුරු දිය නොහැකිනම්, වහාම යාච්ඤාවෙන් අවංකව ඔබගේ ජීවිතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේට පුදන්න. උන්වහන්සේට ඔබගේ හදවතට පැමිණීමට ආරාධනා කරන්න. එවිට ක්‍රිස්තුස් - වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නොහොත් ශුද්ධාත්ම - යාණන්වහන්සේ ඔබ තුලට පැමිණෙනු ඇත.

**එසේ කිරීමට දෙවි සමිඳුන්**

**ඔබට පිහිට වනසේක්වා !!**

සටහන්

සටහන්

## සටහන්

# ශුද්ධාත්මයාණන්වහන්සේ - 02



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 02

# අපගේ ජීවිත තුළ
# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාකිරීම

**<u>හැඳින්වීම</u> :-**

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව අප කිරීමට යන්නාවූ දෙවැනි අධ්‍යයනය මෙය වේ. පළමුවැනි අධ්‍යයනයේදී ශුද්ධාත්මයාණන්වහන්සේ යනු කවුද? යන ප්‍රශ්නයට අප පිළිතුරු සෙවූ අතර, උන්වහන්සේ උදෙසා බයිබලයේ සඳහන් වන්නාවූ සංකේත සහ නම් සමහරක් දෙසද බැලුවෙමු.

මෙම අධ්‍යයනයේදී, උන්වහන්සේ අපගේ ජීවිතවල ඉටුකරන්නාවූ බොහෝ දේවල් අප ඔබ ඉදිරියේ තබන්නෙමු. මෙසේ කරුණු 30 කට ආසන්න සංඛ්‍යාවක් ඔබ ඉදිරියේ තබන අතර, මෙහි සඳහන් නොවන්නාවූ තවත් කරුණු රාශියක් තිබේ.

ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ ජීවිත තුළ ක්‍රියාකිරීම පිළිබඳව මෙම අධ්‍යයනයේදී ඉදිරිපත් කරනු ලබන කරුණු, අප නව ගිවිසුමකට සීමා කර ඇති අතර, ඒවා සඳහන් පිළිවෙළද නව ගිවිසුමේ සඳහන් පිළිවෙල බොහෝ දුරට අනුගමනය කර ඇත.

**<u>අධ්‍යයනය</u> :-**

**<u>ශුද්ධාත්මයාණන්වහන්සේ අප ජීවිත තුළ ඉටුකරන්නාවූ දේ</u>**

**1. අපට ආත්මික උපත ලබාදීම - යොහන් 3 : 3,5,6**

**යොහන් 3:3,5,6 :- " [3]යේසුස්වහන්සේ උත්තර දෙමින් : සැබවක් සැබවක් නුඹට කියමි - යමෙක් <u>අලුතෙන් නූපන්නොත්</u> ඔහුට <u>දෙවියන්වහන්සේගේ රාජ්‍ය දකින්ට නොහැකියයි කීසේක</u>. [5]යේසුස්වහන්සේ උත්තර දෙමින්.....යමෙක් වතුරෙන්ද <u>ආත්මයාණන්ගෙන්ද නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙන්ට බැරිය</u>. [6] මාංසයෙන් උපදින දේ මාංසයය; <u>ආත්මයාණන්ගෙන් උපදින දේ ආත්මයය</u>."**

යේසුස්වහන්සේ විසින් නිකොදේමුස්ට පවසන ලද මෙම වදන් තේරුම්ගැනීමට නිකොදේමුස්ට, එදා අපහසුවූවා සේම, අදද කිතුනු නම දරන බොහෝ අය, 'අලුතෙන් ඉපදීම' නිසිලෙස තේරුම්ගැනීමට අපොහොසත් වෙති.

මෙසේ වීමට එක හේතුවක් වන්නේ, 'මනුෂ්‍යයා යනු කවරෙක්ද?' කියා නිවැරදි අවබෝධයක් අපට නොතිබීමයි.

කුඩා කල පටන් අප පුරුදුවී සිටින්නේ මනුෂ්‍යයා යනු, මනසක් සහ ආත්මයක් ඇත්තාවූ ශරීරයක් ලෙස තේරුම්ගැනීමටයි. මෙනමුත් සත්‍යය වන්නේ මනුෂ්‍යයා යනු, ආත්මයක් වන්නාවූ දෙවියන්වහන්සේ විසින්, **'උන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වයෙන්' (උත්. 1:26)** මවන ලද්දාවූ අමරණීය ආත්මයක් වන බවය. මනුෂ්‍ය ශරීරය යනු මෙලොව විසීම උදෙසා දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දී ඇත්තාවූ කුඩාරමකි.

මනුෂ්‍යවූ අප ''උපත'' යනුවෙන් අදහස්කරන්නේ ශාරීරික උපත නොහොත් මාංසයෙන් ඉපදීමට වන අතර, යේසුස්වහන්සේ ඉහත සඳහන් කොටසේ 'අලුතෙන් ඉපදීම' යනුවෙන් අදහස් කරන්නේ, ආත්මික ඉපදීමටයි.

මෙය කියවන්නාවූ ඔබ සැමගේ කැමැත්ත සහ විශ්වාසය වන්නේ ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීම වන අතර, යේසුස්වහන්සේ පවසන්නේ එය උදෙසා අප **අනිවාර්යයෙන්ම ආත්මික උපතක් ලැබිය යුතු බවයි.** මෙම උපත ඉටු කරනු ලබන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින්ය.

**තීතස් 3 : 5 :- ''අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස <u>නැවත ඉපදීම</u> නැමති සේදීමෙන්ද <u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත්කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූසේක</u>.''**

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරියෙනි, ඔබ ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ මේ ක්‍රියාවට ඇතුල්වී නොමැති නම්, ඔබ 'ගැළවීම' ලබා නොමැති බව තේරුම්ගෙන **නොපමාව ඔබගේ ජීවිතය දෙවි සමිඳුන්ට භාරදී, අලුතෙන් ඉපිද, දේව දරුකමට ඇතුල්වන්න.**

**2. අපට ඉගැන්වීම - යොහන් 14:26**

**යොහන් 14:26 :- "නුමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන් - වහන්සේ, නුඹලාට <u>සියල්ල උගන්වමින්</u>, මා විසින් නුඹලාට කියන ලද <u>සියල්ල නුඹලාට සිහිකරවනසේක</u>."**

ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් අපගේ ජීවිත වල කරන්නාවූ අතිශයින් වැදගත් දෙයක් වන්නේ අපට ඉගැන්වීමයි.

කිතුනු අපගේ ජීවිතවල අත්‍යවශ්‍ය වන්නාවූ දෙයක් වන්නේ, දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිව වටහා ගැනීමයි. අද දවසේ දේව වචනය විවිධ අන්දමට අර්ථකතනය කරන්නාවූ කණ්ඩායම් බොහෝ සිටින අතර, අප තුළ වසන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේ, දේව වචනයේ කතුවරයා බව අප දනිමු (**2 පේත්‍රුස් 1:21, 2 තිමෝති 3:16** කියවා බලන්න). එසේ වන්නේ, දේව වචනය ලිවීමට මනුෂ්‍යයන් පොළඹවනු ලැබුවේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් බැවිනි.

දේව දරුව, ඕනෑම කෘතියක් අපට වඩාත්ම නිවැරදිව පහදා දීමට හැකියාව ඇත්තේ, එම කෘතියේ කතුවරයාටය. එලෙසම දෙවියන්වහන්සේගේ වචනය, වඩාත්ම නිවැරදිව අපට ඉගැන්වීමට හැක්කේ, ශුද්ධාත්මයාණන්වහන්සේටය.

**එබැවින් අප සැම, දේව වචනය කියවන අතර, එම වචනයේ කතුවරයා, අපට ඉගැන්වීමට බලා සිටින බව තේරුම් - ගනිමින්, දේව වචනය අපට පහදා දෙන ලෙස ශුද්ධාත්ම - යාණන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු.**

**3. යේසුස්වහන්සේ කී සියලු දේ අපට සිහිකරවීම - යොහන් 14:26**

සෑම මනුෂ්‍යයෙකුටම පාහේ, තමන් බලාපොරොත්තු නොවූ, හදිසි අවස්ථාවලට මුහුණ දීමට සිදුවේ. මෙවැනි අවස්ථාවලදී අප නොසන්සුන්වී, කැළඹී, පැහැදිලිව සිතීමට පවා අපොහොසත් වන අවස්ථා එමටය. බොහෝවිට එවිට අප සිත් තුළ බිය ඇතිවේ.

මෙවැනි අවස්ථාවන්හිදී, ශුද්ධාත්මයාණන්වහන්සේ යේසුස්වහන්සේගේ වචන අපට සිහිකරවා අපගේ බිය සැක දුරු කර, අපව සන්සුන් කරන සේක.

<u>නිදසුනක් වශයෙන්</u>, දැඩි උපද්‍රවයක් ඉදිරියේ, මරණ බියෙන් වෙවුලමින් සිටි කිතුනු කාන්තාවකට ශුද්ධාත්මයාණන් - වහන්සේ, යේසුස්වහන්සේ කී වචන, එනම් **"මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමි" (මතෙව් 28:20)** සිහිකිරීම තුළින්, ඇයගේ බිය තුරන්වී, ඇදහිල්ල ශක්තිමත් වී ඇය ලැබූ මහත් ජය ගැන කලකට පෙර මා ඇසුවාවූ කථා පුවතක් යොහන් 14:26 හි සඳහන් සත්‍යතාවය පැහැදිලිව පෙන්වාදෙයි.

### 4. අපගේ පාප අපට පෙන්වාදීම - යොහන් 16:8

**යොහන් 16:8 :- "උන්වහන්සේ ආ කල, <u>පාපය ගැනද</u> ධර්මිෂ්ඨකම ගැනද, විනිශ්චය ගැනද ලෝකයාට <u>අඟවා දෙනසේක</u>."**

මනුෂ්‍ය ස්වභාවය වන්නේ, තමාගේ පාපය සඟවා දැමීම, වසා දැමීම, සහ පිළිනොගැනීමය. තම පාපය පිළිනොගැනීම උදෙසා මනුෂ්‍යයා භාවිතා කරන්නාවූ එක උපක්‍රමයක් වන්නේ, අන් අය වෙත වරද පැටවීමට උත්සාහ කිරීමය.

මේ අතර දේව වචනය කිතුනු අපට උගන්වන්නේ අපගේ වරද පිළිගැනීමටත් අපගේ වරද ගැන පසුතැවිලි වීමටත්ය. මෙසේ කිරීම උදෙසා ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ කරන්නේ මහඟු සේවයකි.

අප පව් කලවිට උන්වහන්සේ අපගේ හදවත් තුළ අසමාදානය ඇතිකරනසේක. එමගින් අපගේ පාප අපට පෙන්වා දෙනසේක.

දේව දරුව, ඔබ විවිධාකාර තීරණ ගන්නා කල ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ සමාදානය ඔබගේ හදවතේ නොමැති නම්, ඔබගේ තීරණය දේව කැමැත්තට අනුකූල නොවීම, එයට හේතුව විය හැක. එබැවින් **ශුද්ධාත්මයාණන් - වහන්සේගේ සමාදානය ඔබගේ හදවතේ නැති කරන්නාවූ ක්‍රියා සම්පූර්ණයෙන්ම අතහරින්න.**

**5. මුළු සත්‍ය කරා අපට මඟපෙන්වීම - යොහන් 16:13**

**යොහන් 16:13:- ''එසේවී නුමුත්, උන්වහන්සේ එනම් සැබෑකමේ ආත්මයාණන්වහන්සේ ආ කල, උන්වහන්සේ <u>මුළු සත්‍ය කරා නුඹලාට මඟපෙන්වන සේක</u>. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා, <u>පැමිණෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක</u>.''**

**6. මතු පැමිණෙන්ට තිබෙන දේ අපට ප්‍රකාශ කිරීම - යොහන් 16:13**

දෙවියන්වහන්සේගේ වචනයේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ, එහි අනාගත වාක්‍යයන් බහුලව සඳහන්වීමයි.

**ආමොස් 3:7 :- ''සැබවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන් වූ ආනාගත - වක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරනසේක.''**

**යෙසායා 46:10 :- ''මම වනාහි අන්තිමය මුල පටන්ද තවම සිද්ධ නූණ දේ පුරාණයේ පටන්ද දන්වන්නාවූ : ... තැනන්වහන්සේය.''**

මෙසේ අනාගත වාක්‍යවලින් සපිරුණු ''බයිබලය'' අපට ලබාදී ඇති දෙවියන්වහන්සේ තව දුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමන්වහන්සේගේ මෙහෙකරුවන්ට එළිදරව් නොකර උන්වහන්සේ කිසිවක් නොකරන බවයි. උන්වහන්සේ මෙසේ එළිදරව් නොහොත් ප්‍රකාශ කරන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගිනි.

**7. යේසුස්වහන්සේව ගෞරවයට පැමිණවීම - යොහන් 16:14**

**යොහන් 16:14 :- ''උන්වහන්සේ මා ගෞරවයට පමුණුවන සේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශකරනසේක.''**

යේසුස්වහන්සේව ගෞරවයට පැමිණවීම, අප තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ කරන්නාවූ ක්‍රියාවක් ලෙස සඳහන් කරන්නේ මන්ද ? කියා ඔබ අසන්ට පුළුවන.

ශුද්ධාත්මයාණන්වහන්සේ, යේසුස්වහන්සේව ගෞරවයට පමුණුවන්නාවූ, එක මාර්ගයක් වන්නේ, අප තුළ සහ අප තුළින් මහත් දේ ඉටුකරමින්, ඒවා ගැන සාක්ෂි දැරීමට අපව පොළඹවමිනි.

**දේව දරුව, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් ඔබගේ ජීවිතයේ පුදුම සහ හාස්කම් ඉටුකරන අතර, ඒවා ගැන සාක්ෂිදරමින් යේසුස්වහන්සේගේ නාමය ගෞරවයට සහ මහිමයට පත්කිරීම අතපසු නොකරන්න.**

ඔබ මෙසේ සාක්ෂි දරන ඔබ වෙත හෝ වෙන කිසි මනුෂ්‍යයෙකු වෙත වැඩියෙන් අවධානය යොමුකිරීමේ වරදින් සම්පූර්ණයෙන්ම වලකින්න. **සියළු ගෞරවය සහ මහිමය යේසුස්වහන්සේට සහ දෙවියන්වහන්සේට දීමට සැලකිලිමත් වන්න.**

**8. අපට බලය ලබාදීම - ක්‍රියා 1:8**

**ක්‍රියා 1:8 :- "නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල <u>නුඹලා බලය ලබන්නහුය</u>."**

ශුද්ධාත්මයාණන්වහන්සේ අපට බලය ලබා දෙන අතර, උන්වහන්සේගේ බලය යක්ෂයාගේ බලයට වඩා අධික බව තේරුම්ගන්න.

**1 යොහන් 4:4 :- "මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා දෙවියන්වහන්සේට අයිතිව, ලෝකයේ සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනන්වහන්සේ උතුම්** (Greater) **බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජයගෙන සිටින්නේය."**

**9. දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමට අපට නිර්භීතකම දීම - ක්‍රියා 4:31**

**4:31 :- "ඔවුන් යාච්ඤා කළ පසු, ඔවුන් රැස්වී සිටි ස්ථානය කම්පාවිය; ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, <u>දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය</u>."**

දෙවියන්වහන්සේ තම සභාවට කැඳවන්නේ, ශුද්ධව පවිත්‍රව සිටීමටය.

**එපීස 5:27 :- "<u>තේජවත් සභාවක්</u> කොට තමන්ට ඔප්පුකර ගැනීම සඳහා වචනය නමැති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ එය <u>පවිත්‍රකොට පිරිසිදු කරන පිණිසය</u>."**

දේව දරුව, සභාව පවිත්‍රවීම උදෙසා අප සැමදෙන දේව වචනය නිර්භීත ලෙස කථා කළ යුතුවේ. විශේෂයෙන්ම සභාව තුළ දේව වචනයට එකඟ නොවන්නාවූ ඕනෑම දෙයක් සිදුවන්නේ නම්, අප නිර්භීතව සත්‍යය කථා කළ යුතුවේ. එනමුත් **මෙසේ අප කථා කළ යුත්තේ, යටහත් කමින් සහ ප්‍රේමයෙන් යුතුව (එපීස 4:15) බව කිසිසේත් අමතක නොකරන්න.**

**10. අපට කථාකිරීම - ක්‍රියා 13:2**

**ක්‍රියා 13:2 :- "ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, <u>ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට</u> : මා විසින් බාර්ණබස්ද සාවුල්ද <u>කැඳවූ වැඩය</u> පිණිස ඔවුන් මට <u>වෙන්කරපල්ලා යයි කීසේක</u>."**

ත්‍රිඑක දෙවියන්වහන්සේ අපට කථාකරන බව, මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබගෙන් අති බහුතරයක් අත්දැක ඇති බව මම විශ්වාස කරමි.

උන්වහන්සේ මෙලෙස අපට බොහෝසේ කතාකරන්නේ දේව වචනය ඇසීම හෝ කියවීම සහ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ විශේෂ ක්‍රියාකිරීම මගිනි.

<u>නිදසුනක් වශයෙන්</u>, තම කුසයේ පිළිසිඳගත් දරුවා නැතිවී ගිය බව දැනුනු මවක් පසුගිය සතියේ මා හට සාක්ෂිදැරුවේ මේ අයුරිනි - "මගේ දරුවා නැතිවූ බව මට දැනුනු විට, මම මහත් වේදනාවෙන් සමිඳුන්ට යැදුවා. උන්වහන්සේ මට **ලූක් 7:11-15** දක්වා කියවන්න කියා කීවා. එහි සඳහන්ව තිබුනේ නායින් නුවර කනවැන්දුම්යගේ පුතා ජීවත්කරනු ලැබීමේ සිද්දියයි. උන්වහන්සේ මට එමඟින් කථා කළා."

දේව දරුව, දෙවියන්වහන්සේ/ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට කථාකොට යමක් කියන විට, **උන්වහන්සේ කියන දේ සම්පූර්ණයෙන්ම විශ්වාස කරන්න.** සැක නොකර දේව ආශිර්වාද ලබාගන්න.

**11. වැඩ (සේවය) උදෙසා අපව කැඳවා, වෙන්කිරීම - ක්‍රියා 13:2**

**ක්‍රියා 13:2** වන පදයේ සඳහන්වන්නේ, ශුද්ධාත්මයාණන් - වහන්සේ කථාකොට බාණිබස් සහ සාවුල්, උන්වහන්සේ කැදෙව්වාවූ සේවය උදෙසා වෙන්කිරීමට අන්තියෝක සභාවේ නායකයන්ට ප්‍රකාශ කළ බවයි.

දේව දරුව, දෙවි සමිඳුන් ඔබව කැඳවා ඇත්තාවූ සේවය ඔබට පැහැදිළිව පෙන්වන මෙන් උන්වහන්සේගෙන් යදින්න. **උන්වහන්සේ පෙන්වන්නාවූ සේවයෙහි විශ්වාස - වන්තව නිරතවෙන්න.**

**12. අපව වැලැක්වීම - ක්‍රියා 16:6,7**

**ක්‍රියා 16:6,7 :- "[6] ඔව්හු ආසියාවේදී වචනය කියාදෙන්ට <u>ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරනු ලැබ</u>.... [7] බිතිනියට යන්ට උත්සාහ කළෝය. නුමුත් <u>යේසුස්වහන්සේගේ ආත්මයාණෝ ඔවුන්ට ඉඩ නුදුන්සේක</u>."**

දෙවියන්වහන්සේගේ කැමැත්ත හා සමඟ එකඟ නොවන්නාවූ සේවයන්හි අප නිරතවීමට උත්සාහ කරන විට, උන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් අපව වලක්වන්නාවූ, දොරවල් වසන්නාවූ අවස්ථා ඇතිවිය හැක.

**13. දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල වැගිරීම - රෝම 5:5**

**රෝම 5:5 :- "....මක්නිසාද අපට දෙනලද ශුද්ධාත්මයාණන්- වහන්සේ කරණකොටගෙන <u>දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය</u>."**

දේව දරුව, ඔබ අන් අය වෙත දක්වන්නාවූ ප්‍රේමය, ඔවුන්ට සමාවීම, අසරණවූවන්ට පිහිටවීම වැනි දෙයින්, මෙම ප්‍රේමය ප්‍රකාශවනවාද ? කියා විමසා බලන්න.

**14. අපගේ ශරීර නැවත නැගිටවීම - රෝම 8:11**

**රෝම 8:11 :- ''.... ක්‍රිස්තුස් යේසුස්වහන්සේව මළවුන්ගෙන් නැගිටෙවූ තැනන්වහන්සේ නුඹලා තුළ වසන තමන්ගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන <u>නුඹලාගේ මරණීය ශරීරයන්ද ජීවත් කරනසේක</u>.''**

දේව දරුව, අප ස්වාමීවූ යේසුස්වහන්සේ උත්ථානය වී තම ගෝලයන්ට ප්‍රකාශවුනාවූ ශරීරය වැනි නොදිරන්නාවූ අමරණීය ශරීරයක් (**1 කොරි 15:52-54**) අපට ලැබෙනු ඇත.

**15. අපව ගෙනයෑම - රෝම 8:14**

**රෝම 8:14 :- ''මක්නිසාද දෙවියන්වහන්සේගේ <u>ආත්මයාණන්වහන්සේ විසින් ගෙන යනු ලබන</u> යම් පමණ දෙනෙක් ඇද්ද, එපමණ දෙනා දෙවියන්වහන්සේගේ පුත්‍රයෝය.''**

**ලූක් 4:1,2** යන පද අපට පෙන්වාදෙන්නේ, තම බවතීස්මයේදී ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ යේසුස්වහන්සේ, උන්වහන්සේ විසින් 'සතලිස් දවසක් වනයෙහි ගෙනයනු ලැබූ' බවය.

**16. අප දෙවියන්වහන්සේගේ දරුවන් බව අපට සාක්ෂිදැරීම - රෝම 8:16**

**රෝම 8:16 :- ''<u>අපි දෙවියන්වහන්සේගේ දරුවෝ යයි</u> ආත්මයාණන්වහන්සේම අපේ ආත්මය එක්ව <u>සාක්ෂිදෙන සේක</u>.''**

දේව දරුව, මෙම සාක්ෂිය ඔබට දැනෙනවාද ?

**17. අපගේ දුර්වලකම්වලදී අපට උපකාර කිරීම - රෝම 8:26**

**රෝම 8:26 :- ''එලෙසම ආත්මයාණන්වහන්සේත් <u>අපගේ දුර්වලකම් වලදී උපකාර කරනසේක</u>. මක්නිසාද යුතුලෙස යාච්ඤාකරන්ට අපි නොදනිමුව : නුමුත් ආත්මයාණන් - වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම්වලින් <u>අප උදෙසා මැදහත්කම් කරනසේක</u>.''**

## 18. අප උදෙසා මැදහත්කම් කිරීම - රෝම 8:26

දේව දරුවෙනි, ශුද්ධාත්මයාණන්වහන්සේ අප උදෙසා මැදහත්කම් කරනසේක. **අපද අන් අය උදෙසා මැදිහත් යාච්ඤාවේ නිරතවීම අරඹමු. විශේෂයෙන්ම අපට හතුරුකම් කරන්නාවූ අය උදෙසා මැදිහත් යාච්ඤාවේ යෙදෙමු.**

## 19. අපට ප්‍රීතිය ගෙනදීම - රෝම 14:17

**රෝම 14:17 :- "මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද, සමාදානයද ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ."**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල සඳහන් කරන්නාවූ **ගලාති 5:22** හි ප්‍රීතිය දෙවැනිව සඳහන් වන බව අප සැම හොඳහැටි දනිමු.

දේව දරුව, මෙම ප්‍රීතිය ඔබගේ හදවතේ තිබෙනවාද ?

## 20. දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් එළිදරව් කිරීම - 1 කොරි 2:10

**1 කොරි 2:10 :- "නුමුත් දෙවියන්වහන්සේ ස්වකීය ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපට ඒ දේ එළිදරව් කළසේක. මක්නිසාද ආත්මයාණන්වහන්සේ සියලු දේ, එසේය, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් විමසනසේක."**

යමෙක් 'අලුතෙන් උපන්විට' ඔහු දෙවියන්වහන්සේගේ පවුලේ ආත්මික උපත ලබන්නේ 'බිළිඳෙක්' ලෙසය. දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, අප ආත්මික බිළිඳු ස්වභාවයේ සිටීම නොව, අප ආත්මිකව වර්ධනය වීමයි. මෙනමුත් කිතුනු සභාව තුළ බොහෝ දෙනා, ආත්මික පරිනතභාවය නොසොයමින්, බිළිඳුන් මෙන් ක්‍රියාකිරීම නිතර දක්නට ලැබේ. දේව දරුව, අප සැම මෙවැනි තැනක නොසිට, දෙවියන්වහන්සේගේ ගැඹුරු දේවල් කරා ගමන් කරමු.

**21. දීමනා අපට බෙදා දීම - 1 කොරි 12:11**

**1 කොරි 12:11 :- ''<u>නුමුත් ඒ එකමවූ ආත්මයාණන්වහන්සේ</u> තමන් කැමති ලෙස <u>එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්</u>, මේ සියල්ල කරවන සේක.''**

**1 කොරි 12 වන පරිච්ඡේදය** ශුද්ධාත්මයාණන්වහන්සේ දීමනා පිළිබඳව අපට උගන්වන අතර, එහි 11 වන පදය පෙන්වාදෙන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේ කැමති ලෙස, **'එකිනෙකාට වෙන වෙනම'** උන්වහන්සේගේ දීමනා බෙදා දෙන බවයි. උන්වහන්සේ තම <u>දරුවන් සැමදෙනාට</u> වෙන වෙනම උන්වහන්සේගේ <u>දීමනා දෙන බව</u> මෙම පදයෙන් <u>පැහැදිලිවේ</u>.

**දේව දරුව, උන්වහන්සේ ඔබට පිරිනමා ඇති දීමනා හඳුනාගෙන දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ඒවා යොදවන්න.**

**22. යේසුස්වහන්සේගේ ශරීරයට අපව බව්තීස්ම කිරීම - 1 කොරි 12:13**

**1 කොරි 12:13 :- ''.....අප සියල්ලෝ එකම <u>ආත්මයාණන් - වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ</u>, සියල්ලෝ එකම අත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව.''**

**23. මාංසයේ තෘෂ්ණාවන්ගෙන් ජය අපට ලබාදීම - ගලාති 5:16**

**ගලාති 5:16 :- ''නුමුත් ආත්මයාණන්වහන්සේ කරණ - කොටගෙන හැසිරියල්ලා, එවිට නුඹලා <u>මාංසයේ තෘෂ්ණා සම්පූර්ණකරන්නේ නැතැයි කියමි</u>.''**

**24. ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල අප තුළ ඇතිකිරීම - ගලාති 5:22,23**

**ගලාති 5:22,23 :-'' [22] නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, [23] විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය....''**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සහ එල ගැන, වැදගත් කරුණක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා උන්වහන්සේගේ කැමැත්ත ලෙස අපට බෙදා දෙන අතර, එම දීමනා තිබීම පමණකින් යමෙකුගේ ආත්මික පරිනතභාවය ප්‍රකාශ නොවේ.

එම පරිනතභාවයේ මූලික ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ යමෙකුගේ ජීවිතයෙන් ප්‍රකාශවන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ එලයි.

දේව දරුව, ආත්මික දීමනාවලට ආශාවීම සහ ඒවා සෙවීම යහපත් දෙයකි (**1 කොරි 14:1,12** කියවා බලන්න). මෙනමුත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ එල අතුරින් ප්‍රථමයෙන් සඳහන් වන්නාවූ ප්‍රේමයේ මාර්ගය ඊටත් වඩා උතුම් මාර්ගයක් බව අමතක නොකරන්න (**1 කොරි 12:31-13:3** කියවා බලන්න). එබැවින් **අප සැම දීමනා සොයන අතර, ශුද්ධාත්මයාණන්වහන්සේගේ එල අප තුළ ඇතිවීමට ඊටත් වඩා උනන්දු වෙමු.**

**25. අභ්‍යන්තර මනුෂ්‍යයා බලයෙන් ශක්තිමත් කිරීම - එපීස 3:16**

**එපීස 3:16 :- "උන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා <u>බලයෙන් ශක්තිමත් වන පිණිසත්,</u> ....."**

**26. දෙවියන්වහන්සේ ස්තූති පුදකිරීමට උපකාර කිරීම - එපීස 5:19, 20**

**එපීස 5:19, 20 :- "[19] නුමුත් <u>ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණවී,</u> ...... නුඹලාගේ සිත්වලින් ස්වාමීන්වහන්සේට <u>ගායනාද ගීතිකාද කරමින්,</u> [20] අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ <u>දෙවියන්වහන්සේට නිතරම ස්තූතිකරපල්ලා</u>."**

**27. අපව පිරිසිඳු කිරීම - 2 තෙසලෝනි 2:13**

**2 තෙස 2:13 :- "නුමුත්, ස්වාමීන්වහන්සේ විසින් ප්‍රේමකරනු ලබන සහෝදරයෙනි, ආත්මයාණන්වහන්සේගේ පිරිසිඳු කිරීමද....."**

**1 පේත්‍රුස් 1:2 :- "ආත්මයාණන්වහන්සේගේ පිරිසිඳු - කිරීමෙන් කීකරුවීමටත්, ....."**

**28. අප තුළ වාසය කිරීම - 2 තිමොති 1:14**

**2 තිමෝති 1:14 :- "නුඹට භාරදුන් යහපත් දෙය, අප තුළ වසන ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන ආරක්‍ෂා කරපන්න."**

**යොහන් 14:17 :- "..... මක්නිසාද උන්වහන්සේ නුඹලා සමඟ නැවතී සිටිනසේක. නුඹලා තුළෙහි සිටිනසේක."**

මාගේ ප්‍රේමවන්ත සහෝදර, සහෝදරියනි, ඉහත සඳහන් කරුණු 28 ට අමතරව, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ ජීවිතවල ඉටුකිරීමට ආසා කරන්නාවූ තව බොහෝ දේ ඇත. මේ අතර ඉහත සඳහන් කරුණු අප ඔබ ඉදිරියේ තබන්නේ එමගින් ඔබගේ හදවතේද ඔබගේ ආත්මයේද, මහත් පිබිදීමක් ඇති කිරීමට ඔබ ශුද්ධාත්මයාණන් - වහන්සේට ඉඩදේවා යයි පතමිනි.

දේව දරුව, දෙවියන්වහන්සේගේ කැමැත්ත උන්වහන් - සේගේ දරුවන් වන්නාවූ අප සැම යේසුස්වහන්සේ මෙන් වීමයි. අපගේම උත්සාහයෙන් සහ හැකියාවෙන් අපට කිසිසේත් මෙසේ කළ නොහැකිවේ. මෙනමුත් **අප දෙවියන්වහන්සේට සම්පූර්ණයෙන්ම කීකරුවී, ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුව ජීවත්වීමට කැප වෙන අතර, දිනෙන් දින ශුද්ධාත්මයාණන්වහන්සේ අපව වෙනස්කරනු ඇත.**

**2 කොරි 3:18 :- "අපි සියල්ලෝද මුහුණ වැස්මක් නැතුව, ස්වාමීන්වහන්සේගේ තේජස කැඩපතකින් මෙන් දක්වමින්, ආත්මයාණන්වහන්සේ වන ස්වාමීන්වහන්සේ කෙරෙන් තේජසින් තේජසට එම ස්වරූපයට වෙනස්කරනු ලබමුව."**

**මෙසේ ජීවත්වීමට**

**ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට**

**මඟපෙන්වනසේක්වා !!!**

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 01



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 03

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කිරීම

**<u>හැඳින්වීම</u> :-**

අද අප අධ්‍යයනය කිරීම අරඹන්නාවූ 'ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා' යන මාතෘකාව, කිතුනු සභාවට අතිශයින් වැදගත්වන්නාවූ මාතෘකාවකි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සම්බන්ධව සභාවන් තුළ ඇත්තාවූ විවිධ මත හේතුකොටගෙන, සභාවන් අතර ඇත්තාවූ සම්බන්ධකම් දුර්වලවීම ගැන අපට අසන්ට ලැබේ. එපමණක් නොව ප්‍රාදේශීය සභාවකට අයිතිවන්නාවූ සාමාජිකයන් අතර පවා ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා පිළිබඳව මත ගැටුම් ඇතිවීම හේතුවෙන්, සභා දෙකඩවීමේ ඛේදජනක පුවත් පවා අපට ඇසෙන අවස්ථා තිබේ. මෙවැනි මතගැටුම් හේතුවෙන්, එකම පවුලකට අයිති දේව දරුවන්, එකට නමස්කාර කිරීමට නොහැකිව, මව, පියා සහ දරුවන් සභා දෙකකට හෝ තුනකට පවා වෙන්වී නමස්කාරයේ යෙදෙන්නාවූ පවුල් ගැන ඔබ සමහරවිට දන්නවා ඇත.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා වැරදිලෙස තේරුම් ගැනීම, භාවිතා කිරීම සහ ඉගැන්වීම වැනි කාරණා හේතුවෙන්, දෙවියන්වහන්සේ සභාවට දී ඇත්තාවූ මේ අනර්ඝ තිළිණය පිළිබඳව කිතුනුවන් දරන්නාවූ වැරදි ආකල්ප සහ අදහස් කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

### (i) ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අවතක්සේරු කිරීම

මෙවැනි අය ප්‍රකාශකරන්නේ, එම දීමනා වර්තමාන සභාවට එතරම් අදාළ නොවන බවත්, එමනිසා ඒවාට වැදගත් ස්ථානයක් දීම අනවශ්‍ය බවත් වැනි අදහස්ය.

### (ii) ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවලට අධිසාමාන්‍ය වැදගත්කමක් දීම

මෙවැනි අය, 'දැනගැනීමේ වචනයේ දීමනාව' ඇත්තාවූ දේව දාසයෙකුගේ වචනවලට, දේව වචනයටත් වඩා උසස් ස්ථානයක් දීම, අප දකින අවස්ථා තිබේ.

(iii) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම**

මෙවැනි අය බොහෝවිට ප්‍රකාශකරන්නේ, 'මට නම් ඕවා ඕනෙ නෑ, මගේ චාම් ඇදහිල්ල මට ඇති' වැනි අදහස්ය.

අපගේ යාච්ඥාව වන්නේ, මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබ සැම, ශුද්ධාත්මයාණන්වහන්සේම **'මුළු සත්‍යය කරා මගපෙන්වමින්' (යොහන් 16:13), 'නුඹලාට සියල්ල උගන්වමින්' (යොහන් 14:26)**, ආත්මිකව වර්ධනය කරන සේක්වා !! යන්නයි.

**<u>අධ්‍යයනය</u> :-**

හැඳින්වීමේදී අප පෙන්වාදුන් ආකාරයට ශුද්ධාත්මයාණන්-වහන්සේගේ දීමනා භාවිතා කිරීමේදී සිදුවිය හැකි අඩුපාඩු නිසා, අනවශ්‍ය ගැටලු සහ භේද ඇති විය හැක. එබැවින් මෙම අධ්‍යයනයේ අප ඔබගේ අවධානය යොමු කිරීමට යන්නේ, මූලික වශයෙන්ම ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කළ යුතු අන්දම වෙතය.

1. **<u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සභාවට දෙනු ලබන්නේ කුමක් උදෙසාද ?</u>**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා නිවැරදිව භාවිතා කිරීම උදෙසා, අප ප්‍රථමයෙන්ම තේරුම්ගත යුතුව ඇත්තේ, දෙවියන්වහන්සේ එම දීමනා සභාවට ප්‍රධානය කර ඇත්තේ, කුමක් උදෙසාද? කියා තේරුම්ගැනීමයි.

(a) **සභාවේ/ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය උදෙසා**

**1 කොරි 12:11 :-**

**"නුමුත් ඒ එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ල කරවන සේක."**

පසුගිය අධ්‍යයනයේදී අප පෙන්වාදුන් ආකාරයට, ශුද්ධාත්මයාණන්වහන්සේ <u>සෑම දේව දරුවෙකුටම</u> අවම වශයෙන් දීමනා එකක් හෝ දෙනසේක.

මෙසේ අප සෑම කෙනෙකුටම ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා එකක් හෝ ලැබෙන අතර, දෙවියන්වහන්සේ එය අපට ලබා දී ඇත්තේ, සභාවේ වර්ධනය උදෙසා බව අප පැහැදිලිව තේරුම්ගත යුතුවේ.

**1 කොරි 12:7 :-**

**"නුමුත් ආත්මයාණන්වහන්සේගේ ප්‍රකාශවීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය."**

මෙම පදයෙහි **'ප්‍රයෝජනය පිණිසය'** යන වචන ඉංග්‍රීසි පරිවර්තනයේ සඳහන් වන්නේ ' for the common good ' (NIV) නොහොත් **'පොදු යහපත උදෙසාය'** යන අර්ථය ඇතිවය.

දේව දරුව, දෙවියන්වහන්සේ ඔබට ප්‍රධානය කර ඇත්තාවූ සියළුම ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා උන්වහන්සේ දී ඇත්තේ, කිතුනු සභාවේ නොහොත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය උදෙසාය.

එමනිසා ඔබගේ දීමනාවන් භාවිතාකිරීම අතපසු නොකරන්න. දේව මඟපෙන්වීම අනුව, පොදු යහපත උදෙසා නොහොත් සභාවේ වර්ධනය උදෙසා නොමසුරුව පරිත්‍යාගශීලීව ඒවා භාවිතා කරන්න.

**එපීස 4:13 :-**

**"ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණවීම සඳහා සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය."**

මෙම පදයේ විස්තර කරන්නේ, පස්වැදෑරුම් සේවය තුළින් දෙවියන්වහන්සේ අපේක්ෂාකරන්නාවූ ප්‍රතිඵල වන අතර, උන්වහන්සේ ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරුන්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් සභාපාලකයන් සහ ගුරුවරුන් යන පස්වැදෑරුම් සේවය උදෙසා කැඳවා ගත්තවුන් හට, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා බහුලව දෙනසේක. ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා මෙසේ ඔවුන්ට ප්‍රධානය කරනු ලැබුවේ, **'සේවය කිරීමේ වැඩය පිණිසත් ක්‍රිස්තුස් - වහන්සේගේ ශරීරයේ වර්ධනයවීම පිණිසත්'** බව පැහැදිලිය.

(b) **ඉවැන්ජලිස්ත සේවය උදෙසා**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සභාවට දෙන ලද්දේ, ඉවැන්ජලිස්ත සේවය උදෙසා බව ඍජුවම දේව වචනයේ සඳහන් නොවන නමුත්, යේසුස්වහන්සේගේ සේවය මෙන්ම අපෝස්තලුවරුන්ගේ සේවයද, මුල් සභාවේ සේවය දෙසද බලන අතර අපට පෙනීයන්නේ, ඉවැන්ජලිස්ත සේවයේ ප්‍රධානතම ශක්තියක් වූයේ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා සහිත දේව දරුවන් බවයි.

(i) **යේසුස්වහන්සේගේ සේවය**

**ලූක් 4:40 :- "ඉර බසින කල අනේකාකාර රෝගවලින් පීඩිත වූ.....සියල්ලෝම උන්වහන්සේ වෙතට ඔවුන් ගෙනාවෝය ; උන්වහන්සේ ඔවුන් එකිනෙකා පිට අත් තබා, ඔවුන් සුවපත් කළසේක."**

**ලූක් 4:42 :- "......සමූහයා උන්වහන්සේ සොයමින් උන්වහන්සේ ළඟට පැමිණ, ඔවුන් කෙරෙන් නොයන ලෙස උන්වහන්සේ නවත්වාගන්ට උත්සාහ කළෝය."**

මේ අයුරින් සමූහයා යේසුස්වහන්සේ වෙත ඇදුනේද, උන්වහන්සේව පිළිගත්තේද, උන්වහන්සේ තුළින් ප්‍රකාශවුනාවූ 'සුවකිරීමේ දීමනාව' සහ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ බලය නිසාය.

(ii) **පේත්‍රුස් සහ යොහන් කොරෙකු සුවපත් කිරීම - ක්‍රියා 3:1-10**

දේව මාළිගාවේ සුදර්ශන දොරටුව ළඟ සිඟමින් සිටියාවූ, මව්කුස පටන් කොරව සිටි මනුෂ්‍යයා සුවකරනු ලැබීම ගැන අප හොඳහැටි දන්නෙමු. පේත්‍රුස් සහ යොහන් තුළින් ප්‍රකාශවුණාවූ 'සුව කිරීමේ දීමනාවේ' ප්‍රතිඵලයක් වූයේ, පන්දහසක් පමණ සංඛ්‍යාවක් ඇදහිල්ලට පැමිණීමයි (**ක්‍රියා 4:4**).

ප්‍රේමණීය දේව දරුව, දෙවි සමිඳුන් ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා ඔබට දී ඇත්තේ සභාවේ වර්ධනය සහ ඉවැන්ජලිස්ත සේවය උදෙසායි. එමනිසා එම දීමනා නොනිසි අන්දමින් හෝ වැරදි අරමුණු ඇතුව භාවිතා කිරීමට යක්ෂයා ඔබ වෙත ගෙන එන්නාවූ පරීක්ෂාවලට අසු නොවන්න.

උන්වහන්සේ ඔබට ප්‍රධානය කර ඇත්තාවූ දීමනා ගැන උඩඟු නොවන්න. ඔබ වෙත අවධානය යොමු කර ගැනීම උදෙසා ඒවා භාවිතා නොකරන්න. උන්වහන්සේ ඔබව ශුද්ධාත්ම බලයෙන් සහ දීමනාවන්ගෙන් පාවිච්චි කරන විට, **සෑම අවස්ථාවකදීම සියලු ගෞරවය සහ මහිමය සමිඳුන්ට පුදන්න.** ඔබගේ උපස්ථානය ලබන්නාවූ සැමදෙනාට, දෙවි සමිඳුන්ට ස්තුතිය සහ ප්‍රශංසාව පුදකරන්ට උගන්වන්න.

## 2. 1 කොරි 12 වන පරිච්ඡේදයෙහි ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා සඳහන්වන්නාවූ අනුපිළිවෙල

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා කොපමණ තිබෙනවාද ? යන ප්‍රශ්නය අසන්ට යෙදුනොත්, බොහෝ කිතුනුවන්ගේ ක්ෂණික පිළිතුර වන්නේ නවය යන්නයි. දේව වචනයේ මීට වඩා දීමනා අධික සංඛ්‍යාවක් සඳහන් වන නමුත්, මේ අයුරින් පිළිතුරු සැපයීමට බොහෝ කිතුනුවන් පුරුදුව සිටින්නේ, **1 කොරි 12 වන පරිච්ඡේදය** ඇසුරෙනි. ඔවුන් මෙසේ පිළිතුරු දීමට හේතුව වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ගැන වඩාත්ම දීර්ඝතම ඉගැන්වීම **1 කොරි 12-14 වන පරිච්ඡේද** වල සඳහන්වීම සමඟම ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා නවයක් **1 කොරි 12:8-10** දක්වා සඳහන් කරනු ලැබීමයි.

කොරින්ති පොතේ මෙම ස්ථානයේ දීමනා නවයක් සඳහන් කරන්නාවූ පාවුල්තුමා, එහි සඳහන් නොවන වෙනත් දීමනා, මෙම පරිච්ඡේදයේම අන්තිම කොටසේද, ඔහු ලියූ වෙනත් ලිපිවලද සඳහන් කර තිබේ. මෙනමුත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ගැන පාවුල්තුමා මූලික ලෙස උගන්වන්නාවූ **1 කොරි 12 වන පරිච්ඡේදයෙහි, 8-10 වන පද තුන තුළ** සඳහන් දීමනා නවය, එහි සඳහන් අනුපිළිවෙලට ඔහු සඳහන් කරන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම අනුව බව අප විශ්වාස කරමු.

එබැවින් මා අදහස්කරන්නේ, මෙම කොටසෙහි ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සඳහන්වන්නාවූ අනුපිළිවෙලින්, ඒවා භාවිතාකිරීම පිළිබඳව යම්කිසි මඟපෙන්වීමක් ඇත්ද ? කියා විමසා බැලීමටයි.

(i) **ප්‍රඥාවේ වචනය සහ දැනගැනීමේ වචනය - 1 කොරි 12:8**

ප්‍රඥාවේ වචනය සහ දැනගැනීමේ වචනය ලෙස හඳුන්වා දෙනු ලබන්නාවූ දීමනා දෙකෙන්ම සිදුවන්නේ, එම දීමනා ඇත්තන්ට ඔවුන්ට අවශ්‍යවන්නාවූ ප්‍රඥාව හෝ දැනගැන්ම දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් එළිදරව් කිරීමයි.

දැනගැනීමේ වචනය මඟින් දෙවියන්වහන්සේ එම දීමනාව ඇත්තාවූ තම දරුවාට අවශ්‍යවන්නාවූ දැනුම ලබා දෙන අතර, එම අවස්ථාවේදී ඔහු ක්‍රියා කළ යුතු අන්දම, ප්‍රඥාවේ වචනය මඟින් ඔහු ලබයි. මෙසේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියාකිරීමට ඔහුට හැකිවේ.

**දේව දරුව, අපගේ ජීවිතවල වඩාත්ම වැදගත්වන්නාවූ දෙය වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමයි. එසේ කිරීමට මෙම දීමනා දෙක අපට බොහෝසේ උපකාරවෙයි.**

මෙම දීමනා දෙක ප්‍රථමයෙන්ම සඳහන්වීම මඟින් සෑම කිතුනුවෙක්ම දෙවියන්වහන්සේගේ කැමැත්ත සෙවීමද, ඊට යටත්වීමද ප්‍රථමයෙන්ම කළ යුතු බවට යම් කිසි ඉඟියක් සැඟවී ඇති බව අපට සිතිය හැක.

(ii) **ඇදහිල්ල - 1 කොරි 12:9**

ඉහත සඳහන් දීමනා දෙක මගින් අප ගත යුතු ක්‍රියා මාර්ගය දෙවියන්වහන්සේ පෙන්වන අතර, බොහෝවිට උන්වහන්සේ මඟපෙන්වන අන්දමට ක්‍රියාකිරීමට මහත් ඇදහිල්ලක් අවශ්‍ය වේ.

**<u>නිදසුනක් වශයෙන්</u>** -

වෛද්‍යවරුන්ට සුව කළ නොහැකිවූ දරුණු පිළිකාවකින් පෙලෙන රෝගියෙකුට සුවය දෙන බව දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කරන නමුත්, එම සුවය එම රෝගියාට ලබාදීම උදෙසා ඇදහිල්ල අතිශයින් වැදගත් ස්ථානයක් ගනියි.

(iii) **සුවකිරීමේ දීමනාව සහ ආශ්චර්යජනක කිරීම - 1 කොරි 12:9**

**යාකොබ් 5:15 :-**

**"එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ, ස්වාමීන්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත....."**

**යාකොබ් 5:15** හි සඳහන් වන්නාවූ 'ඇදහිල්ලේ යාච්ඤාව', දේව බලය අත්දැකීම උදෙසා ඇදහිල්ල ගන්නාවූ වැදගත් ස්ථානය මතක් කර දෙයි.

ඉහත සඳහන් කර ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සඳහන් අනුපිළිවෙල, දේව සේවය ගැන අපට වැදගත් මාර්ගයක් පහදා දෙයි : එනම්,

(a) ප්‍රථමයෙන් දේව කැමැත්ත සොයන්න.
(b) දෙවැනුව උන්වහන්සේ දෙන්නාවූ මඟපෙන්වීම පිළිගන්න.
(c) තෙවැනුව දේව කැමැත්ත අනුව ඉල්ලන යාච්ඤා උන්වහන්සේ අසන බව තේරුම්ගන්න. **(1 යොහන් 5:14,15)**
(d) බාධා ඇතිවූවත් ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න.

**දේව දරුවෙනි, අප දේව කැමැත්ත අනුව ඇදහිල්ලෙන් සේවයේ නිරත වෙමු. දෙවියන්වහන්සේ නිසැකවම අපව බලවත් ලෙස පාවිච්චි කරනවා ඇත.**

(iv) **ධර්මවාක්‍ය කීම - 1 කොරි 12:10**

ධර්මවාක්‍ය කීම සභාවට ඉතා වැදගත්වන්නාවූ දීමනාවක් වන අතර, යක්ෂයාද සභාව නොමඟ යැවීම උදෙසා ව්‍යාජ ධර්මවාක්‍ය භාවිතා කරන අවස්ථා තිබිය හැක.

මෙම හේතුව නිසා, පාවුල්තුමා සභාවට උපදෙස් දෙන්නේ ධර්මවාක්‍ය විමසා බලන ලෙසය.

**1 කොරි 14:29 :-**

**" ධර්ම වාක්‍ය කියන්නෝ දෙදෙනෙක් නොහොත් තුන්දෙනෙක් කථාකරත්වා, <u>අනිත් අය විමසා බලත්වා</u>."**

(v) **ආත්ම විමසීම, නානා වර්ග භාෂා, භාෂා තේරුම්කරදීම - 1 කොරි 12:10**

දේව දරුවෙනි, අප තුළ ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩවසන අතර, යක්ෂයා අපගේ සිත්වලට පරීක්ෂා ගෙන එයි. එබැවින් අප ධර්මවාක්‍ය හෝ අන්‍ය භාෂා පවසන අතර, ඒවා පැමිණෙන්නේ, ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන්ද, යක්ෂයාගෙන්ද, නැතහොත් අපේම ආත්මයෙන්ද කියා නිරාකරණය කිරීම අතිශයින් වැදගත් වන්නේ, මෙම දීමනා අනුකරණය කරමින් යක්ෂයාද ව්‍යාජ දීමනා පෙන්නුම් කරන බැවිනි.

එබැවින් ධර්මවාක්‍ය විමසා බලන ලෙස දේව වචනය අපට උපදෙස් දෙන අතර, 'ආත්ම විමසීමේ දීමනාව' දෙවියන්වහන්සේ සභාවට දී ඇත. සෑම ප්‍රාදේශීය සභාවකම මෙම දීමනාව ඇත්තාවූ කිහිප දෙනෙක් සිටීම, 'ව්‍යාජ අන්‍ය භාෂාවලින්' සභාව ආරක්ෂා කරනු ලබයි.

දේව දරුවෙනි, සෑම සභාවකම මෙම දීමනාව තිබිය යුතුවේ. එබැවින් සමිඳුන්ගෙන් මේ ගැන මඟපෙන්වීම සොයමින්, යක්ෂයාගේ ව්‍යාජ දීමනාවලට නොරැවටෙන්න.

**1 කොරි 12:8-10** දක්වා සඳහන්වන්නාවූ, ශුද්ධාත්මයාණන් -වහන්සේගේ දීමනා නමයෙහි, අන්‍ය භාෂා කථාකිරීම සහ අන්‍ය භාෂා තේරුම් කරදීමට ප්‍රථමයෙන්, ආත්ම විමසීම සඳහන්වන්නේ මන්ද කියා, ඔබට වැටහෙනවා ඇතැයි සිතමි.

## 3. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවල ස්වභාවය</u>

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා වල ස්වභාවය නිවැරදිව වටහා නොගතහොත්, අපට නොයෙක් අනවශ්‍ය ප්‍රශ්න මතුවිය හැක. අප ප්‍රථමයෙන් තේරුම්ගත යුතුව ඇත්තේ, දීමනාවක් යනු 'තෑග්ගක්' බවයි. ශුද්ධාත්මයාණන් -වහන්සේගේ දීමනාවක් යනු අපට ප්‍රධානය කරනු ලබන්නාවූ **'අධි ස්වභාවික තෑග්ගකි.'**

මෙම තෑග්ග **'ආත්මයාණන්වහන්සේ තමන් කැමැත්ත ලෙස අපට බෙදා දෙනසේක.' (1 කොරි 12:11)**

එබැවින්,

(a) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අපට <u>ඉගෙන ගැනීමට නොහැකි වේ</u>**

මෙය තේරුම්ගැනීමට අප අපොහොසත් වුවහොත්, දීමනා ඇත්තාවූ දේව දරුවෙක්, රෝගීන් සුවකිරීම සහ යක්ෂයන් දුරු කිරීම උදෙසා දෙවියන්වහන්සේ පාවිච්චි කිරීම දැක, අපටත් එලෙස කළ හැකියයි කියා අප සිතන්ට පුළුවන. මෙසේ සිතමින්, අප ශුද්ධාත්මයාණන් -වහන්සේගේ බලය සහ අවශ්‍ය දීමනා නොමැතිව, අපවම රවටාගෙන වෙන කෙනෙක් කරන්නාවූ දේවල් සහ ප්‍රකාශකරන්නාවූ වචන අනුකරණය කිරීමට පෙළඹුනහොත්, අප ලජ්ජාවට පැමිණෙන්ට පුළුවණ.

දේව දරුව, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා, උන් - වහන්සේගේ කැමැත්ත අනුව බෙදා දෙනු ලබන නිසා, ඒවා ඉගෙන ගත නොහැකි බව සිතේ තබාගන්න.

අන් අයෙකුගේ අන්‍ය භාෂා අනුකරණය කිරීමට තැත්කිරීම, යක්ෂයාට අපව නොමඟ යැවීමට අපම ලබාදෙන අවස්ථාවක් බව තේරුම්ගන්න.

(b) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අපට <u>උපයාගත නොහැකිවේ</u>**

අප යම්කිසි ආයතනයක රැකියාව කරනවිට, අපගේ රාජකාරීන් උනන්දුවෙන්ද, වගකීමෙන්ද, කාර්යක්ෂම - තාවයෙන්ද, විශ්වාසවන්තවද, ඉටුකිරීම තුළින්, අපට උසස්වීම් වැනි දේ උපයා ගත හැක. එබැවින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාද 'යහපත් ජීවිතයක්' තුළින් උපයා ගත හැකි බව අප සිතන්ට පුළුවන.

ගැළවීම දීමනාවක් වන නිසා, එය ඇදහිල්ලෙන් ලබා ගත යුතුවේ. ක්‍රියාවලින් ලබාගත (උපයාගත) නොහැකිවේ.

**එපීස 2:8-9 :-" [8] මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. <u>එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය</u>. [9] කිසිවෙක් පාරට්ටුකර නොගන්න පිණිස <u>ඒක ක්‍රියාවලින් නොවේ</u>."**

ගැළවීම ක්‍රියාවලින් ලබා ගත නොහැකිසේම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවද යහපත් ජීවිතයක් මඟින් උපයාගත නොහැකිවේ.

(c) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා <u>අපට බලෙන් ලබාගත නොහැකිවේ</u>**

අපගේ වර්තමාන සමාජයේ, විවිධ ආකාර බලපෑම් භාවිතා කිරීම මඟින්, අපට බොහෝ දේ ලබා ගත හැකිවේ. මේ අයුරින් දෙවියන්වහන්සේට බලපෑම් කිරීමට අපට නොහැකිය. එබැවින් 'මම කෙසේ හෝ එම දීමනාව ලබා ගන්නවා' කියා අප සිතන්නේ නම් අප සිටින්නේ වැරදි මතයකය.

දේව වචනය අපට කියාදෙන්නේ 'වඩා උතුම් දීමනාවලට ආශාවන්ට' කියාය (**1 කොරි 12:31**).

අප මෙසේ ආශාවීම යහපත් දෙයකි. අප ආශාකරන දීමනා දෙවි සමිඳුන්ගෙන් ඉල්ලීමේ වරදක් නැත. අපට උන්වහන්සේගෙන් ඉල්ලීමට ඉඩ ඇති අතර, උන්වහන්සේගෙන් 'කෙසේ හෝ ලබාගන්ට' අපට නොහැකිවේ.

**4. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කළ යුතු අන්දම - 1 කොරි 13,14</u>**

(i) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ප්‍රේමයෙන් භාවිතා කළ යුතුවේ - 1 කොරි 13:1-3**

**1 කොරි 12** වන පරිච්ඡේදයේ මූලික ඉගැන්වීම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා පිළිබඳව වන අතර, **1 කොරි 13** වන පරිච්ඡේදයේ මූලික ඉගැන්වීම ප්‍රේමය පිළිබඳව වන බව අප සැවොම දනිමු. මෙනමුත් මෙම පරිච්ඡේද දෙක ඍජුවම එකට බැඳී තිබෙන බව කිතුනුවන්ගෙන් බහුතරයක් තේරුම් නොගැනීම කණගාටුවට කරුණකි.

**1 කොරින්ති 12 හි** උගන්වනු ලබන්නා වූ දීමනා භාවිතා කළ යුත්තේ **1 කොරින්ති 13 හි** සඳහන් ප්‍රේමයෙන් විය යුතු බව දේව වචනය ඉතා පැහැදිලිව පෙන්වාදෙයි.

**' තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. '** (**1 කොරි 12:31**) යන වචන වලින් කොරින්ති දොළහ අවසාන වන අතර, කොරින්ති දහතුන ඇරඹෙන්නේ, ප්‍රේමයේ අත්‍යවශ්‍යතාවය උගන්වමිනි.

(a) **<u>ප්‍රේමය රහිතව</u> ප්‍රකාශ කරන්නාවූ අන්‍ය භාෂා <u>නිෂ්ප්‍රයෝජන වේ</u> - 1 කොරි 13:1**

**1 කොරි 13:1** පෙන්වාදෙන්නේ මනුෂ්‍යයන්ගේ සහ දේවදූතයන්ගේ භාෂා කථා කිරීමේ දීමනාව ඇති නමුත්, අපට ප්‍රේමය නොමැතිනම් එම කථාකිරීම නිශ්ප්‍රයෝජන බවයි.

(b) **අනාගත වාක්‍ය කීමේ දීමනාව, සියලු දැනගැන්ම, කඳු පහකරන තරම් ඇදහිල්ල තිබෙන නමුත්, <u>මට ප්‍රේමය නොමැති නම් මම හිස් මනුෂ්‍යයෙක් වෙමි</u> - 1 කොරි 13:2**

දේව දරුව, මෙය තේරුම්ගන්න. කෙතරම් අනර්ඝ දීමනා දෙවි සමිඳුන් ඔබට ප්‍රධානය කර ඇති නමුත්, ඔබ ඒවා භාවිතාකරන්නේ, ප්‍රේමය රහිතව නම් ඔබ හිස්වූ මනුෂ්‍යයෙක් වේ. එබැවින් අප සැම දෙවි සමිඳුන්ට මෙසේ පොරොන්දු වෙමු.

ස්වාමීනි, ඔබවහන්සේ මට දී ඇති දීමනා,
- මා 'ප්‍රදර්ශනය' නොකරන්නෙමි.
- මා උසස්කර ගැනීම උදෙසා භාවිතා නොකරන්නෙමි.
- ගැන උඩගු නොවන්නෙමි.
- නිසා මා අන් අය පහත් ලෙස නොසලකන්නෙමි.
  (මා අනුන්ට වඩා උතුම් යයි නොසිතන්නෙමි)

(c) **මම කෙතරම් පරිත්‍යාගිශීලීව දුන්නත්, සේවය උදෙසා කෙතරම් පීඩා වින්දත්, මට <u>ප්‍රේමය නැත්නම්</u> ඒවායින් <u>මට කිසි ප්‍රයෝජනයක් නොමැතිවේ</u> - 1 කොරි 13:3**

දේව දරුවෙනි, දිළිඳුන්ට, අනාථ වූවන්ට, වැන්දඹුවන් සහ අසරණ වූවන් වැනි අයට දීම අප විසින් කළ යුතුවේ. මෙසේ අප කෙතරම් දුන්නත්, එම දීම සිදුවන්නේ ප්‍රේමය රහිතව නම්, එයින් අපට කිසිම ප්‍රයෝජනයක් නැත.

**දේව දරුවෙනි, ප්‍රේමයෙන් යුක්තව, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා සභාවේ වර්ධනය උදෙසා භාවිතාකරමු.**

(ii) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ඔබ්න ලෙසද පිළිවෙලින්ද භාවිතා කළ යුතුවේ - 1 කොරි 14**

(a) සභාවේ වර්ධනය උදෙසා දීමනා භාවිතා කිරීම දේව කැමැත්ත වේ.
**(1 කොරි 14:4, 5, 12, 26 කියවන්න)**

(b) තේරුම් කර දීමට නොහැකි නම්, සභාවේ අන්‍යභාෂා කථාකිරීම, නිශ්ප්‍රයෝජන වන්නාවූ අවස්ථා තිබේ.
**(1 කොරි 14:9, 11, 13, 19 කියවන්න)**

(c) දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් පමණක්, පිළිවෙලට අන්‍යභාෂා වලින් සභාවේ කථා කළ යුතු අතර, එම වචන තේරුම් කර දීමට කෙනෙක් සිටිය යුතු වේ. එවැනි කෙනෙක් නොසිටිත්නම්, නිහඬව සිටීම උචිත වේ.
**(1 කොරි 14:27, 28)**

**1 කොරි 14:27,28 :-**
**" [27] යමෙක් අන් භාෂාවකින් කථා කෙරේ නම්, දෙදෙනෙක් නොහොත් වැඩිවුණොත් තුන් දෙනෙක් පමණක් එක්කෙනෙක් පාසා එක්කෙනෙක් එසේ කෙරේවා ; එක්කෙනෙක් තේරුම් කර දේවා. [28] තේරුම්කර දෙන කෙනෙක් නැත්නම්, ඔහු සභාවේදී නිශ්ශබ්ද වේවා ; තමාටත් දෙවියන්වහන්සේටත් කථා කෙරේවා."**

(d) අන් අයගේ විමසීමට යටත්වීමට සූදානම්ව යටහත් - කමින් ධර්මවාක්‍ය කීම නිවැරදි ආකල්පය වේ.
**(1 කොරි 14:29 කියවන්න)**

(e) එකිනෙකාට යටත්වෙමින් දීමනා භාවිතා කළ යුතුවේ.

**1 කොරි 14:30 :-**
**"නුමුත් එහි හිඳින අනිකෙකුට එළිදරව්කිරීමක් පැමිණුණොත්, පළමුවෙන තැනැත්තේ නිශ්ශබ්ද වේවා."**

(f) සභාව තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කරන විට, එය ඔබින ලෙසද පිළිවෙලින්ද කළ යුතුවේ.

**1 කොරි 14:40 :-**
**" නුමුත් සියල්ල ඔබිනා ලෙසද පිළිවෙලින්ද කරනු ලැබේවා."**

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ**

**දීමනා නිසි අයුරින් භාවිතාකිරීමට**

**දෙවි සමිඳුන් ඔබට පිහිටවන සේක්වා !!!**

සටහන්

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 02



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 04

## එළිදරව් කිරීමේ දීමනා

**<u>හැඳින්වීම</u> :-**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා පිළිබඳව, අප කිරීමට යන්නාවූ දෙවැනි අධ්‍යයනය මෙයයි. මා අදහස් කරන්නේ **1 කොරි 12:8-10** දක්වා සඳහන් වන්නාවූ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා නවය ඉගැන්වීම මෙම අධ්‍යයනය මගින් අරඹන්ටයි. මෙහි සඳහන් දීමනා තරමක් විස්තරාත්මකව ඉගැන්වීමට මා අදහස් කරන බැවින්, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා ඉගැන්වීම උදෙසා අවම වශයෙන් තවත් අධ්‍යයනයන් දෙකක් අවශ්‍යය වනු ඇත.

**1 කොරි 12:8-10** දක්වා සඳහන් වන්නාවූ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා පැහැදිලිව තේරුම්ගැනීම උදෙසා බොහෝ විචාරකයෝ මෙම දීමනා නවය, දීමනා තුන බැගින් අයිති වන්නාවූ කොටස් තුනකට බෙදා විස්තර කරති. මෙම වර්ග කිරීම අනුව, මෙම දීමනා නවය එළිදරව් කිරීමේ දීමනා තුනක්, වාචික දීමනා තුනක් සහ බලයේ දීමනා තුනක් ලෙස සලකනු ලැබේ.

මෙම අධ්‍යයනයෙන් අපගේ අවධානය යොමු කරනු ලබන්නේ, ඉහත සඳහන් එළිදරව් කිරීමේ දීමනා තුන වෙතය.

**<u>අධ්‍යයනය</u> :- <u>1 කොරි 12:8-10 දක්වා සඳහන් දීමනා නවය</u>**

මෙම කොටසේ සඳන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා නවය සඳහන් වන්නේ, පහත අනුපිළිවෙලටය.

(i) ප්‍රඥාවේ වචනය
(ii) දැනගැනීමේ වචනය
(iii) ඇදහිල්ල
(iv) සුවකිරීමේ දීමනාව
(v) ආශ්චර්ය්‍යය කිරීම
(vi) ධර්මවාක්‍ය කීම
(vii) ආත්මවල් විමසීම
(viii) නානා වර්ග භාෂා
(ix) භාෂා තේරුම් කර දීම

මෙම දීමනා නවය, පහත සඳහන් අයුරින් වර්ගකර ඉගැන්වීම, ඔබට ප්‍රයෝජනවත් වේය යන්න මාගේ විශ්වාසයයි.

1. **එළිදරව් කිරීමේ දීමනා**

   (a) ප්‍රඥාවේ වචනය (**8 වන පදය**)

   (b) දැන ගැනීමේ වචනය (**8 වන පදය**)

   (c) ආත්මවල් විමසීම (**10 වන පදය**)

2. **බලයේ දීමනා**

   (a) ඇදහිල්ල ( **9 වන පදය**)

   (b) සුවකිරීමේ දීමනාව (**9 වන පදය**)

   (c) ආශ්චර්ය කිරීම ( **10 වන පදය**)

3. **වාචික දීමනා**

   (a) ධර්ම වාක්‍ය කීම (**10 වන පදය**)

   (b) නානා වර්ග භාෂා ( **10 වන පදය**)

   (c) භාෂා තේරුම්කර දීම (**10 වන පදය**)

අද දවසේ අප පිවිසෙන්නේ **එළිදරව් කිරීමේ දීමනා** තුන අධ්‍යයනය කිරීමටයි.

1. <u>**එළිදරව් කිරීමේ දීමනා**</u>

**එළිදරව් කිරීමේ දීමනා** ලෙස වර්ග කර ඇත්තාවූ දීමනා තුන, එලෙස වර්ගකර තිබෙන්නේ, මෙම දීමනා තුනම දෙවියන් - වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් දේව දරුවන්ට විශේෂ දැනුමක් හෝ එළිදරව් කිරීමක් ගෙන දෙන්නාවූ දීමනා වන බැවිනි.

දේව දරුවෙනි, මෙය වටහාගන්න. දෙවියන්වහන්සේ මනුෂ්‍යවූ අපට යම්කිසි දෙයක් එළිදරව් කරන්නේ, ඒ දේ දැනගැනීම ඉතා වැදගත් වන බැවිනි. එබැවින් ආලේපලත් දේව දාසයෙක් දෙවියන්වහන්සේ ඔහුට ප්‍රධානය කර ඇත්තාවූ **'එළිදරව් කිරීමේ දීමනාවක්'** භාවිතා කරමින්, ඔබ වෙත යම්කිසි එළිදරව් කිරීමක් හෝ උපදෙසක් හෝ මගපෙන්වීමක් ලබා දෙන අතර, ඇදහිල්ලෙන් එය භාර ගන්න. **දෙවියන්වහන්සේ** එම දේව දාසයා මගින් **ඔබට ලබාදෙන්නාවූ එළිදරව් කිරීම අනුව ක්‍රියා කරන්න.**

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව මා ලියන්නාවූ අධ්‍යයන මාලාවේ, පළමුවැනි අධ්‍යයනයෙහි පළමුවැනි පිටුවේ, මා විසින් ලියනු ලැබූ වගන්තියක්, නැවත වරක් මා පහතින් සඳහන් කරන්නේ, දෙවියන්වහන්සේගේ එළිදරව්කිරීම අනුව ක්‍රියා නොකිරීමේ වරදින් වැලකී සිටීමට ඔබට උපකාර කිරීමේ අරමුණෙනි.

**'මෙම අධ්‍යයනය කියවන්නාවූ ප්‍රේමණීය දේව දරුව, මා මෙන් දෙවියන්වහන්සේගේ හඬ හඳුනාගැනීමට අපොහො - සත්වීමේ වරදට කිසිවිටක පත් නොවීමට වග බලා ගන්න.' (ශුද්ධාත්මයාණන්වහන්සේ 01, 1 නි පිටුව)**

සැබවින්ම එළිදරව් කිරීමේ දීමනා තුනම දෙවියන්වහන්සේ සභාවට ලබා දී ඇත්තේ, සභාව නිසි මාර්ගයේ ගෙන යෑම පිණිසය. සභාව යක්ෂයාට මුලා නොවන පිණිසය. එබැවින් අප සැමදෙන, මෙම දීමනා සෑම ප්‍රාදේශීය කිතුනු සභාවකම වර්ධනය කරන මෙන් දෙවි සමිඳුන්ගෙන් අයැද සිටිමු.

(A) **ප්‍රඥාවේ වචනය**

ප්‍රඥාවේ වචනය පහත සඳහන් අයුරින් විස්තර කිරීමට කැමැත්තෙමි.

ප්‍රඥාවේ වචනය යනු, **යම් කිසි අවස්ථාවකදී අවශ්‍ය - වන්නාවූ උපදෙස් හෝ ප්‍රඥාව ලබා දීම උදෙසා, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් එළිදරව් කරන්නාවූ වචනය නොහොත් මඟපෙන්වීමයි.**

මෙසේ එළිදරව් කරනු ලබන්නාවූ වචනය නොහොත් මඟපෙන්වීම, එළිදරව් කරනු ලබන්නේ දෙවියන්වහන්සේ විසින් හේතුකොටගෙන, පහත සඳහන් නිගමනවලට අපට පැමිණිය හැක.

- දෙවියන්වහන්සේ දේව දාසයෙකු මඟින් එම වචනය අපට ලබා දෙන්නේ, **එය දැනගැනීම අපට අවශ්‍ය වන බැවිනි.** එබැවින් දෙවියන්වහන්සේ දෙන්නාවූ එළිදරව් කිරීම පිළිබඳව යම්කිසි **අපැහැදිලිතාවයක් අප සිත්හි ඇත්නම්,** එය අපට **පැහැදිලි කර දෙන ලෙස අප දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතු වේ.**

- මෙම වචනය දෙවියන්වහන්සේම අපට දෙන්නාවූ එළිදරව් කිරීමෙක් බැවින්, **<u>එම එළිදරව් කිරීම</u>** **අනිවාර්යයෙන්ම <u>දේව වචනය සමඟ එකඟ විය යුතුවේ.</u>**

එබැවින් ප්‍රඥාවේ වචනය යනු, දේව වචනය යම්කිසි අවස්ථාවකට අදාල කිරීම උදෙසා, දෙවියන්වහන්සේ ලබා දෙන්නාවූ, ප්‍රඥාව ලෙසද බොහෝවිට තේරුම් ගත හැකිවේ.

**<u>නිදසුනක් වශයෙන්</u>**

යේසුස්වහන්සේ, උන්වහන්සේ වෙත යක්ෂයා ගෙනා පරීක්ෂා තුනටම මුහුනදීම උදෙසා භාවිතා කළේ දේව වචනයයි. උන්වහන්සේ මෙලෙස දේව වචනයෙන් උපුටා ගත්තාවූ වචන, (ප්‍රඥාවේ වචන) **ද්විතීය කථාව 8:3, 6:13 සහ 6:16** වන පදවල සඳහන් වන්නාවූ වචන වේ.

මෙම අවස්ථාවේදී, යේසුස්වහන්සේව පරීක්ෂාකිරීම උදෙසා, යක්ෂයාද දේව වචනය **(ගීතාවලිය 91:11,12)** භාවිතා කළ බව, ඔබට මතක් කිරීමට කැමැත්තෙමි.

දේව දරුව, දේව වචනය හොඳහැටි දැන සිටීමේ වැදගත්කම මෙම නිදසුනින් ඔබට පැහැදිලිව පෙනෙනු ඇත. එබැවින් ප්‍රඥාවේ වචනය ඔබගේ ජීවිතයට වැඩි දුරටත් අදාල කර ගැනීම පිණිස, දේව වචනය කියවීමට ඉගෙනීමට සහ කට පාඩම් කිරීමට, ඔබගේ ජීවිතයේ වැදගත් ස්ථානයක් දෙන්න.

**<u>ප්‍රඥාවේ වචනය පිළිබඳව නිදසුන්</u>**

(a) **යේසුස්වහන්සේගේ ජීවිතයේ**

(i) <u>කායිසර්ට ආදායම් දීම පිළිබඳව - **මතෙව් 22:17-22**</u>

යේසුස්වහන්සේව වරදකට අසුකර ගැනීමේ පරමාර්ථයෙන් ඵරිසිවරුන් යේසුස්වහන්සේ ඉදිරියේ තැබූ ප්‍රශ්නයට, යේසුස්වහන්සේ දැක්වූවාවූ ප්‍රතිචාරය, 'දිව්‍යමය ප්‍රඥාව' නොහොත් ප්‍රඥාවේ වචනය පෙන්නුම් කරන්නාවූ කදිම නිදසුනකි.

(ii) <u>අනාචාර ස්ත්‍රිය පිළිබඳව - **යොහාන් 8:3-11**</u>

මෙම අවස්ථාවේදී යේසුස්වහන්සේ ප්‍රකාශ කළ වචන, **'නුඹලා අතරෙන් පව් නැත්තා ඇට පළමුකොට ගලක් ගසාවා' (යොහන් 8:7)** යන වචන, ප්‍රඥාවේ වචන වේ.

(b) **පාවුල්තුමාගේ ජීවිතයේ**

(i) <u>පාවුල් අතීනසයේ දේශනා කිරීම</u> - **<u>ක්‍රියා 17:22-34</u>**

මෙම අවස්ථාවේදී දෙවියන්වහන්සේ ඔහුට ලබා දුන් ප්‍රඥාවේ වචනය අනුව, පාවුල් අතීනසයේ මනුෂ්‍යයන් විසින් ඉදිකර තිබුණාවූ **'නාඳුනන දෙවිකෙනෙකු, උදෙසා ඉදිරකරන ලද පූජාසනය' (ක්‍රියා 17:23)** ඇසුරින්, මැවුම්කාර දෙවියන්වහන්සේ වෙත අතීනසයේ මනුෂ්‍යයන්ගේ සිත් යොමු කළේය.

එහි ප්‍රතිඵලයක් වූයේ සමහර මනුෂ්‍යයින් ඇදහිල්ලට පැමිණීම විය. **(ක්‍රියා 17:34)**

(ii) <u>යුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියේ පාවුල්ගේ වචන -</u> **<u>ක්‍රියා 23:6-10</u>**

පාවුල්ගේ වචන හේතුවෙන් ඵරිසිවරුන් සහ සද්දුසිවරුන් අතර භේදයක් හටගෙන, සමහරෙක් පාවුල්ට පක්ෂව තර්ක කළෝය **(ක්‍රියා 23:9)**.

(c) **ස්තේපාන්ගේ ජීවිතයේ**

<u>ප්‍රඥාවේ වචනයේ බලය</u> **<u>(ක්‍රියා 6:10)</u>**

**ක්‍රියා 6:10 :- "ඔහු ප්‍රඥාවෙන්ද අතාමයාණන් කරණකොට-ගෙනද කළ කථාවේ බලයට විරුද්ධව සිටින්ට ඔවුන්ට නොහැකිවිය."**

ප්‍රඥාවේ වචනය පිළිබඳව යේසුස්වහන්සේ තම ගෝලයන්ට දුන්නාවූ පොරොන්දුවක් **ලූක් 12:11,12** හි සඳහන් වේ.

**ලූක් 12:11,12 :-**

**" 11 ඔවුන් සිනගෝගවලටද ප්‍රධානීන් සහ ආණ්ඩුකාරයන් ඉදිරියටද නුඹලා ගෙනයන කල, උත්තර දෙන්නේ, කෙසේද කියාවත් කියන්නේ කුමක්ද කියාවත් සිතා කනගාටු නොවෙල්ලා.**

**12 මක්නිසාද නුඹලා විසින් කිය යුතු දේ ඒ පැයේදීම ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලාට උගන්වනවා ඇතැයි කී සේක."**

දේව දරුව, මෙම පොරොන්දුව අද අපට අයිති වේ. එබැවින් ඔබ දෙවියන්වහන්සේගේ සේවයේ නියැලෙන අතර ඔබට පැමිණෙන්නාවූ විවිධ බාධා සහ විරුද්ධතා ඉදිරියේ නොසැලෙන්න. තැති නොගන්න.

දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් එම අවස්ථාවට මුහුනදීම උදෙසා දිව්‍යමය ප්‍රඥාව ඔබට ලබා දෙනු ඇත. උන්වහන්සේ ඔබව ආරක්ෂා කරමින් ගෙන යනු ඇත.

දේව සභාවට විරුද්ධ නොයෙක් ප්‍රහාර එල්ල කරනු ලබන්නාවූ මේ කාලය 'ප්‍රඥාවේ වචනයේ' දීමනාව සභාවට බොහෝසේ අවශ්‍ය වන්නාවූ කාලයකි.

දේව සභාව දේව කැමැත්ත අනුව ක්‍රියාකිරීම අතිශයින් වැදගත් වන්නාවූ කාලයකි. එබැවින් <u>සභා නායකයන් ඇතුලුව සෑම කිතුනුවකුටම දේව කැමැත්ත අනුව තීරණ ගැනීමට උපකාර කිරීම උදෙසා</u>, 'ප්‍රඥාවේ වචනය' යන දීමනාව අධික ලෙස කිතුනු සභාව මත වගුරුවන මෙන් සමිඳුන්ගෙන් නිරන්තරයෙන්ම යදිමු.

## (B) දැනගැනීමේ වචනය

දැනගැනීමේ වචනය පහත සඳහන් අයුරින් විස්තර කිරීමට කැමැත්තෙමි.

දැනගැනීමේ වචනය යනු, **යම්කිසි පුද්ගලයෙක්, අවස්ථාවක් හෝ අවශ්‍යතාවයක් පිළිබඳව, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් විශේෂ තොරතුරු එළිදරව් කිරීම මගින් ලැබෙන්නාවූ දැනුම.**

දේව දරුව, මෙම දීමනාව දෙවියන්වහන්සේ ඔබට ප්‍රධානය කර ඇත්නම්, එය භාවිතා කිරීමේදී, ප්‍රවේසම් වන්න. උන්වහන්සේ යම්කිසි කෙනෙක් ගැන විශේෂ තොරතුරු ඔබට එළිදරව් කරන අතර, උන්වහන්සේ ඔබට දෙන්නාවූ දැනුම, එම සහෝදරයාව අපහසුතාවයට පත් කරන අයුරින් ක්‍රියාකිරීමෙන් සම්පූර්ණයෙන්ම වළකින්න. දෙවියන් - වහන්සේ ඔබට ඔහු ගැන විශේෂ එළිදරව් කිරීමක් ලබාදෙන්නේ එම සහෝදරයාට උපකාරවීමට, ශක්තිමත් කිරීමට සහ ගොඩනැගීමට බව තේරුම්ගන්න.

සමහර අවස්ථාවලදී එම තැනැත්තාගේ සැඟවුණු පාප දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කරන සේක. උන්වහන්සේ එසේ කරන්නේ ඔහුට ඇත්තාවූ ප්‍රේමය නිසාය. උන්වහන්සේ ඔබට එය එළිදරව් කරන්නේ, එම පාපයෙන් ගෙතෙම නිදහස්කිරීම උදෙසා, ක්‍රියාකිරීම පිණිසය. දෙවියන්වහන්සේ මෙසේ ඔබට පවරන්නාවූ සේවය, විශ්වාසවන්තව ඉටුකරන්න. එම රහස් අන් අය සමග බෙදා නොගන්න. එම සහෝදරයා කෙරෙහි දෙවියන්වහන්සේට ඇත්තාවූ ප්‍රේමය ඔබගේ හදවතේද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන වගුරුවන මෙන් **(රෝම 5:5)** දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**දැනගැනීමේ වචනය පිළිබඳ නිදසුන්**

(a) **යේසුස්වහන්සේගේ ජීවිතයේ**

(i) නතානියෙල්ගේ කැඳවීම - **යොහන් 1:44-50**

නතානියෙල් සහ යේසුස්වහන්සේ අතර ඇතිවුණාවූ දෙබස කෙටි වුවත් ඉතා රසවත් එකකි. පිලිප් විසින් නතානියෙල්ට යේසුස්වහන්සේ ගැන ප්‍රකාශ කරනු ලැබූ වදන් නතානියෙල් නොපිළිගත් නමුත්, යේසුස් - වහන්සේගේ මුවින් පිටවුණාවූ 'දැනගැනීමේ වචනයේ' වදන් ඔහු තුළ ඇතිකළේ ක්ෂණික ඇදහිල්ලකි. යේසුස්වහන්සේට එළිදරව් කරන ලද දැනගැනීමේ වචනයට එබැවින් ඔහුගේ ප්‍රතිචාරය වූයේ, **'රබ්බි, ඔබ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය : ඔබ ඉශ්‍රායෙල් - වරුන්ගේ රජ්ජුරුවෝය' (යොහන් 14:49)** යන ඇදහිල්ලේ ප්‍රකාශනයයි.

(ii) සමාරියේ ස්ත්‍රිය සහ යේසුස්වහන්සේ අතර දෙබස - **යොහන් 4:16-19**

සිඛාර්හි පිහිටා තිබුනාවූ යාකොබ්ගේ ළිඳ අසලදී සමාරියේ ස්ත්‍රිය සහ යේසුස්වහන්සේ අතර ඇතිවූ දෙබස ඇසුරින් බොහෝ දේශනා අප අසා ඇත.

එම සමාරියේ ස්ත්‍රිය යේසුස්වහන්සේ අනාගතවක්තෘ කෙනෙකු බව ප්‍රකාශකරන්නේ **(යොහන් 4:19)** යේසුස්වහන්සේගේ මුවින් පිටවුනාවූ 'දැනගැනීමේ වචනයට' **(යොහන් 21:17,18)** ප්‍රතිචාර වශයෙනි.

ඉහත සඳහන් නිදසුන් දෙකෙන්ම අපට පෙනීයන්නාවූ කරුණක් වන්නේ, 'දැනගැනීමේ වචන' ප්‍රකාශ කරනු ලැබීම හේතුකොටගෙන මනුෂ්‍යයන් ඇදහිල්ලට පැමිණීමයි.

දේව දරුවෙනි, දැනගැනීමේ වචනය යන්නාවූ එළිදරව් කිරීමේ දීමනාව, සැක සහ අවිශ්වාසය ඇත්තාවූ මනුෂ්‍යයන්ගේ හදවත් තුළ ඇදහිල්ල ඇතිකිරීම උදෙසා ඉතා බලවත් ලෙස භාවිතා වන්නාවූ දීමනාවකි. එබැවින් යේසුස්වහන්සේගේ 'මහා නියෝගයට' **(මතෙව් 28:19)** කීකරුවීමට ආසාකරන්නාවූ ඔබ සැම, මෙම දීමනාව දෙවියන්වහන්සේගෙන් ඉල්ලා යාච්ඤාකරන්න. එම දීමනාව ඔබගේ සභාවේ බොහෝ දෙනෙකුට දෙන ලෙස සමිඳුන්ට යදින්න.

(b) **එලිෂා අනාගතවක්තෘගේ ජීවිතයේ**

<u>එලිෂා, නාමන් සහ ගෙහාසි - **2 රාජා 5:1-27**</u>

කුෂ්ඨ රෝගියෙක්ව සිටියාවූ නාමන් සුවකරනු ලැබීමේ සිද්ධිය සැම සබත් පාසැල් දරුවෙක්ම අසා ඇති අතර, නාමන්ගේ කුෂ්ඨය ගෙහාසිටද ඔහුගේ වංශයටද වැළඳුණු බව අපට බොහෝවිට අමතක වේ.

ගෙහාසි රහසිගතව, නාමන් පසුපස හඹා ගොස්, බොරු කියා නාමන්ගෙන් තෑගි ලබාගත්තේය **(2 රාජා 5:26).** අපට පෙන්වාදෙන්නේ, දැනගැනීමේ වචනයේ දීමනාව තුළින්, එලිෂාට මෙය එළිදරව් කරන ලද බවයි. ගෙහාසිගේ වංචනික ක්‍රියාවේ ප්‍රතිඵලය වූයේ, නාමන්ගේ කුෂ්ඨය ඔහුට සහ ඔහුගේ වංශයට වැළඳීමයි.

දේව දරුව, අපගේ දෙවියන්වහන්සේ සියලු දේ දන්නා සේක. අප රහසින් කරන්නාවූ සැම දේ උන්වහන්සේ දන්නා සේක. මෙම සත්‍යය ඉහත සඳහන් නිදසුන් තුනෙන්ම තහවුරු වන අතර, ගෙහාසිගේ සිද්ධිය මතක් කර දෙන්නේ, දෙවියන්වහන්සේට වංචාකිරීමට උත්සාහකිරීමේ භයානක කමය. **මතෙව් 23:1-36** දක්වා කියවන අපට ලියන්නන්ගේ සහ ඵරිසිවරුන්ගේ 'වංචාකාරකමට' යේසුස්වහන්සේ දැක්වූ ප්‍රතිචාරය පැහැදිලිව පෙනේ.

දේව දරුව, මෙහි සඳහන් 'වංචාකාරකමේ' චෝදනාවේ වරදට වැඩියෙන් අසුවන්නේ සභාවට අයිතිවූවන්ද නැතහොත් අයිති නූවන්ද කියා මෙනෙහි කර බලන්න.

**කිතුනු අප සැම, දෙවියන්වහන්සේට වංචාකිරීමේ භයානක පාපයෙන් මිදී ජීවත්වීමට අධිෂ්ඨානය කරමු.**

(c) **පේත්‍රුස්ගේ ජීවිතයේ**

(i) <u>අනනියස් සහ සප්පිරා - **ක්‍රියා 5:3-10**</u>

අනනියස් සහ සප්පිරා ශුද්ධාත්මයාණන්වහන්සේ රවටන්ටද, දෙවියන්වහන්සේට බොරුකියන්ටද පෙළඹුනු අවස්ථාවේදී, දෙවියන්වහන්සේ දැනගැනීමේ වචනය තුළින් පේත්‍රුස්ට සැබෑව එළිදරව් කළසේක. 'වංචාකාර ලෙස' ක්‍රියා කිරීමට තැත් කළ ඔවුන් දෙදෙනාට හිමි වූ ඉරණම වූයේ, එම ස්ථානයේ මැරී වැටීමයි.

(ii) <u>පේත්‍රුස් සහ කොර්නේලියස්ගේ පණිවිඩකරුවන් තිදෙනා - **ක්‍රියා 10:1-19**</u>

**ක්‍රියා 10:19,20 :-**
**"[19]පේත්‍රුස් වනාහි දර්ශනය ගැන කල්පනාකරමින් සිටියදී, ආත්මයාණන්වහන්සේ කථාකොට: බලව, මනුෂ්‍යයෝ තුන්දෙනෙක් නුඹ සොයති. [20] එබැවින් නැගිට, බැස කිසිසේත් සැක නොකොට, ඔවුන් සමග පලයන්න. මක්නිසාද මම ඔවුන් එව්වේමියි කී සේක."**

මෙම අවස්ථාවේදී ශුද්ධාත්මයාණන්වහන්සේ දැනගැනීමේ වචනය තුළින් ලබාදුන්නාවූ මඟපෙන්වීමේ වැදගත්කම, ඔබ සැමට පැහැදිලි ඇතැයි සිතමි.

ඉහත සඳහන් සෑම නිදසුනක්ම අපට පෙන්වාදෙන්නේ, දැනගැනීමේ වචනය යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවේ වැදගත්කමයි.

දේව දරුව, දේව දාසයෙක් මගින් මෙවැනි වචනයක් ඔබට ලැබුනොත්, යටහත්වද ස්තුතිවන්ත හදවතින්ද, දෙවියන්වහන්සේ ලබාදෙන්නාවූ මඟපෙන්වීම අනුව ක්‍රියාකරන්න.

(C) **ආත්මවල් විමසීම**

ආත්මවල් විමසීමේ දීමනාව, පහත සඳහන් අයුරින් විස්තර කිරීමට කැමැත්තෙමි.

ආත්මවල් විමසීම යනු, **ඕනෑම අවස්ථාවක, ආත්මික ක්‍රියා යන නමින් කරනු ලබන්නාවූ දේ පිටුපස ක්‍රියාකරන්නාවූ සැබෑ ආත්මය හඳුනාගැනීමය.**

මාගේ අදහස වන්නේ, මෙම දීමනාව සෑම ප්‍රාදේශීය කිතුනු සභාවක් තුළම අනිවාර්යයෙන්ම තිබිය යුතු දීමනාවක් බවයි. නොඑසේ නම් එම සභාව මුලාකිරීමට, නොමඟ යැවීමට හෝ ව්‍යාකූල තත්ත්වයකට පත්කිරීමට යක්ෂයාට ඇත්තාවූ අවකාශ අධික වේ.

ඕනෑම මනුෂ්‍යයෙකුගේ ජීවිතයේ බලපෑමක් ඇතිකිරීම උදෙසා ක්‍රියාකරන්නාවූද, ආත්ම ලෝකයට අයිති වන්නාවූද කණ්ඩායම් දෙකක් සිටිති. ඒවා නම් දෙවියන්වහන්සේට පක්ෂව ක්‍රියාකරන්නාවූ ආත්ම සහ යක්ෂයාට පක්ෂව ක්‍රියා කරන්නාවූ ආත්ම යන කණ්ඩායම් දෙකය. මේ අතර සෑම මනුෂ්‍යයෙකුට ඇත්තාවූ ඔහුගේම ආත්මය නොයෙක් අදහස් සහ සිතුවිලි ඔහු තුළ ඇතිකරයි. එබැවින් ඕනෑම මනුෂ්‍යයෙක්, යම්කිසි දෙයක් ගැන ඔහුගේ අදහස් ඉදිරිපත් කරන අතර, බොහෝවිට ඔහුම නොදැන, එම අදහස් වෙනත් උල්පතක් මගින් ඔහුගේ සිතට ඇතුල්කරනු ලැබුවාවූ අදහස් විය හැක.

මෙම හේතුව නිසා, දේව සභාවට අයිතිවන්නාවූ, කිතුනු නම දරන්නාවූ අපට, අපගේ සභා තුළ ප්‍රකාශවන්නාවූ අදහස් සහ අප සභාවල ගනු ලබන්නාවූ තීරණ පිළිබඳව,

**මේ දෙවියන්වහන්සේගේ මඟපෙන්වීමද ?**
**මේ යක්ෂයා ගෙනෙන්නාවූ මුලා කිරීමක්ද ?**
**මේ අපගේම අදහස් පමණක්ද ?**

යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු දීමට හැකි විය යුතුය.

**මෙය උදෙසා දෙවියන්වහන්සේ සභාවට ප්‍රදානය කර ඇත්තාවූ <u>ආත්මවල් විමසීමේ දීමනාව, සෑම ප්‍රාදේශීය කිතුනු සභාවකම තිබිය යුතුම දීමනාවක්</u> බව මම අවධාරනයෙන් පවසමි.**

**1 යොහන් 4:1 :- "ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැමිණ සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට, ඒ ආත්ම දෙවියන්වහන්සේගෙන් දැයි පරීක්ෂාකරපල්ලා."**

**ආත්මවල් විමසීම පිළිබඳව නිදසුන්**

(a) **යේසුස්වහන්සේගේ ජීවිතයේ**

පේත්‍රුස්ගේ ජීවිතයේ ක්‍රියාකල ආත්ම - **මතෙව් 16:15-23**

**මතෙව් 16:15-23** දක්වා කියවන අපට, යේසුස්වහන්සේ පේත්‍රුස්ට ප්‍රකාශ කළාවූ, පරස්පර විරෝධි ලෙස පෙනෙන්නාවූ වදන් දෙකක් **17 වන සහ 23 වන** පදවල අප දකිමු.

**මතෙව් 16:17 :-"....ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් - වහන්සේ මිස මාංසය හා රුධිරය මේක නුඹට එළිදරව් නොකළේය."**

**මතෙව් 16:23 :- ".....සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය....."**

යේසුස්වහන්සේ මෙවදන් දෙකම ප්‍රකාශ කළේ ආත්මවල් විමසීමේ දීමනාව තුළින්ය.

දේව දරුව, මෙම සිද්ධිය අපට පෙන්වාදෙන්නාවූ ඉතා වැදගත් ආත්මික සත්‍යයන් දෙකක් දෙස බලමු.

(1) **අපට සමීප, අපට හිතවත් අය පවා, අපව නොමග යැවීම උදෙසා සාතන්ට පාවිච්චි කළ හැක.**

(2) **එකම මනුෂ්‍යයෙකුට, අවස්ථා දෙකක ඔහුම නොදැන ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහ යක්ෂයාගේ වචන ප්‍රකාශ කළ හැක.**

දේව දරුවෙනි, අපව මුලා කිරීම උදෙසා යක්ෂයා බොහෝවිට පාවිච්චි කරන්නේ මනුෂ්‍යයන් බව තේරුම් - ගන්න. එබැවින් ඔබට කතාකරන්නාවූ **මනුෂ්‍යයන්ගේ තරාතිරම් අනුව තීරණ නොගන්න. ඔවුන් තුළ ක්‍රියා කරන්නාවූ ආත්මය විමසා තීරණ ගන්න.**

(b) **පේත්‍රුස්ගේ ජීවිතයේ**

<u>මායාකාර සීමොන් - **ක්‍රියා 8:14-24**</u>

මායාකාර සීමොන් ක්‍රියා කළේ ඔහුගේ සිත අනුව බව, ආත්මවල් විමසීම තුළින් පේත්‍රුස් හඳුනාගත්තේය (**ක්‍රියා 8:21,22**).

(c) **පාවුල්තුමාගේ ජීවිතයේ**

<u>පේන කියන තරුණිය - **ක්‍රියා 16:16-18**</u>

මෙම තරුණිය තුළ සිටියාවූ නපුරු ආත්මය හඳුනාගෙන පාවුල්තුමා එම ආත්මය දුරු කළේය (**ක්‍රියා 16:18**).

ආත්ම විමසීමේ දීමනාව සභාවට වැඩි දුරටත් වැදගත් වන්නේ, මුලාකිරීම යක්ෂයාගේ මූලික උපායක් වීම හේතුවෙනි. මෙසේ සභාව මුලා කිරීම උදෙසා, සාතන් ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගන්නා බව දේව වචනය අපට පෙන්වාදෙයි.

**2 කොරි 11:13,14 :- " [13] එබඳු මනුෂ්‍යයෝ බොරු ප්‍රේරිතයෝය, ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ වෙස් ගන්නාවූ වංචාකාර සේවකයෝය. [14] ඒක පුදුමයක් නොවේ : මක්නිසාද සාතන් පවා ආලෝකයේ දූතයෙකුගේ වෙස් ගනියි."**

දේව දරුවෙනි, සභාව යනු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයයි. **සභාව නමැති ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ක්‍රියා කළ යුත්තේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුවයි. මෙසේ ක්‍රියා කිරීම උදෙසා <u>සභාවට වඩාත්ම වැදගත් වන්නේ එළිදරව් කිරීමේ දීමනාය</u>.**

එබැවින් අප සැම, මෙහි සඳහන් එළිදරව් කිරීමේ දීමනා සභාව මත වගුරුවන මෙන්, මුලු හදවතින් දෙවි සමිඳුන්ට යදිමු.

**දෙවි පියාණන්වහන්සේම, සෑම ප්‍රාදේශීය කිතුනු සභාවකම, මෙම දීමනා ඇත්තාවූ, විශ්වාසවන්තවූ දේව දරුවන් නැගුටුවනසේක්වා !!!**

සටහන්

..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................
..................................................................................

# සටහන්

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

......................................................................................................

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 03



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 05

# වාචික දීමනා

**<u>හැඳින්වීම</u> :-**

මෙම අධ්‍යයනයෙන් අප පිවිසෙන්නේ, වාචික දීමනා ලෙස හඳුන්වනු ලබන්නාවූ ධර්මවාක්‍යය කීම, නානා වර්ග භාෂා සහ භාෂා තේරුම් කර දීම යන දීමනා අධ්‍යයනය කිරීමටයි.

වාචික දීමනා වන්නාවූ ධර්මවාක්‍යය කීම සහ නානා වර්ග භාෂා වලින් කථාකිරීම නොනිසි අයුරින් කොරින්ති සභාවේ භාවිතා කරනු ලැබූ බව **1 කොරි 14** කියවන අපට නිගමනය කළ හැකිවේ. මෙම හේතුව නිසාම මෙම මුළු පරිච්ඡේදය තුළෙහිම පාවුල්තුමා, මෙම දීමනා භාවිතා කිරීම පිළිබඳව කොරින්ති සභාවල දෙන්නාවූ උපදෙස් අප දකිමු.

මෙම අධ්‍යයනය කියවන්නාවූ ඔබ සැම, මෙම දීමනා පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා, දේව රාජ්‍යයේ යහපත් භේවායන් බවට පත්වීම අපගේ යාච්ඤාවයි.

**<u>අධ්‍යයනය</u> :-**

1. **<u>ධර්මවාක්‍යය කීම</u>**

ධර්මවාක්‍යය කීමේ දීමනාව, පහත සඳහන් අයුරෙන් විස්තර කිරීමට කැමැත්තෙමි.

ධර්මවාක්‍යය කීම යනු,

**දෙවියන්වහන්සේගේ සෙනඟ වෙත උන්වහන්සේ දෙන්නාවු පණිවිඩ ලැබීමට සහ ප්‍රකාශකිරීමට ශුද්ධාත්මයාණන් - වහන්සේ මඟින් දෙවියන්වහන්සේ දෙන්නාවු විශේෂ හැකියාවයි.**

එබැවින් ධර්මවාක්‍යය යනු, **සභාවේ පවතින්නාවූ සැබෑ තත්ත්වයද** එම තත්ත්වය නිසා **පැමිණෙන්ට යන්නාවු අනාගත සිදුවීම් පිළිබඳවද** දෙවියන්වහන්සේ විසින් එළිදරව් කරන්නාවූ දේ ප්‍රකාශකිරීමේ දීමනාව ලෙසද විස්තර කළ හැකිවේ.

මෙනමුත් බොහෝවිට සභාව ධර්ම වාක්‍යය කීම යන දීමනාවෙන් බලාපොරොත්තු වන්නේ '<u>අනාගත වාක්‍යයක්</u>' ලැබීම වේ. මෙයට මූලික හේතුවක් වන්නේ, ඉතා දිගු කලක් තුළම දෙවියන්වහන්සේගේ හඬ අසා, ප්‍රකාශ කරන්නෙක් 'අනාගත වක්තෘවරයෙක්' ලෙස සිංහල බයිබලයේ සඳහන් වීම විය හැක. එබැවින් අප පුරුදුව සිටින්නේ 'අනාගතවක්තෘවරයෙක්' යනු අනාගත වාක්‍ය ප්‍රකාශ කරන්නෙක් ලෙස සිතීමටයි.

ධර්මවාක්‍යය ප්‍රකාශ කරන්නෙක් ' <u>දිවැසිවරයෙක්</u> ' ලෙස විස්තර කිරීම වඩා යෝග්‍ය වේ. දිවැසිවරයෙක් යනුවෙන් අදහස් වන්නේ ' දිව්‍ය ඇස් ' වලින් දකින්නෙක් වන බැවින්, හෙතෙම අතීතය, වර්තමානය සහ අනාගතය ප්‍රකාශ කරන්නෙක් ලෙස අපට පහසුවෙන් වටහා ගත හැකිවේ. මේ තේරුම්ගැනීම ඇතිව **දිවැසිවර යෙසායාගේ පොත දෙස බලමු.**

**යෙසායා 1:2-3 :- " [2]..... ස්වාමීන්වහන්සේ කථාකරනසේක : මම දරුවන් පෝෂණය කොට ඇතිදැඩි කෙළෙමි, [3] එහෙත් ඔව්හු මට විරුද්ධව කැරළි ගැසුවෝය. ගොනා උගේ අයිතිකාරයාද කොටළුවා උගේ ස්වාමියාගේ පට්ටියද දනියි. එහෙත් ඉශ්‍රායෙල් දන්නේ නැත, මාගේ සෙනඟ කල්පනාකරන්නේ නැතැයි කියනසේක."**

මෙම වචන අනාගත වාක්‍යය නොවේ. ඒවා ඉශ්‍රායෙල් ජාතියේ එදා තිබුණාවූ අතීතය සහ වර්තමාන තත්ත්වයයි. නමුත්, මෙම වචන **ධර්ම වාක්‍යය ලෙස** අප දකිනවිට, ධර්මවාක්‍යය කීමේ දීමනාව, අපට ඉතා පහසුවෙන් හඳුනා ගත හැකිවේ.

මාගේ ප්‍රේමණීය දේව දරුව, මෙය තේරුම්ගන්න. අපගේ සභාවන්වල දේශනා කරන්නාවූ දේව දරුවන්, ප්‍රකාශ කරන්නාවූ සමහර දේ, දෙවියන්වහන්සේ ඔවුන්ට එළිදරව් කර ඇත්තාවූ, **සභාවේ සැබෑ තත්ත්වය නොහොත් ධර්මවාක්‍යය විය හැක.**

මෙනමුත් බොහෝවිට අප එම ධර්මවාක්‍යය හඳුනා නොගෙන, ඒවාට සවන් නොදී ක්‍රියා කරන්නාවූ අවස්ථා තිබෙන බව මාගේ විශ්වාසයයි. **එබැවින් අප සැමවිටම, දේව පණිවිඩවලට නොහොත් දේශනාවලට සවන් දෙන අතර, ශුද්ධාත්මයාණන් - වහන්සේට සංවේදීව සවන් දීමට සිතට ගනිමු.**

A. **ධර්ම වාක්‍යය කීම පිළිබඳ නිදසුන්**

(a) **යේසුස්වහන්සේගේ ජීවිතයේ**

(i) මුල් ගෝලයන් කැඳවන අවස්ථාවේදී - **මතෙව් 4:18,19**

මේ අවස්ථාවේදී යේසුස්වහන්සේ ප්‍රකාශ කළ වචන - **" මා පස්සේ වරෙල්ලා, මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් කරන්නෙමි." (මතෙව් 4:19)** ධර්ම වාක්‍යය කීම වේ. උන්වහන්සේ එදා ඒ ගෝලයන්ට ප්‍රකාශ කළේ, අනාගතයේ ඔවුන් මනුෂ්‍යයන් අල්ලන්නන් නොහොත් ශුභාරංචිය ප්‍රකාශ කරමින්, බොහෝ දෙනා දේව රාජ්‍යය වෙත ගෙන එන්නන් වෙන්න යන බවයි.

දේව දරුවෙනි, නිදසුනක් ලෙස මෙම සිදුවීම මා තෝරා ගත්තේ, යේසුස්වහන්සේගේ මේ වදන්, අද දවසේ අපට අදාළ වන බැවිනි. එදා යේසුස්වහන්සේ ගෝලයන් තෝරාගත් සේම, **අද දවසේ දෙවියන්වහන්සේ අපව, තෝරා කැඳවා ඇත්තේ ද 'මනුෂ්‍යයන් ඇල්ලීම' උදෙසාය.** අප සැමද, මනුෂ්‍යයන් දේව රාජ්‍යය වෙත ගෙන ඒම උදෙසා අපගේ ජීවිත යොදවමු.

(ii) උන්වහන්සේගේ නැවත නැගිටීම ගැන, යෝනාගේ ලකුණ ප්‍රකාශ කරන අවස්ථාව - **මතෙව් 12:38-40**

මේ අවස්ථාවේදී යේසුස්වහන්සේ ප්‍රකාශ කළා වූ වචන - **"මක්නිසාද යෝනා මහා මත්ස්‍යයාගේ බඩේ දහවල් තුනක්ද රෑ තුනක්ද සිටියාක් මෙන්, මනුෂ්‍ය පුත්‍රයාද පොළෝ ගැබේ දහවල් තුනක්ද රෑ තුනක්ද සිටින්නේය."(මතෙව් 12:40)** ධර්ම වාක්‍යය කීම වේ.

(iii) උන්වහන්සේගේ දෙවැනි ඊම ගැන - **මතෙව් 24:32-44**

**මතෙව් 24:4-44** දක්වා පවසන්නාවූ සියලුම වචන පාහේ ධර්ම වාක්‍යය ලෙස පිළිගත හැකිවේ. උන්වහන්සේගේ දෙවැනි ඊම කුමන දිනක සිදුවේද යන්න කිසි මනුෂ්‍යයෙක් නොදන්නා බැවින්, **'නුඹලාත් සෑදී සිටපල්ලා' (මතෙව් 24:44) නොහොත් 'නුඹලා සූදානම්ව සිටපල්ලා'** කියා උන්වහන්සේ අපට දී ඇත්තාවූ අනුශාසනාව අනුව අප ක්‍රියා කරනවාද ? යන්න අද අප අපගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයකි.

දේව දරුව, යේසුස්වහන්සේගේ දෙවැනි ඊම අද සිදුවුවහොත්, ඔබට කුමක් සිදුවෙයිද ?? කියා අවංකව මෙනෙහි කර බලා, සැමවිටම එයට සූදානම්ව ජීවත් වෙන්න.

(b) **අගබස් නමැති ප්‍රොපේතවරයාගේ ජීවිතයේ**

(i) <u>මහත් සාගතයක් පිළිබඳව ධර්මවාක්‍යය - **ක්‍රියා 11:27-30**</u>

මෙය සම්බන්ධයෙන් **ක්‍රියා 11:27-30** දක්වා කියවා බලන්න. මෙහි **29 වන** පදයේ සඳහන් වන්නේ, සියලුම ගෝලයින් තම තමාගේ පුළුවන්කමේ හැටියට අවශ්‍ය උදව් උපකාර කිරීමට කැපවුණු බවයි.

මෙය අපට ඉතා වැදගත් පාඩමක් උගන්වයි. එනම් දෙවියන්වහන්සේ ධර්ම වාක්‍යයක් මඟින් අපට අනාගත සිදුවීමක් එළිදරව් කරන්නේ එය උදෙසා නිසි සූදානම්වීමක් අපට අවශ්‍ය හෙයිනි. එබැවින් උන්වහන්සේගේ මහත් දයානුකම්පාව නිසා, උන්වහන්සේ අපට අවශ්‍ය කරන්නාවූ 'එළිදරව් කිරීම' අනිවාර්‍යයෙන් කරන බව දේව වචනය අපට පෙන්වාදෙයි.

**ආමොස් 3:7:- "සැබැවින් ස්වාමිවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන්වූ අනාගත - වක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරනසේක."**

දේව දරුවෙනි, බොහෝ කලක් සිට, දෙවියන්වහන්සේ මගේ හදවතේ තැන්පත් කර ඇත්තාවූ, සත්‍යයක් ඔබ ඉදිරියේ තැබීමට කැමැත්තෙමි.

වර්තමාන සභාව විවිධාකාර හිංසා සහ පීඩා වලට ලක්වෙමින් සිටින්නාවූ මේ අවස්ථාවේදී, සභාව විසින් ගත යුතු පියවර කුමක්ද කියා ඔබ සිතා තිබෙනවාද ? මෙම ප්‍රශ්නය සෑම දේව දරුවෙකුගෙන්ම අප අසන්ට යෙදුනහොත්, අති බහුතරයකගේ පිළිතුර වන්නේ, 'සභාව ආරක්ෂා කරන ලෙස සමිඳුන්ට යැදීම' වැනි පිළිතුරක් වන බව නිසැකය.

**මෙනමුත් දෙව් සමිඳුන් දේව වචනය තුළින් අපට ලබා දී ඇත්තේ, මීට හාත්පසින්ම වෙනස් වූ විසඳුමකි.**

දේව වචනය, සන්සුන්කමින්ද සමාදානයෙන්ද නිශ්චල ජීවිත ගත කිරීම උදෙසා අපට ලබාදී ඇති අවවාදය සහ අනුශාසනාව මෙසේය.

**1 තිමෝති 2:1,2 :-**

**" [1] ඉතින් <u>අප විසින් සියලු ආකාර</u> <u>භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදානවූ නිශ්චල ජීවිතයක් ගත කරන පිණිස, රජවරුන් සහ උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව</u>,**

**[2] <u>සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද, යාච්ඤාද මැදිහත්කම්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලන්ට පළමුවෙන් අවවාද කරමි</u>."**

දේව දරුවෙනි, කිසිම සුදුසුකමක් නැත්තාවූ මා ඔබ සැමගෙන් අයැද සිටින්නේ - **මෙය දෙවියන්වහන්සේ ඔබට දෙන්නාවූ ධර්මවාක්‍යයක් ලෙස භාරගෙන, 1 තිමෝති 2:1,2** අනුව ක්‍රියාකරන්ට පුද්ගලිකව තීරණය කර, එසේ කිරීමට ඔබගේ සභාවටද උගන්වන ලෙසය.

- අප රටේ නායකයන් උදෙසා යාච්ඤා කරමු.
- අපට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරමු.
- විනාශ වෙන්නාවූ සියලු මනුෂ්‍යයන් උදෙසා යාච්ඤා කරමු.

කිතුනු සභාව මෙලෙස කිරීම ආරම්භ කර, විශ්වාසවන්තව එහි යෙදුනහොත්, නිසැකවම දෙවියන්වහන්සේ **1 තිමෝති 2:1** හි සඳහන් වන්නාවූ **'සන්සුන්කමින් සමාදාන වූ නිශ්චල'** ජීවිතයක් අපට ලබා දීම නිසැකය.

**දේව දරුවෙනි නැගිටිමු !!**

**දේව වචනයට කීකරු වෙමු !!**

**දේව ආශිර්වාද භුක්ති විඳිමු !!**

B. ධර්මවාක්‍යය කීම තුළින් ඇතිවන යහපත් ප්‍රතිඵල

(i) **1 කොරි 14:3 :- "නුමුත් ධර්මවාක්‍යය පවසන්නා වර්ධන වීමද දැනමුතුකමද සැනසීමද පිණිස මනුෂ්‍යයන්ට කතා කරන්නේය."**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, ධර්ම වාක්‍යය කීම තුළින් සභාව වර්ධනය වීමද, සැනසීමද, සභාවලට අවශ්‍යවන්නාවූ දැනමුතුකම් හෝ මඟපෙන්වීමද ලැබෙන බවයි.

(ii) **1 කොරි 14:31 :- "මක්නිසාද සියල්ලන් ඉගෙන ගන්නා පිණිසත්, සියල්ලන් ධෛර්‍යය වෙන පිණිසත්, සියල්ලන්ට එක්කෙනෙකු බැගින් ධර්මවාක්‍යය කියන්ට පුළුවන."**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, ධර්ම වාක්‍යය කීම තුළින් සභාවේ සියල්ලන්ට ඉගෙනගැනීම සහ දිරිමත් කිරීම ලැබෙන බවය.

(iii) **ක්‍රියා 11:27-30** යන කොටස අපට පෙන්වාදෙන්නේ, අගබස් තුළින් සභාව ලැබුවාවූ ධර්මවාක්‍ය ඇතිකළාවූ යහපත් ප්‍රතිඵලයි.

එනම් අන්තියෝකියේ සභාව යුදයෙහි විසූ තම කිතුනු සහෝදරයන්ට ආධාරෝපකාර යවන්ට තීරණය කර, බාර්ණබස් සහ සාවුල් අතින් ඒවා යුදයෙහි වැඩිමහල්ලන් වෙත යැවීමයි.

ඉහත සඳහන් යහපත් ප්‍රතිඵල ධර්මවාක්‍යය තුළින් සිදුවීම දේව වචනය මගින් අප ඉගෙන ගන්න අතර, අපගේ ස්වාමීන්වහන්සේ වදාළ, උන්වහන්සේගේ නැවත ඊම ගැන ධර්මවාක්‍ය අපගේ කිතුනු ජීවිතවලට තදින් බලපෑ යුතුවේ. උන්වහන්සේගේ ඊම උදෙසා අප සැමවිටම සූදානම්ව සිටිය යුතු අතර, එම ඊම ලංවත්ම විනාශවන්නාවූ මනුෂ්‍යයන් ගැළවීම වෙත ගෙන ඊමට ඇත්තාවූ කාලය අඩුවෙමින් පවතියි.

එබැවින් **1 තිමෝති 2:1,2** කියැවූ ඔබට මා ඇරයුම් කරන්නේ ඊළඟ පද එනම් **1 තිමෝති 2:3,4** කියවන්ට කියාය.

**1 තිමෝති 2:3:4 :- " [3] මෙය සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දැනගැනීමට [4] පැමිණෙනවාට කැමතිවූ, අපගේ ගැළවුම්කාරයාණන් වන <u>දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව ප්‍රසන්නව තිබේ</u>."**

**1 තිමෝති 2:4 වන පදයෙහි, 'දෙවියන්වහන්සේ ඉදිරියෙහි යහපත්ව ප්‍රසන්නව තිබේ '** කියා සඳහන් කරන්නේ, කිතුනු අප **'සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤා ද මැදහත්කම්ද ස්තුතිදීම්ද පැවැත්වීම ' (1 තිමෝති 2:4)** පිළිබඳවයි.

දේව දරුවෙනි, <u>**1 තිමෝති 2:1-4** යන කොටසේ දෙවියන්වහන්සේ අපට ප්‍රකාශ කරන්නාවූ සත්‍යයන් අනුව ජීවත්වීමට කැපවෙමු</u>.

C. **ධර්මවාක්‍යය සෝදිසි කර බැලීම**

ධර්මවාක්‍යය කීමේ දීමනාව දෙවිසමිඳුන් සභාවට දී ඇත්තේ, සභාවේ වර්ධනය උදෙසා වන බව අප සැවොම හොඳහැටි දනිමු **(1 කොරි 14:4).**

මෙනමුත් විවිධ හේතූන් නිසා සමහර අවස්ථාවන්හිදී ධර්මවාක්‍ය කීම ලෙස සභාවේ කෙරෙන්නාවූ ප්‍රකාශනයන් නිවැරදි නොවීමට හැකියාව ඇත. එබැවින් දේව වචනය අපට අනුශාසනා කරන්නේ සභාවේ ප්‍රකාශ කරනු ලබන්නාවූ ධර්මවාක්‍යය නිවැරදිද කියා විමසා බලන ලෙසය.

**1 කොරි 14:29 :- "ධර්මවාක්‍යය කියන්නෝ දෙදෙනෙක් නොහොත් තුන් දෙනෙක් කථා කරත්වා, <u>අනිත් අය විමසා බලත්වා</u>."**

ඉහත සඳහන් අයුරින් ධර්ම වාක්‍යය විමසා බැලීම උදෙසා, අප විසින් ඇසිය හැකි ප්‍රශ්න කිහිපයක් ඔබ ඉදිරියේ තබමි.

1. පවසනු ලැබුවාවූ ධර්ම වාක්‍යය දේව වචනය සමග එකඟ වනවාද ? එකඟ නොවනවාද ?
2. එම ධර්මවාක්‍යය සභාව තුළ ඇතිකරන්නේ පසුතැවිල්ල සහ සමාදානයද ? නැතහොත් වියවුල්කමද ?

**1 කොරි 14:33 :- "මක්නිසාද දෙවියන්වහන්සේ වියවුල් කමේ නොව සමාදානයේ දෙවියන්වහන්සේය ; ශුද්ධ - වන්තයන්ගේ සියලු සභාවන්හි එසේමය."**

3. එම ධර්මවාක්‍යය ඉෂ්ඨ වුනාද ? **ද්විතීය 18:22**
4. එම ධර්මවාක්‍යය නික්මවූයේ කුමන ආත්මයකින්ද ? (ශුද්ධ ආත්මයාණන්වහන්සේගෙන්ද / යක්ෂ ආත්මයකින්ද? මනුෂ්‍ය ආත්මයෙන්ද ?)

   කරුණාකර ආත්ම විමසීමේ දීමනාව (**1 කොරි 12:10**) ඔබ සභාව තුළ ඇතිකරන මෙන් සමිඳුන්ට යදින්න.
5. එම ධර්මවාක්‍යය ගෞරවය ගෙනදෙන්නේද නැතහොත් අවධානය යොමුකරන්නේ කවුරුන් වෙතද ? දෙවියන්වහන්සේ වෙතද නැතහොත් මනුෂ්‍යයෙක් වෙතද ?

## 2. <u>නානා වර්ග භාෂා කථාකිරීම</u>

නානා වර්ග භාෂා කථාකිරීමේ දීමනාව යනු, **දෙවියන් - වහන්සේ වෙත හෝ මනුෂ්‍යයන් වෙත, තමා නොදන්නාවූ භාෂාවලින් කථාකිරීම උදෙසා, දෙවියන්වහන්සේ මගින් දෙන්නාවූ හැකියාවයි.**

බොහෝ සභාවන්හි විවිධාකාර 'අන්‍ය භාෂා' අපට ඇසෙන අතර, ඒවාහි විවිධත්වය තේරුම්ගැනීමට ඔබට උපකාර වීම උදෙසා, අප අසන්නාවූ 'අන්‍ය භාෂා' පහත සඳහන් අයුරින් වර්ග කිරීමට කැමැත්තෙමි.

(A) **අන්‍ය භාෂා වර්ග**

1. දේව දූතයන්ගේ නොහොත් ස්වර්ගයේ භාෂා -
   **1 කොරි 13:1 :- "මම මනුෂ්‍යයන්ගේද <u>දේව දූතයන්ගේද භාෂාවලින්</u> කථාකරන්නෙම් නුමුත්...."**
2. කතාකරන්නාවූ තැනැත්තා නොදන්නාවූ වර්තමාන මනුෂ්‍යය භාෂා -
   **ක්‍රියා 2:4:- "ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන් ගත්තෝය."**

පෙන්තකොස්ත දවසේ, ඇදහිලිවන්තයින් 120 දෙනා විසින් කතාකරන්ට යෙදුණු අන්‍ය භාෂා, සවන් දෙන්නන්ට තේරුණි. **(ක්‍රියා 2:7-11)**

3. වර්තමාන මනුෂ්‍යයා නොදන්නාවූ, අති පූරාණ මනුෂ්‍ය භාෂා.

(B) **අන්‍ය භාෂා කථාකිරීමේ දීමනාව භාවිතාකිරීම**

(a) **අපගේ පුද්ගලික නමස්කාරයේදී නොහොත් අපගේ 'නිහඬ කාලයේදී' (දෛනිකව පවත්වන්නාවූ)**

(i) මෙහිදී අප අන්‍ය භාෂාවලින් කථාකරන්නේ දෙවියන්වහන්සේටයි. **(1 කොරි 14:2)**

(ii) අප මෙහිදී උන්වහන්සේ සමග අපගේ ආත්මයෙන් රහස් කථා කරන්නෙමු. එසේ අප කථාකරන්නාවූ දේ අන් කිසිවෙකුට තේරෙන්නේ නැත. **(1 කොරි 14:2)**

(iii) අප මෙසේ කථාකිරීම තුළින් අප ආත්මිකව වර්ධනය කරනු ලබන්නෙමු. **( 1 කොරි 14:4)**

(iv) අන්‍ය භාෂාවලින් යාච්ඤා කිරීම උදෙසා අපට මෙම දීමනාව භාවිතා කළ හැක. **(1 කොරි 14:15)**

**එපීස 6:10-18** දක්වා සඳහන් වන්නාවූ කොටසේ අප දකින්නේ, කිතුනුවන් දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගෙන, **'සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤා කළ යුතු බවය' (එපීස 6:18)**

මෙහිදී අප තේරුම්ගත යුතු කරුණක් සඳහන් කරන්නෙමි. අප ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන යාච්ඤා කිරීම, සෑම අවස්ථාවකදීම 'අන්‍ය භාෂාවලින්' නොවෙන්ට පුළුවන.

ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන අපගේම බසින් හෝ 'අන්‍ය භාෂාවලින්' අපට යාච්ඤා කළ හැකි අතර, අප අන්‍ය භාෂාවලින් යාච්ඤා කරන කල, නිසැකවම අපගේ යාච්ඤාව සිදුවන්නේ ආත්මයාණන්වහන්සේ කරණකොට - ගෙනවේ.

(v) අන්‍ය භාෂාවලින් ගීතිකා කිරීම උදෙසා මෙම දීමනාව අපට භාවිතා කළ හැක. **(1 කොරි 14:15)**

**එපීස 5:19** වන පදය, අපට පෙන්වාදෙන්නේ අප **"ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවී ගීතිකාවලින්ද කව්වලින්ද ආත්මික ගී වලින්ද එකිනෙකාට කථාකොට ...."** දෙවියන්වහන්සේට නිතරම ස්තුති කළ යුතු බවයි.

(මෙසේ අන්‍ය භාෂාවලින් ගීතිකා ගැයීම, පුද්ගලික යාච්ඤාවේදී මෙන් සභාවේදීද කළ යුතු බව **එපීස 5:19-21** අපට පෙන්වා දෙයි)

(vi) අන්‍ය භාෂා වලින් දෙවියන්වහන්සේට ස්තුති කිරීමට හැක. **(1 කොරි 14:16)**

(b) **ප්‍රසිද්ධ නමස්කාරයේදී සහ අප සේවයේ යෙදෙන අතර**

(i) දෙවියන්වහන්සේ අන්‍ය භාෂාවකින් අප තුළින් සභාවට කථාකරන්ට හෝ පණිවිඩයක් දීමට ක්‍රියාකරන අවස්ථා තිබේ. **(1 කොරි 14:5-11)** (මෙය භාවිතා කිරීම පිළිබඳව **'භාෂා තේරුම් කර දීම'** යන කොටස දෙසද බලන්න)

(ii) එම දීමනාව සභාවේදී භාවිතා කළ යුත්තේ, (දිනකට) දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් පමණකි. මෙසේ කළ යුත්තේ භාෂා තේරුම් කර දීමේ දීමනාව ඇත්තාවූ කෙනෙක් සභාවේ සිටින අවස්ථාවල පමණි.

**1 කොරි 14:27,28 :- "[27] යමෙක් අන් භාෂාවලින් කථා කෙරේනම්, දෙදෙනෙක් නොහොත් තුන් දෙනෙක් පමණක් එක්කෙනෙක් පාසා එක්කෙනෙක් එසේ කෙරේවා ; එක් කෙනෙක් තේරුම් කර දේවා. [28] තේරුම්කර දෙන කෙනෙක් නැත්නම්, ඔහු සභාවේදී නිශ්ශබ්ද වේවා ; තමාටත් දෙවියන්වහන්සේටත් කථා කෙරේවා."**

(iii) දෙවියන්වහන්සේට ආත්මයෙන් නමස්කාර කිරීම උදෙසා ප්‍රසිද්ධ නමස්කාරයේ මෙම දීමනාව භාවිතා කළ හැක. **(1 කොරි 14: 14-17, එපීස 5:18-20)**

(iv) සමහර විශේෂ අවස්ථාවන්හිදී, දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම අනුව සභාවේ සියලු දෙනා එකට ශබ්ද නඟා දෙවියන්වහන්සේට යාච්ඤාකරන්නාවූ, ප්‍රශංසා කරන්නාවූ, ආත්මයෙන් ගායනා කරන්නාවූ, අවස්ථා තිබේ. (**1 කොරි 14:15, එපීස 5:19-21**)

## (C) අන්‍ය භාෂා වලින් කථාකිරීමේ දීමනාවේ වැදගත්කම

(i) දේව දරුවන් ලෙස ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට බව්තීස්ම කරන ලද්දාවූ අප සැම, 'ආත්මිකව අලුතෙන් ඉපදීම' ලැබූ අය වන්නෙමු. අප තුළ ශුද්ධාත්මයානණ්වහන්සේද වැඩ වසනසේක.

ආත්මිකව ඉපිද සිටින්නාවූ අපගේ ආත්මික වර්ධනය උදෙසා, අන්‍ය භාෂා දීමනාව අතිශයින් ප්‍රයෝජනවත් වේ. (**1 කොරි 14:4**)

(ii) ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපය අප ලබා ඇති බවට එය සහතිකයක් වන බැවින්, එය තුළින් අපගේ ඇදහිල්ල ශක්තිමත් වෙයි.

(iii) කිතුනු අපට ඇත්තාවූ බලවත්ම ආයුධය වන්නේ යාච්ඤාව වන අතර, යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ කතා කිරීමයි.

සමහර අවස්ථාවලදී අප මෙසේ දෙවියන්වහන්සේට කතාකරන අතර අපගේ අදහස්/සිතුවිලි/හැඟීම්/ඉල්ලීම් යනාදිය නිසි ආකාර ප්‍රකාශ කිරීම උදෙසා අපගේම වචන නොසෑහෙන බව අපට හැඟී යන අවස්ථා ඇතිවේ.

මෙවිට අන්‍ය භාෂාවලින් යාච්ඤාකිරීමට ශුද්ධාත්ම - යාණන්වහන්සේ අපට උදව්වී උන්වහන්සේම අප උදෙසා මැදිහත්කම් කරනසේක (**රෝම 8:26**).

(iv) සමහරවිට අප යාච්ඤාවෙන් ඉල්ලිය යුත්තේ කුමක්ද කියා නොදනිමු. යමක් පිළිබඳව දේව කැමැත්ත නොදනිමු. මෙවැනි අවස්ථාවල අප අන්‍ය භාෂාවලින් යාච්ඤා කරන අතර ශුද්ධාත්මයාණන්වහන්සේම දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කිරීමට අපට උපකාර කරනසේක. මෙසේ අප අන්‍ය භාෂාවලින් <u>දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව යාච්ඤා කරන අතර, දෙවියන්වහන්සේ එම යාච්ඤා වලට පිළිතුරු දීමට පොරොන්දු වී තිබෙනසේක</u>.
**(රෝම 8:27, 1 යොහන් 5:14,15)**

(v) පුද්ගලික යාච්ඤාවේදී දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට එය මහත් රුකුලක් වෙයි.

(vi) මැදහත් යාච්ඤාවේදී, කුමක් ඉල්ලිය යුතුද කියා අප නොදන්නාවිට, ආත්මයෙන් යාච්ඤාකිරීම වඩාත්ම උචිත වෙයි.

**3. <u>භාෂා තේරුම්කර දීම</u>**

භාෂා තේරුම් කර දීම යනු, **දෙවියන්වහන්සේ විසින් අන්‍ය භාෂාවලින් දෙනු ලබන්නාවූ පණිවිඩයක්, අසන්නන්ගේ බසින් ප්‍රකාශ කිරීමට දෙවියන්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන් - වහන්සේ මගින් දෙන්නාවූ හැකියාවයි.**

(i) සභාවේ අන්‍ය භාෂා දීමනාව ඇති විට, සභාවේ වර්ධනය උදෙසා එය සමඟම භාෂා තේරුම්කර දීමේ දීමනාව තිබිය යුතුවේ. **(1 කොරි 14:5)**

(ii) සභාවේ මෙම දීමනාව නැත්නම්, අන්‍ය භාෂාවලින් දෙවියන්වහන්සේගේ හඬ අසන්නාවූ දීමනාව ඇත්තන් සභාවේ වර්ධනය උදෙසා, මෙම දීමනාව සමිඳුන්ගෙන් ඉල්ලිය යුතු වේ. **(1 කොරි 14:12,13)**

(iii) භාෂා තේරුම් කර දීම සභාවේ සාමාන්‍යයෙන් සිදුවිය යුතුවේ **(1 කොරි 14:26)**. එසේ කිරීමට සභාවේ කෙනෙකු නොසිටින අවස්ථාවන්හිදී, අන්‍ය භාෂාවලින් සභාවේ ශබ්ද නඟා කථා නොකළ යුතුවේ.
**(1 කොරි 14:27,28)**

දේව දරුවෙනි, මෙම අධ්‍යයනයෙහි සඳහන් වන්නාවූ දීමනා තුනම සභාවේ වර්ධනය උදෙසා, අතිශයින් වැදගත්වේ. එබැවින් අප රටේ සෑම ප්‍රාදේශීය කිතුනු සභාවකටම මෙම දීමනා තුනම තිළිණ කරන මෙන් සමිඳුන්ගෙන් ඉල්ලා යාච්ඤා කිරීම අතපසු නොකරමු.

මෙම අධ්‍යයන කියෙව්වාවූ ඔබ සැමට මෙම දීමනා තුනම තේරුම් කර ගැනීමටත්, අත් දැකීමටත්

**දෙවි ස්වාමීන්වහන්සේ**

**ඔබට**

**ආශිර්වාද කරන සේක්වා !!!**

සටහන්

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 04



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 06

# නානා වර්ග භාෂා අනිවාර්ය්‍ය දීමනාවක්ද ?

**<u>හැඳින්වීම</u> :-**

අප දැන් අධ්‍යයනය කිරීමට යන්නාවූ මාතෘකාව, අතීතයේදී බොහෝ මතභේද සහ මත ගැටුම් ඇතිවීමට තුඩුදුන්නාවූ එකකි. එනම් **'නානා වර්ග භාෂා කථාකිරීමේ දීමනාව, සෑම කිතුනුවෙක්ම ලබා ගත යුතු අනිවාර්ය්‍ය දීමනාවක්ද ?** යන්නයි.

අතීතයේදී මෙම මාතෘකාව පිළිබඳව විවිධාකාර ප්‍රශ්න සහ ගැටළු ඇතිවුවද, වර්තමානයේ සභාව බොහෝවිට මෙය ගැන අනුගමනය කරන්නේ නිහඬ පිළිවෙතකි.

ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන මා ලියූ ප්‍රථම අධ්‍යයනයෙහි මා සඳහන් කළ අයුරින්, ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන ලිවීමට දෙවි සමිඳුන් මට ඇරයුම් කළේ මීට වසර හතකට පමණ උඩදීය. පමාවී උන්වහන්සේගේ හඬට කීකරුවූ මට දෙවි සමිඳුන් පසුගිය සතියේ මඟපෙන්වූයේ, මෙම අධ්‍යයනය ඔබ ඉදිරියේ තැබීමටය. එබැවින් ගිහියකු වන මා, මෙම අධ්‍යයනයට පිවිසෙන්නේ, ඉතා ස්වාධීනව සහ අපක්ෂපාතව, මෙම මාතෘකාව පිළිබඳව දේව වචනයේ ඉගැන්වීම ඔබ ඉදිරියේ තැබීමේ අපේක්ෂාවෙනි.

**<u>අධ්‍යයනය</u> :-**

**1 . <u>දේව වචනය නිසිලෙස තේරුම්ගැනීම</u>**

දේව වචනය නිසිලෙස තේරුම්ගැනීම පිණිස, 'දේව වචනය' යනු කුමක්ද කියා අප තුළ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුවේ.

දේව වචනය නොහොත් ශුද්ධවූ බයිබලය පොත් 66 කින් සමන්විත වන අතර, එය 'පරණ ගිවිසුම' සහ 'අලුත් ගිවිසුම' ලෙස කොටස් දෙකකට බෙදා ඇත. 'පරණ ගිවිසුම' පොත් 39 කින් සමන්විත වන අතර, 'අලුත් ගිවිසුමට' පොත් 27 ක් ඇතුලත් වේ.

ශුද්ධවූ බයිබලයට අයිතිවන්නාවූ පොත් හැටහය වසර 1500 ක පමණ කාලයක් තුළ කතුවරයන් 40 ක් පමණ විසින් ලියන ලදී. මෙලෙස බොහෝ මනුෂ්‍යයන් මඟින් ඉතා දිගු කාලයක් තුළ ශුද්ධවූ බයිබලය ලියන ලද අතර, **බයිබලයේ සැබෑ කතුවරයා වන්නේ මහෝත්තමවූ දෙවියන්වහන්සේ වනසේක.** දේව වචනයම මේ ගැන සාක්ෂි දරන්නේ පහත සඳහන් අයුරිනි.

**2 තිමෝති 3:16 :-**

**"දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස <u>දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල</u> ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."**

**2 පේත්‍රුස් 1:21 :-**

**"මක්නිසාද කිසි අනාගත වාක්‍යයක් මනුෂ්‍ය කැමැත්තෙන් කිසි කලක නොපැමිණියේය. නුමුත් <u>මනුෂ්‍යයෝ ශුද්ධාත්මයාණන් විසින් පොළඹවනු ලැබ, දෙවියන්වහන්සේගෙන් ලැබූ ලෙස කථා කළෝය</u>.**

මෙම පද දෙක අපට පෙන්වාදෙන්නේ, 'මුළු ලියවිල්ල' නොහොත් දේව වචනය ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පොළඹවනු ලැබූ මනුෂ්‍යයන් මඟින් අපට ලබා දීම පිණිස දෙවියන්වහන්සේ ක්‍රියා කළ බවයි. මේ අයුරින් අප ලබා ඇත්තාවූ **දේව වචනය, බොරු නොකියන්නාවූද වෙනස් නොවන්නාවූද අපගේ දෙවියන්වහන්සේගේ නොවෙනස්වන්නාවූද සදාකාලිකවූද වචනයයි.**

**යෙසායා 40:8 :-**

**"තණකොළ වියළෙයි, මල පරවෙයි. නුමුත් <u>අපේ දෙවියන්වහන්සේගේ වචනය සදාකාලේටම පවත්නේය</u> කියාය."**

**මතෙව් 5:18 :-**

**"සැබවක් නුඹලාට කියමි : අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, <u>ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය</u>."**

## 2. <u>දේව වචනයට ඇතුලත්වන්නාවූ විවිධාකාර ලියවිලි හඳුනා ගැනීම</u>

මෙලෙස දේව වචනය යනු දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයාට ලබා දුන්නාවූ නොවෙනස්වන්නාවූ සත්‍යතාවේ වචන වන අතර, එම වචනය සදාකාලික වේ. මෙම වචනය නිසි ලෙස තේරුම්ගැනීම උදෙසා, දේව වචනයට පහත සඳහන් විවිධාකාර කොටස් හෝ ලියවිලි අඩංගුවන්නා බව අප හඳුනා ගැනීම අතිශයින් වැදගත් වේ.

(i) දෙවියන්වහන්සේගේ එළිදරව් කිරීම්

**<u>නිදසුන් වශයෙන්</u>** -
බයිබලයේ ප්‍රථම පොත වන්නාවූ 'උත්පත්ති කථාව' ඇරඹෙන්නේ දෙවියන්වහන්සේගේ මැවීමේ ක්‍රියාව විස්තර කරමිනි. මෙනමුත් මෙය ලියූ මෝසෙස් උපත ලැබුවේ ඊට බොහෝ කලකට පසුව හෙයින්, දෙවියන්වහන්සේ මෝසෙස්ට මනුෂ්‍යයාගේ අතීතය එළිදරව් කළ බව පැහැදිලිය.

මේ අයුරින්ම බයිබලයේ අන්තිම පොත වන 'එළිදරව්' පොත යොහන්තුමා විසින් ලියන ලද්දේ වෙන්ට තිබෙන්නාවූ දේවල් ගැන ඔහු ලැබූ එළිදරව් කිරීම අනුවය. (**එළිදරව් 1:1**)

(ii) මනුෂ්‍ය ඉතිහාසය
(iii) ඉශ්‍රායෙල් ජාතියේ ඉතිහාසය
(iv) දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව/ ආඥා යනාදිය
(v) අනාගත වාක්‍යය
(vi) යාච්ඤා, ගීතිකා, ප්‍රශංසා යනාදිය
(vii) ඉගැන්වීම්, උපදෙස්, උපමා කථා යනාදිය
(viii) යේසුස්වහන්සේගේ ජීවිතය සහ සේවය
(ix) කිතුනු සභාවේ ආරම්භය සහ වර්ධනය
(x) මිෂනාරී ගමන්
(xi) නව සභාවන් වලට ලියන ලද ලිපි
(xii) දේව පොරොන්දු

මෙසේ ඉහත සඳහන් ලැයිස්තුව කිසිසේත් සම්පූර්ණ එකක් නොවන බැවින්, ඔබටද තව දේ එයට එකතු කළ හැකිවේ යයි සිතමි. දේව වචනය තේරුම්ගැනීම උදෙසා, ඔබ කියවන්නාවූ කොටස නිවැරදිව හඳුනාගැනීමත් එහි පසුබිම තේරුම්ගැනීමත් ඉතාමත්ම වැදගත් වේ.

**<u>නිදසුනක් වශයෙන්</u> -**

**යෝෂුවා හයවෙනි පරිච්ඡේදයේ** සඳහන් වන්නාවූ, යෙරිකෝවේ පවුර බිඳ වැටීම **සත්‍යවූ ඓතිහාසික සිද්ධියකි. එය සතුරන් පරාජය කිරීම උදෙසා දෙවියන් - වහන්සේ අපට දෙන්නාවූ <u>විශේෂ උපක්‍රමයක් ගැන ඉගැන්වීමක් නොවේ</u>.**

එබැවින් සාතන්ගේ බලකොටුවක් පරාජය කිරීම උදෙසා, එය වටා අප 13 න් වරක් පා ගමනේ ගිය යුතු බව යමෙක් නිගමනය කිරීම, දේව වචනය වැරදි ලෙස තේරුම් - ගැනීමකි.

## 3. <u>සභාවන් අතර ඇත්තාවූ ඉගැන්වීම් වල මූලික වෙනස්කම් සහ ඒවායේ ඓතිහාසික පසුබිම තේරුම්ගැනීම</u>

මුල් සභාව නිර්භීතකමින්ද ශුද්ධාත්ම බලයෙන්ද ශුභාරංචිය ප්‍රකාශ කිරීම හේතුවෙන් සභාව සීඝ්‍රයෙන් වැඩුණි. මෙසේ සංඛ්‍යාත්මිකව වර්ධනයවූ ආරම්භක සභාව අප අද හඳුන්වන්නේ රෝමානු කතෝලික සභාව ලෙසිනි. මෙනමුත් කාලයාගේ ඇවෑමෙන්, මෙම සභාවෙන් බිඳී එංගලන්ත සභාවද, එම සභාවෙන් බිඳී මෙතෝදිස්ත සභාවද, බිහිවුණි.

මෙසේ අතිවිශාල ක්‍රිස්තියානි නිකායන් සංඛ්‍යාවක් බිහිවුනු අතර, සභාවන් අතර ඇත්තාවූ විවිධ වෙනස්කම් සහ ඉගැන්වීම් ඔබට තේරුම්ගැනීමට උපකාර වන පිණිස, නිදසුන් දෙකක් ඔබ ඉදිරියේ තබමි.

### (a) මෙතෝදිස්ත සභාව

මෙතෝදිස්ත සභාව එංගලන්ත සභාවෙන් වෙන්වී, අලුත් සභාවක් ලෙස ස්ථාපනයවීම පිළිබඳව මෙතෝදිස්තයකු වන මාගේ පියා, මා කුඩා කාලයේ මට ඉගැන්වූ එක් දෙයක් මෙසේය.

ගෞරවණීය ජෝන් වෙස්ලි නමැති එංගලන්ත සභාවේ දේවගැතිතුමාට, එංගලන්තයේ එවකට බහුලව තිබූ තැබෑරුම් වල ගැවසුනාවූ බීමත්කමට ඇබ්බැහි වුනාවූ පුරුෂයන්, යේසුස්වහන්සේ වෙත දිනා ගැනීමට මහත් පිපාසයක් ඇතිවුණි.

එබැවින් ඔහු මේ අය වෙත ශුභාරංචිය ගෙන යෑමට දැඩි උත්සාහයක් දරමින්, තැබෑරුම් ආශ්‍රිතව පවා දේශනා කිරීමට යෙදුණි. ඔහුගේ මෙම ක්‍රියාදාමය එංගලන්ත සභාව අපකීර්තියට පත්කරන බැවින් ඒවා අත්හරින ලෙස සභා නායකත්වයෙන් ලැබුනු උපදෙස්, දෙවියන්වහන්සේගෙන් තමා ලැබූ මඟපෙන්වීමට පටහැනි බව වෙස්ලිතුමා විශ්වාස කළේය. මෙහි ප්‍රතිඵලය වූයේ ඔහුට එංගලන්ත සභාවෙන් ඉවත්වීමට සිදුවීම සහ 'මෙතෝදිස්ත සභාව' බිහිවීමය.

ඉහත සඳහන් වන්නේ මෙතෝදිස්ත සභාව ඇතිවීමට එක හේතුවක් වන අතර, එයට අදාළ වෙනත් කරුණු කාරණා රාශියක් ඇත. නමුත් ඉහත සඳහන් අයුරින්, මෙතෝදිස්ත සභාව බිහිවීමේදී, 'බීමත්කම නැතිකිරීම' වැදගත් ස්ථානයක් ගත් නිසා, **මත්පැන් භාවිතා කිරීමෙන් වැළකී සිටීම වැදගත් මෙතෝදිස්ත ප්‍රතිපත්තියක් ලෙස, මෙතෝදිස්ත සභාව පිළිගනියි.**

මෙතෝදිස්ත සභාවට අයිති වන්නාවූ මම, එබැවින් කිසිදිනක මත්පැන් පානය කිරීමෙහිවත්, දුම් පානය කිරීමෙහිවත් යෙදී නොමැති වන්නෙක් වෙමි.

(මෙනමුත් දේව වචනය අපට උගන්වන්නේ, **'මුද්‍රික පානයෙන් මත් නොවෙල්ලා ' - එපීස 5:18** කියා මිස 'මුද්‍රික පානයෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිල්ලා' කියා නොවේ).

මෙම නිදසුනෙන් අප දකින්නේ, 'මත්පැන් භාවිතය' පිළිබඳව, මෙතෝදිස්ත සභාව දේව වචනයටත් වඩා තද ස්ථාවරයක සිටීම වන අතර, මෙම ස්ථාවරය කිසිසේත් හානිකර නොවේ.

(b) **'පෙන්තකොස්ත' සභාවන්**

කිතුනු සභාව ආරම්භ වූයේ 'ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය ප්‍රකාශවීමෙන්' නමුත්, කාලයාගේ ඇවෑමෙන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා පිළිබඳව, සමස්ත කිතුනු සභාව, වැඩි ඕනෑකමක් හෝ උනන්දුවක් නොදැක්වූ කාල ඇතිවුණි.

20 වන ශතවර්ෂයේ ආරම්භයේදී මෙවැනි සමයක ඇමරිකාවේ **'ශුද්ධාත්ම පිබිදීමක්'** ඇතිවිය. එහි ප්‍රතිඵලයක්, වූයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා පිළිබඳව මහත් අවධානයක් සමස්ත කිතුනු සභාව තුළ ඇතිවීමයි.

එබැවින් 20 වන ශතවර්ෂයේ ආරම්භයේදී ඇතිවුණාවූ 'පෙන්තකොස්ත පිබිදීම' හේතුවෙන් වර්ධනයවූ සභාවන් ඉතා දැඩි උනන්දුවක් දැක්වූයේ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා වලටයි.

මෙහි ස්වභාවික ප්‍රතිඵලයක් වූයේ දේව වචනයේ **'නොඅදහන්නන්ට ලකුණක්' (1 කොරි 14:22)** ලෙස සඳහන්වන්නාවූ අන්‍ය භාෂාවලින් කථාකිරීමේ දීමනාව 'අනිවාර්‍යය දීමනාවක්' බව සමහර කිතුනු කණ්ඩායම් ප්‍රකාශ කිරීමයි.

20 වන ශතවර්ෂයේ ආරම්භයේදී, මෙම 'පෙන්තකොස්ත පිබිදීම' ඇතිකළේ දෙවියන්වහන්සේය. සභාව ශුද්ධාත්ම දීමනා ගැන වැඩි සැලකිල්ලක් නොදැක්වූ සමයක උන්වහන්සේ මෙම පිබිදීම ගෙනාසේක. කිතුනු සභා ඉතිහාසයේ මෙම පිබිදීම, විශිෂ්ඨ ස්ථානයක් ගනියි.

දෙවියන්වහන්සේ ඇතිකළාවූ මේ පිබිදීම අතිශයින් අනර්ඝ වන අතර, මනුෂ්‍යයන්ගේ දුර්වලකම් නිසා, ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ දීමනාවලටද විශේෂයෙන්ම අන්‍ය භාෂා කථා කිරීමේ දීමනාවටද, දේව වචනයටත් වඩා වැදගත් ස්ථානයක් සමහර කණ්ඩායම් දැක්වීම මෙම පිබිදීම සමඟ ඇතිවුණාවූ දුර්වලකමක් සේ සැලකිය හැක.

(කරුණාකර 82 සහ 83 වන පිටු බලන්න)

## 4. දේව ධර්මය ගොඩනැගිය යුත්තේ මූලික වශයෙන්ම දේව වචනයේ ඇත්තාවූ ඉගැන්වීම් මතයි

**නිදසුනක් වශයෙන්** -

අන්‍ය භාෂා කථාකිරීමේ දීමනාව ගැන, දේව වචනයේ මූලික ඉගැන්වීම් වෙත ඔබගේ අවධානය යොමුකිරීමට කැමැත්තෙමි.

(a) **1 කොරි 12:8-11 තුළ ඇති ඉගැන්වීම්**

(i) මෙම කොටසේ දේව දරුවන් ලබන්නාවූ 'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා' 9 ක් සඳහන් වන අතර, අන්‍ය භාෂාවලින් කථාකිරීම ඒවායින් එකක් පමණකි.

(ii) මෙම කොටසේ, නැවත නැවත සඳහන් වන්නාවූ වචන වන්නේ, 'එක්කෙනෙකුට', 'තවත් කෙනෙකුට' 'වෙන කෙනෙකුට' යන වචන වේ. කිසිම දීමනාවක් සුවිශේෂ බව හෝ අනිවාර්‍ය්‍ය බව හෝ මෙහි සඳහන් නොවේ.

(iii) මෙම දීමනා 9 **' එකමවූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස වෙන වෙනම බෙදා දෙන බව '** (**1 කොරි 12:11**) මෙම කොටසේ අප දකින තවත් ඉගැන්වීමකි.

(b) **1 කොරි 14:6-11 තුළ ඇති ඉැන්වීම**

තේරුම් කර දීම නොමැතිව සභාවේ අන්‍ය භාෂා කථාකිරීම නුසුදුසු වේ.

(c) **1 කොරි 14:22 තුළ ඇති ඉගැන්වීම**

අන්‍ය භාෂා කථාකිරීමේ දීමනාව, නොඅදහන්නන් හට ලකුණක් පිණිස වේ.

# ක්‍රියා පොතේ සඳහන් - ශුද්ධාත්ම දීමනාව

| බයිබල් කොටස | අවස්ථාව | අත තබනු ලැබුවාද ? |
|---|---|---|
| **1. ක්‍රියා 2:1-4** | පෙන්තකොස්ත දවසේ උඩුමහල් මැදුරේ සිටි 120 දෙනා ශුද්ධාත්මයෙන් පූර්ණවීම | නැත |
| **2. ක්‍රියා 2:38-41** | පෙන්තකොස්ත දවසේ ඇදහිල්ලට පැමිණි 3000 ක් පමණ ශුද්ධාත්ම දීමනාව ලැබීම | සඳහන් නැත |
| **3. ක්‍රියා 8:1-18** | දෙවියන්වහන්සේගේ වචනය පිළිගත් සමාරියයන් ශුද්ධාත්මය ලැබීම | ඔව් **(ක්‍රියා 8:17)** |
| **4. ක්‍රියා 8:26-39** | එතියෝපීය නපුංසකයා ඇදහිල්ලට පැමිණ බව්තීස්ම කරනු ලැබීම | නැත |
| **5. ක්‍රියා 9:1-19** | පාවුල්තුමා ශුද්ධාත්මයෙන් පූර්ණ කරනු ලැබීම | ඔව් |
| **6. ක්‍රියා 10:44-47** | අන්‍ය ජාතික, සියයකට මුලාදෑනියෙක්වූ කොර්නේලියස් ශුද්ධාත්ම දීමනාව ලැබීම | නැත |
| **7. ක්‍රියා 16:12-15** | තියාතිරා නුවර ලිදියා සහ ඇයගේ ගෙයි වැසියන් ශුද්ධාත්ම දීමනාව ලැබීම | නැත |
| **8. ක්‍රියා 16:25-33** | පිලිප්පියේ හිරගෙදර මුලාදෑනියා සහ පවුල ශුද්ධාත්ම දීමනාව ලැබීම | නැත |
| **9. ක්‍රියා 19:1-6** | එපීසියේ සිටි යොහන් බව්තීස්තගේ ගෝලයන් 12 දෙනා ශුද්ධාත්ම දීමනාව ලැබීම | ඔව් |

# සහ අන්‍ය භාෂා අතර ඇත්තාවූ සම්බන්ධකම

| බව්තීස්ම කරනු ලැබුවාද ? | ශුද්ධාත්ම දීමනාව ලැබුවාද ? | අන්‍ය භාෂා දීමනාව ලැබුවාද ? | වෙනත් කරුණු |
|---|---|---|---|
| නැත | ඔව් | ඔව් | සභාවේ ආරම්භය, අන්‍ය භාෂා ලකුණෙන් දෙවියන්වහන්සේ සනාථ කිරීම |
| ඔව් | ඔව් | සඳහන් නැත | – |
| ඔව් | ඔව් **(ක්‍රියා 8:13, 16)** | ලැබූ බව නිගමනය කළ හැක | සමාරියයන් දේව සභාවට අයිති බව පෙන්වීමට දෙවියන්වහන්සේ දුන් ලකුණ |
| ඔව් | ඔව් **(ක්‍රියා 2:38 අනුව)** | නැත | – |
| ඔව් | ඔව් | සඳහන් නැත | – |
| ඔව් | ඔව් | ඔව් | අන්‍ය ජාතිකයන් දේව සභාවට ඇතුල් කරනු ලැබීම පෙන්වීමට දෙවියන්වහන්සේ දුන් ලකුණ |
| ඔව් | ඔව් **(ක්‍රියා 2:38 අනුව)** | නැත | – |
| ඔව් | ඔව් **(ක්‍රියා 2:38 අනුව)** | නැත | – |
| ඔව් | ඔව් | ඔව් | යොහන් බව්තීස්ත තුමාගේ සේවය පිළිගැනීම පෙන්වීම පිණිස දෙවියන්වහන්සේ දුන් ලකුණ |

## 5. ක්‍රියා පොත ඇසුරෙන්, ශුද්ධාත්ම දීමනාව සහ අන්‍ය භාෂා දීමනාව අතර ඇති සම්බන්ධකම විමසා බැලීම

අලුත් ගිවිසුම ඇරඹෙන්නේ මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන් විසින් ලියන ලද්දාවූ ශුභාරංචි පොත් හතරෙනි. අලුත් ගිවිසුමේ පස්වන පොත වන්නාවූ ක්‍රියා පොත අපට පෙන්වාදෙන්නේ, කිතුනු සභා ඉතිහාසයේ මුල් අවදියයි. මෙම කාලය පිළිබඳව, උත්ථානවූ යේසුස්වහන්සේ ස්වර්ගයට නැගීමට ප්‍රථමයෙන් තම ගෝලයන්ට ප්‍රකාශ කළාවූ, පහත සඳහන් වචන ඉතා වැදගත් වේ.

**ක්‍රියා 1:5 :- "මක්නිසාද යොහන් වතුරෙන් බව්තීස්ම කළේය ; නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්ම කරනු ලබන්නහුයයි කීසේක."**

අපගේ අධ්‍යයනයේ, මෙම කොටස වෙන්කර ඇත්තේ, ක්‍රියා පොතේ සඳහන්වන්නාවූ මනුෂ්‍යයන් ශුද්ධාත්ම දීමනාව ලැබුවාවූ අවස්ථා අධ්‍යයනය කිරීම උදෙසායි. මෙවැනි අවස්ථා 9 ක් හඳුනා ගැනීමට මා සමත් වූ අතර, මා විසින් මගහැරුනු වෙනත් අවස්ථා ඇත්නම්, එය මාගේ අතපසුවීමක් මිස හිතා මතා කළාවූ මග හැරීමක් නොවන බව ප්‍රකාශ කරන්ට කැමැත්තෙමි.

මෙම අවස්ථා 9, (82 සහ 83 වන පිටුවල) වගුවක් ලෙස ඔබට ඉදිරිපත් කර තිබේ.

මෙම වගුවේ සිරස් තීර හතක් ඇති අතර, ඒවා මෙලෙස පැහැදිලි කිරීමට කැමැත්තෙමි.

(i) **බයිබල් කොටස :-** මෙහි දැක්වෙන්නේ, ශුද්ධාත්ම දීමනාව ලැබීම විස්තර කරන්නාවූ අදාල බයිබල් කොටස් වන අතර, ක්‍රියා පොතේ සඳහන් අනුපිළිවෙල අනුව ඒවා සඳහන් කර ඇත.

(ii) **අවස්ථාව :-** පැහැදිලි කිරිමක් අනවශ්‍යය බව සිතමි.

(iii) **අත තබනු ලැබුවාද :-** එනම් යම් මනුෂ්‍යයෙක් විසින් එම දීමනාව ලැබූවන් මත අත තබා (යාච්ඤා කලාද ?) යන ප්‍රශ්නයයි.

(iv) **බවතීස්ම කරනු ලැබුවාද ?** ශුද්ධාත්ම දීමනාව ලැබීම උදෙසා ඔවුන් වතුරෙන් බව්තීස්ම කරනු ලැබුවාද ?

(v) **ශුද්ධාත්ම දීමනාව ලැබුවාද ?** අප තෝරා ඇත්තේ එවැනි අවස්ථා පමණක් වේ.

(vi) **අන්‍ය භාෂා දීමනාව ලැබුවාද ?** එනම් ඔවුන් එම අවස්ථාවේ අන්‍ය භාෂාවලින් කථාකලාද ?

(vii) **වෙනත් කරුණු :-** පැහැදිලි කිරීමක් අනවශ්‍ය බව සිතමි.

මෙම වගුව දෙස බලන අපට පැහැදිලිව පෙනී යන්නේ, අන්‍ය භාෂා දීමනාව ලැබූ බවට සෘජුවම සඳහන් කරනු ලබන්නේ, අවස්ථා නවයෙන් අවස්ථා තුනක් සම්බන්ධයෙන් පමණක් බවයි.

ඒ අවස්ථා තුන වන්නේ,

**ක්‍රියා 2:1-4 :- පෙන්තකොස්ත දින ශුද්ධාත්මයෙන් පූර්ණවූ 120 දෙනා**

**ක්‍රියා 10:44-47 :- කොර්නේලියස් සහ ඔහුගේ නිවසේ රැස්ව සිටියාවූ සියලු අන්‍ය ජාතිකයන්**

**ක්‍රියා 19:1-6 :- එපීසයේ සිටි දොළොස් දෙනෙක් පමණ වූ යොහන් බවතීස්තගේ ගෝලයෝ**

මීට අමතරව **ක්‍රියා 8:18** වන පදයේ සඳහන් වචන එනම්, **'සීමොන්ද ප්‍රේරිතයන්ගේ අත තැබීම කරණකොටගෙන ශුද්ධාත්මය ලැබෙන බව දැක ......'** යන වචන වලින්, එදින සමාරියයන් අන්‍ය භාෂා දීමනාව ලැබූ බව අපට නිගමනය කළ හැක. (නිසැකවම ඔවුන් ශුද්ධාත්ම - යාණන්වහන්සේ දුටුවේ නැත. ඔවුන් දකින්ට ඇත්තේ ශුද්ධාත්ම දීමනාව ලැබීමේ ප්‍රතිඵලයයි).

දේව දරුවෙනි, ඉහත සඳහන් අවස්ථා හතර දෙස අපක්ෂපාතව, ස්වාධීනව සිතා බලන්න.

මෙම අවස්ථා හතරම, නොඅදහන්නන්ට දෙවියන්වහන්සේ දුන්නාවූ ලකුණු ලෙස තේරුම් ගැනීමට හැකි නොවේද ?

1. **ක්‍රියා 2:1-4 :-** මේ පෙන්තකොස්ත දවසයි. කිතුනු සභාවේ බලවත් ආරම්භයයි. **අන්‍ය භාෂා දීමනාව, යේසුස්වහන්සේ මෙසියස්වහන්සේ බව අවිශ්වාස කල (නොඇදහිලිවන්ත යුදෙව්වන්ට) දෙවියන්වහන්සේ දුන් ලකුණයි.**

2. **ක්‍රියා 8:1-18 :-** යුදෙව්වරුන් සහ සමාරියයන් අතර එදා තිබුනේ යහපත් සම්බන්ධකමක් නොවේ. මෙසේ සමාරියයන්ද සභාවට අයිති වන බව අවිශ්වාසකල (නොඇදහිලිවන්ත) යුදෙව්වන්ට **සමාරියයන් අන්‍ය භාෂා දීමනාව ලැබීම, දෙවියන්වහන්සේ දුන් ලකුණයි.**

3. **ක්‍රියා 10 : 44 - 47 :- ක්‍රියා 10:10-16** දක්වා සඳහන් දර්ශනය හෝ ස්වප්නය දෙවියන්වහන්සේ පේත්‍රුස්ට නොපෙන්නුවේ නම්, පේත්‍රුස් අන්‍ය ජාතිකයෙක්වූ කොර්නේලියස්ගේ නිවසට යෑම පවා ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබුණි.

   පේත්‍රුස් සහ ඔහු සමඟ ගියාවූ චර්මච්ඡේදිත ඇදහිලි - වන්තයන්ට **(සභාව අචර්මච්ඡේද අන්‍ය ජාතිකයන්ට අයිති නොවන බව සිතූ යුදෙව් 'නොඇදහිලිවන්තයන්ට') අන්‍ය ජාතිකයන් අන්‍ය භාෂා දීමනාව ලැබීම, දෙවියන්වහන්සේ දුන් ලකුණයි.**

4. **ක්‍රියා 19:1-6 :-** යොහන් බව්තීස්ත තුමාගේ සේවය සහ බව්තීස්මය පිළිගැනුනු බවට, **යොහන් බව්තීස්තගේ ගෝලයන් අන්‍ය භාෂා දීමනාව ලැබීම, දෙවියන්වහන්සේ දුන් ලකුණයි.**

   ඉහත සඳහන් 1, 2, 3 සහ 4 අනුව **1 කොරි 14:22** හි සඳහන් ලෙස, අන්‍ය භාෂා කථා කිරීමේ දීමනාව, දෙවියන්වහන්සේ විශේෂ සත්‍යයන් 4ක් 'නොඅදහන්නන්ට' ඉගැන්වීම උදෙසා දුන් ලකුණක් බව පැහැදිලි වෙයි.

## 6. <u>අන්‍ය භාෂා දීමනාව සැබවින්ම අනිවාර්‍යය වන්නේද ?</u>

දිනපතාම දෙවි සමිඳුන් සමග අන්‍ය භාෂා වලින් කථාකරන්නාවූ දේව දරුවෙක් වන්නාවූ මාගේ පිළිතුර පහත සඳහන් වේ.

(a) දෙවියන්වහන්සේ සමඟ 'නිහඬ කාලයක්' ගත කිරීම උදෙසා උදෑසන 4.00 ට පමණ පිබිසෙන මම, දිනපතාම උන්වහන්සේ සමඟ **'ආත්මයෙන් රහස් කථාකරන්නෙමි' (1 කොරි 14:2).** ආත්මයෙන් යාච්ඤාද ගීතිකාද කරන්නෙමි, ආත්මයෙන් ස්තුතිද ප්‍රශංසාද නමස්කාරද කරන්නෙමි.

මේ දේ තුළින් මා ලබන්නාවූ ආත්මික ශක්තිය සහ ආත්මික වර්ධනය නිසා අන්‍ය භාෂා දීමනාවට මගේ ජීවිතයේ මා දෙන්නේ අතිශයින් වැදගත් ස්ථානයකි.

(b) ඉහත සඳහන් මාගේ ආත්මික අත්දැකීම් නිසා, 'ඔබ සැමද අන්‍ය භාෂා දීමනාව ලබා, ආත්මිකව වැඩි වැඩියෙන් වර්ධනය වේවා !! ' කියා මම පතන නමුත්, එලෙස සැම කෙනෙක්ම මෙම දීමනාව ලබන බව, දේව වචනය උගන්වන්නේ නැති බව මම විශ්වාස කරමි.

**(<u>තවත් කෙනෙකුට</u> නානා වර්ග භාෂාද -1 කොරි 12:10)**

**1 කොරි 12:10** හි සඳහන් වන්නේ, 'තවත් කෙනෙකුට නානා වර්ග භාෂා' මිස <u>'සෑම කෙනෙකුටම' කියා නොවේ</u>. එබැවින් අන්‍ය භාෂා දීමනාව අනිවාර්‍යය වන බව ප්‍රකාශ කිරීම නිවැරදි නොවේ.

(c) ක්‍රියා පොතේ ශුද්ධාත්ම දීමනාව සඳහන් අවස්ථා 9 තුළින් අපට පැමිණිය හැකි නිගමනය වන්නේ, දෙවියන්වහන්සේ **'නොඅදහන්නන් හට ලකුණක් ලෙස'** සභාවේ ආරම්භයේදී අන්‍ය භාෂා දීමනාව, විශේෂ අවස්ථාවන් 4 ක් ලබා දුන් බවයි.

(d) අද දවසේද නිසැකවම දෙවියන්වහන්සේ එම දීමනාව ලකුණක් ලෙසද නිදහස් කරනු ඇත. දේව දරුව, ඔබව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නමැති කිතුනු සභාවට බව්තීස්ම කරන ලද්දේ ශුද්ධාත්මයාණන්වහන්සේ විසිනි. ඔබගේ ශරීරය උන්වහන්සේගේ මාළිගාව වේ. මෙනමුත් සමහරවිට ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවන් ඔබ තවම අත් දැක නොතිබෙන්නට පුළුවන. එම නිසා ඔබගේ ඇදහිල්ල පවා දුර්වල වන්නට පුළුවන. එසේ නම් ලකුණක් ලෙස අන්‍ය භාෂාවේ දීමනාව ඔබට දෙන මෙන් සමිඳුන්ගෙන් යදින්න.

ඔබට අසීමිත ප්‍රේමයකින් ප්‍රේම කරන්නාවූ ඔබගේ හදවත දන්නාවූ, අපගේ පියාණන්වහන්සේ ඔබගේ හඬ අසා, ඔබට පිළිතුරු දෙනු ඇත.

**දෙව් සමිඳුන් ඔබ සැමගේ ඇදහිල්ල**

**ශක්තිමත් කර, ඔබව ආත්මිකව**

**වර්ධනය කරණ සේක්වා !!**

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 05



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 07

# බලයේ දීමනා

**<u>හැඳින්වීම</u> :-**

මෙම අධ්‍යයනයෙන් ඔබගේ අවධානය යොමු කරනු ලබන්නේ **'බලයේ දීමනා'** තුන වෙතය. එනම් **1 කොරි 12:9** හි සඳහන් කරනු ලබන්නාවූ ඇදහිල්ල, සුවකිරීමේ දීමනාව සහ ආශ්චර්යය කිරීමේ දීමනාව යන දීමනා තුන වෙතය.

මෙම දීමනා තුනෙන් දෙකක් වන්නාවූ **'ඇදහිල්ල'** සහ **'සුවකිරීම'** උදෙසා යාච්ඤාකිරීම සෑම දේව දරුවෙක්ම තමාගේ ජීවිතයෙහි සාමාන්‍යයෙන් ක්‍රියාවට නංවන බව අප දනිමු. එබැවින් මෙම අධ්‍යයනයේ එක වැදගත් අරමුණක් වන්නේ, මෙය කියවන්නාවූ සෑම දෙනාගේම ජීවිතවල ඇදහිල්ල සහ යාච්ඤාව තව දුරටත් ශක්තිමත් කිරීමයි.

දේව දරුව, දෙවියන්වහන්සේ ඔබට 'ඇදහිල්ලේ දීමනාව' හෝ 'සුවකිරීමේ දීමනාව' ලබාදී ඇතත් නැතත්, රෝගීන් උදෙසා **'ඇදහිල්ලෙන් යාච්ඤාකිරීමට'** දෙවියන්වහන්සේ ඔබට හැකියාවද, අවස්ථාවන්ද ලබා දෙනසේක. එබැවින් අප සෑම දේව දරුවන් ලෙස අපගේ පියාණන්වහන්සේ අපට ලබාදී ඇත්තාවූ මෙම හැකියාව ඇදහිල්ලෙන් ක්‍රියාවට නංවමු.

මෙම අධ්‍යයනය තුළින් ඔබගේ ඇදහිල්ල අතිශයින් වැඩිවී, දෙවියන්වහන්සේගේ ආශිර්වාද සහ දීමනා ඔබ වැඩි වැඩියෙන් අත්දැකීම සහ ඔබගේ ජීවිතය බොහෝ දෙනෙකුට අභියෝගයක් සහ ආශිර්වාදයක් වීම අපගේ අවංක යාච්ඤාවයි.

**<u>අධ්‍යයනය</u> :-**

1 . <u>ඇදහිල්ලේ දීමනාව</u>

**ඇදහිල්ලේ දීමනාව යනු, යම්කිසි අවස්ථාවකදී දෙවියන්වහන්සේ අති බලවත් අන්දමින් ක්‍රියාකිරීමට යන බවට ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් දේව දරුවන් ලබන්නාවූ අධිස්වභාවික සහතිකය නොහොත් ඇදහිල්ල වේ.**

මෙම දීමනාව දෙස අප ඉගෙනගැනීමට මත්තෙන්, අප සැමදෙනා තුළම ඇත්තාවූ **'සාමාන්‍ය ඇදිහිල්ල'** වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. සැම දේව දරුවෙකුටම ඇත්තාවූ මෙම ඇදහිල්ලට අදාල අංශ තුනක් පහත සඳහන් වේ. ඒවා නම්,

(i) **දෙවියන්වහන්සේ අප එකිනෙකාට බෙදා දී ඇත්තාවූ ඇදහිල්ල**

**රෝම 12:3 :- "නුඹලා එකිනෙකා සුදුසු තරමට වඩා තමා ගැන උතුම්කොට නොසිතා, දෙවියන්වහන්සේ එකිනෙකාට බෙදා දුන් ඇදහිල්ලේ ප්‍රමාණය ලෙස පමණ දැන සිතන හැටියට...."**

මෙම පදයෙන් අපට උගන්වන්නේ **රෝම 12:4-8** දක්වා සඳහන්වන්නාවූ දීමනා නිසිලෙස භාවිතාකිරීම උදෙසා, දෙවියන්වහන්සේ අප එකිනෙකාට අවශ්‍ය ඇදහිල්ල බෙදා දී ඇති බව වන අතර, එම ඇදහිල්ල අනිකුත් සැම ශුද්ධාත්ම දීමනා භාවිතාකිරීම පිළිබඳවද අදාළ වේ.

(ii) **ගැළවීමට ඇතුල්වීම උදෙසා අවශ්‍ය ඇදහිල්ල**

**එපීස 2:8 :- "මක්නිසාද ඇදිහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය...."**

ඇදහිල්ල නොමැතිව දේව දරුකමට ඇතුල්වීමට නොහොත් ගැළවීමට ඇතුල්වීමට කිසිවෙකුට නුපුළුවන. එබැවින් මෙය කියවන්නාවූ සැම දේව දරුවෙක් තුළම, **'ගැළවීම ලැබීම උදෙසා අවශ්‍ය ඇදහිල්ල'** තිබෙන බව නිසැකය.

(iii) **දේව වචනය ඇසීමෙන් ඇති වන්නාවූ ඇදහිල්ල**

**රෝම 10:17 :- "මෙසේ ඇසීමෙන් ඇදහිල්ලද, ක්‍රිස්තුස් - වහන්සේගේ වචනයෙන් ඇසීමද පැමිණෙන්නේය."**

බයිබලය අපට ඉතා පැහැදිලිව පෙන්වාදෙන්නේ, දේව වචනය ඇසීමෙන් අප තුළ ඇදහිල්ල ඇති වන බවය. එබැවින් සැම දේව දරුවෙක් තුළම මෙම ඇදහිල්ලද පවතියි.

කිතුනු අප තුළ ඇත්තාවූ මේ **'සාමාන්‍ය ඇදහිල්ල'** අප ආත්මිකව වර්ධනයවීම සමඟ වර්ධනය වන අතර, එය උදෙසා මූලික වන්නේ දේව වචනය, **ඇසීම, කියවීම, අධ්‍යයනය කිරීම, කටපාඩම් කිරීම සහ මෙනෙහි කිරීම** යන මේවායි.

දේව දරුවෙනි, ඔබගෙන්ම මේ ප්‍රශ්නය අසා ගන්න.

**ඔබගේ ඇදහිල්ල වර්ධනය වෙමින් පවතිනවාද ?** මෙම ප්‍රශ්නයට ඔබගේ අවංක පිළිතුර සෘණාත්මක වන්නේ නම්, ඔබගේ ඇදහිල්ල වර්ධනය කරන මෙන් දෙවි සමිඳුන්ට යදින්න.

අපගේ ඇදහිල්ල වර්ධනය වීමේ ඇති වැදගත්කම නිසාම, **ලූක් 17:5** වෙත ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

**ලූක් 17:5 :- "එවිට ප්‍රේරිතයෝ කථාකොට : අපේ ඇදහිල්ල වැඩි කළ මැනවයි ස්වාමීන්වහන්සේට කීවෝය...."**

මෙම අවස්ථාවේදී ප්‍රේරිතයන් යේසුස්වහන්සේගෙන් කළාවූ මෙම ඉල්ලීම අප හොඳහැටි දනිමු. නමුත් ඔවුන් එසේ ඉල්ලුවේ යේසුස්වහන්සේ ප්‍රකාශකළ පහත සඳහන් වචන වලට ප්‍රතිචාරයක් ලෙස බව ශුද්ධාත්මයාණන්වහන්සේ මට පෙන්නුවේ, මට ඉතා වැදගත් පණිවිඩයක් දෙමිනි.

**ලූක් 17:3,4 :- "<u>නුඹේ සහෝදරයා</u> පව් කලොත් ....... ඔහු පසුතැවිලි වේ නම් ඔහුට කමාවෙන්න. ඔහු <u>දවසකට සත්වරක් නුඹට විරුද්ධව පව්කොට</u>, <u>සත්වරක් නුඹ වෙතට හැරී මම පසුතැවිලි වෙමියි කීවොත්</u>, <u>ඔහුට කමාවේයන්නැයි කීසේක</u>."**

එකදිනකදී තමාට විරුද්ධව හත්වතාවක් පව්කාළාවූ කෙනෙකුට හත් වතාවේදීම සමාවීමට නම්, **<u>අති බලවත් ඇදහිල්ලක් අනිවාර්‍යය වේ</u>.** එවැනි ඇදහිල්ලක් නොමැතිව මෙය කිසිසේත් කළ නොහැකි බව වටහාගත් ප්‍රේරිතයන්ගේ ඉල්ලීම **ලූක් 17:5** හි සඳහන් වේ.

යේසුස්වහන්සේ කිරීමට අනුශාසනා කළාවූ මෙම සමාවීමෙහි යෙදීමට අවශ්‍යවූ ඇදහිල්ල ඔවුන්ට නොමැතිවූ බව ප්‍රේරිතයෝ මෙම අවස්ථාවේදී තේරුම්ගත්හ.

අපගේ ජීවිතවලට මෙය අදාල කරගැනීම උදෙසා, යේසුස්වහන්සේ අපට දී ඇත්තාවූ ඉගැන්වීම් දෙකක් දෙස බලමු.

**මතෙව් 5:10-12 :-**
**" [10] ධර්මිෂ්ඨකම නිසා පීඩා වින්ද තැනැත්තෝ ආශිර්වාද ලද්දෝය ; මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. [11] මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්දා පීඩාකොට නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාද ලද්දෝය. [12] ප්‍රීතිවෙයල්ලා, ඉතා සන්තෝෂ වෙයල්ලා ; මක්නිසාද ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත්ය…."**

**මතෙව් 5:44-45 :-**
**" [44] නුමුත් මම නුඹලාට කියමි : නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා - කරපල්ලා ; [45] මෙසේ නුඹලා ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය…."**

මෙම ඉගැන්වීම් දෙකෙහිම යේසුස්වහන්සේම අපට දෙන්නාවූ සහතික පොරොන්දු අප දකින අතර, ඒවාට අදාළ කොන්දේසිද අප දකිමු.

දේව දරුව, ඔබ මේ පොරොන්දු අදහනවාද? එසේනම්, එම කොන්දේසි රකින්න. එම පොරොන්දු ඇදහීමට ඔබගේ ඇදහිල්ල මදිද? එසේ නම්, ඔබගේ ඇදහිල්ල වැඩිකරන මෙන් සමිඳුන්ට යදින්න.

දේව දරුවෙනි, අප දේව පොරොන්දු අදහමු. ඒවා අදහමින්

- **අපගේ සතුරන්ට ප්‍රේම කරමු !!**
- **අපට පීඩාකරන්නන් උදෙසා යාච්ඤා කරමු !!**
- **යේසුස්වහන්සේ නිසා නින්දා පීඩා ලබන කල ප්‍රීතිවෙමු, සමිඳුන්ට ප්‍රශංසා කරමු !!**

**මෙසේ ක්‍රියාකිරීම උදෙසා, අපගේ ඇදහිල්ල වැඩිකරන මෙන් සමිඳුන්ට යදිමු.**

(iv) **ඇදහිල්ලේ දීමනාව ගැන නිදසුන් කිහිපයක්**

(a) **ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේගේ ආරක්ෂාව අත්දැකීම - දානියෙල් 6:1-28**

ඇදහිල්ලෙන්, දානියෙල් දෙවියන්වහන්සේ ඔහුව සිංහයන්ගෙන් ආරක්ෂා කරන බව විශ්වාස කළේය. මෙහි ප්‍රතිඵලය වූයේ දාරියුස් රජතුමා, ඔහුගේ මුලු රාජ්‍යය මුලුල්ලේ දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට සහ මහිමයට පත්කිරීමයි. (**දානියෙල් 6:26,27** කියවා බලන්න)

(b) **ඇදහිල්ලෙන් ආබ්‍රහම් දේව පොරොන්දුව ලබාගැනීම - රෝම 4 : 17-21**

ඇදහිල්ලේ පියා ලෙස හඳුන්වනු ලබන්නාවූ ආබ්‍රහම්ගේ ඇදහිල්ල ගැන සෑම කිතුනුවෙක්ම දනියි. මනුෂ්‍ය ශක්තියෙන් ඉටුකළ නොහැකිවූ පොරොන්දුව, ඔහු ඇදහිල්ලෙන් ඉටුකර ගත්තේය.

(c) **ඇදහිල්ලෙන් පේත්‍රුස් අනනියස් සහ සප්පිරාගේ පාපයට විරුද්ධව නැගීසිටීම - ක්‍රියා 5:1-11**

පේත්‍රුස් ප්‍රකාශ කළාවූ ඇදහිල්ලේ වචන වල ප්‍රතිඵලය වූයේ දේව භය සභාව තුළට පැමිණීමයි.

දේව දරුවෙනි, අප සැමද සම්පූර්ණ ඇදහිල්ලෙන් ක්‍රියාකරමු. උන්වහන්සේ ඇදහිල්ලේ දීමනාව බොහෝ දේව දරුවන්ට දෙමින්, දේව ආරක්ෂාව අත්දැකීමටද, දේව පොරොන්දු ලබා ගැනීමටද, දේව භය ඇතිව ක්‍රියාකිරීමටද, දේව සභාවට පිහිටවන ලෙස නිරන්තරයෙන් සමිඳුන්ට යදිමු.

**2. සුවකිරීමේ දීමනාව**

**සුවකිරීමේ දීමනාව යනු, රෝගීව සිටින්නන්ට අධිස්වභාවික ලෙස සුවය ලබා දීම උදෙසා, දෙවියන්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින්, දේව දරුවෙකුට ලබා දෙන්නාවූ දීමනාවයි.**

මෙම දීමනාව ගැන අධ්‍යයනය කරන්නාවූ ඔබ වෙත ප්‍රථමයෙන් අප ඉදිරිපත් කරන්නාවූ කරුණ වන්නේ, ඇදහිල්ලේ දීමනාවට සමගාමීව සෑම කිතුනුවෙකුටම දෙවියන්වහන්සේ **'සාමාන්‍ය ඇදහිල්ල'** දී ඇති සේම, සුවකිරීමේ දීමනාවට සමගාමීව සෑම කිතුනුවෙකුටම **'රෝගීන් උදෙසා යාච්ඤා කිරීමට'** උන්වහන්සේ හැකියාව ලබාදී ඇති බවයි.

(i) **රෝගීන් උදෙසා යාච්ඤාකිරීම**

සෑම දේව දරුවෙකුටම දෙවියන්වහන්සේ ලබා දී ඇත්තාවූ මේ අවස්ථාව සහ හැකියාව, පැහැදිලිව අවබෝධ කර ගැනීම උදෙසා, යේසුස්වහන්සේගේ ජීවිතය දෙස බලමු.

(a) යේසුස්වහන්සේ මෙලොව කළාවූ මෙහෙය දෙස බලන අපට පෙනෙන එක කරුණක් වන්නේ, උන්වහන්සේ වෙත පැමිණියාවූ රෝගීන් **'සියලු දෙනා'** උන්වහන්සේ සුව කල බව දේව වචනයේ නොයෙක් තැන්වල සඳහන් වන බවයි.

**මතෙව් 12:15 :- ''..... බොහෝ සමූහයෝද උන්වහන්සේ අනුව ගියෝය. <u>උන්වහන්සේ සියල්ලන් සුවකොට</u> .....''**

**මතෙව් 14:36 :- ''උන්වහන්සේගේ සළුවේ දාවල්ලටවත් අතගසන්ට ඔවුන්ට ඉඩ දෙන හැටියට උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. <u>අතගැසූ සියල්ලෝම සුවපත් වූවෝය</u>.''**

(තව දුරටත් - **ලූක් 4:40, ලූක් 6:19, ක්‍රියා 10:38** කියවා බලන්න)

මෙසේ යේසුස්වහන්සේ උන්වහන්සේ වෙත <u>සුවය සොයමින් ඇදහිල්ලෙන් පැමිණි, සෑම දෙන සුව කල බවට</u> අපට නිගමනය කළ හැක. යේසුස්වහන්සේ සෑමවිටම ක්‍රියා කළේ දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව බව දේව වචනය පැහැදිලිව උගන්වන බැවින් **(හෙබ්‍රෙව් 10:7, යොහන් 6:38** කියවා බලන්න), අපට තව දුරටත් නිගමනය කළ හැකි වන්නේ, මනුෂ්‍යයා ශාරීරික සුවය ඇතිව ජීවත්වීම දෙවියන්වහන්සේගේ මුල් කැමැත්ත වන බවයි.

මෙනමුත් විශේෂ හේතුන් මත සමහරුන් රෝගාතුරවන්ට දෙවියන්වහන්සේ ඉඩහරින අවස්ථාද ඇති බව දේව වචනයෙන් අප දකිමු. (**2 කොරි 12:7-9, යොහන් 9:1-2, යොහන් 11:3,4** කියවා බලන්න)

මේ අයුරින් දෙවියන්වහන්සේගේ මුල් කැමැත්ත රෝගාතුරවූවන් සුවය ලැබීම නම්, ඒ කැමැත්ත අනුව අප රෝගීන් උදෙසා යාච්ඤා කරන අතර, අප ඉල්ලූ දේ ලැබෙන බව දේව වචනය ප්‍රකාශ කරයි.
**(1 යොහන් 5 : 14, 15)**

(b) යේසුස්වහන්සේ තම ගෝලයන්ට සුවකිරීමේ බලය පවරමින් ඔවුන් පිටත්කර යැවූසේක.

(A) ගෝලයන් 12 දෙනා - **මතෙව් 10:1,7,8, මාර්ක් 3:14,15, ලූක් 9:1,6**

(B) 70 දෙනෙකු යවනු ලැබීම - **ලූක් 10:1,9**

(C) අදහන්නාවූ සියළු දෙනා - **මාර්ක් 16:17,18**

රෝගීන්ගේ සුවය උදෙසා යාච්ඤා කිරීම පිළිබඳව **යාකොබ් 5:14-16** දෙස බලමු.

**යාකොබ් 5:14-15 :- " [14] යමෙක් රෝගාතුරව සිටින්නේද ? ඔහු සභාවේ වැඩිමහල්ලන්ට හඬගසාවා ; ඔව්හු ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ඔහුට තෙල් ආලේපකොට, ඔහු උදෙසා යාච්ඤා කරත්වා. [15] එවිට ඇදහිල්ලේ යාච්ඤාවෙන් රෝගාතුරයාට සුවය ලැබේ, ස්වාමීන්වහන්සේ ඔහු නැගුටුවනවා ඇත....."**

දේව දරුවෙනි, ඉහත සඳහන් කොටස්වල **'සුවකිරීමේ දීමනාව'** සඳහන් නොවේ. ඒවාහි සඳහන් ලෙස පෙනී - යන්නේ රෝගීන් උදෙසා යාච්ඤාකිරීම, අප සැම දෙනාටම කළ හැකිවූද, අප විසින් කළ යුතුවූද වගකීමක් බවයි.

එබැවින් අප සැම දෙනා, දෙවියන්වහන්සේ අපට දී ඇත්තාවූ මේ උතුම් කැඳවීම භාරගෙන, <u>රෝගීන් උදෙසා ඇදහිල්ලෙන් යාච්ඤාකරමු</u>. (**මාර්ක් 11:24** අනුව, එම සුවය ලැබුණේ යයි අදහමින් යාච්ඤා කරන්න)

(ii) **සුව කිරීමේ දීමනාව භාවිතාකිරීම**

නිතර නිතරම බරපතල රෝගවලින් පෙළෙන්නාවූ අය ගැන අපට අසන්ට ලැබෙන්නාවූ මේ සමයේ, සුවකිරීමේ දීමනාව ලැබීම ඉමහත් ආශිර්වාදයකි. මේ අතරම මෙම දීමනාව ලබා ඇත්තාවූ අය වෙත පැමිණෙන ප්‍රබල පරීක්‍ෂාවන් නිසා, මා මෙම කොටස අරඹන්නේ එම පරීක්‍ෂා කිහිපයක් ඔබ ඉදිරියේ තබමිනි.

(a) උඩඟු බවට පත්වීම.

(b) රෝගීන් 'භාණ්ඩ' මෙන් සැලකීම නැතහොත් රෝගීන් ගැන කිසි හැඟීමක් නොමැතිව යාච්ඤා කිරීම.

(c) ලෞකික දේට ආශාවී, ධනවත් රෝගීන්ට විශේෂ සැලකිල්ල දක්වීම.

(d) දෙවියන්වහන්සේ වෙත වෙනුවට, තමන් වෙත ගෞරවය ලබා ගැනීමට පෙළඹීම.

(e) දීමනා තමා තුළින් නිදහස්වීම හේතුකොටගෙන, කිසි සූදානමක් නොමැතිව, දෙවියන්වහන්සේ සමග තමා ගතකරන්නාවූ කාලය පවා අතපසු කරමින් **'සුවකිරීමේ සේවයේ'** යෙදීම.

මාගේ ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී, දෙවියන්වහන්සේ ඔබට දී ඇත්තාවූ මේ දීමනාව, මලපතක් ලෙස යක්‍ෂයාට පාවිච්චි කිරීමට කිසිසේත් ඉඩ නොදෙන්න. මෙය උදෙසා ඉතා යටහත්ව පහත සඳහන් යෝජනා ඔබ ඉදිරියේ තබමි.

[A] රෝගීන් වෙත යේසුස්වහන්සේ දක්වූවාවූ අනුකම්පාව, සැලකිල්ල, සහ ප්‍රේමය, ඔබගේ හදෙහි වගුරුවන මෙන් සමිඳුන්ට නිතරම යදින්න.

[B] සෑම සුවවීමකදීම, දෙවියන්වහන්සේට සියලු ගෞරවය සහ මහිමය පුදන්න. සුවය ලැබූ අයගෙන්ද, එම අවස්ථාවේ එහි සිටියාවූ අන් සියලු දෙනාගෙන්ද එසේම කරන මෙන් ඉල්ලා සිටින්න.

[C] සෑම **'සුව මෙහෙයකටම'** ප්‍රථමයෙන් හැකිනම් නිරාහාර යාච්ඤාවේ යෙදී, ඔබගේ ජීවිතය, හදවත සහ අරමුණු නිවැරදි කරගන්න.

දේව දරුව, **මතෙව් 7:21-23** දක්වා සඳහන් වචන, යේසුස්වහන්සේ පැවසුවේ කවුරුන් ගැනද? කියා සිතා බලන්න.

**'සුවකිරීමේ දීමනාව'** වැරදි ලෙස භාවිතා කළ අයටද මෙම වචන සමහරවිට අදාල විය හැකි බව, ඔබටම වැටහෙනවා ඇත. කරුණාකර මෙවැනි අවාසනාවන්ත තත්ත්වයකට ඔබව ඇද දැමීමට යක්ෂයාට කිසිවිටක අවස්ථාවක් නොදෙන්න අධිෂ්ඨාන කරගන්න.

(iii) **මෙම දීමනාව ප්‍රකාශවීම තුළින් ඇතිවන්නාවූ ප්‍රතිඵල සමහරක්**

(a) දේව බලය රජවරුන් (බලධාරීන්) තේරුම්ගැනීම -

**නිදසුනක් වශයෙන් - සිරියේ රජුගේ සේනාපතියාවූ නාමන් සුවය ලැබීම - 2 රාජා 5:1-14**

කුෂ්ඨ රෝගයෙන් සුවය ලැබුවාවූ නාමන්ගේ වචන වූයේ, **'ඉතින් ඉශ්‍රායෙල්හි සිටින දෙවියන්වහන්සේ මිස මුළු පොළොවේ වෙන දෙවිකෙනෙක් නැති බව දැන් දනිමි' (2 රාජා 5:15)**

(b) තමාගේ පව්කාරකම මනුෂ්‍යයන් තේරුම්ගැනීම -

**නිදසුනක් වශයෙන් - බෙතෙස්දාවේ ඔත්පලව සිටි මනුෂ්‍යයෙක් සුවකරනු ලැබීම - යොහන් 5:1-9**

තිස්අට අවුරුද්දක් ඔත්පලව සිටි මෙම මනුෂ්‍යයාට, යේසුස්වහන්සේ පසුව පැවසූ වචන, එනම් **'තවත් පව් නොකරන්න' (යොහන් 5:14)** යන වචන, එම රෝගියාට ඔහුගේ පාපිෂ්ඨකම පෙන්වා දුන්නේය.

(c) මනුෂ්‍යයන් ඇදහිල්ලට පැමිණ ගැළවීම ලැබීම -

**නිදසුනක් වශයෙන් - උපන්දා පටන් අන්ධවූ මනුෂ්‍යයෙක් සුවකරනු ලැබීම - යොහන් 9:1-9**

උපන්දා පටන් අන්ධව සිටියාවූ මෙම මනුෂ්‍යයා, ඇදහිල්ලට පැමිණීමේ සිද්ධිය කරුණාකර කිවා බලන්න. **(යොහන් 9:35-38)**

මෙම හේතුව නිසා, ඉවැන්ජලිස්ත සේවයේ යෙදෙන්නන්ට **'සුවකිරීමේ දීමනාව'** අතිශයින් වැදගත්වේ. **යොහන් 3:1-26** දක්වා සඳහන් වන්නාවූ සුදර්ශන දොරටුව අසල සිටි කොරා සුවකරනු ලැබීම සහ ඉන් අනතුරුව පේත්‍රුස්ගේ කථාව හේතුකොටගෙන මනුෂ්‍යයන් 5000 ක් පමණ ඇදහිල්ලට පැමිණියහ **(ක්‍රියා 4:4)**.

එබැවින් ඉවැන්ජලිස්ත සේවයේ යෙදී සිටින්නාවූ සැමගෙන් මා යටහත්ව ඉල්ලා සිටින්නේ, **1 කොරි 2:4,5** සඳහන් වන්නාවූ වචන අනුව, ඔබගේ සේවය තුළ **'ආත්මයාණන්වහන්සේගේද බලයේද '** ප්‍රකාශවීම ඇතිකරන මෙන් සමිඳුන්ගෙන් යදින ලෙසයි.

(d) මනුෂ්‍යයන් සාතන්ගේ බලයෙන් නිදහස ලැබීම -

<u>**නිදසුනක් වශයෙන්**</u> **- කුදු ස්ත්‍රියක් සුවකරනු ලැබීම - ලූක් 13:11-17**

අවුරුදු 18 ක් **'දුර්වලකමේ ආත්මයක් '** මගින් කුදු බවට පත්ව සිටියාවූ මේ ස්ත්‍රිය **සාතන් විසින් බැඳ සිටි බව (ලූක් 13:16)** දේව වචනය පෙන්වාදෙයි. යේසුස්වහන්සේ සාතන්ගේ බැම්මෙන්/බලයෙන් ඇ නිදහස්කොට ඇ සුවපත් කළසේක.

**3. <u>ආශ්චර්යය කිරීම</u>**

**ආශ්චර්යය කිරීමේ දීමනාව යනු, යම්කිසි අවස්ථාවක ස්වභාවධර්මයේ නීතිවලට ඉහලින් ක්‍රියාකිරීම උදෙසා, දෙවියන්වහන්සේ විසින් ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් දේව දරුවෙකුට දෙන්නාවූ බලයයි.**

**මෙම දීමනාව තුළින් ඉටුවන්නාවූ සමහර දේ**

(a) දෙවියන්වහන්සේගේ ප්‍රේමය, කරුණාව සහ අනුකම්පාව මනුෂ්‍යයන්ට ප්‍රකාශවීම -

<u>**නිදසුන් වශයෙන්**</u>

(i) **නායින් නුවර කනවැන්දුම්යගේ පුතා මළවුන්ගෙන් නැගිටුවනු ලැබීම - ලූක් 7:11-17**

මෙම ආශ්චර්යය ක්‍රියාව යේසුස්වහන්සේ විසින් කරනු ලැබුවේ, කනවැන්දුම් ස්ත්‍රියකගේ එකම පුත්‍රයා මැරුණු අවස්ථාවේදීය. එදා සමාජයේ තිබුණු තත්ත්වය අනුව, තමාගේ එකම පුත්‍රයා මිය යැමෙන්, මෙම ස්ත්‍රිය වැටී සිටියේ අන්ත අසරණ තත්ත්වයකටය. අඬමින් තමාගේ එකම පුත්‍රයාගේ අවමංගල්‍යයට සහභාගිවෙමින් සිටියාවූ ඇය දුටු යේසුස්වහන්සේ තුළ ඇතිවූයේ මහත් අනුකම්පාවකි.

**ලූක් 7:13 :- "ස්වාමීන්වහන්සේ ඈ දුටු කළ <u>අනුකම්පා කොට</u> : අඬන්ට එපා යයි ඈට කීසේක."**

**ලූක් 7:14,15 :-" [14].... උන්වහන්සේ <u>යෞවනය නැගිට</u> - <u>පන්නැයි</u> <u>නුඹට</u> කියමියි <u>කීසේක</u>. [15].... උන්වහන්සේ <u>ඔහුගේ මෑණියන්ට ඔහු භාරදුන්සේක</u>."**

(ii) **භාරදහසකට කන්ට දීම - මතෙව් 15:32-38**

මෙම ආශ්චර්යය ක්‍රියාවද, යේසුස්වහන්සේ කළේ එම සමූහයා කෙරෙහි උන්වහන්සේගේ අනුකම්පාව නිසාය.

**මතෙව් 15:32 :- "මම සමූහයා කෙරෙහි <u>අනුකම්පා ඇත්තෙමි</u>, මක්නිසාද ඔව්හු <u>දැනට තුන් දවසක්</u> මා ළඟ සිටිති ; <u>ඔවුන්ට කන්ට කිසිත් නැත</u>. ඔවුන් <u>බඩගින්නෙන් හරින්ට නොකැමැත්තෙමි</u>, හැරියෙම් නම් මාර්ගයේදී <u>ඔවුන් ක්ලාන්තවෙන්ට පුළුවනැයි කීසේක</u>."**

දේව දරුව, අසරණකමට පත්වූ, කුසගින්නට පත්වූ, වේදනාවට පත්වූ ජනයා ගැන අනුකම්පාව ඔබගේ හදවතේ තිබෙනවාද? නොඑසේනම් ප්‍රේමයෙන් පිරුනාවූ, අනුකම්පාව ඇත්තාවූ, යේසුස්වහන්සේගේ මෙන් උණුවන්නාවූ හදවතක් ඔබට දෙන ලෙස සමිඳුන්ට අවංකව යදින්න.

එවිට උන්වහන්සේ එවැනි හදවතක් ඔබට දී, ඔබ තුළින් මහත් බලවත් ක්‍රියා කරනසේක් නම්, මවිතයට පත් නොවන්න !!

(b) මනුෂ්‍යයන් පසුතැවිලි වී, වැරදි දේ අතහැර දැමීම

<u>**නිදසුනක් වශයෙන්**</u>

**එපීසයේදී දෙවියන්වහන්සේ පාවුල්ගේ අත්වලින් ආශ්චර්‍යයන් කිරීම (ක්‍රියා 19:11.12) තුළින් මනුෂ්‍ය ජීවිත වෙනස්වීම (ක්‍රියා 19:18,19)**

**ක්‍රියා 19:11-20** දක්වා කියවන අපට පෙනීයන්නේ, දෙවියන්වහන්සේ පාවුල් තුළින් ආශ්චර්‍යයන් කිරීම තුළින්, එපීසයේ වැසියන් රිදී මිල 50,000 ක් වටිනා මන්ත්‍ර පොත් ගිනිතැබීමේ සිද්ධියය.

ඉවැන්ජලිස්ත සේවය තුළ **'බලයේ දීමනා'** මගින් දෙවියන්වහන්සේ සුවිශේෂ ප්‍රතිඵල ගෙන දෙන්නාවූ නොයෙක් අවස්ථා දේව වචනයේ සඳහන් වේ.

විනාශවන්නාවූ මනුෂ්‍යයන් ගැළවීම වෙත ගෙනඒම උදෙසා, **'බලයේ දීමනා'** සභාව මත වගුරුවන ලෙස අප නිරන්තරයෙන්ම සමිඳුන්ට යදිමු.

**මෙම අධ්‍යයනය කියෙව්වාවූ ඔබ සැම,**

**දෙවියන්වහන්සේගේ බලයේ දීමනා අත්දකිමින්,**

**'ඇදහිල්ලේ යාච්ඤාවේ' යෙදෙමින්,**

**තමන්වහන්සේගේ රාජ්‍යයේ වර්ධනය උදෙසා**

**දෙවියන්වහන්සේ පාවිච්චි කරන සේක්වා !!!**

සටහන්

.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................
.....................................................................................

සටහන්

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................


..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

# දේව සේවය උදෙසා දීමනා



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 08

<u>**හැඳින්වීම**</u> **:-**

පසුගිය අධ්‍යයනයන් පහ තුළ අපගේ මාතෘකාව වූයේ **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා'** යන්න වන අතර, අපගේ අවධානය යොමු කරනු ලැබුවේ **1 කොරි 12:8-10** දක්වා සඳහන් වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා නවය වෙතයි. මෙම අධ්‍යයනයෙන් අප පිවිසෙන්නේ ත්‍රිඑක දෙවි සමිඳුන් සභාවට ප්‍රධානය කර ඇත්තාවූ, **රෝම 12:6-8, 1 කොරි 12:28, 1 පේත්‍රුස් 4:11** යන බයිබල් කොටස් වල සඳහන් වන්නාවූ, **'දේව සේවය උදෙසා දීමනා'** දෙස බැලීමටයි.

(a) එබැවින් අප විසින් ප්‍රථමයෙන්ම කළයුතු දෙයක් වන්නේ, මේ පද වල සඳහන් වන්නේ දේව දරුවන් ලබන තවත් **'දීමනා'** බව පෙන්වාදීමයි.

**රෝම 12:6 :- " එහෙයින් අපට දෙන ලද අනුග්‍රහය ලෙස <u>වෙන වෙන දීමනා ඇත්තාවූ අපට ලැබුණේ</u> ...."**

**1 පේත්‍රුස් 4:10 :- "දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් <u>එකිනෙකාට ලැබුණු දීමනාවේ</u> හැටියට එයින් එකිනෙකාට සේවය කරපල්ලා."**

**1 කොරි 12:28** වන පදයෙහි, ප්‍රේරිතයන්, අනාගත - වක්තෘවරුන්, ගුරුවරුන්, ආශ්චර්යය කරන්නන්, සුවකිරීමේ දීමනාව, උපකාර, ආණ්ඩු සහ නානා වර්ග භාෂා දෙවියන්වහන්සේ සභාවේ පිහිටුවන බව සඳහන් වෙයි.

මෙහි මෙසේ සඳහන් **'දීමනා'** අටෙන් තුනක් වන්නාවූ ආශ්චර්යය කිරීම, සුවකිරීමේ දීමනාව සහ නානා වර්ග භාෂා යන දීමනා තුන, **1 කොරි 12:8-10** දක්වා සඳහන් වන්නාවූ **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා'** නවයට ඇතුලත් වන බව අප දනිමු. එබැවින් ඉතිරි පහද දෙවියන්වහන්සේ සභාව තුළ පිහිටුවන්නාවූ දීමනා බව නිගමනය කිරීම වැරදි නොවේයයි සිතමි.

(b) අපගේ මීළඟ පියවර වන්නේ, ඉහත සඳහන් බයිබල් කොටස්වල ඇතුලත් වන්නාවූ, **1 කොරි 12:8-10 සහ එපීස 4:11** යන බයිබල් කොටස්වල සඳහන් නොවන්නාවූ, දීමනා ලැයිස්තුවක් සාදා ගැනීමයි.

**රෝම 12 : 6-8 හි සඳහන් එවැනි දීමනා**

(i) සේවය
(ii) ඉගැන්වීම
(iii) උපදෙස් දීම
(iv) දීම
(v) ආණ්ඩු කිරීම (**1 කොරි 12:28** ද සඳහන් වේ)
(vi) කරුණාව පෙන්වීම

**1 කොරි 12:28 හි සඳහන් එවැනි දීමනා**

(vii) උපකාර කිරීම

**1 පේත්‍රුස් 4:11 හි සඳහන් එවැනි දීමනා**

(viii) කථා කිරීම

මෙම අධ්‍යයනය ඉහත සඳහන් දීමනා අටට අප සීමා කරන නමුත්, ඒවාට අමතරව තවත් **'දේව සේවය උදෙසා දීමනා'** කිහිපයක් දේව වචනයේ තිබෙන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

(c) **1 කොරි 12:4-6** දක්වා සඳහන් වන්නාවූ, ත්‍රිඑක දෙවියන්වහන්සේ සභාවේ වර්ධනය උදෙසා සභාවට දී ඇත්තාවූ **දීමනා, සේවය කිරීම්** සහ **ක්‍රියා කිරීම්** ඔබ ඉදිරියේ තැබීම අප ගන්නා තෙවැනි පියවරයි.

**1 කොරි 12:4 :- "නානාප්‍රකාර දීමනා ඇත්තේය, නුමුත් එක ආත්මයාණන්වහන්සේය."**

**1 කොරි 12:5 :- "නානාප්‍රකාර සේවය කිරීම් ඇත්තේය, නුමුත් එක ස්වාමීන්වහන්සේය."**

**1 කොරි 12:6 :- "නානාප්‍රකාර ක්‍රියාකිරීම් ඇත්තේය, නුමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන් - වහන්සේය."**

මේ අයුරින් **දීමනාද, සේවයකිරීම්ද, ක්‍රියාකිරීම්ද** සහාවට ලබාදෙන්නේ අපගේ එකම දෙවියන්වහන්සේ බව තේරුම්ගනිමින්, මෙම අධ්‍යයනයට ඇතුල් වෙමු.

**අධ්‍යයනය :-**

## 1. දේව සේවය උදෙසා ඇති දීමනා පැහැදිලි කිරීම

(i) සේවය

**රෝම 12:7 :- "සේවය නම් අපගේ සේවයෙහි යෙදී සිටිමු...."**

**1 පේත්‍රුස් 4:11 :- "....යමෙක් සේවය කෙරේ නම්, දෙවියන්වහන්සේ සපයාදෙන ශක්තියේ ප්‍රකාර සේවය කරාවා....."**

මෙම පද දෙක අපට උගන්වන්නේ, දෙවියන්වහන්සේ අපට පවරා ඇත්තාවූ සේවය විශ්වාසවන්තව, අත්නොහරිමින්, දෙවියන්වහන්සේ අපට සපයා දෙන්නාවූ ශක්තියෙන් කිරීමේ වැදගත්කමය. එසේ කිරීම උදෙසා අප ගත යුතු පියවර වන්නේ,

- දෙවියන්වහන්සේ අපට පවරන්නාවූ සේවය කුමක්ද කියා, උන්වහන්සේගේ මඟපෙන්වීම ලබා ගැනීම.
- එම සේවය කුමක් වුවත්, එය උන්වහන්සේට අප කරන්නාවූ සේවයක් බව තේරුම්ගනිමින්, හැකි තරම් හොඳට අපගේ උසස්ම මට්ටමට එම සේවයේ යෙදීම.
- කෙතරම් බාධා, ප්‍රශ්න, විවේචන පැමිණියත් විශ්වාස - වන්තව එම සේවය කරගෙන යෑම.
- ඔබගේ ශක්තිය නොව දෙවියන්වහන්සේගේ ශක්තිය මත රඳා පවතිමින් එම සේවයේ නිරත වීම.

දේව දරුව, ඉහත සඳහන් පියවර ගනිමින් දෙවියන්වහන්සේ ඔබට පවරා ඇත්තාවූ සේවය, කිසිවිටක අත් නොහරින්න.

මෙහි සඳහන් **'සේවය'** කුමක්ද? කියා පහත සඳහන් අයුරින් විස්තර කිරීමට කැමැත්තෙමි.

**මෙම සේවය යනු, සභාවට හෝ එහි සාමාජිකයින්ට අවශ්‍ය වන්නාවූ ඕනෑම සේවයකි.**

**<u>නිදසුනක් වශයෙන්</u> -**

**ස්තේපන්ට පැවරුනු සේවය - ක්‍රියා 6:1-5**

සභාවේ ආරම්භයේදී, සභාවේ සිදුවුනාවූ එක් සේවයක් ගැන කෙඳිරිගෑමක් ඇතිවුනි. එය විසඳීම උදෙසා ප්‍රේරිතයන් දොළොස්දෙනා ගත් පියවර වූයේ, **'මේසවල සේවය කිරීම'** උදෙසා -

**'යහපත් යයි ප්‍රසිද්ධවූ, ආත්මයෙන්ද, ප්‍රඥාවෙන්ද පූර්ණවූ මනුෂ්‍යයන් සත්දෙනෙකු' (ක්‍රියා 6:3)** පත් කිරීම විය.

ඒ අනුව සභාවේ ප්‍රථම වේදසාක්ෂිකයා වන්නාවූ ස්තේපාන් නිල වශයෙන් කළාවූ **'සේවය'** වූයේ සභාවේ අවශ්‍යතාවය අනුව ආහාර සාධාරණව බෙදාදීමයි.

සභාවට අවශ්‍යවන්නාවූ සේවයන් වැඩිදුරටත් තේරුම්-ගැනීම උදෙසා **රෝම 16:1-23** දක්වා බලමු. මෙම කොටසේ විවිධාකාර සේවයන් කළාවූ බොහෝ දෙනෙක් සඳහන් වන අතර, ඔවුන්ගෙන් සමහරෙක් මෙසේය.

**1. රෝම 16 : 1, 2 :- ෆේබී**

ෆේබී කෙංක්‍රයේ සභාවේ මෙහෙකාරියක් විය. **"ඈ බොහෝ දෙනෙකුගේද මාගේද උපකාර කාරියෙක්ව සිටියාය."(රෝම 16:2).** පාවුල්තුමා මෙහි සඳහන් කරන්නේ, ෆේබී යන මෙහෙකාරිය <u>සැමදෙනාට උපකාර කිරීමට සූදානම්ව සිටි බවයි</u>.

දේව දරුව, ඔබ නමස්කාර කරන්නාවූ සභාව ගැන මොහොතක් සිතන්න. එහි ඔබගේ **'උපකාරය'** අවශ්‍යවන්නාවූ කිසිවෙක් සිටිනවාද? ඔවුන්ට උපකාර කිරීමට දෙවි සමිඳුන් ඔබව පොළඹනවාද?

**1 කොරි 12:28** හි සඳහන් වන්නාවූ **'උපකාර කිරීම'** අපට ලැබිය හැකි දීමනාවක් බව තේරුම්ගන්න. (මෙහි සඳහන් වන්නේ මුදලින් / ආර්ථික උපකාර නොවේ)

මෙසේ උපකාර කිරීමේ සේවයේ යෙදෙන්නවුන්ට සභාවෙන් වැඩි සැලකිල්ලක් නොලැබෙන්නට පුළුවන. නමුත් දෙවි සමිඳුන් එම සේවය දකින සේක, අගය කරන සේක.

**2. රෝම 16 : 3, 4 :- ප්‍රිස්කා සහ අකිලා**

පාවුල්තුමා ඔවුන් ගැන **"..... මාගේ ජීවිතය උදෙසා බෙල්ල දුන්නාවූ...." (රෝම 16:3)** ලෙස සඳහන් කිරීමෙන් අපට පෙනීයන්නේ, සෑම පීඩාවක්ම මැද පවා ඔවුන් දෙදෙනා පරිත්‍යාගයෙන් සහ කැපවීමෙන්, තම ජීවිත ගැන නොසලකා , ඔහු සමඟ සේවය කළ බවයි.

ඔවුන් මේ අයුරින් කළාවූ කැපකිරීම ගැන පාවුල්තුමා තම ස්තුතිය පිරිනැමීම, **රෝම 16:4** වන පදයෙහි අප දකිමු.

**3. රෝම 16 : 6 :- මරියා**

මරියා කළ සේවය මෙහි විස්තර කරනු නොලබන නමුත්, ඇ රෝම සභාව උදෙසා බොහෝ වෙහෙස දූරූ බව මෙම පදයේ සඳහන් වෙයි.

**4. රෝම 16 : 9 :- උර්බානස්**

උර්බානස් හවුල් සේවකයෙක් ලෙස ක්‍රියා කළා.

**5. රෝම 16 : 12 :- ත්‍රාපේනා සහ ත්‍රාපෝසා**

මොවුන් දෙදෙනා ස්වාමීන්වහන්සේ තුළ වැඩ කළා.

**6. රෝම 16 : 12 :- පර්සිස්**

පර්සිස් ස්වාමීන්වහන්සේ තුළ බොහෝ වෙහෙස දූරුවා.

**7. රෝම 16 : 22 :- තර්තියස්**

පාවුල් වෙනුවෙන්, රෝමවාසීන්ට මෙම ලියුම ලියන ලද්දේ තර්තියස් විසිනි. තම ඇස්වල තිබුනාවූ දුර්වලකමක් නිසා, පාවුල්තුමාට ලිවීම අපහසු කාරියක් විය. තර්තියස් කලාවූ සේවය වූයේ, පාවුල් උදෙසා මෙම ලිපිය ලිවීමයි.

## 8. රෝම 16 : 23 :- ගායස්

ගායස්ගේ සේවය වූයේ මුළු සභාවට <u>ආගන්තුක සත්කාරය</u> කිරීමයි.

ප්‍රේමණීය දේව දරුව, ඔබ තවම ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා අධික ලෙස අත්දැක නොතිබෙන්නට පුළුවන. මෙනමුත් මේ දේ තේරුම්ගන්න. දෙවියන් - වහන්සේ ඔබව උන්වහන්සේගේ දරුකමට ඇතුල්කර ඇත්තේ උන්වහන්සේට සේවය කිරීම පිණිස වන අතර, උන්වහන්සේ ඔබව සේවයේ යොදන්නාවූ, ප්‍රමුඛ ස්ථානයක් වන්නේ ඔබගේ සභාවේ, ඔබගේ සහෝදර ඇදහිලිවන්තයින් අතරයි.

එම සභාවේ විවිධාකාර නිලතල ඔබ දරුවත් නොදරුවත් **රෝම 16 වන පරිච්ඡේදයේ** අප දකින ආදර්ශ අනුගමනය කිරීමට තීරණය කරන්න. මෙසේ දෙවියන්වහන්සේ ඔබව පොළඹවන සේවයෙහි ඔබ නිරත වන අතර, උන්වහන්සේ එම සේවයද, ඔබවද අනර්ග අන්දමින් පාවිච්චි කරනවා ඇත.

**1 පේත්‍රුස් 4:10 :- "…. එකිනෙකාට <u>ලැබුණු දීමනාවේ හැටියට</u> එයින් <u>එකිනෙකාට සේවය කරපල්ලා</u>.**

(ii) <u>ඉගැන්වීම</u>

**රෝම 12:7 :- "….උගන්වන්නා තමාගේ ඉගැන්වීමටත් ….. <u>භාරවේවා</u>."**

සභාවේ ඉගැන්වීම උදෙසා කැඳවනු ලැබූ අයට දේව වචනය පවසන්නේ, **'හොඳට උගන්වන්න'** කියා නොවේ, **'ඉගැන්වීමට කැපවෙන්න'** කියාය.

දේව දරුව, දෙවියන්වහන්සේ ඔබව ඉගැන්වීම උදෙසා කැඳවා තිබෙනසේක් නම්, ඔබගේ ඉගැන්වීම ඔබ ඉටු කළ යුතු යුතුකමක් ලෙස නොව, එය **දෙවියන්වහන්සේ ඔබට භාර දුන් අති උතුම් කැඳවීමක්** ලෙසයි. එසේ එය භාරගෙන ඊට කැපවෙන්න.

එබැවින් ඔබගෙන් ඉගෙනුම ලබන අය උදෙසා,

- නිතර යාච්ඤා කරන්න.
- ඔවුන්ට ප්‍රේම කරන්න.
- අවශ්‍යවූ විට ඔවුන්ට උපකාර කරන්න.
- ඔවුන්ට ආදර්ශයක් වන්න.
- ඔබත් තව තවත් ඉගෙන ගන්න.

**ඔබ උගන්වන්නාවූ දේ, ප්‍රථමයෙන්ම ඔබගේ ජීවිතයේ සත්‍යයක් විය යුතුම බැවින්, අන් අයට ඔබ උගන්වන දේ අනුව ජීවත්වීමට සැමවිටම වගබලා ගන්න.**

දෙවියන්වහන්සේ සමහරුන් ඉගැන්වීම උදෙසා කැඳවන අතර, උන්වහන්සේ විවිධාකාර ඉගැන්වීමේ අවස්ථා සභාව තුළ තබා ඇති සේක. ඒවායින් සමහරක් වන්නේ,

(i) එක්කෙනෙක් හෝ දෙදෙනෙක් තමාගේම ගෝලයන්/ ආත්මික දරුවන් සේ තෝරාගනිමින්, ඔවුන්ව ආත්මික ගැඹුර කරා ගෙන යෑම.

**(2 තිමෝති 2:1,2** හි, පාවුල්තුමා තම **'දරුවා'** වූ තිමෝතියස්ට දෙන උපදෙස් කියවා බලන්න)

(ii) සබත් පාසැලේ හෝ සභාවේ නිවාස කණ්ඩායමක හෝ සෙල කණ්ඩායමක් වැනි කුඩා කණ්ඩායමක ඉගැන්වීම.

(iii) සභාවේ බයිබල් අධ්‍යයනයකට නායකත්වය දෙමින් ප්‍රාදේශීය සභාවක දේව වචනය ඉගැන්වීම.

(iv) දේව ධර්ම විද්‍යාලයක කථිකාචාර්යවරයෙකු ලෙස දේව ධර්ම ශිෂ්‍යයන්ට ඉගැන්වීම.

(v) තමාගේම දරුවන්ට දෙවියන්වහන්සේ ගැන ඉගැන්වීම.

**ඉගැන්වීමේ වැදගත්කම**

කිතුනු සභාවේ වර්ධනය රඳා පවතින්නාවූ ඉතා වැදගත් කේන්ද්‍රස්ථානයක් වන්නේ නිවැරදි ඉගැන්වීමයි. එබැවින් මෙය කියවන්නාවූ ඔබ සැම, ඉගැන්වීමේ වැදගත්කම තදින් වටහාගෙන, ඔබගේ ප්‍රාදේශීය සභාව ඒ අනුව ක්‍රියා කිරීමට යොමුවේ යයි අපේක්ෂාකරමින්, පහත සඳහන් කරුණු ඔබ ඉදිරියේ තබමි.

(a) **දේව වචනය සභාවට අනුශාසනා කරන්නේ, සභාවේ නායකයන් පත්කරන විට, 'උගන්වන්ට සමර්ථ' අය පත්කරන්ට කියාය.**

**1 තිමෝති 3:1,2 :- " [1] යමෙක් සභාවේ නායක තනතුර ලබන්ට ආශාවන්නේ නම් ..... [2] <u>උගන්වන්ට සමර්ථ වූ කෙනෙක්ව සිටින්ට ඕනෑය</u>."**

**තීතස් 1:9:- "තවද ඔහු සාරවත් ගුරුකමින් අවවාද කරන්ටත් විරුද්ධවාදීන් නිශ්ශබ්ද කරන්ටත් පුළුවන් වන පිණිස <u>ඉගැන්වීමට එකඟවූ විශ්වාස වචනය තදින් අල්ලාගෙන සිටින්ට ඕනෑය</u>."**

මෙම පද අපට පෙන්වාදෙන්නේ, සභාවේ නායකත්වය දැරීම උදෙසා අප පත්කරන්නාවූ සැම දෙන, උගන්වන්ට සමර්ථවූ, දේව වචනය තදින් අල්ලා සිටින්නාවූ **(ඒ අනුව ජීවත්වන්නාවූ)** අය වීමේ අත්‍යාවශ්‍යකමය.

දේව දරුවෙනි, දේව වචනයට අනුකූලව අපගේ නායකයන් පත් කිරීමට තීරණය කරමු !

(b) **ආත්මික මේරීමට පත්ව සිටින සැම දෙනාම, විශ්වාසවන්ත ගෝලයන් බිහිකිරීමේ වැදගත්කම තේරුම්ගනිමින්, එම සේවයේ යෙදෙමු.**

**2 තිමෝති 2:2 :- "බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි [2]<u>නුඹ</u> [1]<u>මාගෙන්</u> ඇසූ දේම, [4]<u>වෙන අයටත්</u> උගන්වන්ට සමර්ථ වූ [3]<u>විශ්වාස වූ මනුෂ්‍යයන්ට</u> භාරදීපන්න."**

මෙම පදයේ 1,2,3,4 ලෙස සලකුනු කර ඇති වචන අපට පෙන්වාදෙන්නේ, පාවුල්ගේ ආත්මික තේරුම්ගැනීම, ඔහු මගින් තව **'පරම්පරා'** 3 ක් වෙත ගලා ගිය තුන් ආකාරයයි. එනම් -

| |
|---|
| පාවුල්→තිමෝතියස්→විශ්වාසවූ මනුෂ්‍යයන්→ වෙන අය |

දේව දරුවෙනි, මෙම කදිම ගෝලයන් බිහිකිරීමේ සැලැස්ම අපගේ ප්‍රාදේශීය සභාවන්වල අනුගමනය කරමු.

(c) **සෑම කිතුනු නිවසකම ('පවුලේ යාච්ඤාව' පවත්වමින්) පියවරුන් තම දරුවන්ට, අපගේ දෙවි පියාණන්වහන්සේ ගැන, ඉගැන්වීම.**

මේ පිළිබඳව පරණ ගිවිසුමේ සඳහන් පද කිහිපයක් දෙස බලමු.

**ද්විතීය කථාව 4:9 :-**
**"නුඹේ ඇස්වලින් දුටු දේවල් නුඹට මතක නැති නොවන පිණිසත් නුඹේ ජීවිතයේ සියලු දවස්වල ඒවා නුඹේ සිතෙන් පහ නොවන පිණිසත් බලාගෙන, නුඹේ ආත්මය ප්‍රවේසමෙන් ආරක්ෂා කර ගනින්න. ඒවා නුඹේ පුත්‍රයන්ටද නුඹේ පුත්‍රයන්ගේ පුත්‍රයන්ටද දන්වාපන්න."**

**ද්විතීය කථාව 6:7 :-**
**"ඒවා නුඹේ දරුවන්ට හොඳාකාර උගන්වා, නුඹ ගෙයි හිඳින කලද මග යන කලද නුඹ සයනය කරන කලද නැගිටින කලද ඒවා ගැන කථා කරපන්න."**

**ද්විතීය කථාව 11:20 :-**
**"නුඹ ගෙදර ඉන්න විටත් මාර්ගයෙහි යන විටත් නුඹ නිදාගන්න විටත් නැගිටින විටත් ඒවා ගැන කථා කරමින්, ඒවා නුඹලාගේ දරුවන්ට උගන්වාපල්ලා."**

**<u>මාගේ ප්‍රේමණීය කිතුනු නායකයෙනි, අන් අයට උගන්වන අප සැම, අපගේ දරුවන්ට දෙවි සමිඳුන් ගැන ඉගැන්වීම අතපසු නොකරමු</u> !**

(iii) <u>උපදෙස් දීම</u>

**රෝම 12:7 :-**
**".....උපදේශ දෙන්නා තමාගේ උපදේශ දීමටත් <u>භාරවේවා</u>."**

උගන්වන්නාට මෙන්ම උපදේශ දෙන්නාටද දෙනු ලබන්නාවූ අනුශාසනාව වන්නේ තමාට පැවරී ඇත්තාවූ මෙම සේවයට **'භාරවෙන්ට'** කියාය. මෙසේ පවසනු ලබන්නේ මෙම සේවයේ ඇති වැදගත්කම නිසාය.

ඕනෑම කිතුනු සභාවක විවිධාකාර අන්දමේ උපදෙස් සහ මඟපෙන්වීම අවශ්‍ය වන්නාවූ බොහෝ දෙනෙක් සිටිති. ඔවුන්ට අවශ්‍ය වන්නාවූ මගපෙන්වීම,

- තම දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව
- තමාගේ රැකියාව පිළිබඳව
- තමාට සුදුසු සහකාරයෙක්/සහකාරියක් පිළිබඳව
- ආර්ථික ගැටලුවක් පිළිබඳව
- ආත්මික දේ පිළිබඳව
- දේව කැමැත්ත පිළිබඳව

යනාදිය සහ තවත් බොහෝ දේ පිළිබඳව, ඉතා පුළුල් පරාසයක විහිදී තිබෙනු ඇත. එබැවින් උපදෙස් දෙන්නා, නිසැකවම **ආත්මිකව මේරූ,** ඉතා **අවංකවූ,** මනුෂ්‍යයන්ට **උපකාර කිරීමේ හදවතක් ඇත්තාවූ,** <u>දේව වචනය සමග එකඟ නොවන උපදෙස් කිසිවිටක නොදෙන්නාවූ</u>, දේව දරුවෙක් විය යුතුවේ.

දේව දරුව, ඉහත සඳහන් ගතිගුණ ඔබට ඇත්නම්, මෙම ඉතාමත්ම වැදගත් වන්නාවූ සේවය පිළිබඳව ඔබගේ කැඳවීම දෙවි සමිඳුන්ගෙන් විමසන්න. මෙම සේවය උදෙසා ඔබගේ සභාවේ කිහිප දෙනෙක් කැඳවන ලෙසද සමිඳුන්ගෙන් ඉල්ලා සිටින්න.

(iv) <u>දීම</u>

**රෝම 12:8 :- "..... දෙන තැනැත්තේ ත්‍යාගවන්තකමෙන්ද .... එසේ කෙරේවා."**

දුප්පත් පොහොසත් බේදයකින් තොරව, සෑම කිතුනුවෙක්ම දේව රාජ්‍යය උදෙසා දිය යුතුවේ. අපගේ දෙවිවූ, අපගේ පියාණන්වහන්සේ, උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයා අපට දුන්සේක. උන්වහන්සේගේ දරුවන් වන්නාවූ අපද එලෙසම දිය යුතු අතර, අප සතුටු සිතින් එසේ කළ යුතුවේ.

**2 කොරි 9:7 :- "කනගාටුවෙන්වත් ඕනෑම නිසාවත් නොව එක් එක්කෙනා තම තමාගේ සිතින් නියමකරගත් ලෙස දේවා. මක්නිසාද සතුටු සිතින් දෙන්නාට දෙවියන්වහන්සේ ප්‍රේමකරන සේක."**

මේ අතර දෙවි සමිඳුන් සමහරුන් **'දීමේ සේවයට'** කැඳවා දේව රාජ්‍ය උදෙසා නොමසුරුව, අධිකලෙස වැපිරීමේ හදවතක් ඔවුන්ට දෙන සේක.

දේව දරුව, මෙවැනි හදවතක් ඔබ තුළ දෙවියන්වහන්සේ දමා ඇති සේක්නම්, උන්වහන්සේගේ පෙළඹීම අනුව, <u>යටහත්කමින් ක්‍රියා කරන්න</u>. <u>රහසින් **නොමසුරුව දෙන්න**</u>**. දසයෙන් කොටස අධිකව ඉක්මවා දෙන්න. (මතෙව් 6:3,4 කියවා බලන්න)**

(v) <u>ආණ්ඩුකිරීම</u>

**රෝම 12:8:- "…..ආණ්ඩුකරන තැනැත්තේ උනන්දු - කමෙන්ද …. එසේ කෙරේවා."**

'ආණ්ඩුකිරීම' **රෝම 12:8** හි සහ **1 කොරි 12:28** හි සඳහන් වන අතර, ඉංග්‍රීසි පරිවර්තනයේ (NIV) මෙය උදෙසා භාවිතා කර ඇති වචන දෙකක් වේ. එනම් **රෝම 12:8** හි එය LEADERSHIP ලෙසද **1 කොරි 12:28** හි එය ADMINISTRATION ලෙසද සඳහන් වේ.

මෙම සේවය, සභාවේ විවිධ ක්‍රියාවන් පිළිබඳව, දෙවියන්වහන්සේ දෙන්නාවූ දර්ශන එම ඉලක්ක කරා ගෙන යෑමට අවශ්‍ය නායකත්වය සහ පරිපාලනය ලබා දීමේ සේවය ලෙස හැඳින්විය හැක. (නෙහෙමියා යෙරුසලමේ පවුර ප්‍රතිසංස්කරණ කිරීම උදෙසා නායකත්වය දුන් ආකාරය - **'නෙහෙමියා අධ්‍යයන'** කියවා තේරුම්ගන්න)

(vi) <u>කරුණාව පෙන්වීම</u>

**රෝම 12:8 :- "…..කරුණාව පෙන්වන තැනැත්තේ ප්‍රසන්න ලීලාවෙන්ද එසේ කෙරේවා."**

**<u>නිදසුනක් වශයෙන්</u>**

අපගේ සභාවේ එක් සහෝදරියක්, ඇයගේ සේවයේ කොටසක් ලෙස ස්වේච්ඡාවෙන් භාරගෙන තිබෙන්නේ, අඩු වයසේ වැන්දඹුවන් බවට පත්වුනු අයට කරුණාව පෙන්වමින් ඔවුන්ට සැනසීම සහ ශක්තිය ගෙන දීමය.

මෙය උදෙසා ඈ නිතරම ඔවුන් බලන්ට යෑමටත්, දිරිමත් කිරීමටත්, ඔවුන් සමග යාච්ඤාකිරීමටත් කැපවී වසරක් පාසා වසරක් එසේ කර ගෙන යන්නේ, ඉතා සතුටිනි.

දේව දරුවෙනි, ඔබගේ සභාවේ දුක්වෙන්නන් උදෙසා ඔබට කළ හැක්කේ කුමක්ද? කියා සිතා බලන්න.

(vii) <u>උපකාර කිරීම</u>

**1 කොරි 12:28 :- "…..උපකාරද…..සභාවෙහි පිහිටෙවූ සේක."**

මෙම සේවය වැඩි දුරට තේරුම්ගැනීම උදෙසා **රෝම 16:2** හි පේබී නැමැති මෙහෙකාරිය ගැන සඳහන් **'ඈ බොහෝ දෙනාගේද මාගේද උපකාර කාරියෙක්ව සිටියාය.'** යන වචන මෙනෙහි කරන්න.

මෙහි සඳහන් අයුරින්, **'බොහෝ දෙනෙකුට'** උපකාර කිරීම ඉතා දුෂ්කර කාර්යයකි. මෙනමුත් ඉතා විශ්වාසවන්තවද, මහත් ඉවසිල්ලෙන්ද ඈ එසේ කළ බව නිසැකය.

(viii) <u>කථා කිරීම</u>

**1 පේත්‍රුස් 4:11 :- "යමෙක් කථා කෙරේ නම්, දෙවියන්වහන්සේගේ වාක්‍ය වශයෙන් කථා කරාවා ; ……"**

දේව දරුව ඔබගේ **'කථා කිරීම'** දේශකයෙක් ලෙස, ගුරුවරයෙක් ලෙස, උපදෙස් දෙන්නෙක් ලෙස, සභාවට අලුතෙන් පැමිණි කෙනෙක් පිළිගන්නා කෙනෙක් ලෙස, යනාදිය වන්ට පුළුවන.

**1 පේත්‍රුස් 4:11** අනුව, අප මේ හැම අවස්ථාවකම **'දෙවියන්වහන්සේගේ වාක්‍ය'** කථා කරන්නෙක් මිස, අපගේම විවිධාකාර අදහස් ප්‍රකාශකරන්නෙක් ලෙස ක්‍රියා නොකිරීමට වග බලාගනිමු.

**සැමවිටම 'දෙවියන්වහන්සේගේ වාක්‍ය' නොහොත් දෙවියන්වහන්සේගේ වචනයට එකඟව කථා කරමු !**

❖ දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනා නවය (**1 කොරි 12:8-10**) තුළින් ඉටුවුනාවූ සේවය අති විශාල වේ.

**ඒවායින් සමහරක් වන්නේ,**

- මනුෂ්‍යයන් තුළ ඇදහිල්ල ඇති කිරීම (**සුව කිරීමේ දීමනාව, දැනගැනීමේ වචනය, ධර්මවාක්‍ය කීම, ආශ්චර්යය කිරීම**)
- එම ඇදහිල්ල වර්ධනය කිරීම (**ප්‍රඥාවේ වචනය, ඇදහිල්ල**)
- නොඇදහිලිවන්තයන්ට ලකුණක් වෙමින්, ඔවුන් තුළ ඇදහිල්ල ඇතිකිරීම (**නානා වර්ග භාෂා, භාෂා තේරුම්කර දීම, සුවකිරීමේ දීමනාව**)
- සභාව ' වැරදි ආත්මවලින් ' ආරක්ෂා කිරීම (**ආත්මවල් විමසීම**)
- දේව බලය මනුෂ්‍යයන් දැකීම (**ඇදහිල්ල, ආශ්චර්යය කිරීම, සුව කිරීම**)

මෙසේ අති මහඟු සේවයක් ඉටුවන අතර ඒවායින් සිදුවිය හැකි සෘණාත්මක ප්‍රතිඵලයක් වන්නේ, බොහෝ මනුෂ්‍යයන් එම දීමනා ලබා දුන්නාවූ දෙවි සමිඳුන් වෙතටත් වඩා, එම දීමනා ඇත්තාවූ දේව දරුවන් කෙරෙහි අවධානය යොමු කිරීමට පෙළඹීමයි.

❖ මෙම අධ්‍යයනයෙහි අප අවධානය යොමු කළාවූ **'දේව සේවය උදෙසා දීමනා'** වෙත වන අතර ඒවා තුළින් ඉටුවන්නේද මහඟු සේවයක් බව අප දුටිමු.

**ඒවායින් ඉටුවන්නාවූ ප්‍රධානතම ප්‍රතිඵලයක් වන්නේ, <u>දෙවියන්වහන්සේගේ ප්‍රේමය සභාව තුළ වර්ධනය වීමයි</u>. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන්නාවූ සභාවේ <u>සාමාජිකයන් ප්‍රේමයෙන් එකට බැඳීමයි</u>. ඔවුන් <u>යටහත්කමින් එකිනෙකාට සේවය කිරීමයි</u>. (1 පේත්‍රුස් 4 : 10,11)**

මෙනමුත්, මෙම සේවාවන් වල යෙදෙනවුන්ට සාමාන්‍යයෙන් කිසි පිළිගැනීමක් හෝ අගයකිරීමක් නොලැබෙයි. එබැවින් මෙම දීමනා වලට වඩා **'දුර්වලවූ අප'** වඩා ආශාකරන්නේ, **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා'** වලටයි.

දේව දරුවෙනි මෙය වටහාගන්න. **'දේව සේවය උදෙසා දීමනා'** භාවිතාකරමින් සේවය කරන්නා, **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා'** ඇත්තාවූ දේව දාසයාට **කිසිසේත් දෙවැනි නොවේ.**

අප සමිඳුන් ලොව වැඩියේ, **'සේවය ලබන්ට නොව සේවය කිරීමටය.'** උන්වහන්සේ පැවසූ වදන් සිතට ගනිමින් අප **'දේව සේවය උදෙසා දීමනා'** භාවිතාකරමින් **අන් අයට සේවය කරමු**.

**ලූක් 22:26 :-**
**''නුඹලා අතරෙත් වඩා උත්තමයා බාලයා මෙන් වේවා ; ප්‍රධානයා උපස්ථාන කරන්නා මෙන් වේවා.''**

**ලූක් 22:27 :-**
**''....නුමුත් මම වනාහි නුඹලා මධ්‍යයෙහි උපස්ථාන කරන්නා මෙන් වෙමි.''**

**ප්‍රේමණීය සහෝදරයා සහෝදරී,**

**මෙම අධ්‍යයනය ඔබ සැම**

**ප්‍රේමයෙන් එකට බැඳී,**

**යටහත්ව එකිනෙකාට සේවය කිරීම උදෙසා**

**අභියෝගයක් වේවා !!**

# ක්‍රිස්තුස්වහන්සේ සභාවට දුන් දීමනා




ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 09

# ක්‍රිස්තුස්වහන්සේ සභාවට දුන් දීමනා

**<u>හැඳින්වීම</u> :-**

'ශුද්ධාත්මයාණන්වහන්සේ' පිළිබඳව අධ්‍යයන මාලාවක යෙදී සිටින්නාවූ අපගේ අවධානය යොමුවී තිබෙන්නේ ත්‍රිඒක දෙවියන්වහන්සේ විසින් කිතුනු සභාව වෙත ප්‍රධානය කළ ඇත්තාවූ දීමනා වෙතය. මෙම දීමනා අතුරින් අප මින් පෙර කළාවූ අධ්‍යයනයන් මගින්, **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා'** 9 ක් දෙසද **'දේව සේවය උදෙසා දීමනා'** 8 ක් දෙසද බැලුවෙමු.

මෙම අධ්‍යයනයෙහිදී අප ඉගෙනගැනීමට යන්නේ **ක්‍රිස්තුස්වහන්සේ විසින් සභාවට දුන් දීමනා'** නොහොත් තෑගි 5 ක් දෙසය.

**එපීස 4:8 :- "එහෙයින් උන්වහන්සේ කථාකොට : උන්වහන්සේ උසස්තැනට නැගුණු කල්හි වහල්කමට ගත්තවුන් වහල්කොට ගෙනගොස්, <u>මනුෂ්‍යයන්ට තෑගි දුන්සේකැයි</u> කියනසේක."**

**එපීස 4:11 :- "උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගතවක්තෘවරුන්ද සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද සමහරුන් සභාපාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක."**

දේව වචනය අපට පෙන්වාදෙන්නේ, **"පස්වැදෑරුම් සේවය"** ලෙස විස්තර කරනු ලබන්නාවූ,

(1) ප්‍රේරිතයන්,
(2) අනාගතවක්තෘවරුන්,
(3) ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්,
(4) සභාපාලකයන්,
(5) ගුරුවරුන්

යන්නවුන්, ත්‍රිඒක දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ මගින් සභාවට ලබාදුන්නාවූ තෑගි නොහොත් දීමනා 5 ක් වන බවයි.

<u>අධ්‍යයනය</u> :-

1. <u>**පස්වැදෑරුම් සේවය තේරුම්ගැනීම**</u>

(a) **ප්‍රේරිතයන්**

**'ප්‍රේරිතයන් '** යන්නාවූ වචනය අපට ලැබී ඇත්තේ **'යවනු ලබන තැනැත්තා'** යන අර්ථය ඇත්තාවූ APOSTOLOS යන්නාවූ ග්‍රීක් වචනයෙනි. අපගේ ස්වාමීවූ යේසුස් - වහන්සේට **'ගෝලයන් '** දොළොස් දෙනෙක් සිටි බව කිතුනු අප ප්‍රකාශ කිරීමට පුරුදුව සිටින අතර, ඔවුන්ව උන්වහන්සේ තෝරාගත්තේ **'ප්‍රේරිතයන් '** ලෙසය.

**ලූක් 6:13 :-**

**''පහන්වූ කල උන්වහන්සේ තම ගෝලයන් කැඳවා ඔවුන්ගෙන් දොළොස් දෙනෙකු තෝරා ගෙන, ඔවුන්ට <u>ප්‍රේරිතයෝ යයි නම් තැබූ සේක</u>.''**

උන්වහන්සේ මෙසේ තෝරාගත් දොළොස් දෙනාට **'ප්‍රේරිතයන්'** නොහොත් **'යවනු ලබන්නවුන් '** යන වචනය වඩා යෝග්‍ය වන්නේ මන්ද කියා **මාර්ක් 13:14,15** යන පද වලින් පැහැදිලිව පෙනේ.

**මාර්ක් 3:14,15 :-**

**'' 14 උන්වහන්සේ තමන් සමඟ සිටින පිණිසත්, දේශනා - කරන්ට 15 <u>පිටත්කර අරින පිණිසත්</u>, .... දොළොස් දෙනෙකු නියම කළ සේක.''**

❖ ඉහත සඳහන් ලෙස, යේසුස්වහන්සේ පත්කළාවූ ප්‍රේරිතයන්ගේ, සේවයේ ප්‍රධානතම කොටසක් වූයේ නොහොත් එහි ප්‍රමුඛත්වය දෙනු ලැබුවේ, <u>දෙවියන් - වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමටය</u>. සභාවේ ආරම්භයේ දවස්පතා කෙරුණු උපස්ථානයේදී ඇතිවුණාවූ ගැටළුවක් විසඳීම උදෙසා **'උපස්ථායකයන් '** සත් දෙනෙකු තෝරා, පත්කරනු ලැබුවේ මේ නිසාය.

**ක්‍රියා 6:2 :-**

**''එවිට දෙළොස්දෙනා ගෝල සමූහයා කැඳවා ඔවුන්ට කථාකොට : අප විසින් දෙවියන්වහන්සේගේ වචනය හැරදමා මේසවල සේවය කිරීම සුදුසු නැත.''**

- පාවුල්තුමා යේසුස්වහන්සේගේ ප්‍රේරිතයෙක් ලෙස කැඳවනු ලැබූ බව දේව වචනය සඳහන් කරන අතර (**රෝම 1:1, 1 කොරි 1:1, 2 කොරි 1:1, ගලාති 1:1, එපීස 1:1 සහ තවත් පද**) පාවුල්තුමාව විශේෂයෙන්ම පත්කරනු ලැබුවේ **'අන්‍ය ජාතීන්'** වෙත ශුභාරංචිය ගෙන යෑම උදෙසාය (**ගලාති 2:7:8**). තව දුරටත් පාවුල්තුමා එපීසවරුන් වෙත යැවූ ලිපියේ සඳහන් වන්නේ, ඔවුන් **'ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත් අත්තිවාරම පිට ඉදි කරනු ලැබ සිටින බවය' (එපීස 2:20).** මෙම පදවලින් අපට පෙනීයන්නාවූ, කරුණක් වන්නේ, ප්‍රේරිතයෙකුගේ සේවය, **'<u>පුරෝගාමී සේවයක්</u> නැතහොත් <u>අත්තිවාරම් ඉදිකිරීමේ සේවයක්</u>'** ලෙස තේරුම්ගැනීම නිවැරදි බවය.

- ලකුණු, පුදුම සහ බලවත් ක්‍රියා **'ප්‍රේරිතයෙකුගේ ලකුණු'** වන බව **2 කොරි 12:12** හි සඳහන් වෙයි.

  **2 කොරි 12:12 :- "සැබවින් <u>ලකුණු වලින්ද පුදුම වලින්ද බලවත් ක්‍රියා වලින්ද</u> ප්‍රේරිතයෙකුගේ ලකුණු සියලු ආකාර ඉවසීම ඇතුව නුඹලා අතරෙහි කරන ලද්දේය."**

  එබැවින්, ඉහත සඳහන් පද වලින් අපට පෙනීයන්නේ ප්‍රේරිතයෙකු යනු, විශේෂ කාර්යයක් උදෙසා විශේෂ පණිවිඩයක් සහිතව යවනු ලබන්නෙක් වූ අතර ඔහුගේ සේවය,
  - පුරෝගාමීවූ
  - දේව වචනය ප්‍රකාශ කිරීමට මුල් තැන දුන්නාවූ
  - ලකුණු, පුදුම සහ බලවත් ක්‍රියාවලින් සමන්විතවූ සේවයක් බවයි.

  මේ අතර, නව ගිවිසුමේ, පහත සඳහන් අය ප්‍රේරිතයන් ලෙස සඳහන් කරනු ලබයි.

  (i) ප්‍රේරිතයන් දොළොස් දෙනා (**ලූක් 6:13**)
  (ii) පාවුල් (**රෝම 1:1**)
  (iii) බාර්නබස් (**ක්‍රියා 14:14**)
  (iv) යාකොබ් (**ගලාති 1:19**)
  (v) අන්ද්‍රොනිකස් සහ යූනියස් (**රෝම 16:7**)
  (vi) සිල්වානස් සහ තිමෝතියස් (**1 තෙස 1:1, 3:6**)

මෙම ලැයිස්තුවේ අන්තිමට නම් සඳහන් හතර දෙනා, **'ප්‍රේරිතයන්'** ලෙස සඳහන් කරනු ලැබීමෙන්, අපට පෙනීයන්නේ මෙම කාලයේ සභාවන් විසින්, යහපත් සේවයක් කළාවූ දේව දාසයන් ලෙස පිළිගැනුනාවූ සමහරුන්ද, 'ප්‍රේරිතයන්' ලෙස සඳහන් කර ඇති බවයි.

(b) **අනාගතවක්තෘවරුන්**

**'අනාගතවක්තෘ'** යන වචනය **'කථාකරන්නාවූ තැනැත්තා'** නොහොත් **'කියාදෙන්නාවූ තැනැත්තා'** යන අර්ථය ඇති 'PROPHATAYS' යන ග්‍රීක් වචනයෙන් බිහිවන්නකි. එබැවින් අනාගතවක්තෘවරයෙකු යනු, දෙවියන්වහන්සේ තම සෙනඟට එළිදරව් කිරීමට අපේක්ෂාකරන්නාවූ පණිවිඩය, ශුද්ධාත්මයාණන්වහන්සේ මගින් ලබා, එය ප්‍රකාශ කරන්නෙකි. ඔහු විසින් ප්‍රකාශ කරනු ලබන්නාවූ වචනය, දෙවියන්වහන්සේ ඔහුට එළිදරව් කළාවූ වචනය වේ.

❖ දෙවියන්වහන්සේ මෙසේ අනාගතවක්තෘවරයෙක් තුළින් තම සෙනඟට උන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කරන අතර, එම එළිදරව් කිරීම,

(i) අනාවැකියක් විය හැක.

**ක්‍රියා 11 : 27,28 :- " [27] ඒ දවස්වලදී යෙරුසලමෙන් ප්‍රොපේතවරු අන්තියෝකියට ආවෝය. [28] ඔවුන්ගෙන් අගබස් නම් කෙනෙක් නැගිට, <u>මුළු ලෝකයෙහි මහත් සාගතයක් වන්නේයයි</u> ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන <u>දැන්වූයේය</u> ....."**

(ii) අප/සභාව විසින් ගත යුතු ක්‍රියා මාර්ගයක් විය හැක.

**ක්‍රියා 13:2 :- "ඔවුන් ස්වාමීන්වහන්සේට මෙහෙකරමින් නිරාහාරයෙන් උන් කල, ශුද්ධාත්මයාණන්වහන්සේ කථාකොට : <u>මා විසින්</u> බාර්ණබස්ද සාවුල්ද <u>කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන්කරපල්ලා</u> යයි කීසේක."**

❖ දෙවියන්වහන්සේ මෙසේ උන්වහන්සේගේ **'රහස්'** සභාවට එළිදරව් කරන්නාවූ තැනන්වහන්සේ වන අතර, දේව වචනය ප්‍රකාශ කරන්නේ එසේ නොකර උන්වහන්සේ කිසිවක් නොකරන බවයි.

**ආමොස් 3 : 7 :-**

**"සැබවින් ස්වාමීවූ දෙවියන්වහන්සේ තමන්ගේ රහස තමන් මෙහෙකරුවන්වූ අනාගතවක්තෘවරුන්ට එළිදරව් නොකර කිසිවක් නොකරනසේක."**

❖ වර්තමාන සභාවේ 'ධර්මවාක්‍ය කීමේ' ශුද්ධාත්මයාණන් - වහන්සේගේ දීමනාව ලබා ඇත්තාවූ දේව දරුවන් සැලකියයුතු ප්‍රමාණයක් සිටින බව අප දනිමු. මේ පිළිබඳව අප පැහැදිලිව වටහාගතයුතු කරුණක් වන්නේ, යමෙක් මෙම දීමනාව ලබා ඇති බැවින් පමණක්, ඔහු අනාගතවක්තෘවරයකු නොවන බවයි.

මේ සම්බන්ධයෙන් **1 කොරි 14:3** වන පදය දෙස බලමු.

**1 කොරි 14 : 3 :-**

**"නුමුත් ධර්මවාක්‍ය පවසන්නා <u>වර්ධනයවීමද දැනමුතුකමද සැනසීමද පිණිස</u> මනුෂ්‍යයන්ට <u>කථා කරන්නේය</u>."**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, යම්කිසි ධර්ම - වාක්‍යයක් සභාවක් තුළ ඇතිකරන්නේ නොසන්සුම්කම, වියවුල්භාවය සහ අසහනය වැනි දේ වන්නේ නම්, එම ධර්මවාක්‍ය මෙන්ම එය පැවසූ තැනැත්තාද, විමසුමට ලක්කිරීම සභාව විසින් කළ යුතු බවයි.

**1 කොරි 14 : 29 :-**

**"ධර්මවාක්‍ය කියන්නෝ දෙදෙනෙක් නොහොත් තුන් දෙනෙක් කථා කරත්වා, <u>අනිත් අය විමසා බලත්වා</u>."**

(c) **ශුභාරංචිය ප්‍රකාශකරන්නන්**

**'ශුභාරංචිය ප්‍රකාශකරන්නෙක්'** යනු හොඳ පණිවිඩයක් නොහොත් ශුභ ආරංචියක් ප්‍රකාශකිරීම උදෙසා කැඳවීම ලබා ඇත්තාවූ කෙනෙක්වේ.

මෙසේ ඔහු විසින් ප්‍රකාශ කළ යුතු ශුභාරංචිය, **1 කොරි 15:1-4** දක්වා සඳහන් වේ.

**1 කොරි 15:1 - 4 :- " [1]..... [2] නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි ......[3] එනම්, ලියවිලි වල ප්‍රකාරයට <u>අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්</u>, [4] උන්වහන්සේ <u>තැන්පත්කරනු ලැබූ බවත්</u>, ලියවිලි වල ප්‍රකාරයට <u>තුන්වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්</u>..."**

- නව ගිවිසුමේ **'එවැන්ජලිස්තවරයෙක්'** නොහොත් ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙක් යන්න සඳහන් වන්නේ තෙවතාවකි. ඒවා නම්,

  (i) **ක්‍රියා 21 : 8 :- "...... සත්දෙනාගෙන් එක්කෙනෙක් වූ <u>එවැන්ජලිස්ත පිලිප්ගේ</u> ගෙට පැමිණ ......"**

  උපස්ථායකයන් හත්දෙනා අතරට ඇතුලත් වූ පිලිප්, **(ක්‍රියා 6:5)** එවැන්ජලිස්ත කැඳවීම ලද්දාවූ කෙනෙක් බව අප මෙහි දකිමු.

  (ii) **එපීස 4 : 11 :- " උන්වහන්සේ .....සමහරුන් <u>ශුභාරංචිය ප්‍රකාශකරන්නන්ද</u>....."**

  (iii) **2 තිමෝති 4 : 5 :- ".....නුමුත් නුඹ සියලු කාරණාවලදී සිහි ඇතුව සිටපන්න, දුක් ඉවසාපන්න, <u>ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ වැඩේ කරපන්න</u>....."**

  මෙම පදයේ පාවුල්තුමා, තම ආත්මික දරුවෙකුවූ තිමෝතියස්ට අනුශාසනා කරන්නේ, **'ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩේ කරපන්න'** කියාය.

  දේව දරුව, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ <u>සෑම දරුවෙකුගෙන්ද මෙම ඉල්ලීම කරන බව</u> <u>තේරුම්ගන්න</u>. එයට <u>කීකරු වන්න</u>.

- එවැන්ජලිස්ත සේවය උදෙසා දෙවියන්වහන්සේ කැඳව - න්නාවූ අය තුළ සාමාන්‍යයෙන් තිබිය යුතු ගුණාංග / දීමනා දෙකක් ඔබ ඉදිරියේ තබමි. ඒවා නම් :

  (i) විනාශවන්නාවූ මනුෂ්‍යයන් ගැන මහත් බරක් සහ ඔවුන් ගළවා ගැනීමට පිපාසයක් තිබීම.

  (ii) සුව කිරීමේ දීමනාව සහ දුෂ්ඨ ආත්ම පලවා හැරීමේ හැකියාව.

(d) **<u>සභාපාලකයන්</u>**

සභාපාලකයෙකුගේ කැඳවීම වන්නේ, **'දෙවියන් - වහන්සේගේ රැළ බලාගැනීමයි,' රැළට ආදර්ශයක් වීමයි (1 පේත්‍රුස් 5:2-3)**. මේ කැඳවීම සම්බන්ධයෙන් උත්ථානවූ යේසුස්වහන්සේ **යොහන් 21:15-17** දක්වා, පේත්‍රුස්ට දුන්නාවූ නියෝගය කියවා බලන්න. 'නුඹ මට ප්‍රේම කරනවාද? 'යන ප්‍රශ්නය තෙවරක් පේත්‍රුස්ගෙන් ඇසූ යේසුස්වහන්සේ, පේත්‍රුස්ට ප්‍රකාශ කළේ **'මාගේ <u>බැටළු පැටවුන්</u> <u>පෝෂණය කරපන්න</u>' 'මාගේ <u>බැටළුවන්</u> <u>පාලනය කරපන්න</u>', 'මාගේ <u>බැටළුවන්</u> <u>පෝෂණය කරපන්න</u>'** කිරීමට කියාය.

❖ අපේ ස්වාමීන්වහන්සේ තම බැටළුවන් කෙරෙහි දක්වන්නාවූ සැලකිල්ල සහ ආදරය පෙන්වීමට දේව වචනයේ ඇති කොටස් දෙකක් දෙස බලමු.

(i) **යෙසායා 40:11 :- "එඬේරෙකු මෙන් උන්වහන්සේ තමන්ගේ රැළ පෝෂ්‍ය කරන සේක, බැටළු පැටවුන්ද තම හස්තයෙන් රැගෙන, තමන්ගේ ළයේ දරමින්, කිරිදෙන බැටළුදෙනුන් හෙමින් ගෙන යන සේක."**

(ii) **ලූක් 15:1-7 :-** නැතිවුණ බැටළුවාගේ උපමාව කියවා බලන්න.

❖ **ගීතාවලිය 23 මගින්,** එඬේරාගේ සේවයට අයිතිවන්නාවූ නොයෙක් දේ, පැහැදිලිව පෙනී යයි. ඒවායින් සමහරක් වන්නේ,

(i) එඬේරා බැටළුවන්ට අවශ්‍ය පෝෂණය සපයයි.
(ii) හෙතෙම තම බැටළුවන්ව ආත්මිකව ශක්තිමත් කරයි.
(iii) ඔහු විසින් බැටළුවන් නිසි මාර්ගවල ගෙන යනු ලබයි.
(iv) එඬේරා බැටළුවන්ට මඟපෙන්වයි.
(v) හෙතෙම ඔවුන් ආරක්ෂා කරයි.
(vi) ඔහු බැටළුවන්ට සහනය ලබාදෙයි.
(vii) එඬේරා බැටළුවන්ගේ සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
(viii) ඔහු බැටළුවන්ට සැනසීම සහ සිත් සමාදානය ලබාදෙයි.

**ගීතාවලිය 23** ලිවුවාවූ දාවිත් බැටළු එඬේරෙක් විය. බැටළු රැළක් බලාගැනීමට සුපුරුදුව සිටියාවූ ඔහු, දෙවියන් - වහන්සේ තම සෙනඟ ගේ එඬේරා ලෙස, ඔවුන් උදෙසා කරන්නාවූ දේ මෙම ගීතිකාවේ සඳහන් කරයි. සභාපාලකයෙකුගේ සේවය එඬේරෙකුගේ සේවයට සමාන වන බැවින්, එඬේරෙකුගේ සේවය පිළිබඳව ඉහත සඳහන් කරනු ලැබුවාවූ දේ සභාපාලකයන් විසින් ඉටු කළ යුතුය.

(b) **ගුරුවරුන්**

ගුරුවරයෙකුගේ කැඳවීම වන්නේ, දෙවියන්වහන්සේගේ වචනය නිවැරදිව සභාවට ඉගැන්වීමයි.

සභාවන් දෙස බලන අතර අපට පෙනීයන්නාවූ එක් දෙයක් වන්නේ, සෑම සභාවකම, ආත්මික බිළිඳුන් මෙන්ම ආත්මික වර්ධනයේ විවිධාකාර ස්ථානවල සිටිනවුන්ද ඇති බවයි. දෙවියන්වහන්සේ පත්කරන්නාවූ ගුරුවරුන් සභාවේ ඇති අවශ්‍යතාවන් අනුව සභාවේ සැමදෙනා පෝෂණය කිරීම ගැන සැලකිලිමත්වීම වැදගත්වේ. ඔවුන් විසින් බිළිඳුන්ට කිරි සැපයීම මෙන්ම (**1 පේත්‍රුස් 2:3**) වැඩිහිටියන්ට දැඩි ආහාර (**1 කොරි 3:2**) සැපයීමද කළ යුතුවේ.

## 2. <u>පස්වැදෑරුම් සේවය තුළින්, ක්‍රිස්තුස්වහන්සේ අපේක්ෂා කරන්නාවූ ප්‍රතිඵල - එපීස 4:12-16</u>

### (a) කිතුනුවන්ගේ ආත්මික වර්ධනය - එපීස 4 : 12

**එපීස 4:12 :-**

**"එසේ දුන්නේ ඇදහීමේදී දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් පැමිණෙනතෙක්,"**

අපගේ ආත්මික වර්ධනය පිළිබඳව, වැදගත්වන්නාවූ පියවර හතරක්, මෙම පදයෙහි සඳහන්ව තිබේ.

(I) **ඇදහීමට පැමිණීම**

සෑම ඉරුදිනකම අප රට පුරා ඇති දේවස්ථානවලට ඇදී එන්නාවූ සැමදෙනාම පැමිණෙන්නේ, ඔවුන් තුළ දෙවියන්වහන්සේ කෙරෙහි යම්කිසි ඇදහීමක් තිබෙන බැවිනි.

දෙවියන්වහන්සේ කෙරෙහි යම්කිසි ඇදහීමක් ඇතිවී, උන්වහන්සේව නමස්කාර කිරීමට දේව සභාවකට පැමිණීම, ඔවුන්ගේ ආත්මික ගමනේ ප්‍රථම පියවර ලෙස හැඳින්විය හැක.

(ii) **දෙවියන්වහන්සේගේ පුත්‍රයා දැනගැනීම**

මෙම ගමනේ මීලඟ පියවර වන්නේ, දෙවියන්වහන්සේ ගැන හෝ උන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේ ගැන දැනගැනීම නොවේ. එම පියවර වන්නේ **දෙවියන්වහන්සේව සහ උන්වහන්සේගේ පුත්‍රයාණන් - වහන්සේව දැනගැනීමයි.**

මෙසේ දැනගැනීම උදෙසා අප උන්වහන්සේට අපගේ ජීවිත භාරදෙමින්, **<u>උන්වහන්සේ සමඟ සම්බන්ධකමකට ඇතුල් විය යුතුවේ</u>.**

(iii) **සම්පූර්ණ පුරුෂකමට පැමිණීම**

ඉහත සඳහන් පියවර මගින්, අප දේව දරුවන් බවට පත්වන නමුත්, අප පත්වන්නේ, ''ආත්මික බිළිඳුන්'' බවටය. අප මින් ඉදිරියට යමින් සම්පූර්ණ පුරුෂකමට පැමිණීම, කිතුනු ගමනේ තෙවැනි පියවරයි.

මෙම පියවර, ඇදහිල්ලෙන් ශක්තිමත්වී, නොසැලී, විශ්වාසවන්තව, දෙවියන්වහන්සේ සමඟ ඇවිදින ස්ථානයට අප පැමිණීම ලෙස සැලකිය හැක.

(iv) **ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයට පැමිණීම**

දේව කැමැත්ත වන්නේ, අප සැම යේසුස්වහන්සේ මෙන් වීමය (**රෝම 8:29**).

මෙය උදෙසා අපට ගත හැකි ඉතා වැදගත් පියවරක් වන්නේ, දෙවියන්වහන්සේගේ ශක්තියෙන් යේසුස් - වහන්සේව අනුගමනය කිරීමයි.

**1 පේත්‍රුස් 2 : 21 :- "..... මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ, නුඹලා <u>උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹලාට ආදර්ශයක් දී ගියසේක</u>."**

(b) **<u>කිතුනුවන් සේවය කිරීම උදෙසා සූදානම් කිරීම- එපීස 4:13</u>**

බොහෝ කිතුනුවන් පුරුදුවී සිටින්නේ, දේව සේවයේ යෙදීම, විශේෂ කැඳවීම් ලබා ඇත්තාවූ අයට සීමාවූ දෙයක් සේ සැලකීමටය. මෙනමුත් දේව වචනය අපට පෙන්වාදෙන්නේ මීට හාත්පසින්ම වෙනස්වූ දෙයකි.

**එපීස 4:13** මගින් ප්‍රකාශවන්නේ, ක්‍රිස්තුස්වහන්සේ පස්වැදෑරුම් සේවය සභාවේ ඇතිකිරීමෙන් අපේක්ෂා කරන්නාවූ තවත් ප්‍රතිඵලයක් වන්නේ, සෑම දේව දරුවෙක්ම **"සේවය කිරීමේ වැඩය"** උදෙසා සූදානම් කරනු ලැබීම බවයි. බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනයේ මේ සම්බන්ධව සඳහන් වචන වන " to prepare God's people for works of service " (NIV) මගින් මෙය ඉතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

(c) **<u>කිතුනුවන් වැරදි ඉගැන්වීම් මගින් මුලා නොවීම-එපීස 4:14</u>**

අපගේ සතුරා සැමවිටම බලාසිටින්නේ, දේව දරුවන් මුලා කිරීමටයි. 'අන්තිම කාලයේ' මෙම රැවටිලිකාර ක්‍රියාකිරීම් ලෝකයේ අතිශයින් වැඩිවීමට යන බව යේසුස්වහන්සේද ප්‍රකාශ කල සේක.

**මතෙව් 24 : 24 :- "මක්නිසාද බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවක්තෘවරුද නැගිට, පුළුවන් නම් තෝරාගනු ලැබූවන් පවා මුළා කරන ලෙස මහත් ලකුණුද පුදුමද දක්වන්නෝය."**

පේත්‍රුස්තුමා බොරු ගුරුවරුන් පිළිබඳව, කර ඇති ප්‍රකාශය දෙස බලමු.

**2 පේත්‍රුස් 2 : 1 :- ".... එලෙසම විනාශක ධර්මභේද රහසින් උපදවමින්ද තමුන්ව මිලේටගත් ආචාරින්වහන්සේව එපා කරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නාවූ බොරු ගුරුවරු නුඹලා අතරෙන් වන්නෝය."**

ක්‍රිස්තුස්වහන්සේ පස්වැදෑරුම් සේවය සභාවේ පිහිටු - වීමෙන් ඇති තව ප්‍රතිඵලයක් නම්, කිතුනුවන් වැරදි ඉගැන්වීම් මගින් මුලා නොවීමයි.

**"මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපමාවෙන්ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්," (එපීස 4:14)**

(d) **කිතුනුවන් සැමවිටම, ඇත්ත ප්‍රකාශ කරන්නාවූ සෙනඟක් වීම - එපීස 4:15**

**එපීස 4:15 :- "....ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා - කරමින්...."**

අප හොඳ හැටි දන්නා ආකාරයට, මනුෂ්‍යයා ආරම්භයේදී පාපයට වැටුනේ, යක්ෂයාගේ ප්‍රයෝගකාරී කම නිසයි. යක්ෂයා ප්‍රකාශකළ අසත්‍ය වචන නිසයි.

යේසුස්වහන්සේ යක්ෂයා පිළිබඳ කළාවූ ප්‍රකාශනයක් **යොහන් 8:44** හි සඳහන්වන්නේ, මෙලෙසය -

**"....යක්ෂයා....බොරුකාරයෙක්ය, බොරුවේ පියාය."**

එසේ වී නමුත්, කිතුනු සභාව තුළ සමහර අවස්ථාවලදී ඇත්ත නොව බොරුකීම අපට අසන්ට ලැබේ.

**"මාර්ගයද සැබෑවද ජීවනයද මමය." (යොහන් 14:6)** කියා ප්‍රකාශකළ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයන් වන්නාවූ අප අතරේ මෙසේ සිදුවීම ඉමහත් කණගාටුවට කරුණකි. ප්‍රේමණීය දේව දරුව, අපගේ පියාණන්වහන්සේ අපව කැඳවා තිබෙන්නේ,

**සැමවිටම ඇත්ත කතා කිරීමටය.**
**සැමවිටම ප්‍රේමයෙන් කතා කිරීමටය.**

## 3. <u>**මෙම තෑගි පහ ලබා ඇත්තාවූ අපගේ වගකීම**</u>

පස්වැදෑරුම් සේවය නොහොත් ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රධානය කළාවූ දීමනා (තෑගි) 5 මගින්, දෙවියන්වහන්සේ අපේක්ෂා කරන්නාවූ ප්‍රතිඵල කිමෙක්ද කියා, **එපීස 4:12-15** මගින් අප දූන් දනිමු.

දේව දරුව, පැහැදිලිව මෙය තේරුම්ගන්න. අප ඉහත කොටසේ ඉගෙන ගත්තේ, සභාව සහ <u>**සභාවට අයිති සෑම දේව දරුවෙක් පිළිබඳවම දෙවියන්වහන්සේගේ කැමැත්තයි.**</u>

මෙම දේව කැමැත්ත ඉටුවීම උදෙසා අප විසින් කළ යුතුවූ කොටසක් තිබේ. <u>**එම කොටස අප ඉටුකරන විට**</u> දෙවි සමිඳුන්, උන්වහන්සේගේ කැමැත්ත <u>**(උන්වහන්සේගේ කොටස) කිරීමට බැඳී සිටින සේක.**</u>

එබැවින් අප සෑම දෙන, පහත සඳහන් වන්නාවූ දේ <u>**(අපගේ කොටස) ඇදහිල්ලෙන්ද, විශ්වාසවන්තවද කරගෙන යෑමට අදම තීරණය කරමු.**</u>

(i) **මනුෂ්‍යයන් ඇදහිල්ල කරා ගෙන ඒම උදෙසා සේවයේ යෙදෙමු.**

අප ඉගෙනගත් ආකාරයට, **'ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකුගේ වැඩය'** සෑම දේව දරුවෙක් විසින්ම කළ යුතුවේ. දෙවි සමිඳුන් මෙම සේවය තුළ අපව බලවත් ලෙස පාවිච්චි කිරීම උදෙසා,

- අපගේ ජීවිත මනුෂ්‍යයන්ට ආදර්ශයක්, ආලෝකයක් සහ අභියෝගයක් වන පරිදි ජීවත්වෙමු. **(මතෙව් 5:14-16)**
- ගැළවීම නොලැබූ මනුෂ්‍යයන් කිහිප දෙනෙක් තෝරා ගෙන දිනපතාම ඔවුන්ගේ ගැළවීම උදෙසා යාච්ඤා කරමු.
- දෙවියන්වහන්සේගේ ප්‍රේමය අන් මනුෂ්‍යයන්ට දක්වමු.

(ii) **අපගේ ඇදහිල්ල වර්ධනය කිරීම උදෙසා ක්‍රියා කරමු.**

- අපගේ ඇදහිල්ල වැඩිකරන මෙන් දෙවි සමිඳුන්ගෙන් ඉල්ලා සිටිමු. (**ලූක් 17:5**)
- දේව පොරොන්දු ඇදහිල්ලෙන් ප්‍රකාශ කරමු. (**ගීතා 23:1, 1 පේත්‍රුස් 2:24, පිලිප්පි 4:13, හෙබ්‍රෙව් 13:5,6** වැනි පදවල ඇති පොරොන්දු **අප මුවින්, ඇදහිල්ලෙන් ප්‍රකාශ කරමු**)
- අපගේ ඇදිහිල්ල ක්‍රියාවට නංවමු.

  (අපගේ ඇදහිල්ල අප ක්‍රියාවට නැංවූ විට, දෙවියන් - වහන්සේ අපගේ ඇදහිල්ල අනුව ප්‍රතිඵල දෙනසේක. මෙය තුළින් අපගේ ඇදහිල්ල වර්ධනය වන බැවින් අප වඩාත් ඇදහිල්ලෙන් ක්‍රියා කරනු ඇත. මේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලය වන්නේ, දිගින් දිගටම අපගේ ඇදහිල්ල වර්ධනය වීමයි).
- දේව වචනය වැඩි වැඩියෙන් කියවමු / ඉගෙන ගනිමු.

(iii) **යේසුස්වහන්සේව වඩා හොඳට දැනගැනීම උදෙසා ක්‍රියාකරමු.**

- දිනපතා උන්වහන්සේ සමඟ කාළය ගත කරමු.
- සැමවිටම උන්වහන්සේට කීකරුව ජීවත් වෙමු.

(අප යේසුස්වහන්සේට කීකරු වන අතර, උන්වහන් - සේගේ ආදරය අප වැඩියෙන් අත්දකින්නෙමු. මෙය අපගේ කීකරුකම වැඩිකිරීමට අපව පොළඹවන හේතුවෙන් උන්වහන්සේගේ ආදරය වැඩි වැඩියෙන් අත් දැකීමටද, උන්වහන්සේට වඩාත් කීකරුවීම කරාද අපව ගෙන යයි).

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, පස්වැදෑරුම් සේවයේ උපරිම ආශිර්වාද ලබන පිණිස, අප සැම මෙම අධ්‍යයනයෙහි පෙන්වා ඇත්තාවූ **දෙවියන්වහන්සේගේ කැමැත්තට සරිලන ලෙස, අපගේ වගකීම් ඉටුකරමු.**

**දෙවියන්වහන්සේම ඔබට ආශිර්වාද කොට**


**ක්‍රිස්තුස්වහන්සේගේ**

**සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයට**

**ඔබව**

**වර්ධනය කරන සේක්වා !!**

# ප්‍රේමයෙන් දීමනා භාවිතා කිරීම



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 10

# ප්‍රේමයෙන් දීමනා භාවිතා කිරීම

**හැඳින්වීම** :-

පසුගිය අධ්‍යයන හතෙහිම, අපගේ අවධානය යොමු කරන ලද්දේ ත්‍රී එක දෙවි සමිඳුන් විසින් කිතුනු සභාවට ප්‍රදානය කළාවූ **' ආත්මික දීමනා '** වෙත වන අතර, එවැනි දීමනා 22 ක් දෙස අප බැලුවෙමු.

එම දීමනා 22 පහත සඳහන් අයුරින් කොටස්කර අප ඉගෙන ගතිමු. එනම්,

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා - 9 ක්
දේව සේවය උදෙසා දීමනා - 8 ක්
යේසුස්වහන්සේ සභාවට දුන් දීමනා - 5 ක්

මෙම දීමනා 22 ට අමතරව, වෙනත් දීමනා කිහිපයක්ද නව ගිවිසුමේ සඳහන් වේ.

මෙම අධ්‍යයනයෙන් අදහස් කරනු ලබන්නේ, දෙවියන් - වහන්සේ සභාවට ලබා දී ඇත්තාවූ දීමනාවන් භාවිතා කළ යුතුව ඇත්තේ කෙලෙසින්ද කියා තේරුම්කර දීමටය.

**අධ්‍යයනය** :-

**1 . දෙවියන්වහන්සේ සභාවට දීමනා දුන්නේ කුමක් උදෙසාද ?**

දෙවි පියාණන්වහන්සේ සභාවට ප්‍රදානය කළ දීමනා භාවිතා කළ යුත්තේ කෙලෙසින්ද කියා තේරුම්ගැනීම උදෙසා, ප්‍රථමයෙන්ම අප උන්වහන්සේ එම දීමනා දුන්නේ මන්ද? කියා වටහා ගත යුතු වේ.

එම නිසා අප ගත යුතු මුල් පියවර වන්නේ, **'සභාව'** සහ සභාව සමන්විත වන්නාවූ, **'දේව දරුවන්'** පිළිබඳව දෙවියන්වහන්සේගේ කැමැත්ත වටහාගැනීමයි.

(a) **සභාව යනු ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයයි**

**කොලොස්සි 1:18 :- "උන්වහන්සේ සභාව නමැති ශරීරයට හිසව සිටිනසේක....."**

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන සභාව වෙත උන්වහන්සේ පිරිනැමුවාවූ **'දීමනා'** වන්නාවූ ප්‍රේරිතයන්, අනාගත - වක්තෘවරුන්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභා පාලකයන් සහ ගුරුවරුන් මගින් දෙවියන්වහන්සේ අපේක්ෂා කරන්නාවූ ප්‍රතිඵල සමහරක් පහත සඳහන් වේ.

**එපීස 4:13 :- "..... ක්‍රිස්තුස්වහන්සේගේ <u>ශරීරයේ වර්ධනය වීම පිණිසත්ය</u>."**

**එපීස 4:16 :-"උන්වහන්සේගේ මුළු ශරීරය එකට සන්ධිකරනු ලැබ සවි වී,.....එක එක සන්ධිය කරණ - කොටගෙන <u>ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය</u>."**

(b) **සභාව සමන්විත වන්නේ දේව දරුවන්ගෙනි**

ඕනෑම මනුෂ්‍යයෙකුට දේව දරුකමට ඇතුල්විය හැකි අතර, එසේ ඇතුල්වීමට ඇත්තේ එකම මාර්ගයකි.

**යොහන් 1:12 :- "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, <u>ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක</u>."**

යමෙක් මෙලෙස යේසුස්වහන්සේ පිළිගනිමින්, දේව දරුකමට ඇතුල්වීම සමඟම, හෙතෙම ශුද්ධාත්මයාණන් - වහන්සේ විසින් යේසුස්වහන්සේගේ ශරීරයට නොහොත් සභාවට බව්තීස්ම කරනු ලබයි.

**1 කොරි 12:13 :- "...... අපි සියල්ලෝ එකම ආත්මයාණන් - වහන්සේ තුළ <u>එකම ශරීරයට බව්තීස්ම කරනු ලැබ</u>, ....."**

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් වන්නාවූ, දේව දරුවන්ගේ ජීවිතවල දෙවියන්වහන්සේ අපේක්ෂා කරන්නාවූ ප්‍රතිඵල සමහරක් **එපීස 4:12** හි සඳහන් වේ.

**එපීස 4:12 :- "....<u>සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස් - වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත්</u> අප සියල්ලන් පැමිණෙන තෙක්,"**

ඉහත සඳහන් කරුණු එකට ගොනු කළවිට, අපට පෙනීයන්නේ, ක්‍රිස්තුස්වහන්සේ සභාවට දුන් දීමනා පහ තුළින්, ඉටුවිය යුතු, සමහර දේ වන්නේ,

- <u>දේව දරුවන්</u> ක්‍රිස්තුස්වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයට <u>වර්ධනයවීම</u>,
- ඔවුන් <u>ප්‍රේමයෙන් එකට බැඳී සේවයේ යෙදීම මගින්</u> ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නොහොත් <u>සභාව වර්ධනය වීම</u>, බවයි.

දේව දරුවෙනි, මෙය වටහාගන්න, දෙවියන්වහන්සේ සභාවට ප්‍රධානය කර ඇත්තාවූ දීමනා සියල්ලම මෙම අරමුණු ඉටුකිරීම උදෙසා භාවිතා කරනු ලැබීම දේව කැමැත්තයි.

**2. <u>එපීස සභාව ගැන පාවුල්තුමා ඔප්පුකළ දෙවැනි යාච්ඤාවේ, දේව දරුවන් උදෙසා ඔහු කරන ඉල්ලීම් - එපීස 3 : 16-19</u>**

මෙම යාච්ඤාවෙහි, දේව දරුවන් උදෙසා දෙවි සමිඳුන්ගෙන්, ඉල්ලීම් පහක් පාවුල්තුමා කරන අතර, ඒවායින් තුනක්ම, දේව ප්‍රේමයට සෘජුවම සම්බන්ධ වේ.

(a) **එපීස 3:17 :- "ඇදිහිල්ල කරණකොටගෙන <u>ක්‍රිස්තුස් - වහන්සේ</u> <u>නුඹලාගේ</u> <u>සිත් තුළ වාසය කරන</u> පිණිසත් ....."**

යේසුස්වහන්සේ දේව දරුවන්ගේ සිත් තුළ වාසය කිරීම, දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්නාවූ පාවුල්තුමා, **පිලිප්පි 2:5** වන පදයේ ප්‍රකාශ කරන්නේ, **"ක්‍රිස්තුස් - යේසුස්වහන්සේ තුළ තිබුණු සිතම නුඹලා තුළත් තිබේවා"** කියාය. යේසුස්වහන්සේගේ සිත අප තුළත් තිබීමේ ප්‍රතිඵලයක් වන්නේ, යේසුස්වහන්සේ තම ගෝලයන්ට ප්‍රේම කළාක් මෙන්, අපත් <u>එකිනෙකාට ප්‍රේම කිරීමයි</u>.

**යොහන් 13:34 :- "<u>මා නුඹලාට ප්‍රේම කළාක් මෙන්</u> නුඹලාත් එකිනෙකාට ප්‍රේමකරන ලෙස, <u>එකිනෙකාට ප්‍රේමකරපල්ලාය</u> කියා අලුත් ආඥාවක් මම නුඹලාට දෙමි."**

(b) **එපීස 3:17 :- "…..නුඹලා ප්‍රේමයෙහි මුල් ඇද පිහිටා සිට,"**

දෙවියන්වහන්සේගේ පවුලට අයිති වූවන්ගේ, එනම් දේව දරුවන්ගේ ජීවිතවල අති විශිෂ්ඨ ලක්‍ෂණයක් වන්නේ ප්‍රේමයයි. මේ ප්‍රේමය පිළිබඳව පද කිහිපයක් දෙස බලමු.

**1 යොහන් 4:7,8 :-**

**"<u>ප්‍රේමවන්තයෙනි, අපි එකිනෙකාට ප්‍රේම කරමු</u>. මක්නිසාද ප්‍රේමය දෙවියන්වහන්සේගෙන්ය ….. <u>ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේව නාඳුනයි</u>, මක්නිසාද දෙවියන්වහන්සේ ප්‍රේමයය."**

**1 යොහන් 4:12 :-**

**"<u>අපි එකිනෙකාට ප්‍රේමකරමු</u> නම්, දෙවියන්වහන්සේ අප තුළ සිටිනසේක, උන්වහන්සේගේ ප්‍රේමයද අප තුළ සම්පූර්ණ වී තිබේ."**

**1 යොහන් 4:16 :-**

**"…..දෙවියන්වහන්සේ ප්‍රේමයය, <u>ප්‍රේමයෙහි පවතින්නා දෙවියන්වහන්සේ තුළ සිටී</u>, දෙවියන්වහන්සේද ඔහු තුළ සිටින සේක."**

පාවුල්තුමාගේ මෙම යාච්ඤා ඉල්ලීම වන්නේ, කිතුනු අප **'ප්‍රේමයේ මුල් ඇද පිහිටා සිටීමයි.'**

මෙහිදී කිතුනු ජීවිතය ගසකටද, එය පිහිටා තිබෙන්නාවූද, එහි මුල් සාරය ඇදගන්නාවූද භූමිය ප්‍රේමයටද සමාන කරනු ලබයි. පාවුල්තුමා මෙසේ අප ඉදිරියේ තබන්නාවූ උපමාවෙන්, **කිතුනු ජීවිතයේ ප්‍රේමයට ඇත්තාවූ වැදගත්කම සක්සුදක් සේ ඔබට පැහැදිලිවනවා ඇත.**

(c) **එපීස 3:18,19 :-**

**"…..ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්,"**

ප්‍රේමයට සෘජුවම සම්බන්ධවූ, පාවුල්තුමාගේ තෙවැනි යාච්ඤා ඉල්ලීම වන්නේ, **'ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය අපට තේරුම්ගැනීමට හැකි වීමයි.'**

මනුෂ්‍යවූ අපට ක්‍රිස්තුස්වහන්සේගේ අසීමිත ප්‍රේමය සම්පූර්ණයෙන්ම තේරුම්ගැනීමට නොහැකි වේ. මෙනමුත් පාවුල්තුමා උන්වහන්සේගේ ප්‍රේමයේ පළල, දිග යනාදිය සඳහන් කරමින් විස්තරකරන්නාවූ ප්‍රේමයේ ඉමහත්කම, අපගේ මනසට තේරුම්ගත හැකි ලෙස දේව ධර්මාචාර්‍යවරයෙක් ඉදිරිපත් කළ අන්දම ඔබ ඉදිරියේ තබමි.

(i) <u>උන්වහන්සේගේ ප්‍රේමයේ පළල</u> :- යුදෙව්වරුන් සහ අන්‍යජාතිකයන්ගෙන් සමන්විත වන්නාවූ, අද මෙලොව වසන **බිලියන 7 ක් පමණ වන්නාවූ, සියලුම මනුෂ්‍යයන්ට ප්‍රේම කිරීමට තරම් පළල, (1 යොහන් 3:16)**

(ii) <u>උන්වහන්සේගේ ප්‍රේමයේ දිග</u> :- ඒදන් උයනේ පටන් ලෝකාන්තිමය දක්වා **අතීතයේ විසිවාවූද, දැන් වෙසෙන්නාවූද, අනාගතයේ වසන්ට යන්නාවූද සියලුම මනුෂ්‍යයන්ට ප්‍රේමකිරීමට තරම් දිග, (1 කොරින්ති 13:8)**

(iii) <u>උන්වහන්සේගේ ප්‍රේමයේ ගැඹුර</u> :- මනුෂ්‍ය ඉතිහාසයේ බිහිවූ **ලොකුම පව්කාරයාට ප්‍රේමකිරීමට තරම් ගැඹුරු,**

(iv) <u>උන්වහන්සේගේ ප්‍රේමයේ උස</u> :- ඉහත සඳහන් පව්කාරයාව ස්වර්ගය කරා ඔසවන තරම් උස.

දේව දරුවෙනි, පාවුල්තුමාගේ මෙම යාච්ඤා ඉල්ලීම් තුනම අපට පෙන්වාදෙන්නේ, **දේව දරුවන්ගේ ජීවිතවලද** එමගින් **සභාව තුළද එකිනෙකාට ප්‍රේම කිරීමට දරන්නාවූ ප්‍රමුඛ ස්ථානයයි.**

මෙම අධ්‍යයනයෙහි අප මෙතෙක් සලකා බැලුවාවූ සෑම දෙයක්ම පාහේ අපට පෙන්වාදෙන්නේ, **දෙවියන් - වහන්සේ අපටද උන්වහන්සේගේ සභාවටද දක්වන්නාවූ ප්‍රේමය තේරුම්ගෙන, <u>ප්‍රේමයෙන් ක්‍රියාකිරීමේ වැදගත්කමයි</u>.**

දේව දරුවෙනි, මෙය තේරුම්ගනිමු.
දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, දෙවියන් - වහන්සේ එකිනෙකාට දුන්නාවූ ආත්මික දීමනා සහ **උන්වහන්සේගේ ප්‍රේමය සෑම දේව දරුවෙකුගේ ජීවිතයකින්ම ප්‍රකාශ වීමයි.**

උන්වහන්සේගේ මෙම කැමැත්ත, වෙනසක් නැතිව සෑම දේව දරුවෙකුටම අදාල වන බව අමතක නොකරමු.

මෙම හේතුව නිසා, කිසි දේව දරුවෙකුට, පහත සඳහන් ප්‍රකාශන කිසිසේත් කළ නොහැකිවේ.

- මාගේ කැඳවීම දේශනා කිරීමටයි, එබැවින් ප්‍රේමය / කරුණාව දැක්වීම මට අදාල නැත.
- මට දෙවියන්වහන්සේ ලබා දී ඇත්තේ සුවකිරීමේ දීමනාවයි. එබැවින් ප්‍රේමය/කරුණාව......
- දෙවියන්වහන්සේගේ සේවය උදෙසා මම මාගේ ආදායමින් 30% මම පරිත්‍යාගශීලීව දෙනවා. එබැවින් ......

(යමෙක් මෙසේ කියනවා නම්, එසේ කීමට ඔහුව පොළඹවන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ නොවන බව සහතිකය)

ඉහත සඳහන් කරුණු හේතුකොටගෙන,

- **'ප්‍රේමය වන්නාවූ දෙවියන්වහන්සේ ' (1 යොහන් 4:8)** අපව කැඳවන්නේ, 'උන්වහන්සේගේ දීමනා, ප්‍රේමයෙන් යුක්තව භාවිතා කිරීමටයි' යන නිගමනයට අපට පැමිණිය හැක.

## 2. <u>දීමනා භාවිතා කළ යුතු අන්දම - 1 කොරි 12:31 - 13:3</u>

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ගැන ඉගෙන ගැනීම උදෙසා, දේව වචනයේ සඳහන් වඩාත්ම වැදගත් පරිච්ඡේදය වන්නේ, **1 කොරින්ති 12** වන බව නොරහසකි. එබැවින් මෙම පරිච්ඡේදයේ අන්තිම පදය වන්නාවූ **1 කොරි 12:31** දෙස බැලීම වැදගත් වේ.

**1 කොරි 12:31 :- "නුමුත් වඩා උතුම් දීමනා වලට ආශාවෙයල්ලා. තවද <u>ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි</u>."**

පාවුල්තුමා මෙහි ප්‍රකාශකරන්නේ, වඩා උතුම් දීමනා ලැබීමට අප අශා කළ යුතු අතර, **' ඊටත් වඩා උතුම් මාර්ගයක් '** තිබෙන බව අප හඳුනා ගත යුතු බවයි.

මෙම ප්‍රකාශනයෙන් අනතුරුව පාවුල්තුමා අපට හඳුන්වා - දෙන්නේ, **1 කොරි 13** වන පරිච්ඡේදයේ සඳහන්වන්නාවූ **'ප්‍රේමයේ මාර්ගයයි.'** මෙම මාර්ගය දෙස, අපගේ අවධානය යොමු කරන විට, පහත සඳහන් කරුණු දකින්නෙමු.

(i) **<u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ප්‍රේමයෙන් භාවිතා කළ යුතුවේ - 1 කොරි 13:1-3</u>**

**1 කොරි 12 වන සහ 13 වන පරිච්ඡේදවල,** මූලික ඉගැන්වීම් වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා (**1 කොරි 12**) සහ ප්‍රේමය (**1 කොරි 13**) වන බව අප සැවොම දනිමු.

**1 කොරි 13:1-3** අපට පෙන්වාදෙන්නේ, **1 කොරි 12** හි උගන්වන ලබන්නාවූ දීමනා භාවිතා කළ යුතුව ඇත්තේ **1 කොරි 13** හි සඳහන් ප්‍රේමයෙන් විය යුතු බවයි.

(a) **<u>ප්‍රේමය රහිතව</u> ප්‍රකාශ කරන්නාවූ <u>අන්‍ය භාෂා වල කිසි වටිනාකමක් නොමැතිවේ</u>**

**1 කොරි 13:1 :-**

**"මම මනුෂ්‍යයන්ගේද දේව දූතයන්ගේද භාෂාවලින් කථා කරන්නෙම් නුමුත් මට ප්‍රේමය නැත්නම්, හඬනගන පිත්තලට නොහොත් ශබ්ද පවත්වන අත්තලකට සමාන වී සිටිමි."**

මෙම පදය අපට පෙන්වාදෙන්නේ, අප කෙතරම් අනර්ඝ ලෙස අන්‍ය භාෂා කථා කළත්, **අපට ප්‍රේමය නොමැතිනම්, එම කථා කිරීම නිෂ්ප්‍රයෝජන බවයි.**

(b) **අනාගත වාක්‍ය කීමේ දීමනාව, සියලු දැනගැන්ම, කඳු පහකරන තරම් ඇදහිල්ල තිබෙන නමුත්, <u>මට ප්‍රේමය නොමැති නම් මම හිස් වෙමි</u> - 1 කොරි 13:2**

දේව දරුව, මෙය තේරුම්ගන්න. කෙතරම් අනර්ඝ දීමනා දෙවි සමිඳුන් ඔබට ප්‍රධානය කර ඇති නමුත්, **ඔබ ඒවා භාවිතා කරන්නේ, ප්‍රේමය රහිතව නම් ඔබ හිස්වූ මනුෂ්‍යයෙක් වේ.**

එබැවින් අප සැම දෙවි සමිඳුන්ට මෙසේ පොරොන්දු වෙමු. ස්වාමීනි, ඔබවහන්සේ මට දී ඇති දීමනා,

- මා 'ප්‍රදර්ශනය' නොකරන්නෙමි.
- මා උසස්කර ගැනීම උදෙසා භාවිතා නොකරන්නෙමි.
- ගැන උඩඟු නොවන්නෙමි.
- නිසා මා අන් අය පහත් ලෙස නොසලකන්නෙමි. (මා අනුන්ට වඩා උතුම් යයි නොසිතන්නෙමි)

(c) **මම කෙතරම් පරිත්‍යාගශීලීව දුන්නත්, සේවය උදෙසා කෙතරම් පීඩා වින්දත්, මට <u>ප්‍රේමය නැත්නම්</u> ඒවායින් <u>මට කිසි ප්‍රයෝජනයක් නොමැතිවේ</u> - 1 කොරි 13:3**

දේව දරුවෙනි, දිළිඳුන්ට, අනාථවූවන්ට, වැන්දඹුවන් සහ අසරණවූවන් වැනි අයට දීම අප විසින් කළ යුතුවේ. මෙසේ අප කෙතරම් දුන්නත්, **එම දීම සිදුවන්නේ ප්‍රේමය රහිතව නම්, එයින් අපට කිසිම ප්‍රයෝජනයක් නැත. අප සැම, ප්‍රේමයෙන් යුක්තව, ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සභාවේ වර්ධනය උදෙසා භාවිතාකරමු.**

ප්‍රේමණීය සහෝදරයා, සහෝදරී ඉහත සඳහන් දේ අපට මතක්කරදෙන්නේ, දෙවියන්වහන්සේ අප දෙස බලන්නේ, මනුෂ්‍යයා බලන ආකාරයට නොවන බවය. මනුෂ්‍යවූ අප බොහෝවිට පුරුදුව සිටින්නේ, ඉහත සඳහන් දීමනා ලද අය ඉතාමත්ම ' **ආත්මිකවූ දේව දාසයන්** ' ලෙස සලකමින්, ඔවුන් වටේ රොක් වීමටයි.

මෙනමුත් දේව වචනයේ **1 කොරි 13:1-3** දක්වා අපට උගන්වන්නේ, ඔවුන් තුළ ප්‍රේමය නොමැතිනම්, ඔවුන් ' **නිෂ්ප්‍රයෝජන දාසයින්** ' වන බවයි. මනුෂ්‍යවූ අප පිටාතර ලක්ෂණ දෙස බලන අතර, දෙවි පියාණන්වහන්සේ අපගේ හදවත් දෙස බලනසේක. එබැවින් අපි අපගෙන්ම මෙම ප්‍රශ්නය අසාගනිමු.

**මම සේවයේ යෙදෙන අතර, මගේ අරමුණ වන්නේ කුමක්ද ?** මෙසේ අපි අපවම විමසා ගනිමින්, **ප්‍රේමයෙන් සේවයේ යෙදෙමු.**

- ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා වලට ආශාකරමු. **(1 කොරි 12:31)**
- දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල වැගිරීමට, ඊටත් වඩා ආශාකරමු. **(රෝම 5:5)**

(d) **<u>වඩාත්ම උතුම් මාර්ගය ප්‍රේමයේ මාර්ගයයි - 1 කොරි 12:31</u>**

දීමනාවලට වඩා උතුම් මාර්ගයක් වන්නේ ප්‍රේමයේ මාර්ගය බව **1 කොරි 12:31** හි ප්‍රකාශවන බැවින්, එම මාර්ගය නොහොත් ප්‍රේමය දෙස වැඩි විමසිල්ලෙන් බැලීමට, අදහස් කරමි.

❖ ප්‍රේමය ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවක් ලෙස පාවුල්තුමා සඳහන් නොකරන නමුත්, එය නිසැකවම දෙවියන්වහන්සේ අපට නොමිලේ ලබා දෙන්නාවූ දෙයක් වේ, නොහොත් උන්වහන්සේගෙන් අප ලබන්නාවූ තෑග්ගක් වේ.

**රෝම 5:5 :- ''.....මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන <u>දෙවියන් - වහන්සේගේ ප්‍රේමය අපගේ හෘද වල වගුරුවන ලද්දේය</u>.''**

**1 යොහන් 4:7 :- ''.....මක්නිසාද <u>ප්‍රේමය දෙවියන් - වහන්සේගෙන්ය</u> ; ප්‍රේමකරන සැම දෙනාම දෙවියන් - වහන්සේගෙන් ඉපිද සිටිති.''**

මෙම පද අපට පෙන්වාදෙන්නේ, අප දේව දරුකමට ඇතුල්වූවිට, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් දෙවියන් - වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් වල වගුරුවනු ලැබූ බවයි. එනම් 'ප්‍රේමය' ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේගෙන් අප ලබන්නාවූ තෑග්ගක් බවයි.

ප්‍රේමය නමැති මෙම තෑග්ග **'ආත්මයාණන්වහන්සේගේ ඵල'** සඳහන් ලැයිස්තුවේ ප්‍රථමයෙන්ම සඳහන් වෙයි.

**ගලාති 5:22 :- ''ආත්මයාණන්වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන මේවාය.''**

❖ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බොහෝ දීමනා විශේෂ අවස්ථාවන්හිදී කාලයකට සීමාවී අප තුළින් ක්‍රියාත්මක වන අතර, **ප්‍රේමය සෑම කිතුනු ජීවිතයක, සෑම අවස්ථාවකදීම, සෑම කාලයකදීම ප්‍රකාශ විය යුතු ලක්ෂණයකි.**

❖ සාමාන්‍ය කිතුනුවෙක් ඔහුගේ ජීවිතයේ දීමනා එකක්, දෙකක් හෝ තුනක් පමණ ලබන අතර, **ප්‍රේමය නමැති තෑග්ග සෑම කිතුනුවෙක්ම අනිවාර්යයෙන්ම ලබන්නාවූ තෑග්ගකි.**

**1 යොහන් 4:8 :-**

**"ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේ නාඳුනයි ; මක්නිසාද දෙවියන්වහන්සේ ප්‍රේමයය."**

දෙවියන්වහන්සේ නාඳුනන්නාවූ 'දේව දරුවන් ' නොමැත. අප දේව දරුකමට ඇතුල්වන්නේ, උන්වහන්සේව අඳුනාගෙන, දේව පුත්‍රයාට අපගේ හදවත පිදීම තුළිනි. එවිට ශුද්ධාත්මයාණන්වහන්සේ අප දෙවියන්වහන්සේගේ පවුලට බව්තීස්ම කර, දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් වල වගුරුවන සේක **(රෝම 5:5)**.

**1 යොහන් 4:8** අපට උගන්වන්නේ, ප්‍රේමය නැති තැනැත්තා සැබෑ කිතුනුවෙක්/දේව දරුවෙක් නොවන බවයි.

**මාගේ ප්‍රේමණීය සහෝදරයා/සහෝදරී, 1 යොහන් 4:8 අනුව ඔබ දේව දරුවෙක්ව සිටිනවාද ?**

❖ **වඩාත්ම උතුම් මාර්ගය 'ප්‍රේමය' වන බව (1 කොරි 12:31) පෙන්වාදීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.**

ප්‍රේමය හොඳම මාර්ගය වන්නේ, එය

(i) දෙවියන්වහන්සේගේ ස්වභාවය **(දෙවියන්වහන්සේ ප්‍රේමය බව)** ලොවට පෙන්වාදෙන නිසයි.

(ii) දේව දරුවෙකුගේ මුලු ජීවිත කාලය තුළම ක්‍රියාත්මක වන්නාවූ නිසයි.

(iii) කිසිකලක පහවන්නේ නැති නිසයි.
**1 කොරි 13:8 :- " ප්‍රේමය කිසිකලක පහවන්නේ නැත..."**

(iv) සභාවේ එකමුතුකම සහ එක්සත්කම ඇතිකරන නිසයි.

(v) දේව දරුවන් තුළ ප්‍රකාශවන විට, එමගින් මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ වෙත ඇදගැනෙන නිසයි. **(මතෙව් 5:16)**

(vi) තුළින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් එකට සන්නද්ධවී, සභාව වර්ධනය වන නිසයි **(එපීස 4:16)**.

(vii) ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා, නිෂ්ප්‍රයෝජන නොවීමේ හොඳම මාර්ගය නිසයි. ( **1 කොරි 13:1-3**)

(viii) අපව යේසුස්වහන්සේ මෙන් පරිවර්තනය කිරීමේ හොඳම මාර්ගය නිසයි.

(ix) තුළින් අප යේසුස්වහන්සේගේ ගෝලයන් බව ලෝකයා අඳුනාගන්න නිසයි **(යොහන් 13:35)**.

**දේව දරුවෙනි, ප්‍රේමයෙන් එකට බැඳී, දෙවියන් - වහන්සේගේ ආලෝකය මුලු ලොවෙහි පතුරුවමු.**

**3. <u>දීමනා සහිතවද, ප්‍රේමය රහිතවද සභාව ක්‍රියාකිරීම තුළින් සිදුවන්නේ, දේව රාජ්‍යයටද, සභාවේ සාක්ෂියටද බාධාවකි.</u>**

**<u>නිදසුනක් වශයෙන්</u> -** කොරින්තියේ සභාව දෙස බලමු.

**1 කොරි 1:7 :- "මෙසේ නුඹලා <u>කිසි දීමනාවකින් අඩු නොව</u> අපගේ ස්වාමීවූ <u>යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීම බලා සිටින්නහුය</u>."**

**1 කොරි 1:7** කියවන අප දකින්නේ, කොරින්තියේ සභාව තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ සියලු දීමනා අධිකව තිබුණු බවයි. මෙනමුත් **1 කොරි 1:11,13** අපට පෙන්වාදෙන්නේ, මෙම සභාවේ එක්සත්කමක් නොතිබුණු බවත්, එහි වාද, භේද සහ බෙදීම් තිබුණු බවත්ය.

තව දුරටත් **1 කොරි 5:1,2** පෙන්වාදෙන්නේ එහි කාමමිථ්‍යාචාරයද තිබුණු අතර, සභාව එවැනි භයානක පාපයන්ට ඉඩහැරිය බවයි.

**කොරි 11:27,30** හි සඳහන් වන්නේ, සභාවේ බොහෝදෙනා නුසුදුසු ලෙස ස්වාමීන්ගේ රාත්‍රි භෝජනය පැවැත්වීම හේතුවෙන්, බොහෝ දෙනෙක් මරණයට සහ ලෙඩට පත්වූ බවයි. ඉහත සඳහන් කරුණු අනුව පෙනීයන්නේ, කොරින්තියේ සභාව ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා අධිකව අත්දුටු නමුත්, වැරදිලෙස ඒවා භාවිතාකිරීම හේතුකොටගෙන, සභාව ආත්මිකව ඉතා දුර්වල තත්ත්වයකට වැටී සිටි බවයි. කොරින්ති සභාව වෙත පාවුල්තුමා ශුද්ධාත්ම දීමනා ගැන ඉගැන්වීම උදෙසා **1 කොරින්ති ලිපියේ පරිච්ඡේද 3 ක්** වෙන්කිරීම සමගම, **ප්‍රේමයේ මාර්ගය** ඉගැන්වීම උදෙසා **1 කොරි 13** වෙන්කිරීම ද මගින්, මේ සභාව ආත්මික ප්‍රපාතයකට වැටීමේ, මූලික හේතුවක් වූයේ, **සභාවේ ප්‍රේමය රහිත භාවය** කියා නිගමනය කළ හැක.

දේව දරුව, මෙය තේරුම්ගන්න. ප්‍රේමය රහිතව හෝ අඩුව ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කිරීම මගින් සභාව තුළ බොහෝවිට ඇතිවන්නේ, **තරඟකාරිකම, උඩඟුකම, ඊර්ෂ්‍යාව, භේද සහ අපිළිවෙල** වැනි දේවල් වේ. යක්ෂයා සභාව තුළ ඇති කිරීමට උත්සාහ කරන්නාවූ මේ දේවලින් සභාව බේරාගනිමු. **ප්‍රේමයෙන් එක්ව බැඳී සිටිමින්, ප්‍රේමයෙන් යුක්තව ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා භාවිතා කරමු.**

4. **<u>දෙවියන්වහන්සේ අපගේ හදවත්වල වගුරුවන්නාවූ ප්‍රේමයේ ලක්ෂණ - 1 කොරි 13:4-7</u>**

දෙවියන්වහන්සේ අප තුළ ඇතිකරන්නාවූ ප්‍රේමයේ ලක්ෂණ ඍණාත්මක සහ ධනාත්මක ලෙස ඔබ ඉදිරියේ තබමි.

| **ඍණාත්මක** | **ධනාත්මක** |
|---|---|
| -ඊර්ෂ්‍යා නොකිරීම | -ඉවසිලිවන්තකම |
| -පාරට්ටුකර නොගැනීම | -ගුණවන්තකම |
| -උඩඟු නොවීම | -සැබෑව සමඟ ප්‍රීතිවීම |
| -අශෝභන ලෙස නොහැසිරීම | -සියල්ල දරා ගැනීම |
| -තමාගේම කාරණා නොසෙවීම | -සියල්ල විශ්වාස කිරීම |
| -කෝප නොවීම | -සියල්ල බලාපො - රොත්තුවීම |
| -නපුර ගණන් නොගැනීම | -සියල්ල ඉවසීම |
| -අධර්මිෂ්ඨකමට ප්‍රීතිනොවීම | |

ප්‍රේමය ගැන බොහෝවිට අප සිතන්නේ, එය අපගේ හදවත්වල නැතහොත් සිත්වල ඇත්තාවූ, බොහෝ දුරට හැඟීම්වලට සීමාවූ දෙයක් ලෙසය.

දේව දරුව, ප්‍රේමය ප්‍රකාශවන්නේ අපගේ ක්‍රියාවලිනි. අපගේ හැසිරීමෙනි. **<u>1 කොරි 13:4-7 අනුව හැසිරීම</u>, දෙවියන් - වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත් වල වැගිරී ඇති බවට <u>ඔප්පුවයි</u> !!**

දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ,

- **මෙසේ ප්‍රේමකිරීමටයි.**
- **මෙසේ හැසිරීමටයි.**
- **මෙසේ හැසිරීමෙන් උන්වහන්සේගේ ප්‍රේමය ලොවට ප්‍රකාශ කිරීමටයි.**

මෙනමුත් ඉහත සඳහන් අයුරින් අප ක්‍රියාකරන අතර, **ඉවසන අතර, දරාගන්න අතර,** අපගේ සභාවේ 'සහෝදරයින්' පවා අප දෙස බලන්නේ, ඉතා දුර්වලවූ නිවටවූ අය ලෙස විය හැක.

දේව දරුව, මේ අයුරින් ක්‍රියාකිරීමට හැකිවන්නේ, දුර්වලයන්ට නොව, **ක්‍රිස්තුස්වහන්සේ තුළ ශක්තිමත්වූ** අයට පමණි. එබැවින් අන් අය ඔබ 'නිවටයයි' සිතුවත්, ඒ ගැන කරදර නොවන්න. ඔබගේ හදවත දකින දෙවියන්වහන්සේ, උන්වහන්සේව ප්‍රසන්න කිරීමට ඔබට ඇති ආශාව දකින සේක.

එබැවින් අප සැම දෙන, යේසුස්වහන්සේගේ සිත ඇතිව ක්‍රියාකරමු.

- යටහත්කම පැළඳගනිමු
- දෙවියන්වහන්සේට 100% කීකරු වෙමු
- සැමවිටම ප්‍රේමයෙන් ක්‍රියාකරමු
- වඩා උතුම් දීමනාවලට ආශාවෙමු
- එම දීමනා ප්‍රේමයෙන් භාවිතාකරමු

**එසේ කිරීමට දෙව් සමිඳුන්**

**ඔබට පිහිට වනසේක්වා !!**

## සටහන්

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල




ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 11

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල

<u>**හැඳින්වීම**</u> **:-**

අප අද අධ්‍යයනය කිරීමට යන්නාවූ මාතෘකාව එනම් **'ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල'** සෑම කිතුනු ජීවිතයකටම අතිශයින් වැදගත් වන නමුත්, මෙය ගැන දේශනයක් හෝ ඉගැන්වීමක් කිතුනු සභාවට අසන්ට ලැබෙන්නේ කලාතුරකිනි.

එබැවින් සාරවත් කිතුනු ජීවිතයක් උදෙසා අත්‍යවශ්‍ය වන්නාවූ නොහොත් අනිවාර්්‍යය වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල පිළිබඳව මෙම අධ්‍යයනය ඔබ සැමගේ ජීවිතවලට බොහෝ සේ උපකාරවේය යන්න අපගේ විශ්වාසයයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල ගැන නිසි අවබෝධයක් නොමැතිකම හේතුවෙන්, බොහෝ කිතුනුවන් ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වන අතර, එය අනිවාර්්‍යය වන බව අප පවසන්නේ මන්ද? කියා ඔබ අසන්ට පුළුවන. එම ප්‍රශ්නයට අපගේ පිළිතුර වන්නේ, **'සෑම දේව දරුවෙකුගේ ජීවිතයක් පිළිබඳවම, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ, හෙතෙම යේසුස්වහන්සේ මෙන් වීම, නිසා'** යන්නයි.

**රෝම 8 : 29 :-**

**''..... තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස <u>ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට</u> (දේව දරුවන්ට) පූර්වයෙන් නියම කළසේක.''**

**1 පේත්‍රුස් 2:21 :-**

**''..... මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ නුඹලා නිසා වධවිඳ <u>නුඹලා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස</u> නුඹලාට ආදර්ශයක් දී ගියසේක.''**

ඉහත සඳහන් අයුරින්, යේසුස්වහන්සේට සමානව උන්වහන්සේගේ අඩිපාරේ යෑමට දෙවියන්වහන්සේ අපව කැඳවා ඇති අතර, මෙම කැඳවීම දෙකොටසකට කඩමින් පහත සඳහන් ලෙස විස්තර කළ හැක.

1 නි කොටස - සෑම සැබෑ දේව දරුවෙකුගේම **චරිතය, යේසුස්වහන්සේගේ චරිතයට සමානවීම.**

2 නි කොටස - සෑම සැබෑ දේව දරුවෙකුගේම **සේවය** තම කැඳවීමට ඔබින ලෙස **දේව බලයෙන් පූර්ණවීම.**

(බලවත් ඉවැන්ජලිස්ත සේවයකට සහ සබත් පාසලක කුඩා ළමුන්ට ඉගැන්වීමේ සේවයට කැඳවනු ලැබූවන් අතර, මෙම දේව බලයේ මහත් වෙනස්කමක් තිබිය යුතු බව, ඔබට වැටහෙනවා යයි විශ්වාස කරමි. එබැවින් මෙම දේව බලය අප එකිනෙකා අතර බොහෝසෙයින් වෙනස් වන නමුත්, අප සැමදෙනාගේ චරිත බොහෝ දුරට එක සමාන විය යුතු බවද අප තේරුම් ගත යුතු වේ).

මේ අයුරින් අප ඔබ ඉදිරියේ තබා ඇත්තාවූ පිළිතුර, තවත් ප්‍රශ්නයකට තුඩුදෙයි. එම ප්‍රශ්නය වන්නේ, ' දුර්වලවූ මනුෂ්‍යයන් වන්නාවූ අප, මෙසේ යේසුස්වහන්සේගේ අඩිපාරේ සාර්ථකව යන්නේ කෙසේද? ' යන ප්‍රශ්නයයි. එම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් දේව වචනයෙන් පද දෙකක් ඔබ ඉදිරියේ තබන්නෙමි.

**ගලාති 4:6 :- "තවද නුඹලා පුත්‍රයන්ව සිටින බැවින් : අබ්බා පියාණෙනි, කියා හඬ ගසන්නාවූ තමන් පුත්‍රයාණන්ගේ ආත්මය දෙවියන්වහන්සේ අපේ සිත්වලට එවූ සේක."**

**යොහන් 15:5 :- "යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය."**

මෙම පද අපට පෙන්වාදෙන්නේ, යේසුස්වහන්සේ මෙන් වීම උදෙසා, දෙවියන්වහන්සේ අපට සපයා ඇති මාර්ගයයි. **එනම් යේසුස්වහන්සේගේ ආත්මය අපගේ සිත්වලට එවීමේ මාර්ගයයි.**

දේව දරුවෙනි, අපගේ ශරීර ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව වනසේක. (**1 කොරි 6:19**), අපගේ සිත්වලට යේසුස්වහන්සේගේ ආත්මය දෙවියන්වහන්සේ එවූ සේක **(ගලාති 4:6).** එබැවින් අප සැම, ශුද්ධාත්මයාණන්වහන්සේට අපගේ ජීවිතවල පාලනය සම්පූර්ණයෙන්ම භාරදෙමින්, යේසුස්වහන්සේ මෙන් අපව පරිවර්තනය කිරීමට උන්වහන්සේට ඉඩහරිමු !!

**<u>අධ්‍යයනය</u> :-**

**1. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සහ ඵල සසඳා බැලීම</u>**

(a) ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා 9 ක් **1 කොරි 12:8-10** දක්වා සඳහන් වන අතර, ශුද්ධාත්මයාණන්-වහන්සේගේ ඵල 9 ක් **ගලාති 5 : 22, 23** හි සඳහන් වේ.

මෙම ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා 9, එළිදරව් කිරීමේ දීමනා 3 කින්ද, වාචික දීමනා 3 කින්ද, බලයේ දීමනා 3 කින්ද සමන්විතවූ කොටස් තුනකට වර්ගකර අප ඉගෙන ගත් අයුරින්ම, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ඵල 9 ද, කොටස් 3 කට දමා අප ඉදිරිපත් කරන්නේ, එසේ කිරීම ඒවා තේරුම්ගැනීමට ඉවහල් වන බැවිනි. එම කොටස් 3 පහත සඳහන් වේ.

(i) දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධකමට අදාල වන්නාවූ ඵල 3 ක් - **ප්‍රේමය, ප්‍රීතිය, සාමදානය.**

(ii) අන් අය සමග අපගේ සම්බන්දකම්වලට අදාල වන්නාවූ ඵල 3 ක් - **ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම.**

(iii) අප අප සම්බන්ධයෙන්ද දක්වන්නාවූ ක්‍රියාකිරීමට අදාල වන්නාවූ ඵල 3 ක් - **විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම.**

(b) ශුද්ධාත්මයාණන්ගේ දීමනා තුළින්, මනුෂ්‍යයන්ට ප්‍රකාශවන්නේ **දෙවියන්වහන්සේගේ බලයයි.**

<u>නිදසුනක් වශයෙන්</u> :- **ක්‍රියා 3:1-11** සඳහන්, මවුකුස පටන් කොරව සිටි මනුෂ්‍යයෙක් පේත්‍රුස් සහ යොහන් විසින් සුවකරනු ලැබීම, මනුෂ්‍යයන් පුදුමයෙන්ද විස්මයෙන්ද පිරෙව්වේය **(ක්‍රියා 3:10).** මේ අතර පේත්‍රුස් එම සෙනඟට ප්‍රකාශ කළේ, ඒ සුවවීම සිදුවූයේ ඔවුන්ගේ බලයෙන් නොව දෙවියන්වහන්සේගේ බලයෙන් බවයි.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල තුළින්, මනුෂ්‍යයන්ට ප්‍රකාශ වන්නේ **දෙවියන්වහන්සේගේ ස්වභාවයයි/ ශුද්ධකමයි.**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේ ඔබත් මාත් කැඳවා ඇත්තේ, දෙවියන්වහන්සේගේ බලය මෙන්ම උන්වහන්සේගේ ස්වභාවය ලොවට ප්‍රකාශකිරීමට බව අමතක නොකරන්න.

(c) ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සහ ඵල අතර ඇත්තාවූ වැදගත් වෙනස්කම් කිහිපයක්, ඔබට පැහැදිලිව පෙන්වාදීම උදෙසා, පහත සඳහන් වගුව ඔබ ඉදිරියේ තබමි.

| | **ශුද්ධාත්මයාණන්-වහන්සේගේ දීමනා 1 කොරි 12:8-10** | **ශුද්ධාත්මයාණන්-වහන්සේගේ ඵල ගලාති 5:22,23** |
|---|---|---|
| 1. අපට මේවා ලැබෙන්නේ කවදාද ? | ශුද්ධාත්මයාණන්-වහන්සේගේ බව්තීස්මය ලැබූ විගස | අප තුළ ක්‍රමයෙන් වර්ධනය වේ. |
| 2. අපට මේවා ලැබෙන්නේ කුමක් උදෙසාද ? | **ක්‍රිස්තුස්වහන්සේගේ වැනි සේවයක් උදෙසා** | **ක්‍රිස්තුස්වහන්සේගේ වැනි ජීවිතයක් (චරිතයක්) අප ලැබීම උදෙසා** |
| 3. මේවා ලැබීමෙන් අප තුළින් කුමක් සිදුවිය යුතුද ? | **දෙවියන්වහන්සේගේ බලය** ප්‍රකාශ විය යුතුයි. | **දෙවියන්වහන්සේගේ ශුද්ධකම** ප්‍රකාශ විය යුතුයි. |
| 4. අප මේවා වර්ධනය කරගන්නේ කෙසේද ? | **ඒවා පුබුදු කිරීමෙන් (2 තිමෝති 1:6) සහ නිතර භාවිතා කිරීමෙන්** | **නොකඩව කීකරු වීමෙන්** |

## 2. දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධකමට අදාල ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල තුන

මෙම ඵල තුන වන්නේ, ප්‍රේමය ප්‍රීතිය සහ සමාදානයයි.

**ගලාති 5 : 22, 23 :- "[22] නුමුත් ආත්මයාණන්වහන්සේගේ ඵල නම් - ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්ත කම, යහපත්කම, [23] විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියා කිරීම යන මේවාය."**

ත්‍රි එක දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධකමට අදාල වන්නාවූ, දීමනා තුන පිළිබඳව දේව වචනයේ සඳහන් පද දෙස බලන අපට පෙනීයන ඉතා අනර්ඝ කරුණක් වන්නේ, උන්වහන්සේ,

**<u>දෙවියන්වහන්සේගේ ප්‍රේමය</u> අපගේ <u>හදවත්වලද</u> -**
**(රෝම 5:5)**

**<u>ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රීතිය</u> අපගේ <u>ආත්මවලද</u> -**
**(1 තෙස 1:6)**

**<u>යේසුස්වහන්සේගේ සමාදානය</u> අපගේ <u>සිත්වලද</u> -**
**(කොලො 3:15)**

ඇතිකරන බවයි.

ප්‍රේමණීය දේව දරුව, මෙය තේරුම්ගන්න. ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ ඵල අපගේ දැඩි උත්සාහය නිසා හෝ අපගේ අධික කැපවීම නිසා, අපගේ ජීවිතවල හට නොගනී. ඒවා හටගන්නේ, දෙවියන්වහන්සේගේ බලයට අප තුළ ක්‍රියාකිරීමට අප සම්පූර්ණයෙන්ම ඉඩ හැරීම තුළිනි.

### (i) ප්‍රේමය

**රෝම 5:5 :-"....මක්නිසාද අපට දෙන ලද ශුද්ධාත්ම - යාණන්වහන්සේ කරණකොටගෙන <u>දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපගේ හෘදවල වගුරුවන ලද්දේය</u>."**

දේව දරුව, අප දේව දරුකමට ඇතුල්වූ මොහොතේදීම, ශුද්ධාත්මයාණන්වහන්සේ කරණකොටගෙන මෙම දිව්‍ය ප්‍රේමයේ බීජ අපගේ හදවත්වල වපුරනු ලැබේ.

මෙම ප්‍රේමය, දෙවියන්වහන්සේගේ ප්‍රේමයයි. එනම්, අගාපේ (AGAPE) නොහොත් පූජාවීමේ ප්‍රේමයයි. එම ප්‍රේමය අතිශයින් බලවත් ප්‍රේමයක් වන අතර, කිසිම දෙයකට දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව වෙන් කළ නොහැක.

**රෝම 8:38-39:-" [38] මක්නිසාද මරණයටවත්, ජීවන - යටවත්, දූතයන්ටවත්, .....[39] උසටවත්, ගැඹුරටවත්, අන් කිසි මැවිල්ලකටවත්, අප ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇත්තාවූ <u>දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකි වන්නේ යයි</u> ඒකාන්තයෙන්ම <u>දනිමි</u>."**

මෙවැනි ප්‍රේමයක් අපගේ හදවත්වල වගුරුවන දෙවියන් - වහන්සේ අපව කැඳවන්නේ මෙම ප්‍රේමයෙන් අන් අයටද ප්‍රේමකිරීමටය.

- ❖ **සහෝදරයන්ට ප්‍රේම කිරීම**

තමන්වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල වගුරුවා, එම ප්‍රේමයෙන්ම අපගේ සහෝදරයන්ට ප්‍රේමකිරීමට දෙවියන්වහන්සේ අපව කැඳවනසේක. අප එසේ නොකර අපගේ සහෝදරයාට වෛර කරන්නේ නම්. **'තාගේ දෙවියන්වහන්සේට ප්‍රේමකරව, යන උතුම්වූ පළමුවෙනි ආඥාව' (මතෙව් 22:37, 38)** නියතින්ම අප කඩකරන බව දේව වචනය පෙන්වාදෙයි.

**1 යොහන් 4:20,21 :- " [20] යමෙක් : දෙවියන්වහන්සේට ප්‍රේමකරමියි කියා තමාගේ සහෝදරයාට වෛර කෙරේ නම්, ඔහු බොරුකාරයෙක්ය. මක්නිසාද තමා දුටු සහෝදරයාට ප්‍රේම නොකරනවා නම්, තමා <u>නුදුටු</u> දෙවියන්වහන්සේට ප්‍රේමකරන්ට ඔහුට නුපුළුවන. [21] දෙවියන්වහන්සේට ප්‍රේමකරන තැනැත්තේ තමාගේ සහෝදරයාටත් ප්‍රේම කරාවා යන මේ ආඥාව අපි උන්වහන්සේගෙන් ලැබීමුව."**

- ❖ **1 කොරි 13:4-7** දක්වා සඳහන් ලක්ෂණ මගින් දෙවියන්වහන්සේගේ ප්‍රේමය අපට තව දුරටත් තේරුම්ගත හැකිවේ.

(a) දේව ප්‍රේමය සැමවිටම අන් අයගේ යහපත උදෙසා පුදනු ලබන්නාවූ ප්‍රේමයකි.

**යොහන් 3:16 :- ''මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක.....''**

(b) එම ප්‍රේමය පරාර්ථකාමීවූ, තමාගේම කාරණා නො - සොයන්නාවූ ප්‍රේමයකි (**1 කොරි 13:5**). දේව දරුවනි, දෙවි සමිඳුන් අපව කැඳවන්නේ මේ අයුරින් අපගේ සහෝදරයන්ට ප්‍රේම කිරීමටයි.

**1 පේත්‍රුස් 1:22 :- ''සහෝදරයන්ට <u>අවංකකමින්</u> ප්‍රේමකරන පිණිස සත්‍යතාවට කීකරුවෙමින් නුඹලාගේ ආත්ම පිරිසිදු කරගත් බැවින්, සිතින් <u>එකිනෙකාට උනන්දු ලෙස ප්‍රේම කරපල්ලා</u>.''**

❖ **සතුරන්ට ප්‍රේම කිරීම**

**මතෙව් 5:44** වන පදයේ, යේසුස්වහන්සේ අපට අනුශාසනා කරන්නේ අපගේ සතුරන්ට ප්‍රේමකිරීමටද, අපට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීමටද, කියාය.

මෙනමුත් අප සැවොම පුරුදුව සිටින්නේ, අප ආසා කරන අයට ලක්ෂණ ගති ගුණ තිබෙන අයට, අපට හිතවත් අයට, අපට ප්‍රේම කරන අයට වැනි අයට ප්‍රේමකිරීමටත්, අපට වෛර කරන අයට වෛර කිරීමටත්ය. කිතුනු අපගෙන් බහුතරයක් මෙසේ ක්‍රියා කරන අතර, අප බොහෝවිට සිතන්නේ අප ඉතා හොඳ කිතුනුවන් කියාය. දේව දරුවෙනි, මෙසේ ක්‍රියාකරන්නාවූ අප ගැන, අපගේ ස්වාමීන්වහන්සේ පවසන වදන් දෙස බලන්න.

**මතෙව් 5 : 46-48 :- '' 46 නුඹලාට ප්‍රේම කරන්නන්ටම නුඹලා ප්‍රේම කරනවා නම්, නුඹලාට කවර විපාකයක්ද? සුංගම් අයකරන්නෝ පවා එසේ නොකරද්ද? 47 නුඹලාගේ සහෝදරයන්ට පමණක් ආචාර කරනවා නම්, නුඹලා අනුන්ට වඩා කුමක් කරන්නහුද? අන්‍ය ජාතීහු පවා එසේ නොකරද්ද? 48 එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින්නාක් මෙන් නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා.''**

අපගේ ස්වාමීන්වහන්සේ අපව කැඳවන්නේ, උන්වහන්සේ මෙන් සම්පූර්ණව සිටීමටයි. අපගේ සතුරන්ට ප්‍රේම කිරීමටයි. අපට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීමටයි.

මනුෂ්‍යවූ අපට මෙය ඉතා අසීරු දෙයකි. මෙනමුත් දෙවියන්-වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වල ශුද්ධාත්මයාණන් - වහන්සේ වගුරා ඇති බැවින්, මෙය අපට කළ හැකි දෙයකි.

දේව දරුවෙනි, අපගේ සමිඳුන්ගේ වදන් වලට කීකරු වෙමු. එසේ කිරීම උදෙසා <u>ශුද්ධාත්මයාණන්වහන්සේට අපගේ</u> <u>**ජීවිතවල පාලනය භාර දෙමින්,**</u> <u>උන්වහන්සේට</u> <u>**නොකඩව කීකරු වෙමින්, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වර්ධනය කර ගනිමු.**</u>

❖ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල අපගේ ජීවිත තුළ වර්ධනය වීමේ වැදගත්කම නිසාම, එම ඵල වලට එරෙහිව ක්‍රියාකරන්නාවූ **'මාංසයේ ක්‍රියා'** වෙතද ඔබගේ අවධානය යොමුකරමි.

**ගලාති 5:17 :- "මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද, ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශාකරයි."**

**ගලාති 5:19,20,21 :- " [19] ඉඳින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ ; එනම් [20] වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදීකම්, භේද, ලබ්ධිභේද, [21]වෛර, බීමත්කම, මංගල්‍ය ෂෝෂා සහ තවත් එවැනි දේවල්ය....."**

ඉහත සඳහන් පද අනුව, අපට ඉතා පැහැදිලිව පෙනී යන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයක් වන්නාවූ ප්‍රේමය අප තුළ වර්ධනය වන බැවින්, ප්‍රේමය සමග නොගැලපෙන්නාවූ 'මාංසයේ ක්‍රියා' අප තුළ කිසිසේත් නොතිබිය යුතු බවයි.

එනම්, <u>**සතුරුකම්, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, භේද, වෛර**</u> <u>යනාදිය අපගේ ජීවිතවලින්, සම්පූර්ණයෙන්ම අප විසින් උදුරා දැමිය යුතු බවයි.</u>

(ii) **ප්‍රීතිය**

**ලූක් 10:21 :- "ඒ පැයේදීම උන්වහන්සේ <u>ශුද්ධාත්මයෙන් ප්‍රීතිමත්ව</u> කියනසේක් ....."**

**රෝම 14:17 :- "මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය කෑමත් බීමත් නොව, ධර්මිෂ්ඨකමද සමාදානයද <u>ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද</u> වේ."**

**1 තෙස 1:6 :- "නුඹලාද බොහෝ පීඩාවෙන් යුක්තව <u>ශුද්ධාත්මයාණන්ගේ ප්‍රීතියෙන්</u> වචනය පිළිගැනීමෙන්......"**

ඉහත සඳහන් පදවල අප දකින්නේ, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ අපට ලබා දෙන්නාවූ, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ඵලයක් වන්නාවූ ප්‍රීතියයි. දේව දරුවෙනි, මෙය තේරුම්ගන්න. කිතුනු අප තුළ ඇත්තාවූ මෙම ප්‍රීතිය,

- පිටස්තර කරුණු / තත්ත්වය අනුව වෙනස්නොවන ප්‍රීතියකි.
- අප අභ්‍යන්තරයෙන් පැන නැගෙන්නාවූ ප්‍රීතියකි.
- ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ ඇතිකරන්නාවූ ප්‍රීතියකි.

❖ පාවුල්තුමා පිලිප්පිවරුන් වෙත යැවූ ලිපිය, ඔහු විසින් ලියන ලද්දේ, ක්‍රි.ව. 61 පමණ බවත්, එවිට ඔහු සිටියේ රෝමයේ 'නිවාස අඩස්සියේ ' බවත් **(ක්‍රියා 28:14-31)** බොහෝ විචාරකයන්ගේ මතයයි.

'නිවාස අඩස්සියේ' සිටීම මගින්, ඔහු තුළ තිබුණාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයක් වන්නාවූ ප්‍රීතිය කිසි අන්දමකින් අඩු නොවූ බව අප දකින්නේ, මෙම ලිපියේ නිතරම ප්‍රීතිය ගැන ඔහු සඳහන් කිරීම හේතුවෙනි.

**පිලිප්පි 3:1 :- "ඉතින් මාගේ සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීති වෙයල්ලා....."**

**පිලිප්පි 4:4 :- "ස්වාමීන්වහන්සේ තුළ නිතරම ප්‍රීතිවෙයල්ලා, ප්‍රීතිවෙයල්ලා යයි නැවතත් කියමි."**

නිවාස අඩස්සියේ සිටි පාවුල්තුමා **'ප්‍රීතිවෙයල්ලා'** කියා අනුශාසනා කරන පිලිප්පිවරුන් විවිධාකාර විවේචන, පීඩා සහ නපුරු විරුද්ධතා වලට ගොදුරුව සිටින බව **පිලිප්පි 3:2** පදය මගින් අප දකිමු.

**පිලිප්පි 3:2 :- "බල්ලන්ගෙන් ප්‍රවේසම්වෙයල්ලා, නපුරු ක්‍රියා කාරයන්ගෙන් ප්‍රවේසම්වෙයල්ලා, ඡේද්‍ය කරන්නන්ගෙන් ප්‍රවේසම්වෙයල්ලා."**

එබැවින් **පිලිප්පි 3:1** පදය තව දුරටත් තහවුරු කරන්නේ, කිතුනු අපගේ ප්‍රීතිය, පිටාතර කාරණා හේතුකොටගෙන, නොවෙනස් වන බවය.

❖ **ශුභාරංචිය ප්‍රකාශකිරීම මෙම ප්‍රීතිය ගෙන දෙයි**

**ක්‍රියා 8:8 :- " බොහෝ අංශභාග රෝගීහුද කොරුද සුවකරනු ලැබුවෝය. ඒ නුවර මහත් ප්‍රීතියක් වූයේය."**

**ක්‍රියා 8:39 :- ".....නපුංසකයා.....ප්‍රීතිවෙමින් තමාගේ ගමන ගියේය."**

**පිලිප්පි 1:18 :- ".....ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශකරනු ලබනසේක ; ඊට ප්‍රීතිවෙමි, එසේය, තවත් ප්‍රීතිවන්නෙමි."**

දේව දරුව, ඔබ මෙම ප්‍රීතිය අත්දකිනවාද ? දේව වචනය අපට පෙන්වාදෙන්නේ, **'පශ්චාතාප වන්නාවූ එක පව්කාරයෙකු ගැන දෙවියන්වහන්සේගේ දූතයන් ප්‍රීති වන බවය' (ලූක් 15:10)**

දේව දරුව, ඔබගේ සේවය නිසා කිසිකෙනෙක් පශ්චාතාපයට පැමිණ තිබෙනවාද ? අප සැම, ශුභාරංචිය ප්‍රකාශකරමු. ගැළවීමේ මාර්ගය, විනාශ වන්නාවූ මනුෂ්‍යයන්ට පෙන්වාදෙමු !

පාවුල්තුමාගේ මහඟු මිෂනාරී සේවය හේතුකොටගෙන, බොහෝ කිතුනු සභාවන් පිහිටුවන ලද බව අප දනිමු. පාවුල්තුමා තම සේවය මගින් දේව දරුකමට ඇතුල්වූවන් ගැන සඳහන් කරන්නේ, ඔහුගේ **' ප්‍රීතියත්, ඔටුන්නත් '** ලෙසය.

**පිලිප්පි 4:1 :- "එහෙයින්, මාගේ ප්‍රේමවන්තවූ, මා ඉතා ඇලුම්වෙන්නාවූ සහෝදරයෙනි, <u>මාගේ ප්‍රීතියත් ඔටුන්නත්වූ මාගේ ප්‍රේමවන්තයෙනි</u>, ...."**

**1 තෙස 2:19,20 :- " [19] අපගේ බලාපොරොත්තුවත් <u>ප්‍රීතියත් පාරට්ටුවේ ඔටුන්නත්</u> කිමෙක්ද? අපගේ <u>ස්වාමිවූ යේසුස්වහන්සේගේ ඊමේදී උන්වහන්සේ ඉදිරියෙහි</u> <u>නුඹලාම නොවේද?</u> [20] එසේය, <u>නුඹලා අපේ ගෞරවයත් අපේ ප්‍රීතියත්ය</u>."**

ප්‍රේමවන්ත දේව දරුවෙනි, මෙම පද අපට පෙන්වා - දෙන්නේ, ආත්ම දිනාගැනීම අපට ගෙන එන්ට යන්නාවූ, ඉමහත් ප්‍රීතියයි. <u>අපගේ ස්වාමීන්වහන්සේ ඉදිරියේ ගෞරවය සහ ප්‍රීතියයි</u>. මෙම ප්‍රීතිය ඔබගේම කරගැනීම උදෙසා ක්‍රියා කිරීම අතපසු නොකරන්න. අදම ආත්ම දිනාගැනීම පිණිස, සේවයේ යෙදෙන්න. ඔබගේ මෙම සේවය ඵල දරන අතර, ඔබගේ ප්‍රීතිය සම්පූර්ණ වනවා පමණක් නොව, ස්වර්ගයේ දේව දූතයන්ද ඔබ සමග ප්‍රීති වනවා ඇත.

### ❖ පීඩා මැද තවත් වැඩිවන්නාවූ ප්‍රීතිය

මුල් සභාව දෙස බලන අප දකින්නේ, හිර ගෙවල් මැද, පීඩා මැද, ඔවුන්ගේ ප්‍රීතිය සහ සන්තෝෂය වැඩිවූ බවයි.

**ක්‍රියා 5:41-42 :- "එහෙයින් ඔව්හු ඒ නාමය නිසා නින්දා විඳින්ට තුමූ වටින්නෝයයි ගණන්ගනු ලැබූ බැවින් සන්තෝෂව.....දේශනා කිරීමෙන්ද නොනැවතුණෝය."**

**ක්‍රියා 13:50-52 :- " [50]නුමුත් යුදෙව්වරු.....පාවුල් සහ බාර්ණබස්ට විරුද්ධව පීඩාවක් උපදවා, තමුන්ගේ සීමාවලින් ඔවුන් පිටතට ලුවෝය..... [52].....ගෝලයෝ වනාහි ප්‍රීතියෙන්ද ශුද්ධාත්මයෙන්ද පූර්ණවූහ."**

ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ ආත්ම තුළ ඇතිකරන්නාවූ, නොවෙනස්වන ප්‍රීතය, මකිදෝනියේ දිළිඳු ඇදහිලිවන්තයන්ගේ ජීවිත එදා පෙන්නුම් කළ අතර, එය අපට අදත් ආදර්ශයක් සහ අභියෝගයක් වේ.

**2 කොරි 8:1,2 :-**

**" [1] තවද සහෝදරයෙනි, මකිදෝනියේ සභාවලට දී තිබෙන දෙවියන්වහන්සේගේ අනුග්‍රහය අපි නුඹලාට දන්වමු. [2]එනම්, බොහෝ දුක්විඳීම නැමති පරීක්ෂාවකදී ඔවුන්ගේ ප්‍රීතිය වැඩිවූ බවත්, ඔවුන්ගේ මහත් දිළිඳුකමේ ප්‍රමාණයට ඔවුන් ඔවුන්ගේ තෑගිවන්තකම නමැති ධනයෙන් වැඩිවූ බවත්ය."**

අපද මකිදෝනියේ සභාව මෙන් දෙවියන්වහන්සේ ප්‍රසන්න දේ කරමු (**2 කොරි 8:1-5** කියවා බලන්න). කෙතරම් පීඩා ආවත් එසේ කරමු. එවිට අපගේ ප්‍රේමණීය පියාණන් - වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ප්‍රීතය අප තුළ වර්ධනය කරමින්, **කිසිම දෙයකට අපගෙන් ඉවත් නොකළ හැකි ප්‍රීතියක් අපට ලබා දෙනසේක.**

(iii) **සමාදානය**

ත්‍රි එක දෙවියන්වහන්සේ සමඟ අපේ සම්බන්ධකමට අදාළ වන්නාවූ තෙවැනි ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය වන්නේ, යේසුස්වහන්සේ අපගේ සිත් තුළ ඇතිකරන්නාවූ සමාදානයයි.

**කොලොස්සි 3:15 :-**

**"ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය නුඹලාගේ සිත්වල ආණ්ඩු- කෙරේවා...."**

**පිලිප්පි 4:7 :-**

**"එවිට කිසි නුවණකින් දැනගත නොහැකිවූ දෙවියන් - වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතිවිලිද ආරක්ෂා කරනවා ඇත."**

❖ නව ගිවිසුමේ දෙවි සමිඳුන්ට **'සමාදානයේ දෙවියන්වහන්සේ'** ලෙස ව්‍යවහාර කරන පද හයක් තිබේ. ඒවා නම් **රෝම 15:33, 16:20, 2 කොරි 13:11, පිලිප්පි 4:9, 1 තෙස 5:23, හෙබ්‍රෙව් 13:20,** යන පද වේ. මේවායින් එකක් පමණක්, පහත සඳහන් කරමි.

**රෝම 15:33 :-**

**" ඉඳින් සමාදානයේ දෙවියන්වහන්සේ නුඹලා සියල්ලන් සමඟ සිටින සේක්වා."**

මෙසේ දෙවියන්වහන්සේට **' සමාදානයේ දෙවියන්වහන්සේ '** ලෙස ව්‍යවහාර කරනු ලබන්නේ මන්ද කියා සිතා බලන අපට පෙනීයන්නේ, උන්වහන්සේ සමාදානය ඇති කිරීමට ක්‍රියා කරන්නාවූ දෙවියන්වහන්සේ වන බවයි.

මැවුම්කාර දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුණු සමාදානය ඒදන් උයනේදීම යක්ෂයා විසින් නැති කරනු ලැබූ අතර, එම සමාදානය නැවත ඇති කිරීමට උන්වහන්සේ, යේසුස්වහන්සේව ලොවට එවූසේක **(රෝම:5:1, කොලො 1:19** කියවන්න). එබැවින් මෙම සමාදානය ඇති කිරීම උදෙසා ක්‍රියා කළාවූ දෙවියන් - වහන්සේට **'සමාදානයේ දෙවියන්වහන්සේ'** කියාද, උන්වහන්සේගේ ඒකජාතක පුත්‍රවූ යේසුස්වහන්සේට **'සමාදානයේ කුමාරයා'** කියාද දේව වචනයේ සඳහන්වීම, පුදුමයක් නොවේ.

දේව දරුව, මෙය කියවන්නාවූ ඔබ, සමාදානයේ දෙවියන්වහන්සේ ඔබට නොමිලේ ප්‍රධානය කරන්නාවූ, උන්වහන්සේ සමඟ සමාදානය යන අමිල ත්‍යාගය භාරගෙන තිබෙනවාද ?

- **මනුෂ්‍යයන් සමඟ සමාදානය**

'සමාදානයේ දෙවියන්වහන්සේගේ' දරුවන්වූ අපට උන්වහන්සේ කැඳවන්නේ, උන්වහන්සේ සමඟ අප ලැබූ සමාදානය අන් අයටද හඳුන්වාදීමටද, මනුෂ්‍යයන් අතරේ සමාදානය ඇතිකිරීමටද වේ.

**මතෙව් 5:9 :- "සමාදානය කරන්නෝ ආශීර්වාද ලද්දෝය ; මක්නිසාද ඔවුන් දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය."**

මේ අතරම දේව වචනය අපට උගන්වන්නේ, සියලු මනුෂ්‍යයින් සමඟ <u>සමාදානයෙන් සිටීමට උත්සාහ කරන ලෙසය</u>.

**රෝම 12:18 :- "<u>පුළුවන් නම්, නුඹලාගෙන් විය හැකි ප්‍රමාණයට</u>, සියලු මනුෂ්‍යයන් සමඟ සමාදානයෙන් සිටපල්ලා."**

**හෙබ්‍රෙව් 12:14 :-" සියල්ලන් සමඟ සමාදානයෙන් සිටින්ටත්..... <u>උත්සාහ කරපල්ලා</u>."**

අප කෙතරම් උත්සාහ කළත්, සමහර මනුෂ්‍යයින් අප සමඟ සමාදානයෙන් ක්‍රියාකිරීම ප්‍රතික්ෂේප කළ හැක. අපට වෛර කළ හැක. දේව වචනය පවසන්නේ, අනුන් කෙසේ ක්‍රියා කළත්, **'<u>හැකි තරම් ප්‍රමාණයට,</u> සියල්ලන් සමඟ සමාදානයෙන් සිටීමට, <u>අප උත්සාහ කළ යුතු බවයි</u>.'**

❖ දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර ආරම්භයේ තිබුණාවූ සමාදානය බිඳ දමූ යක්ෂයා, සභාව තුළ අසමාදානය ඇතිකිරීමට නිරන්තරයෙන්ම වෙර දරයි. මෙය උදෙසා බොහෝවිට යක්ෂයා විසින් පාවිච්චිකරනු ලබන්නේ, 'කිතුනු නම දරන්නාවූ අපම වීම' කණගාටුවට කරුණකි.

**ගලාති 5:19 :- ".....මාංශයේ ක්‍රියා.....එනම් <u>ඊෂ්‍යාව</u>..... <u>පක්ෂවාදිකම</u>..... <u>භේද</u>..... සහ තවත් එවැනි දේවල්ය."**

**ගලාති 5:22 :- "ආත්මයාණන්වහන්සේගේ ඵල නම්..... <u>සමාදානය</u>...."**

මාගේ ප්‍රේමවන්ත දේව දරුවෙනි, අප සැම මාංශයේ ක්‍රියා අතහරිමු. සභාවේ අසමාදානය ඇතිකිරීම උදෙසා, යක්ෂයා යොදාගන්නාවූ කූට උපායන්ට අසුනොවෙමු. යක්ෂයාට විරුද්ධව සිට, **'සමාදානයේ බැම්මෙන් ආත්මයාණන්ගේ එකමුතුකම පවත්වාගන්ට උත්සාහ කරමු.' (එපීස 4:3)**

සැබවින්ම මෙය සාර්තකව කළ හැක්කේ **'ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන් පිරුනාවූ'** දේව දරුවන්ට වන බැවින්, අප සැමවිටම ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව ජීවත්වීමට උත්සාහ කරමු. **'ක්‍රිස්තුස්වහන්සේගේ සමාදානය අපගේ සිත්වල ආණ්ඩුකිරීමට' (කොලො 3:15)** ඉඩහරිමු.

**දෙවි පියාණන්වහන්සේ,**
**ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල වන්නාවූ**
**ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය**
**ඔබ සැමදෙනාගේ ජීවිතවල වර්ධනය කරන සේක්වා !!!**

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල-02




ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 12

**<u>හැඳින්වීම</u> :-**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල පිළිබඳව අප කරන්නාවූ දෙවැනි අධ්‍යයනය වන්නේ මෙයයි. පසුගිය අධ්‍යයනයෙහිදී, 'දෙවියන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධකමට අදාල' ඵල තුන, එනම් **ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය** වෙත අපගේ අවධානය යොමු කරන ලදී. මෙම අධ්‍යයනයෙහිදී අප ඉගෙන ගැනීමට යන්නේ, 'අන් අය සමඟ අපගේ සම්බන්ධකම්වලට අදාල' වන්නාවූ ඵල තුන, එනම් **ඉවසිලිවන්තකම, කරුණාවන්තකම සහ යහපත්කම** ගැනවේ.

දෙවියන්වහන්සේ හා සමඟ අපගේ සම්බන්ධකම වර්ධනය වීම සමඟ ත්‍රී එක දෙවියන්වහන්සේ අප තුළ ඇතිකරන්නාවූ ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය වර්ධනය වනවා ඇත. උන්වහන්සේ අපගේ හදවත්වල වගුරුවන්නාවූ ප්‍රේමය, අපගේ ජීවිතවලට එකතු කරන්නාවූ අභ්‍යන්තර ප්‍රීතිය, සහ අපගේ සිත්වල ඇති කරන්නාවූ සමාදානය, හේතුවෙන් අප දිනක් පාසා දිනක් අත්දකින්නාවූ සැනසීම සහ සතුට, අන් අයට බොහෝවිට තේරුම්ගැනීමට පවා අපහසුවනවා ඇත. මේ අතර අද දවසේ අප අධ්‍යයනය කිරීමට යන්නාවූ **ඉවසිලිවන්තකම, කරුණාවන්තකම සහ යහපත්කම** යන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල තුන, අපගේ ජීවිතවල ප්‍රකාශවන අතර, ඔවුන් **දෙවියන්වහන්සේගේ ස්වභාවය අප තුළින් දකින්ට යනවා ඇත.**

දේව දරුව, අපව තමන්වහන්සේගේ දරුකමට කැඳවාගත් දෙවියන්වහන්සේ, අපගෙන් බලාපොරොත්තු වන්නාවූ එක දෙයක් වන්නේ, අපගේ යහපත් ජීවිතය මගින් උන්වහන්සේගේ නාමය ගෞරවයට සහ මහිමයට පත් කිරීමයි.

**මතෙව් 5:16 :-**

**"එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළාවා."**

ප්‍රේමණීය සහෝදරයා/සහෝදරී, මෙය තේරුම්ගන්න. අපගේ අභ්‍යන්තරයේ තිබෙන්නාවූ, ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය අන්‍යන්ට බොහෝවිට නොපෙනෙන නමුත්, අපගේ ඉවසිලිවන්තකම , කරුණාවන්තකම සහ යහපත්කම **අපගේ ක්‍රියාවලින් මනුෂ්‍යයින් දකිනු ඇත.** එසේ දකින ඔවුන් පෙළඹෙන්නේ අපගේ ජීවිත ගැන තුති පුදන්ටය. එමගින් සිදුවන්නේ දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පැමිණීමය.

මේ අයුරින්ම කිතුනු අප **නොඉවසිලිවන්ත වන විට, අකාරුණාවන්තව ක්‍රියා කරන විට, අයහපත්කම් කරන විට, අගෞරවය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගේ නාමයටය.**

එබැවින් අද අප ඉගෙනගැනීමට යන්නාවූ ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ඵල තුන, කිතුනු සාක්ෂියට අතිශයින් වැදගත් වේ.

**යාකොබ් 2:15-16 :- " [15]සහෝදරයෙක් නොහොත් සහෝදරියෙක් ඇඳුම් නැතුව, [16]දවස්පතා කෑම නැතුව සිටිද්දී, නුඹලාගෙන් යමෙක් : සමාදානයෙන් පලයල්ලා, උණුහුම් වෙයල්ලා, කෑම කා තෘප්තියට පැමිණියල්ලා යයි ඔවුන්ට කියනවා මිස, ශරීරයට ඕනෑ දේවල් නොදෙනවා නම්, මොන ප්‍රයෝජනයක්ද ? "**

දේව දරුවෙනි, අප සැවොම බොහෝ දේ මුවින් ප්‍රකාශ කරනමුත්, අපගේ හැසිරීමෙන් අප සාක්ෂිකරුවන්ද? අපගේ ජීවිතය අන් අයට ආදර්ශයක්ද? අන් අය අප තුළ යේසුස්වහන්සේ දකිනවාද? වැනි ප්‍රශ්න අප අවංකව අපගෙන්ම අසා ගත යුතුවේ. දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ උන්වහන්සේගේ සාක්ෂිකරුවන් වීමටය. මෙය ඉටුකිරීම උදෙසා ඉවසිලිවන්තකම, කරුණාවන්තකම සහ යහපත්කම මනුෂ්‍යයන් අප තුළ දැකීම නියත වශයෙන්ම සිදුවිය යුතුය.

මෙම අධ්‍යයනය මඟින් යේසුස්වහන්සේ මෙන් ඉවසීම, කරුණාවන්තවීම සහ යහපත් ජීවිත ගතකිරීම උදෙසා, දෙවියන්වහන්සේ ඔබව පොළඹවනු සේක්වා !

**<u>අධ්‍යයනය</u> :-**

**<u>අන් අය සමඟ සම්බන්ධකම් වලට අදාල වන්නාවූ ශුද්ධාත්ම - යාණන්වහන්සේගේ ඵල තුන</u>**

'හැඳින්වීමේදී' අප පෙන්වාදුන් ආකාරයට, දෙවියන් - වහන්සේගේ ස්වභාවය, මනුෂ්‍යයන්ට අපගේ ජීවිතවලින් නොහොත් අපගේ හැසිරීමෙන් ප්‍රකාශ විය යුතු වේ. එබැවින් ඔවුන් සමඟ සම්බන්ධකම් වලට විශේෂයෙන්ම අදාල වන්නාවූ ඉවසිලිවන්තකම, කරුණාවන්තකම සහ යහපත්කම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල අප තුළ වර්ධනය වීම අනිවාර්‍ය්‍ය වේ.

(i) **<u>ඉවසිලිවන්තකම</u>** <u>(Longsuffering)</u>

බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනවල 'Longsuffering' ලෙස සඳහන්වන්නාවූ මෙම ඵලය **'බොහෝ දේ දරා ගැනීම උදෙසා ඇති ආත්මික ශක්තිය හේතුකොටගෙන ප්‍රකාශවන්නාවූ ඉවසිලිවන්තකම'** ලෙස විස්තර කළ හැක.

**1 පේත්‍රුස් 2:23** හි සඳහන් වන්නාවූ යේසුස්වහන්සේගේ ක්‍රියාකිරීම මෙම ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය අපට එමට පෙන්වාදෙයි.

**1 පේත්‍රුස් 2:23 :- "උන්වහන්සේ නින්දාකරනු ලැබූ කල නින්දා නොකළසේක; වධවින්ද කල තර්ජන නොකර, ධර්මිෂ්ඨ ලෙස විනිශ්චය කරන තැනන්වහන්සේට කාරණය භාරදුන්සේක....."**

උන්වහන්සේව කුරුසියෙහි ඇණගැසූ අයට සමාවන ලෙස දෙවියන්වහන්සේට කළාවූ යාච්ඤාවද අපට පෙන්වාදෙන එක් දෙයක් වන්නේ ඉමහත් වේදනා, පීඩා සහ අපහාස මධ්‍යයේ උන්වහන්සේ දක්වූවාවූ ඉවසිලිවන්තකම නමැති ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයයි.

**දේව දරුව, මෙම ඵලය අන් අය ඔබගේ ජීවිතයෙහි දකිනවාද?**

❖ යේසුස්වහන්සේ අපට කීවාවූ වදනක් දෙස බලමු.

**මතෙව් 5:39 :-**

**"නුමුත් මම නුඹලාට කියමි : නපුරු අය සමඟ පොරට නොසිටිල්ලා. යමෙක් නුඹේ දකුණු කම්මුලට ගැසී නම් ඔහුට අනික් කම්මුලද හරවාපන්න."**

දුර්වලවූ මනුෂ්‍යයන් වන්නාවූ අපට, මෙසේ කිරීම 'කළ නොහැකි තරම්' දුෂ්කර වේ. අප කෙතරම් ඉවසිලිවන්තවීමට උත්සාහ කළත් එසේ කිරීම ඉතාමත්ම අසීරු වේ. මෙනමුත් අපගේ උත්සාහයට **'ආත්මික ශක්තිය'** එකතු වූ විට, නැතහොත් ඉවසිලිවන්තකම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය දුර්වලවූ අපගේ ජීවිතවලට එකතුවූ විට **අපට එසේ කළ හැකිවේ.**

<u>නිදසුනක් වශයෙන්</u>

**2 සාමුවෙල් 16:5-13 (කරුණාකර කියවන්න)**

මෙම බයිබල් කොටසේ අප දකින්නේ, දාවිත් රජතුමාගේ පුදුමාකාර ඉවසිල්ලයි. දාවිත් රජතුමා තම සෙනඟද සියලු බලවන්තයින් ද සමඟ සිටියදී ෂිමෙයි නම් මනුෂ්‍යයෙක් රජතුමාටද ඔහුගේ සියලු සේවකයන්ටද ගල් ගසමින්, රජතුමාට බැන වැදුනේය.

මෙම අවස්ථාවේදී අබිෂයි කුපිතවී, ෂිමෙයිව මරාදැමීමට රජතුමාගෙන් අවසර ඉල්ලුවේය. නමුත් මෙම සිදුවීමෙන් නින්දාවටද, අපහාසයටද ලක්වුනු රජතුමා සියල්ල දරාගෙන, සියල්ල ඉවසාගෙන, ෂිමෙයිට කිසි හානියක් කිරීමට කිසිවෙකුට ඉඩ නුදුන්නේය. දෙවියන්වහන්සේ කෙරෙහි රජතුමාට තිබූ අධික විශ්වාසය නොහොත් ඔහුගේ ආත්මික ශක්තිය නිසා රජතුමාට, මෙසේ ඉවසිලිවන්තව ක්‍රියා කිරීමට හැකිවිය.

දේව දරුව, ඔබගේ ජීවිතයේ මනුෂ්‍යයන් තුළින් හෝ නොසිතූ සිදුවීම් තුළින් (හදිසි අනතුරක් වැනි දෙයක් තුළින්) අසීරු තත්ත්වයක් ඇතිවුවහොත්, පහත සඳහන් දේ තේරුම්ගනිමින්, එහි සඳහන් අයුරින් ක්‍රියා කරන්න.

(a) අපගේ ජීවිතවලට පැමිණෙන්නාවූ, **සෑම දෙයක්ම පැමිණෙන්නේ, ඒවා පැමිණීමට දෙවියන්වහන්සේ ඉඩ හැරිය නිසා බව තේරුම්ගන්න.** එමනිසා

1. නොකැළඹෙන්න. නොකිපෙන්න. ඉවසිලිවන්තවද ඇදහිල්ලෙන්ද එම අවස්ථාවට මුහුණදෙන්න.

2. දෙවියන්වහන්සේ එසේ වීමට ඉඩහැරියේ මන්ද කියා උන්වහන්සේගෙන් විමසන්න. එසේ ඉඩහැරියේ,

   - ඔබට යමක් ඉගැන්වීමටද ?
   - ඔබගේ ඇදහිල්ල ශක්තිමත් කිරීමටද ?
   - ඔබගේම වැරදක් නිසාද ?

3. දෙවි සමිඳුන් ඔබට උගන්වන ලෙස

   - යටත්වන්න
   - උන්වහන්සේට කීකරුවන්න
   - පසුතැවිලිවන්න (අදාල නම් පමණක්)

(b) අපට සිදුවන්නාවූ සැමදේ, අපගේ යහපත උදෙසා උන්වහන්සේ යොදන බව අදහන්න.

**රෝම 8:28 :- ''තවද දෙවියන්වහන්සේට ප්‍රේම - කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව.''**

- දේව දරුව, මෙවදන් අදහන්න.
- සැක නොකර අදහන්න.
- සැමදේ යහපත උදෙසා දෙවියනවහන්සේ යෙදවීම, ඔබගේ ජීවිතයේ අත්දකින්න.

❖ ඉවසිලිවන්තකම දෙවියන්වහන්සේගේ ස්වභාවයයි.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ අසීමිත ප්‍රේමය නිසා, ඔබ ගැන, මා ගැන සහ සෑම මනුෂ්‍යයින් ගැන **<u>බොහෝ කල් ඉවසනසේක</u>.**

**අප සැමද, අන් මනුෂ්‍යයන් සමඟ අපගේ ක්‍රියාකිරීම් වලදී බොහෝසේ ඉවසිලිවන්ත වෙමු.**

**2 පේත්‍රුස් 3:9 :- ''....කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව, නුඹලා කෙරෙහි <u>බොහෝකල් ඉවසන සේක</u>.''**

**නික්මයාම 34:6 :- ''ස්වාමීන්වහන්සේය, ස්වාමීන්වහන්සේය, උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණ වූ දායවන්ත වූ <u>උදහස්වීමට ප්‍රමාද වන්නාවූ</u> අධිකතර කරුණාව සහ සැබෑකමද ඇත්තාවූ දෙවිකෙනෙක්ය.''**

නෙහෙමියා දෙවියන්වහන්සේගේ අනුකම්පාව සහ ඉවසිලි - වන්තකම ගැන, ලියා තිබෙන වචන දෙස බලමු.

**නෙහෙමියා 9:17 :- ''ඔව්හු කීකරුවන්ට අකමැතිව, ඔවුන් අතරේ ඔබ කළ පුදුමවල් සිහි නොකර, තමුන්ගේ කුළල් තදකරගෙන.....එහෙත් ඔබ කමාවන්නාවූ, දයාබරවූ, <u>අනුකම්පාවෙන් පූර්ණවූ ඉවසිලිවන්තවූ, කරුණාභරිතවූ</u> දෙවිකෙනෙක් බැවින්, ඔබ ඔවුන් අත් නොහැරියසේක.''**

ගීතිකා කාරයාගේ වචන දෙසද බලමු.

**ගීතා 86:15 :- ''එහෙත් ස්වාමීනි, ඔබ අනුකම්පාවෙන්ද කරුණාවෙන්ද පූර්ණ වූ, <u>කෝපවීමට ප්‍රමාදවන්නාවූ</u>.....''**

**ගීතා 103:8 :- ''ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටින සේක, <u>කෝපවීමට ප්‍රමාදය</u>, <u>අතිශයින් කරුණාවන්තය</u>.''**

**ගීතා 145:8 :- ''ස්වාමීන්වහන්සේ දයාවන්තය, <u>අනුකම්පාවෙන් පූර්ණය</u> ; <u>උදහස්වීමට ප්‍රමාදය</u>, මහත් කරුණාවෙන් යුක්තය.''**

ඉහත සඳහන් පද, ඉතා පැහැදිලිව අපට පෙන්වාදෙන්නේ, අපගේ පියාණන්වහන්සේගේ අධික ඉවසිලිවන්තකම, උදහස්වීමට ප්‍රමාදකම, අතිශය කරුණාවන්තකම වැනි ගුණාංගය.

මෙවැනි පියෙකුගේ දරුවන්වූ, උන්වහන්සේගේ මෙම පුදුම ඉවසිලිවන්තකම අත්දකින්නාවූ අප සැමද, අන් මනුෂ්‍යයන් සමඟ, මේ අයුරින්ම ක්‍රියාකිරීමට කැපවෙමු.

❖ **ඉවසිල්ලෙන් සේවයේ යෙදීම**

ඉවසිලිවන්තකම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය, අපගේ සේවයටද බොහෝසේ අදාල වේ.

අප දෙවි සමිඳුන්ගේ සේවයේ යෙදෙන අතර, සමහරවිට අප අධෛර්යයට පැමිණෙන්නාවූ, අවස්ථා ඇතිවේ. එම සේවයේ ඵල රහිත බවද, නිෂ්ප්‍රයෝජන බවද යක්ෂයා අපගේ කනට කොඳුරන අවස්ථා ඇතිවේ. අපගේ කාලය, ශ්‍රමය සහ ශක්තිය නිකරුනේ වැයකරන බව, අපගේ සහෝදර කිතුනුවන් පවා අපට කියන අවස්ථා ඇතිවිය හැක.

දේව දරුව, අපගේ ජීවිතවල **සෑම අවස්ථාවකදීම** අපගේම හෝ අන් අයගේ අදහස් නොව, **දෙවි සමිඳුන්ගේ වදන් කෙරෙහි විශ්වාසය තබමු.**

සේවයෙහි යෙදෙන අතර දෙවි සමිඳුන්ගේ වදන් සිහිකරමින් **<u>ඇදහිල්ලෙන්ද ඉවසිලිවන්තවද සේවයේ යෙදෙමු</u>.**

**ගලාති 6:9 :- "තවද යහපත්කම් කිරීමට මැළි නොවෙමු. මක්නිසාද අපි <u>ක්ලාන්ත නොවෙමු නම්</u>, <u>නියම කාලයේදී කපා ගන්නෙමුව</u>."**

**යාකොබ් 5:7,8 :- " [7]..... බලව ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසමින් ගොවියා පොළොවේ අනර්ඝ ඵල ගැන බලා සිටී. [8] නුඹලාත් ඉවසිල්ලෙන් සිටපල්ලා ....."**

(ii) **<u>කරුණාවන්තකම</u>** <u>(Kindness)</u>

කරුණාවන්තකම අප තුළ දෙවියන්වහන්සේ ඇති - කරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලයක් වන අතර, එය අපගේ 'ප්‍රේමය වන්නාවූ දෙවියන්වහන්සේගේ' **(1 යොහන් 4:8)** සුවිශේෂ ගුණාංගයකි.

**ගීතාවලිය 106:1, 107:1, 136:1 :-**

**"ස්වාමීන්ට ස්තුතිකරව් ; මක්නිසාද <u>උන්වහන්සේ යහපත්ය</u>. <u>උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය</u>. "**

දෙවියන්වහන්සේගේ කරුණාවන්තකම, ඉතාමත් අධික වනවා පමණක් නොව, එය සදාකාලික වේ. එපමණක් නොව උන්වහන්සේගේ කරුණාව උන්වහන්සේ දක්වන්නේ උන්වහන්සේට ඇලුම්වූ, උන්වහන්සේට කීකරුවූ මනුෂ්‍යයන්ට පමණක් නොව, උන්වහන්සේ දුෂ්ටයන්ටද කරුණාවන්තව සිටිනසේක.

**ලූක් 6:35 :-**

**" නුමුත් නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, යහපත කරපල්ලා, සැක නොසිතා ණයට දීපල්ලා ; එවිට නුඹලාගේ විපාකය මහත් වන්නේය ; නුඹලා මහෝත්මයාණන්ගේ පුත්‍රයෝ වන්නහුය. මක්නිසාද <u>කෘතෝපකාර නොසලකන්නන්ටද දුෂ්ටයන්ටද උන්වහන්සේ කරුණාවන්තව සිටිනසේක</u>."**

දුෂ්ටයන්ටද කරුණාව දක්වන්නාවූ අපගේ පියාණන්වහන්සේ, උන්වහන්සේගේ දරුවන් වන අපට අනුශාසනා කරන්නේ **'නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, යහපත කරපල්ලා'** කියාය. මෙසේ කිරීම අපට ඉතා දුෂ්කර වන නමුත්, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ ඵල වන්නාවූ **ප්‍රේමය, කරුණාවන්තකම සහ යහපත්කම** අපගේ ජීවිතවල වර්ධනයවූ විට අපට එසේ කළ හැකි වනු ඇත.

දේව දරුවෙනි, කරුණාවන්තව ක්‍රියා කරමින්, අන් මනුෂ්‍යයන් කෙරෙහි අප පියාණන්වහන්සේගේ ආලෝකය පතුරවමු.

<u>නිදසුනක් වශයෙන්</u>

**1 සාමුවෙල් 24 : 1-10 (කරුණාකර කියවන්න)**

දාවිත් මරා දැමීම උදෙසා සාවුල් රජතුමා මනුෂ්‍යයන් 3000 ක් සමග, ඒන්-ගෙදියේ කාන්තාරයේ දාවිත්ව සොයමින් සිටි අවස්ථාවකදී, ශරීර කෘත්‍යය සඳහා එහි තිබුණු ගුහාවකට ඇතුල්වුණේ එම ගුහාව තුළ දාවිත්ද ඔහුගේ මනුෂ්‍යයන්ද සැඟවී සිටින බව නොදැනය. එවිට දාවිත්ගේ මනුෂ්‍යයෝ, සාවුල්ව මරා දැමීමට ඔහුට යෝජනා කළ නමුත්, දාවිත් සාවුල් රජතුමාට කිසි අනතුරක් නොකළේය. මේ අවස්ථාවේදී තමාව මරා දැමීමට සෙව්වාවූ සාවුල් රජතුමාට දැක්වූ කරුණාව, මින් අනතුරුව දාවිත් රජතුමාට පැවසූ වචන අපට පෙන්වාදෙයි.

**1 සාමුවෙල් 24 : 10 :-**

**" ස්වාමීන්වහන්සේ අද ගුහාවේදී ඔබ මා අතට පාවාදුන් බව ඔබගේ ඇස්වලටම මේ දවසේදී පෙනුණේය. සමහරු ඔබ මරන්ටය කියා මට කීවෝය. නුමුත් මම ඔබට කරුණාකලෙමි ; ...."**

ප්‍රේමණීය සහෝදරයා / සහෝදරී, ඔබ නිසැකවම දෙවියන් - වහන්සේට ප්‍රේමකරන බව මම විශ්වාස කරමි. එමෙන්ම දෙවියන්වහන්සේගේ ප්‍රේමය ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් ඔබගේ හදවතේ උන්වහන්සේ වගුරුවන බව දේව වචනය අනුව අප දනිමු.

මෙනමුත් අපගේ ජීවිතවල අතිශයින් වැදගත් වන්නේ, මෙම දිව්‍ය ප්‍රේමය අප වෙතින්, අන් අය වෙත ගලායෑමයි. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔවුන් ඔබ තුළින් දකීමයි. අත්දකීමයි. එබැවින්, ඔබගේ කිතුනු ජීවිතය සහ කිතුනු හැසිරීම ඔබටම විමසා බැලීම උදෙසා, ප්‍රශ්න තුනක් ඔබ ඉදිරියේ තබමි.

(a) දෙවියන්වහන්සේව නොදන්නාවූ, විනාශය කරා ගමන් කරන්නාවූ මනුෂ්‍යයන්ට ඔබ කරුණාව දක්වනවාද? නැතහොත් වෛර කරනවාද ?

(b) ඔබට විද්ධව ක්‍රියාකරන්නන්ට ඔබ කමාවනවාද ? කරුණාව දක්වනවාද ? ඔවුන් ගැන යාච්ඤා කරනවාද ? නැතහොත් පලිගන්නවාද ?

(c) ඔබගෙන් ණය ලබා එය ගෙවන්ට නොහැකි අයෙක් ඇත්නම්, ඔබ ඒ ණය කමාකරනවාද ? **(මතෙව් 18:27)** ඔහුට ප්‍රේමකරනවාද ? නැතහොත් ඔවුන් හෙලා-දකිනවාද ?

❖ කරුණාවන්තකම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය අප තුළ වර්ධනය වන විට, සියලු තිත්තකම, කුරිරුකම, අකාරුණාවන්තකම යනාදිය අපගේ ජීවිතවලින් තුරන්විය යුතුවේ. අන් අයට කමාවීම අපගේ ගති ලක්ෂණයක් වේ.

**කොලො 3:12,13 :-**

**" [12] එබැවින් දෙවියන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමවන්තවූ තෝරාගත්තවුන් මෙන් දයාබර හිතක්ද ගුණවන්තකමද යටත්කමද මෘදුකමද ඉවසිලිවන්තකමද පැළඳගෙන, එකිනෙකා ගැන ඉවසමින්, [13] යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමාවෙයල්ලා ; ස්වාමීන්වහන්සේ නුඹලාට කමාවුණාක්මෙන් නුඹලාත් කරපල්ලා."**

**එපීස 4:32 :- "නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පාව ඇතිව සිට, ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ ලෙසම නුඹලාත් එකිනෙකාට කමාවෙයල්ලා."**

(iii) **<u>යහපත්කම</u>** <u>(Goodness)</u>

යහපත් ලෙස පරිවර්තනය කර ඇත්තාවූ ග්‍රීක් වචනය, 'හොඳ' ලෙසද නව ගිවිසුමේ සමහර තැන්වල පරිවර්තනය කර තිබෙන අතර, එය විවිධ දේ විස්තර කිරීම උදෙසා යොදා ඇති බවද අප එහි දකිමු.

<u>නිදසුන් වශයෙන්</u>

**මතෙව් 7:11 :-** දරුවන්ට **'යහපත්'** දේ (තෑගි) දීම.

**මතෙව් 7:17 :- 'හොඳ'** ගස් **'හොඳ'** එල දරයි.

**මතෙව් 12:35 :- 'යහපත්'** මනුෂ්‍යයා තමාගේ **'යහපත්'** සම්පතින් **'යහපත්'** දේ පිටතට ගෙනෙන්නේය.

**මතෙව් 25:21 :- 'යහපත් වූ'** විශ්වාසවූ දාසය.

**ලූක් 8:8 :-** ඒවා **'සරුබිමේ'** (ඉංග්‍රීසි පරිවර්තනයේ - 'good' soil) වැටී, පැළවී එකෙන් සියයක් එල දුන්නෝ යයි කීසේක.

මේ අන්දමින් මුල් ග්‍රීක් වචනය යොදාගැනීම හේතුවෙන් අපට නිගමනය කළ හැක්කේ, ඕනෑම ක්ෂේත්‍රයක අනර්ඝ/ඉස්තරම් භාවය විස්තර කිරීමට මෙම වචනය යොදා ගනු ලැබූ බවයි.

එබැවින් 'යහපත්කම' යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය වටහාගැනීම උදෙසා, දේව වචනයෙන් නිදසුන් ඔබ ඉදිරියේ තැබීම මාගේ අදහසයි.

<u>නිදසුනක් වශයෙන්</u>

(a) **දෙවියන්වහන්සේගේ යහපත්කම**

**ගීතාවලිය 25:8 :-**
**''ස්වාමීන්වහන්සේ යහපත්ය, අවංකය. <u>එහෙයින් උන්වහන්සේ පව්කාරයන්ට මාර්ගය උගන්වනසේක</u>.''**

දෙවියන්වහන්සේගේ යහපත්කමේ ප්‍රතිඵලයක් වන්නේ, 'උන්වහන්සේ පව්කාරයින් නිසි මාර්ගය වෙත ගෙන ඒම උදෙසා ක්‍රියාකිරීම' බව, මෙම බයිබල් පදය පෙන්වාදෙයි.

ඉතා 'යහපත්' කිතුනු පවුලකට උපත ලැබූ මම, දෙවියන්වහන්සේගේ මාර්ගයෙහි ඇවිදීම බොහෝ කල් ප්‍රතික්ෂේප කෙළෙමි. මෙනමුත් 'යහපත් වූ' මගේ පියාණන්වහන්සේ, මාව අත්නොහැරියසේක.

උන්වහන්සේ විවිධ අන්දමින් මට කථාකරමින්ද මාගේ ජීවිතයේ ක්‍රියාකරමින්ද, **පව්කාරවූ මට හරි මාර්ගය උගන්වමින්, එය කරා මා ගෙනාසේක. උන්වහන්සේගේ දරුකමට ඇතුල්වූ මා අද ජීවත්වන්නේ, 'පව්කාරයන්ට හරි මාර්ගය ඉගැන්වීම උදෙසා'** කියා මා ප්‍රකාශකරන්නේ, මා තුළ කිසි හොඳක් නොමැති බව තේරුම්ගනිමිනි. පිළිගනිමිනි.

- දේව දරුව, යහපත්කම නමැති ඵලය ඔබගේ ජීවිතයෙන් අන් අය දකිනවාද ?

- ඔබ පව්කරුවන් දෙවියන්වහන්සේ වෙත ගෙන ඒම උදෙසා ක්‍රියා කරනවාද ?

- ඔබගේ ජීවිතයේ අරමුණ කුමක්ද ?

(b) **යෝසෙප්ගේ යහපත්කම**

මරියතුමී, යෝසෙප්ට විවාහ බස් දී සිටියදී, ඔවුන් එක්වෙන්ට පළමුවෙන්, ඈ ශුද්ධාත්මයාණන් කරණ - කොටගෙන ගර්භනී වූවාය **(මතෙව් 1:18).** මෙවැනි දෙයක් මීට ප්‍රථමයෙන් මෙලොව කිසිදිනක සිදුවී නොතිබුනි. එබැවින් මනුෂ්‍යයෙකු ලෙස යෝසෙප්ට මරියතුමීට සිදුවූයේ කුමක්දැයි තේරුම්ගැනීමට කිසිසේත් නොහැකිවන්ට ඇත.

මෙම කාලයේ 'විවාහබස් දී' සිටි යුවලකට වෙන්වීම උදෙසා නෛතිකව එම අතහැරීම සිදුකල යුතුව තිබුනි. ප්‍රසිද්ධියේ මෙසේ යෝසෙප් මරියතුමීව අතහැරියා නම්, ඈ මහත් නින්දාවට පැමිණෙනවා පමණක් නොව, ඇයට හිමිවනුයේ ගල් ගසා මැරීමේ දඬුවමය.

**ද්විතීය කථාව 22:23,24 :- " [23] පුරුෂයෙකුට විවාහබස් දී සිටින කන්‍යා යෞවනියක් යම් මනුෂ්‍යයෙකුට නුවරදී සම්බවී, ඔහු ඈ සමග සයනය කළොත්, [24] ඒ යෞවනී නුවර සිටලාත් මොර නොගැසූ බැවින්ද ..... ඔවුන් දෙදෙනාව නුවර දොරටුව ළඟට ගෙන ගොස් ඔවුන් මැරෙන පිණිස ඔවුන්ට ගල්ගසාපල්ලා....."**

ධර්මිෂ්ඨ නොහොත් 'යහපත් ' මනුෂ්‍යයෙක් වූ යෝසෙප් එබැවින් අදහස් කළේ, අවශ්‍ය ලියකියවිලි අත්සන්කොට රහසින් මරියතුමීව අතහැරීමටය. දේව දරුව, යෝසෙප් ගත්තාවූ මෙම තීරණය ගැන කරුණාකර මෙනෙහි කර බලන්න. යෝසෙප් සමඟ සසඳන අතර, අප බොහෝවිට ක්‍රියාකරන්නේ අයහපත් ලෙස බව, ඔබටම වැටහෙනවා ඇත.

❖ පාවුල්තුමා අපගේ ජීවිතවල ඵල ගැන ප්‍රකාශ කළ දේ බලන්න.

**එපීස 5:8-9 :- "[8] මක්නිසාද වරක් නුඹලා අන්ධකාරව සිටිය නුමුත්, දැන් ස්වාමීන්වහන්සේ තුළ ආලෝකයව සිටින්නහුය. <u>ආලෝකයේ දරුවන් මෙන් හැසිරියල්ලා</u>. [9] <u>ආලෝකයේ ඵල නම්</u>, <u>සියලු ආකාර යහපත්කමත්</u>, ධර්මිෂ්ඨකමත් සැබෑකමත්ය."**

පාවුල්තුමා, තෙසලෝනි සභාව ගැන කළාවූ, යාච්ඤාව දෙස බලන්න.

**2 තෙසලොනි 2:17 :-**
**''පියවූ දෙවියන්වහන්සේද, නුඹලාගේ සිත් සනසා, සියලු යහපත් ක්‍රියාවලද වචනවලද නුඹලා ස්ථිරකරන සේක්වා.''**

දේව දරුවෙනි, අපගේ ජීවිත **'සියලු ආකාර යහපත් ක්‍රියාවලින්ද, වචන වලින්ද'** පූර්ණ කර ගනිමු.

**මතෙව් 5:16** අනුව, අපගේ පියාණන්වහන්සේට ගෞරවය ගෙන දෙන ආකාරයට හැසිරෙමු, ක්‍රියා කරමු, කථා කරමු.

**ඉවසිලිවන්තකම, කරුණාවන්තකම සහ යහපත්කම**

**යන**

**ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල තුන**

**දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ**

**වර්ධනය කරනසේක්වා !!!**

සටහන්

# ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල-03




ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 13

## ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල - 03

**<u>හැඳින්වීම</u> :-**

අද අප අධ්‍යයනය කිරීමට යන්නේ, **ගලාති 5:23** වන පදයෙහි සඳහන් වන්නාවූ විශ්වාසකම, මෘදුකම සහ පමණ දන ක්‍රියාකිරීම යන්නාවූ, ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල 3 යි. මෙම ඵල තුන සෑම සැබෑ කිතුනුවකුගේම ජීවිතයේ තිබිය යුතු ඉතා අනර්ඝ ඵල තුනක් වන නමුත්, බොහෝවිට අප ඒවා ගැන වැඩි සැලකිල්ලක් නොදක්වීමට පුරුදුව සිටින්නෙමු. එබැවින් මෙම අධ්‍යයනය මගින් ඔබ සැමට මෙම ඵල තුන ගැන නිසි අවබෝධයක් ලබාදීමත්, එමගින් ඔබගේ ජීවිත වැඩි වැඩියෙන් යේසුස්වහන්සේ මෙන් වීමටත් ඉවහල් වෙයි යන්න අපගේ යාච්ඤාව සහ බලාපොරොත්තුවයි.

**<u>අධ්‍යයනය</u> :-**

**<u>අප, අප දෙසම බලන ආකාරය පෙන්නුම් කරන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල තුන</u>**

1. **විශ්වාසකම** (Faithfulness)

'විශ්වාසකම' ලෙස **ගලාති 5:23** හි සඳහන් වන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය FAITHFULNESS ලෙස බයිබලයේ ඉංග්‍රීසි පරිවර්තනවල සඳහන් වේ. එබැවින් මෙම ඵලය **'විශ්වාසකම'** සේම **'විශ්වාසවන්තකම'** ලෙසද හඳුනාගැනීම, එම ඵලය වැඩි දුරටත් තේරුම්ගැනීමට උපකාර වනු ඇත.

අපගේ දෙවි පියාණන්වහන්සේ තුළ තිබෙන්නාවූ 'විශ්වාසවන්තකම' යන ගුණාංගය නිසැකවම උන්වහන්සේ තුළ තිබිය යුතුවූ 'අනිවාර්‍ය ලක්ෂණයක්' ලෙස හඳුන්වාදීම නිවැරදි වේ. මෙසේ වන්නේ උන්වහන්සේ **බොරු නොකියන්නාවූ වෙනස් නොවන්නාවූ** දෙවියන්වහන්සේ වන බැවිනි.

**ගණන් කථාව 23:19 :- ''බොරු කියන්ට දෙවියන්වහන්සේ මනුෂ්‍යයෙක්වත්, තැවෙන්ට මනුෂ්‍ය පුත්‍රයෙක්වත් නොවන සේක....''**

**1 සාමුවෙල් 15:29 :- "ඉශ්‍රායෙල්ගේ පරාක්‍රමයාණෝ <u>බොරු නොකියන සේක, නොතැවෙනසේක</u>. මක්නිසාද තැවෙන්ට උන්වහන්සේ මනුෂ්‍යයෙක් නොවේ යයි කීසේක."**

**තීතස් 1:1 :- "<u>බොරු නොකියන දෙවියන්වහන්සේ</u> ......"**

බොරුකීම සහ 'විශ්වාසකම' යන ලක්‍ෂණ දෙක එකිනෙකට ප්‍රතිවිරුද්ධ වේ. අපගේ දෙවි සමිඳුන් බොරු නොකියන්නාවූ, අපගේ විශ්වාසවන්තවූ පියාණන්වහන්සේ වන සේක.

උන්වහන්සේගේ විශ්වාසවන්තකම පිළිබඳව දේව වචනයේ පද කිහිපයක් දෙස බලමු.

**ද්විතීය 7:9 :- ".....උන්වහන්සේගේ ආඥා පවත්වන්නන් සමග පරම්පරා දහසක් දක්වා <u>ගිවිසුම සහ කරුණාව පවත්වන්නාවූ විශ්වාස වූ දෙවියන්වහන්සේ</u> බවද, ....."**

**1 කොරි 1:9 :- "..... නුඹලා <u>කැඳවාගත් දෙවියන්වහන්සේ විශ්වාසව</u> සිටින සේක."**

**1 යොහන් 1:9 :- "අපේ පාපවල් කියා දෙමු නම් අපේ පව් අපට <u>කමාකරන්ටත්</u> සියලු අධර්මිෂ්ඨකමින් අප <u>පවිත්‍ර - කරන්ටත් උන්වහන්සේ විශ්වාසව</u> ධර්මිෂ්ඨව සිටින සේක."**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේගේ මෙම ගුණාංගය පැහැදිලිව තේරුම්ගන්න. උන්වහන්සේ විශ්වාසවූ දෙවියන්වහන්සේ වන බැවින් උන්වහන්සේ,

- අප තුළ <u>ඇරඹූ වැඩය සම්පූර්ණ කරන සේක</u>. **(පිළි 1:6)**
- අප උන්වහන්සේගේ ආඥා පවත්වන අතර, නොහොත් උන්වහන්සේට කීකරුව ජීවත්වනවිට, අපට දුන් <u>සෑම පොරොන්දුවක්ම ඉටුකරන සේක</u>, සඳහටම <u>අපට කරුණාව දක්වන සේක</u>.
- අපගේ පව් කෙතරම් අධික වුවත්, කෙතරම් භයානක වුවත්, සැබෑ පසුතැවිල්ලෙන් උන්වහන්සේ වෙත පැමිණිවිට, <u>අපට කමාකරන සේක</u>.

විශ්වාසවන්තකම, අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් - වහන්සේගේ ද ලක්ෂණයකි.

**එළිදරව් 1:5 :- "<u>විශ්වාස සාක්ෂිකාරයාවූ</u>, මළවුන්ගෙන් නැඟිටි කුලුඳුලාවූ, පොළොවේ රජුන්ගේ අධිපතියාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන්ද, නුඹලාට කරුණාවත් සමාදානයත් වේවා....."**

විශ්වාසවන්තවූ දෙවියන්වහන්සේ අප සැමදෙනාවද කැඳවන්නේ උන්වහන්සේ සහ උන්වහන්සේගේ පුත්‍රයාණන්වහන්සේ මෙන්, විශ්වාසවන්තකම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය සහිතව ජීවත්වීමටය. උන්වහන්සේගේ කැඳවීම තේරුම්ගැනීම පිණිස, උන්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන්නාවූ හැසිරීම දෙස බලමු.

(i) **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, බොරු නොකියන ජීවිතයකටය**

ප්‍රේමණීය දරුව, බොරු නොකියන්නාවූ අපගේ පියාණන් - වහන්සේ මෙන් අපද,

- බොරු නොකියමු.
- බාගෙට ඇත්ත නොපවසමු.
- සත්‍ය නොසඟවමු.
- අතිශයෝක්තියෙන් කථා කිරීම අතහරිමු.
- මනුෂ්‍යයන්ව මුලා නොකරමු.

(ii) **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, විශ්වාසවන්ත ජීවිතයකටය**

ප්‍රේමණීය දේව දරුව, විශ්වාසවන්තවූ අපගේ පියාණන් - වහන්සේ මෙන්, අපද විශ්වාසවන්තකම පැළඳ ගනිමින්,

- අප කරන පොරොන්දු ඉටු කරමු.
- පොරොන්දු වෙනස් නොකරමු.
- අනුන් අප සමඟ බෙදා ගන්නාවූ අපගේ රහස් හෙළි නොකරමු.
- මිතුරන් පාවා නොදෙමු.
- (අප රැකියාව කරන ආයතනයේ) 'බොස්' නැති විටදීත් විශ්වාසවන්තව අපගේ වගකීම් ඉටුකරමු.
- නියම වෙලාවට කාර්යාලයට යමු.
- අප බාරගත් වැඩ සම්පූර්ණ කරමු.
- බාරගත් යම් වැඩක් උදෙසා 'බාල බඩු' නොයොදවමු.

(දේව දරුව, ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේ ඉදිරියෙහි විමසා බලා, උන්වහන්සේ ඔබට පෙන්වන ලෙස, මෙම ලැයිස්තුවට ඔබට අදාල දේ එකතුකර, ඒවා විශ්වාසවන්තව ක්‍රියාවට නංවන්න).

(iii) **දෙවියන්වහන්සේ, අප කරන්නාවූ පොරොන්දු ඉටුකිරීම අපගෙන් බලාපොරොත්තු වනසේක**

ප්‍රේමණීය දේව දරුව, පොරොන්දු ඉටුකරන්නාවූ දෙවියන්වහන්සේ, උන්වහන්සේගේ දරුවන්ගේ ජීවිතවල එය අපේක්ෂා කරනසේක.

**ගණන් කථාව 30:2 :-**

**"මනුෂ්‍යයෙක් ස්වාමීන්වහන්සේට බාරයක් වුණොත් නොහොත් යමකින් වැලකීමට බැඳෙන හැටියට දිවුරුමක් දිවුළොත් ඔහු <u>තමාගේ වචනය කඩනොකර තමාගේ මුඛයෙන් නික්මෙන සියල්ල ලෙස කෙරේවා</u>."**

**ද්විතීය කථාව 23:21,22 :-**

**" [21] <u>නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට නුඹ භාරයක් වුණ කල්හි ඒක ගෙවන්ට ප්‍රමාද නොවන්න</u>. මක්නිසාද නුඹගේ දෙවිවූ <u>ස්වාමීන්වහන්සේ ඒක නුඹෙන් අයකරනවාම ඇත</u> ; ඒක නුඹට පාපයක් වේ. [22] එහෙත් නුඹ බාරයක් නොවී සිටියොත්, එයින් නුඹට පාපයක් නැත."**

දේව දරුවෙනි, දෙවියන්වහන්සේගේ මේ ස්වභාවය තේරුම්ගෙන, ඒ අනුව ක්‍රියා කරන්න. අපට ප්‍රේම කරන්නාවූ දෙවියන්වහන්සේ, අපගේ යාච්ඤාවලට පිළිතුරු දෙන්නාවූ අපගේ විශ්වාසවන්තවූ දෙවියන් - වහන්සේ වන සේක. අප ඉල්ලන්ටත් ප්‍රථමයෙන් උන්වහන්සේ අපගේ අවශ්‍යකම් දන්නා සේක. උන්වහන්සේගේ කැමැත්ත අනුව අප උන්වහන්සේට යදින අතර, අපගේ යාච්ඤාවලට පිළිතුරු ලැබීම උදෙසා අපි උන්වහන්සේට 'බාර වීම' හෝ 'විවිධ පොරොන්දු දීම' අවශ්‍ය නොවේ.

මෙනමුත් තමාගේ අවශ්‍යතාවය බලවත්වූ අවස්ථාවලදී තම ඉල්ලීම දෙවියන්වහන්සේ ඉදිරියෙහි තබන අර, බොහෝ කිතුනුවෝ නොයෙක් 'කැපවීම්', 'පොරොන්දු' සහ 'බාර' දෙවියන්වහන්සේට කරති. දේව දරුව, මෙසේ කිරීම අවශ්‍ය නැත. **එනමුත් ඔබ එසේ කර ඇත්නම්, එය ඉටුකිරීම දෙවියන්වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන සේක.**

එබැවින් කරුණාකර, නොපමාව ඔබගේ ජීවිතය (දූන්ම) විමසා බලන්න. දෙවි සමිඳුන්ට ඔබ කර ඇති පොරොන්දු ඔබ ඉටුකර තිබේද ? කියා විමසා බලන්න. ඔබ අතින් මෙම පාපය සිදුවී ඇත්නම්, වහාම පසුතැවිලිවී දෙවි සමිඳුන්ගේ සමාව ලබා ගන්න.

සමහරවිට බොහෝ යහපත් දේව දරුවන් පවා, දෙවි සමිඳුන්ගේ ආශීර්වාද නොලැබීමට හේතුවක් විය හැක්කේ, ඔවුන් දෙවි සමිඳුන්ට කළාවූ පොරොන්දු ඉටු නොකිරීම විය හැකි බව මගේ විශ්වාසයයි. එම නිසා මම නැවත වරක් ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ, ඉහත සඳහන් ලෙස, ඔබගේ ජීවිත විමසා බලන ලෙසය.

<u>නිදසුන් වශයෙන්</u> :-

(a) **හන්නාගේ බාරය - 1 සාමුවෙල් 1:10,11, 26-28**

හන්නා පුතෙක් උදෙසා කළාවූ යාච්ඤාව සහ ඇ කළ බාරය පිළිබඳ පුවත අප හොඳහැටි දනිමු. දෙවියන්වහන්සේ ඇයට සාමුවෙල් නමැති පුතා දුන් බවත්, හන්නා තම බාරය ඉටුකරමින් එම පුතා ස්වාමීන්වහන්සේට කැප කළ බවද අප දන්නෙමු. මෙනමුත් බොහෝ දේව දරුවන් පවා, **1 සාමුවෙල් 2:21** හි සඳහන් දේ නොදනිති.

**1 සාමුවෙල් 2:21 :- "ස්වාමීන්වහන්සේ හන්නාට කරුණාකළ සේක, <u>ඈ ගර්භනීව පුත්‍රයන් තුන් දෙනෙකුත් දුවරුන් දෙදෙනෙකුත් වැදුවාය</u>."**

දේව දරුව, ඔබගේ පොරොන්දු සහ බාර දෙවි සමිඳුන්ට ඉටු කරන්න. එවිට උන්වහන්සේ ඔබ ඉල්ලනවාටත් වඩා ඔබට ආශිර්වාද කරන සේක.

(b) **යෙප්තාගේ බාරය - විනිශ්චයකාරයා 11:29-31, 34-40**

(කරුණාකර **විනි 11:29-40** දක්වා කියවන්න)

මෙම සිදුවීම මා දකින්නේ සැබවින්ම අතිශයින් කණගාටු සහිත සිදුවීමක් ලෙසය.

දේව දරුවෙනි, මෙම සිදුවීම අමතක නොකරන්න. **මෙවැනි ආඥාන බාරයන් වීමෙන් වලකින්න.**

❖ **අපගේ දීමනා / තලෙන්ත සහ විශ්වාසවන්තකම**

දෙවියන්වහන්සේගේ වචනය අපට පෙන්වාදෙන්නේ, සෑම යහපත් දීමනාවකටම උල්පත වන්නේ, දෙවි සමිඳුන් වන බවය.

**යාකොබ් 1:17 :- "සහෝදරයෙනි, නොරැවටෙල්ලා. සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාවද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන් - වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය."**

දෙවියන්වහන්සේගෙන් අප මෙසේ ලබා ඇත්තාවූ දීමනාවලට, අපගේ තලෙන්ත, හැකියාවන්, දරුවන්, ගේ දොර, යාන වාහන, රැකියා යන සියල්ල අයිතිවන අතර, **අප සැම <u>මෙම දීමනාවල ගබඩාකරුවන් මිස</u> අයිතිකරුවන් නොවන්නෙමු.**

**1 කොරි 4:1** පෙන්වාදෙන්නේ අප දෙවියන්වහන්සේගේ රහස්වල (ශුභාරංචියේද) ගබඩාකරුවන් වන බවය.

**1 කොරි 4:1 :- "මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩා - කාරයන් මෙන්ද ගණන් ගනිත්වා."**

ඊළඟ පදය පෙන්වාදෙන්නේ, ගබඩාකාරයෙකුගේ මූලික ගුණාංගයක් වන්නේ, විශ්වාසව සිටීම නොහොත් විශ්වාසවන්තකම බවය.

**1 කොරි 4:2 :- "ඇරත් මෙහිදී ගබඩාකාරයන්ගෙන් ඕනෑ කරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය."**

යේසුස්වහන්සේ ඉගැන්වූ, තලෙන්ත උපමාවෙහි **(මතෙව් 25:14-30)** උන්වහන්සේ පෙන්වාදෙන්නේ, ගබඩා-කාරයෙක් විශ්වාසවන්තව සිටීමේ වැදගත්කමය.

**මතෙව් 25:21 :-"ඔහුගේ ස්වාමියා ඔහුට කථා කොට : <u>යහපත් වූ විශ්වාස වූ දාසය</u>, ....."**

අප සැම දෙන, දෙවියන්වහන්සේ අපට ලබා දී ඇති සෑම දීමනාවකම යහපත්වූද විශ්වාසවන්තවූද ගබඩාකාරයන්සේ ක්‍රියාකරමු.

**දේව දරුව, ඔබගේ තලෙන්ත දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ඔබ භාවිතා කරනවාද ?**

❖ **අපගේ සේවයේදී විශ්වාසවන්ත වීම**

විශ්වාසවන්ත අය බව දේව වචනයේ සඳහන් කර ඇත්තාවූ කිහිප දෙනෙක් හඳුනාගැනීම උදෙසා, **1 කොරි 4:17, එපීස 6:21, කොලො 1:7, 4:9, 1 පේත්‍රුස් 5:12** කියවා බලන්න. එසේ කියවන ඔබට, තිමෝතියස්, තුකීකස්, එපප්‍රස්, ඔනේසිමස්, සහ සිල්වානස් යන නම් හමුවනු ඇත. මොවුන් අතුරෙන් මුලින් සඳහන් තිදෙනාම විශ්වාසව සේවයේ යෙදුන බව දේව වචනයෙහි සඳහන් වේ.

දේව දරුව, දෙවියන්වහන්සේ ඔබට පවරා ඇති සේවයෙහි විශ්වාසවන්තව යෙදී සිටින්න.

**2. <u>මෘදුකම</u>** <u>(Meekness)</u>

වර්තමාන සමාජයේ, මෘදුවූ කෙනෙක් ලෙස යම් කෙනෙක් විස්තර කරන අතර, හෙතෙම 'දුර්වල' නැතහොත් 'කොන්ද පණ නැති' කෙනෙක් යන අදහස පවතියි.

මෙනමුත් දේව වචනයේ, මෘදුවූ කෙනෙක් කිසිසේත් දුර්වල කෙනෙක් ලෙස පෙන්වානොදෙයි. **" මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින් " (මතෙව් 11:29)** යන වචන වදාළ අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ දුර්වල කෙනෙක් නොවූ බව අප සැම හොඳට දන්නෙමු.

දේව වචනයේ මෘදුකම, මොළොක් ගුණය, සහ යටහත්කම යන වචන තුනම එකම අරුත පෙන්නුම්කිරීම උදෙසා යෙදෙන බව අපි දකිමු. එබැවින් මෘදුකම පැළඳගත් කිතුනුවකු මෙසේ විස්තර කිරීමට කැමැත්තෙමි. එනම්,

**'මෘදුකම පැළඳගත් කිතුනුවකු, දෙවියන්වහන්සේට කීකරුවද ශුද්ධාත්මයාණන්වහන්සේගේ පාලනයට යටත්වද ක්‍රියා කිරීමට උත්සාහ කරන බැවින්, ඔහු සැබවින්ම ඉතා ශක්තිමත් වන නමුත්, එම ශක්තිය සමග යටහත්කම පැළඳගෙන ක්‍රියාකරයි.'**

❖ **මෘදුකම / මොළොක්ගුණය / යටහත්කම පැළඳගත් අයට බොහෝ දේවාශිර්වාද හිමිවනු ඇත**

එම ආශිර්වාද වලින් සමහරක් පහත දැක්වේ.

(i) **ගීතා 22:26 :- "යටහත් සිත් ඇත්තෝ අනුභවකොට <u>තෘප්තියට පැමිණෙන්නාහුය</u>."**

(ii) **ගීතා 25:9 :- " උන්වහන්සේ යටහතුන් <u>යුක්තියෙහි හසුරුවන සේක</u>. යටහතුන්ට <u>තමන්ගේ මාර්ගය උගන්වන සේක</u>. "**

(iii) **ගීතා 37:11 :- " නුමුත් මොළොක් ගුණ ඇත්තෝ <u>දේශය උරුම කරගන්නෝය</u>. ඔව්හු මහත් <u>සමාදානයෙන් ප්‍රීතිමත් වන්නෝය</u>."**

**මතෙව් 5:5 :- "මොළොක් ගුණ ඇත්තෝ <u>ආශිර්වාද ලද්දෝය</u>. මක්නිසාද ඔව්හු <u>පොළොව උරුම කර ගන්නෝය</u>."**

(iv) **ගීතා 147:6 :- "<u>ස්වාමීන්වහන්සේ</u> යටහතුන්ට <u>උපකාර කරන සේක</u>."**

(v) **යාකොබ් 4:6 :- ".....<u>දෙවියන්වහන්සේ</u> උඩඟු වූවන්ට විරුද්ධව සිට, යටහතුන්ට <u>කරුණාව දෙන සේකැයි</u>...."**

**1 පේත්‍රුස් 5:5 :- ".....දෙවියන්වහන්සේ උඩඟු අයට විරුද්ධව සිට යටහතුන්ට කරුණාව දෙන සේක."**

දේව දරුව, මෘදුකම පැළඳගනිමින්, ඉහත පදවල සඳහන් දේවාශිර්වාද භුක්ති විඳින්න.

- **යටහත්කම ගැන නව ගිවිසුමේ අනුශාසනා කිහිපයක් දෙස බලමු**

**එපීස 4:1,2 :- " [1] එබැවින් නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස, [2] සියලු ආකාර යටහත් කමින්ද, මොළොක් ගුණයෙන්ද, ඉවසිලිවන්ත කමෙන්ද හැසිර, ....."**

**කොලො 3:12 :-"...එබැවින්...දයාබර හිතක්ද ගුණවන්ත - කමද යටහත්කමද, මෘදුකමද .... පැළඳගෙන ...."**

**1 පේත්‍රුස් 3:15 :- ".....නුඹලා තුළ ඇත්තාවූ බලාපොරොත්තුව ගැන නුඹලාගෙන් අසන සියල්ලන්ට උත්තරදෙන්ට නිතර සෑදී සිටපල්ලා, නුමුත් මෘදුකමින්ද යටහත් කමන්ද එසේ කළ යුතුය."**

නිදසුන් වශයෙන් :-

(a) **යේසුස්වහන්සේ තම ගෝලයන්ගේ පාද සේදීම - යොහන් 13:1-10**

මේ අවස්ථාවේදී යේසුස්වහන්සේ **'උඩ ඇඳුම ගලවා තබා' රෙදිකඩක් රැගෙන ඉඟටියෙහි බැඳගත් සේක. ඉන්පසු උන්වහන්සේ භාජනයකට වතුර වත්කොට ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉඟටියේ බැඳගත් රෙදිකඩින් පිසදමන්ටත් පටන්ගත්සේක.' (යොහන් 13:4,5)**

දේව දරුව, මෙය ගැන මොහොතක් මෙනෙහි කර බලන්න. මෙසේ පාද පිසදැමීම උදෙසා තම ගෝලයන්ගේ පාද ළඟ උන්වහන්සේ දණ නැමුවා නොවේද ? කියා මෙනෙහි කරන්න. අපද උන්වහන්සේගේ යටහත්කම පැළඳගනිමු.

(b) **මෝසෙස්ගේ මෘදුකම - ගණන් කථාව 12:3**

**ගණන් කථාව 12:3 :- "මෝසෙස් නම් මනුෂ්‍ය තෙමේ පොළෝ මතුයෙහි සිටි සියලු මනුෂ්‍යයන්ට වඩා අධික වශයෙන් මෘදු ගුණාන්විත කෙනෙක් වූයේය."**

මෝසෙස් ලොව සියලු මනුෂ්‍යයන්ට වඩා මෘදුකම පැළඳගත් බව, මෙහි ප්‍රකාශ වන අතර මෝසෙස්ට තමා ගැනම උඩඟුවීමට බොහෝ කාරණා තිබුණි.

- ඔහු ඇති දැඩි වූයේ රජ මැදුරේ කුමරෙක් ලෙසය.
- ඔහු සමඟ මැවුම්කාර දෙවියන්වහන්සේ මුහුණට මුහුණලා කථා කළසේක.
- දේව වචනයේ ප්‍රථම පොත් පහ ලියනු ලැබුවේ ඔහු විසින්ය.
- අරුම පුදුම හාස්කම් කිරීම උදෙසා දෙවියන්වහන්සේ ඔහුව පාවිච්චි කළ සේක.

මෙනමුත් මෝසෙස් පැළඳගෙන සිටියේ, උඩඟුකම නොව මෘදුකමය. **අපද මෝසෙස් මෙන් මාදුකම පැළඳ ගනිමු.**

**3. පමණ දැන ක්‍රියාකිරීම** - (Self control)

මෙම ශුද්ධාත්ම ඵලය අප තුළ වර්ධනයවූ විට, අප ආත්ම දමනය සහ ආත්ම පරිත්‍යාගය පෙන්නුම් කරන්නාවූ, විනයානුකූල ජීවිත ගත කිරීමට පුරුදු වෙමු. තවද අප අපගේ ජීවිතවල සෑම අංශයක්ම නිසි අයුරින් පාලනය කරනු ඇත. එබැවින්, ඉතා යටහත්ව ඔබ ඉදිරියේ ප්‍රශ්න කිහිපයක් තැබීමට කැමැත්තෙමි.

දේව දරුව, ඔබ ඔබගේ ජීවිතයේ,

- කෑම බීම සුදුසු ලෙස පාලනය කරනවාද ?
- විනෝදාංශ ප්‍රඥාවන්තව තෝරාගෙන තිබෙනවාද ?
- ඔබගේ කාලය, ඔබගේ ආත්මික / පවුල් / රැකියා / සමාජික ජීවිතයට ඔබින ලෙස බෙදා වෙන්කර ගනිමින් මෙහෙයවනවාද ?
- මුදල් ඔබ නිසි අයුරින් භාවිතා කරනවාද ?
- ඇසුරු කරන මිතුරන් ඔබට වඩාත්ම සුදුසු අයද ?
- දෙවියන්වහන්සේගේ සේවය උදෙසා ඔබගේ කාලය ඔබ විනයානුකූලව වෙන්කර තිබෙනවාද ?
- දෙවියන්වහන්සේගේ පාමුල ඔබ දිනපතාම 'නිහඬ කාලයක් ' අනිවාර්‍යයයෙන්ම පවත්වනවාද ?

දේව දරුව, දෙවියන්වහන්සේ අප සැමට බොහෝ ආශිර්වාද දී ඇති අතර, යක්ෂයා සැමවිටම බලා සිටින්නේ, මෙම ආශිර්වාදම නිසි පාලනයක් නොමැතිව භුක්ති විඳීමට අපව පරීක්ෂා කරමින්, අපව පාපය කරා ගෙන යෑමටය.

නිදසුනක් වශයෙන් 'මත්පැන් භාවිතය' දේව වචනයේ තහනම් කර නොමැති නමුත්, 'බීමත්කම' තුළින් දේව රාජ්‍යයේ උරුමය අපට අහිමි වෙයි (**ගලාති 5:21**).

එබැවින් යක්ෂයා අපව මුලින්ම පොළඹවන්නේ, 'සෝෂල් ඩ්‍රින්ක්' (Social Drink) එකක් ගැනීමටය. ඌගේ උපාය වන්නේ මෙය පුරුද්දකටද, පුරුද්ද ඇබ්බැහිකමකටද, ඇබ්බැහිකම යක්ෂයාගේ පාලනයට ගොදුරු වීමටද, මෙම පාලනය මගින් පවුලේ සතුට සහ සමගිය නැතිකොට, දුක වේදනාව ඇතිකොට අපව ආත්මික මරණය කරා ගෙන ගොස් අපව විනාශ කිරීමටය.

ප්‍රේමණීය සහෝදරයා/සහෝදරී, පමණ දැන ක්‍රියාකිරීම යන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵලය අපගේ ජීවිතවල නිසිලෙස වර්ධනය නොවූ විට අප පහසුවෙන්ම යක්ෂයාට ගොදුරු විය හැකි බව තේරුම්ගන්න.

❖ **මෙය පැහැදිලි කිරීම උදෙසා පාවුල්තුමා ඉදිරිපත් කරන්නාවූ කදිම නිදසුන දෙස බලමු - 1 කොරි 9:24,25**

**1 කොරි 9 : 24, 25 :-**

**" 24දුවන ස්ථානයෙහි සියල්ලන්ම දුවන නමුත් තෑග්ග ලැබෙන්නේ එක්කෙනෙක්ම බව නොදනිවුද ? එසේම නුඹලාත් ලබා ගන්නා පිණිස දුවපල්ලා.**

**25 දිනන පිණිස වීර්‍යයකරන්නාවූ සියල්ලෝම සියල්ලෙහි පමණ දැන හැසිරෙති. ඔවුන් එසේ කරන්නේ දිරන්නාවූ ඔටුන්නක් ලබා ගන්නා පිණිසය, අප වනාහි නොදිරන එකක් ලබාගන්න පිණිසය."**

දේව දරුව, ඔබ අරඹා ඇත්තාවූ කිතුනු ගමන, දිනන පිණිස වීර්‍යය කරන්න.

- යක්ෂයාට ඔබව අසුකරගන්ට ඉඩ නොහරින්න.
- දේව රාජ්‍ය උරුම කරගන්න.
- නොදිරන්නාවූ ඔටුන්න ඔබගේම කරගන්න.
- **ඔබගේ ජීවිතයේ සෑම අංශයකදීම පමණ දැන ක්‍රියා කරන්න.**

දේව දරුව, අවසාන වශයෙන් ඔබගෙන්ම අසා ගැනීමට ප්‍රශ්න තුනක් ඔබ ඉදිරියේ තබමි.

1. ඔබ විශ්වාසවන්ත කෙනෙක් ලෙස ඔබ ඇසුරු කරන සැම දෙන දකිනවාද ?
2. ඔබ යටහත් වූ, උඩගු නොවූ කෙනෙක් ලෙස ඔබ ඇසුරු කරන සැම දෙන දකිනවාද ?
3. ඔබ පමණ දැන ක්‍රියාකරන්නාවූ කෙනෙක් ලෙස ඔබ ඇසුරු කරන සැම දෙන දකිනවාද ?

**දෙවිපියාණන්වහන්සේ**

**විශ්වාසවන්තකම, මෘදුකම සහ පමණ දැන ක්‍රියාකිරීම**

**යන්නාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඵල,**

**ඔබ සැමදෙනාගේ ජීවිතවල**

**වර්ධනය කරන සේක්වා !!!**

සටහන්

.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................
.........................................................................................

සටහන්

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................


....................................................................................

....................................................................................

....................................................................................

....................................................................................

# ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම



ශුද්ධාත්මයාණන්වහන්සේ අධ්‍යයනය 14

# ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම

**<u>හැඳින්වීම</u> :-**

ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා සහ ඵල කිතුනු ජීවිතයට **අතිශයින් වැදගත්** වන අතර, අද අප අධ්‍යයනය කිරීමට යන්නාවූ මාතෘකාව වන, **'ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන් පූර්ණවීම'** සාර්ථකවූ, ඵලබරවූ, ආශිර්වාද - ලත් කිතුනු ජීවිතයක් ගතකිරීම උදෙසා අනිවාර්‍ය වන බව මාගේ විශ්වාසයයි. මම එසේ ප්‍රකාශ කිරීමට හේතුව වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම තුළින්, ශුද්ධාත්මයාණන්වහන්සේ අපගේ කථා කිරීම, ක්‍රියාකිරීම සහ හැසිරීම පාලනය කරනවා පමණක් නොව, එමගින් උන්වහන්සේ බොහෝ සේවාවන් ඉටුකිරීම උදෙසා ද අපව යොදවන බැවිනි.

දේව දරුවෙනි, එබැවින් අප ශුද්ධාත්මයාණන් - වහන්සේගෙන් පූර්ණවීම යන්න හොඳ හැටි තේරුම්ගනිමු, ඉගෙනගනිමු, **එම දේව නියෝගයට කීකරුවෙමු.**

**<u>අධ්‍යයනය</u> :-**

1. **<u>ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳව දේව වචනයේ ඇත්තාවූ නියෝග</u>**

ඕනෑම මනුෂ්‍යයෙක්, ගැළවීමේ පුවත අසා, දෙවියන් - වහන්සේට තම ජීවිතය කැපකිරීමට ක්‍රියා කළ විට, දෙවියන්වහන්සේ එම තැනැත්තා, දේව දරුවෙක්, ලෙස පිළිගන්නාසේක.

**යොහන් 1:12 :- " <u>නුමුත්</u> <u>යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද</u>, <u>එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද</u>, <u>ඔවුන්ට</u> <u>දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක</u>."**

මේ අයුරින් ඕනෑම මනුෂ්‍යයෙක්, තම ජීවිතය දෙවි සමිඳුන්ට කැප කළ විට, නොහොත් ගැළවීමට ඇතුල්වූ විට, දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේ නමැති දීමනාව එම තැනැත්තාට දෙනසේක.

මෙසේ ගැළවීමට ඇතුල්වන අපගේ ජීවිතවල, ඒ මොහොතේදීම ශුද්ධාත්මයාණන්වහන්සේ ඉටු කරන්නාවූ වැදගත් ක්‍රියා තුනක් ඔබට හඳුන්වාදෙමි.

(i) ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළ වාසය කිරීම අරඹන සේක - **රෝම 8:9, 1 කොරි 3:16, 1 කොරි 6:19**

**1 කොරි 3:16 :- " නුඹලා දෙවියන්වහන්සේගේ මාළිගාව බවද <u>දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ නුඹලා තුළ වාසය කරන බව නොදනිවුද ?</u> "**

මාගේ ප්‍රේමවන්ත සහෝදරයා සහෝදරී මෙය තේරුම් - ගන්න. ඔබ දේව දරුකම ලබා ඇත්නම්, **ශුද්ධාත්ම - යාණන්වහන්සේ ඔබ තුළ වාසය කරනසේක.** එබැවින් එසේ නොවන බවට කිසිවෙක් ඔබට ප්‍රකාශ කරන්නේ නම්, ඔහුගේ වචන නොපිළිගන්න, දෙවියන්වහන්සේගේ වචනය විශ්වාස කරන්න.

(ii) ශුද්ධාත්මයාණන්වහන්සේ අපව මුද්‍රා කරනසේක - **2 කොරි 1:22, එපීස 1:14, එපිස 4:30**

**2 කොරි 1:21,22 :-" [21] ඉදින් නුඹලා සමග අප ක්‍රිස්තුස් - වහන්සේ තුළ ස්ථිර කරන්නෙත් අප ආලේපකළෙත් දෙවියන්වහන්සේය. [22] උන්වහන්සේ අප මුද්‍රාකොට අපේ සිත් තුළ ආත්මයාණන්වහන්සේ නැමති අත්තිකාරම අපට දුන්සේක."**

**එපීස 1:14 :- "අපේ උරුමයේ අත්තිකාරමවූ පොරොන්දුවේ <u>ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් නුඹලා උන්වහන්සේ තුළ මුද්‍රාකරනු ලැබුවහුය</u>."**

(iii) ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට (සභාවට) අපව බව්තීස්ම කරනසේක - **1කොරි 12:13**

**1 කොරි 12:13 :-".... අප සියල්ලෝ එකම ආත්මයාණන් - වහන්සේ තුළ එකම ශරීරයට බවතීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයාණන්ගෙන් පොවනු ලැබීමුව."**

මෙසේ අප සැම බව්තීස්ම කරනු ලැබූ එකම ශරීරය වන්නේ සභාවයි.

**එපීස 1:23 :- " ඒ සභාව නම්, සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණකරන තැනන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයයි."**

සෑම දේව දරුවෙකුගේම ජීවිතයකම ඉහත සඳහන් ක්‍රියා තුන, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් සම්පූර්ණ කර ඇතිසේක. **එබැවින් ඒවා පිළිබඳව නියෝග දේව වචනයේ සඳහන් නොවන අතර,** එහි සඳහන්වන්නාවූ ඉතාමත්ම වැදගත් නියෝග තුනක් තිබේ.

එම නියෝග නම්,

(i) **ආත්මයාණන්වහන්සේ නොනිවල්ලා - 1 තෙස 5:19**

(ii) **ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙල්ලා - එපීස 4:30**

(iii) **ආත්මයාණන්ගෙන් පූර්ණවී ..... - එපීස 5:18**

මෙම නියෝග තුනෙන්, මෙම අධ්‍යයනය තුළ මූලික වශයෙන්ම අප අවධානය යොමු කිරීමට යන්නේ **'ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වෙයල්ලා'** යන දේව නියෝගය වෙතය.

## 2. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම යන්නෙහි අර්ථය

**එපීස 5:18,19 :- " [18] මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා, එයින් අනාචාරකම් හටගන්නේය ; [19] නුමුත් ආත්මයාණන් - ගෙන් පූර්ණවී, ...."**

ඉහත සඳහන් වචන වල, නියෝග දෙකක් අප දකිමු. ඒවා නම්,

(a) මුද්‍රිකපානයෙන් මත් නොවෙල්ලා

(b) ආත්මයාණන්ගෙන් පූර්ණ වෙයල්ලා, යන්නයි.

මේ අයුරින්, මුද්‍රික පානයෙන් මත්වීම සහ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවීම, දේව වචනයේ එකට සඳහන්වීම ගැන අප සමහරවිට මවිතයට පත්වනු ඇත.

මෙනමුත් මෙම සම්බන්ධකම කුමක්ද කියා ඔබ දේව වචනය විමසිල්ලෙන් සෙව්වොත්, නව ගිවිසුමේ මෙම දේවල් දෙක එකට සඳහන්වන්නාවූ අවස්ථා තුනක් ඔබට හමුවනු ඇත. එම අවස්ථා නම්,

(i) යොහන් බව්තීස්තතුමා සම්බන්ධව - **ලූක් 1:15**

**ලූක් 1:15 :-**

**" මක්නිසාද ඔහු සවාමීන්වහන්සේ ඉදිරියෙහි උත්තමයෙක් වන්නේය, ඔහු <u>මුදිකපානයවත් මද්‍යපානයවත් නො - බොන්නේය</u> ; මව් කුස පටන්ම ඔහු <u>ශුද්ධාත්මයෙන් පූර්ණව සිටින්නේය</u>."**

(ii) පෙන්තකොස්ත දවසේ 120ක් පමණ,ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවූ අවස්ථාවේදී - **ක්‍රියා 2:4**

**ක්‍රියා 2:4 :-**

**"<u>ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව</u>, <u>ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට</u> අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය."**

**ක්‍රියා 2:13 :-**

**"නුමුත් සමහරෙක් සරදම් කරමින් : <u>මොවුන් අලුත් මුදිකපානයෙන් පිරිලායයි කීවෝය</u>."**

(iii) පාවුල්තුමා තුළින්, දෙවියන්වහන්සේ දුන් නියෝග - **එපීස 5:18, 19**

දේව දරුව, **එපීස 5:18,19** හි සඳහන් මෙම දේව නියෝග දෙක අතර ඇත්තාවූ සම්බන්ධකම කුමක්ද? යන ප්‍රශ්නයට, මාගේ පිළිතුර වන්නේ, **'<u>පාලනය</u>'** යන්නයි.

- බීමත්වූ තැනැත්තා, **' <u>මත් පැන් වලින්</u> '**(යක්ෂයා විසින්) **<u>පාලනය කරනු ලබයි</u>.**
- ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ කිතුනුවා, **<u>ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පාලනය කරනු ලබයි</u>.**

අප සැම දෙන, සැමවිටම යක්ෂයාට විරුද්ධව සිටිමින් අපගේ ජීවිත පාලනය කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට යටත්වෙමු , ඉඩහරිමු.

❖ මැවුම්කාර දෙවියන්වහන්සේගේ මැවිල්ල දෘශ්‍යමාන සහ අදෘශ්‍යමාන, නොහොත් පෙනෙන සහ නොපෙනෙන දේවලින් සමන්විත වේ.

දෘශ්‍යමානවූ ලෝකයේ, වඩාත්ම උතුම්වූ නොහොත් උත්තරීතර ස්ථානය උන්වහන්සේ පැවරුවේ මනුෂ්‍යයාටය, එනම් ඔබට සහ මටය. තමන්වහන්සේගේ ස්වරූපයෙන් සහ සමානත්වයෙන් මනුෂ්‍යයාව මැව්වාවූ දෙවියන්වහන්සේ, මනුෂ්‍යයාට 'නිදහස් කැමැත්ත' යන සුවිශේෂ තිළිණය ප්‍රදානය කළසේක. එම 'නිදහස් කැමැත්ත' භාවිතාකරමින්, මනුෂ්‍යයාට ඔහුව මැව්වාවූ දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කළ හැක. උන්වහන්සේට විරුද්ධව ක්‍රියා කළ හැක. දෙවියන්වහන්සේට විරුද්ධව සිටින්නාවූ යක්ෂයාගේ කැමැත්ත අනුව ක්‍රියා කළ හැක.

දේව දරුව, මෙය තේරුම්ගන්න. ආරම්භයේ සිටම යක්ෂයාගේ ප්‍රධානතම උපාය වන්නේ, **මනුෂ්‍යයාගේ සිත පාලනය කරමින්, දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දුන් 'නිදහස් කැමැත්ත', යක්ෂයාගේ කැමැත්ත කිරීම උදෙසා යෙදවීමය.**

මෙසේ කිරීම උදෙසා **මත්පැන් පානය මගින්, මනුෂ්‍යයාගේ සිත් පාලනයට අසුකරගැනීමේ උපායට, දේව සභාවේ කිසි විටක කිසි අන්දමකින් ඉඩ නොහරිමු.**

❖ දේව වචනය දෙස බලන අතර තව දුරටත් අප දකින්නේ, කිසියම් දෙයකට අපගේ සිත පිරීමට ඉඩ හැරීම මගින් සිදුවන්නේ, එම දෙය අපව පාලනය කිරීම උදෙසා යක්ෂයා එය භාවිතා කරන බවයි.

**<u>නිදසුන් වශයෙන්</u> :-**

(i) අධික කෝපයෙන් (උමතුකමින්) අපගේ සිත් පිරවීම - **ලූක් 6:6-11**

**ලූක් 6:6-11** දක්වා සඳහන්වන්නේ, දකුණත වියළී තිබුණු මනුෂ්‍යයෙක්, සබත් දවසේදී යේසුස්වහන්සේ විසින් සුවකරනු ලැබීමේ සිද්ධියයි. මෙම මිනිසාගේ සුවවීම ඉදිරියේ දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා පිදීම වඩාත්ම යෝග්‍ය බව අප සිතන්ට පුළුවන.

නමුත් සිදුවූයේ මීට හාත්පසින්ම වෙනස් දෙයකි. ලියන්නෝද එරිසිවරුද, **'උමතුවෙන් පිරී'** යේසුස්වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීමට කුමන්ත්‍රණ කිරීමෙහි යෙදුනහ.

දේව දරුව, අධික කෝපයට ඔබගේ සිත පිරවීමට ඔබ ඉඩ හැරිය විට, **එම කෝපයද එය තුළින් යක්ෂයාද ඔබව පාලනය කරනවා ඇත.** වෛරයෙන්, ක්‍රෝධයෙන්, පළිගැනීමේ චේතනාවෙන් ඔබ ක්‍රියාකරනු ඇත.

(ii) අපගේ සිත් දුකින් පිරවීම - **යොහන් 16:6**

යේසුස්වහන්සේ ඔවුන්ගෙන් වෙන්වී යන බව ඇසූ **ගෝලයින්ගේ සිත් දුකින් පිරුණි.**

සිත දුකින් පිරීමේ ප්‍රතිඵලයක් වන්නේ, අධෛර්‍යයට පත්වීම, බලාපොරොත්තු අඩුවීම, දේව කැමැත්ත නොපෙනීම, ස්තුති දීම සහ ප්‍රශංසා කිරීම නැතිවීම වේ. මෙසේ සිදුවීම දේව කැමැත්ත නොවේ.

(iii) තණ්හාවෙන් අපගේ සිත් පිරවීම - **ක්‍රියා 5:1-4**

අනනියස් සහ සප්පිරා, තමන් සතු ඉඩමක් විකුණා, එය විකුණූ මිල ගැන ප්‍රේරිතයන්ට බොරු කීවේ, ඔවුන් තුළ තණ්හාව ඇතිවූ නිසාය. ඔවුන්ගේ මෙම ක්‍රියාව ඉදිරියේ පේත්‍රුස් ප්‍රකාශ කළ වචනය වූයේ ඃ

**''අනනියස්නි, ශුද්ධාත්මයාණන්වහන්සේ රවටා බිමේ මිලෙන් කොටසක් තබාගන්ට, <u>සාතන් නුඹේ සිත පිරෙව්වේ</u> මක්නිසාද ? ''(ක්‍රියා 5:3)** යන වචනයයි.

තණ්හාවෙන් අපගේ සිත් පිරීම තුළින් සිදුවන්නේ, එමගින් අප යක්ෂයාට අපව පාලනය කරන්ට ඉඩදී, යක්ෂයාට ගොදුරුවී, යක්ෂයාගෙන් පිරී, දෙවියන්වහන්සේට විරුද්ධව ක්‍රියා කිරීමයි.

දේව දරුව, **ඕනෑම දෙයකට අපගේ සිත් පිරීමට අප ඉඩහැරිය විට, එය තුළින් අපව පාලනය කිරීමට යක්ෂයා ක්‍රියා කරන බව, සැම විටම මතක තබා ගන්න.**

❖ ඔබගේ සිත පුරවන්නාවූ දේ ක්‍රීඩාව, සංගීතය, ඔබගේ හැඩ රුව, ඔබගේ දරුවන්ගේ දියුණුව, ඔබගේ රැකියාව හෝ වෙනත් ඕනෑම (අප යහපත් හෝ අහිංසක ලෙස සලකන) දෙයක් විය හැක.

මෙනමුත් අපව හොඳහැටි දන්නාවූ, යක්ෂයාගේ ක්‍රියාකිරීමද හොඳහැටි දන්නාවූ, අපගේ ප්‍රේමණීය පියාණන්වහන්සේ අපට නියෝග කරන්නේ, **මේ දේවලින් නොව ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරී සිටීමටය.**

උන්වහන්සේ මෙසේ අපට පවසන්නේ, අපගේම යහපත උදෙසාය. **උන්වහන්සේගේ මේ නියෝගයට අප කීකරුවෙමු. ශුද්ධාත්මයාණන්වහන්සේ හැරෙන්ට අපගේ සිත් පාලනය කරන්ට අන් කිසි දෙයකට ඉඩ නොහරිමු.**

❖ **'ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවීම'** වැඩි දුරටත් තේරුම් - ගැනීම උදෙසා, ග්‍රීක් භාෂාවේ භාවිතා කරනු ලබන්නාවූ කාල ප්‍රභේද අප තේරුම්ගැනීම වැදගත් වේ. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් ලිවීමේදී, අප යොදාගන්නාවූ කාල ප්‍රභේදයන් වන්නේ, අතීතය වර්තමානය සහ අනාගතය වේ (Past, Present and Future tense) . පූර්ණවීමට මෙය යෙදූ විට,

| | | |
|---|---|---|
| පූර්ණවූවා | - | අතීතය |
| පූර්ණයි | - | වර්තමානය |
| පූර්ණවීමට යනවා | - | අනාගතය |

ලෙස අප යොදා ගන්නෙමු.

නමුත් ග්‍රීක් භාෂාවේ මීට අමතරව 'පිරෙමින් පවතිනවා' යන අරුත ඇති කාල ප්‍රභේදයක් භාවිතා වන අතර, **එපීස 5:19** හි සඳහන් දේව නියෝගයේ වඩා නිවැරදි පරිවර්තනය වන්නේ, **'ආත්මයාණන්ගෙන් පිරෙමින් පවතින්න'** යන්නයි.

ඒ අනුව දෙවියන්වහන්සේ අපට නියෝග කරන්නේ, **'සැමවිටම ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවී ජීවත් - වීමට උත්සාහ කරන්න'** කියාය. නව ගිවිසුම දෙස බලන අපට පෙනීයන්නේ, කිතුනුවන්ගේ මෙම 'පිරීම' එක අවස්ථාවකට සීමා නොවුනු බවය.

**<u>නිදසුනක් වශයෙන්</u> :-**

(i) මුල් ඇදහිලිවන්තයන් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණු අවස්ථා දෙකක් නව ගිවිසුමෙහි සඳහන්වේ.

**ක්‍රියා 2:4 :- " ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව...."**

**ක්‍රියා 4:31 :-"....ඔවුන් සියල්ලෝද ශුද්ධාත්මයෙන් පූර්ණව, දෙවියන්වහන්සේගේ වචනය නිර්භීත ලෙස කථා කළෝය."**

(ii) පාවුල්තුමා ශුද්ධාත්මයාණන්ගෙන් පිරුණු අවස්ථා දෙකක් **ක්‍රියා 9:17**, සහ **ක්‍රියා 13:9** හි සඳහන්වේ.

සෙනෙහෙවන්ත සහෝදරයා සහෝදරී, ඔබගේ ජීවිතයේ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ඔබ පූර්ණව සිටි අවස්ථා ඔබ අත්දැක ඇතැයි සිතමි. බොහෝවිට මෙවැනි අවස්ථා ගැන කථාකිරීමට සහ සාක්ෂිදීමටද ඔබ යෙදෙන්ට ඇත. මෙය ඉතා යහපත්වේ, ප්‍රශංසනීයවේ. නමුත් මෙයින් සෑහීමට පත්නොවන්න. **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, සැමවිටම මෙසේ පිරී සිටීමට බව තේරුම්ගෙන, දිනපතාම ඔබගේ සිත ශුද්ධාත්මයාණන්වහන්සේගේ පාලනයට යටත්කිරීමට උත්සාහ කරන්න.**

**3. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටීමට ඇති මූලික බාධාවක්</u>**

ඉහත සඳහන් අයුරින් ජීවත්වන ලෙස දෙවියන්වහන්සේ අපව කැඳවන අතර, මෙසේ කිරීමට අපගේ 'මාංශය' සමග මහත් පොරබැදීමක යෙදීමට අපට සිදුවේ. මෙම පොරබැදීම තේරුම්ගැනීම උදෙසා, **1 කොරි 3:1** දෙස බලමු.

**1 කොරි 3:1 :- "සහෝදරයෙනි, ආත්මිකයන්ට මෙන් නුඹලාට කථාකරන්ට නොහැකිව, මාංසිකයන්ටත් ක්‍රිස්තුස්වහන්සේ තුළ බිළිඳුන්ටත් මෙන් කථාකළෙමි."**

මෙහිදී පාවුල්තුමා අමතන කොරින්ති සභාව **'කිසි දීමනාවකින් අඩු නොවූ සභාවක්' (1 කොරි 1:7)** බව අප දනිමු. මෙසේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනාවල කිසි අඩුවක් නොතිබූ මේ සභාවේ ඇදහිලිවන්තයන් **'මංසිකයන් සහ ආත්මික බිළිඳුන්'** බව පාවුල් ප්‍රකාශ කරයි.

**1 කොරි 3:1** හි සඳහන් වචන වලින්, අපට කිතුනුවන් ආත්මික කිතුනුවන් සහ මාංසික කිතුනුවන් ලෙස වර්ග කිරීමට හැකිවේ. පහත සඳහන් නිර්වචනය කිරීම මගින්, එම කණ්ඩායම් දෙක අපට පහසුවෙන් හඳුනා ගත හැකි වේ. එනම්,

**මාංසික කිතුනුවා, මාංසික ආශාවලින් පාලනය කරනු ලබයි. ආත්මික කිතුනුවා, ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් පාලනය කරනු ලබයි.**

දේව දරුව, අපගේ මාංස බොහෝවිට ශුද්ධාත්මායාණන් - වහන්සේට කීකරුව ජීවත්වීමට අපට බාධා කරයි.

**ගලාති 5:17 :- "මක්නිසාද මාංසය ආත්මයාණන්වහන්සේට විරුද්ධවද ආත්මයාණන්වහන්සේ මාංසයට විරුද්ධවද ආශා කරයි. නුඹලා කැමති වන දේ නොකරන ලෙස මොව්හු එකිනෙකාට විරුද්ධ වෙති."**

අපගේ මාංස සහ ආත්මයාණන්වහන්සේ අතර ඇති ගැටුම වැඩි දුරට තේරුම්ගැනීම උදෙසා, පාවුල්තුමා මේ ගැන ලියා ඇත්තාවූ ඔහුගේ අත්දැකීම **(රෝම 7:14-23)** කියවා මෙනෙහි කරන්න.

සෑම කිතුනුවෙකුගේ අභ්‍යන්තරයේ, මෙම පොරබැදීම තිබෙන අතර, **දෙවියන්වහන්සේ අපව කැඳවන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරී, මෙම සටනින් ජය ගැනීමටයි.**

**4. <u>ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වීම සොයන අප විසින් නොකළ යුතු දේ</u>**

(i) **ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දීම - එපීස 4:30**

**එපීස 4:30 :- "දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් - වහන්සේට දුක් නොදෙල්ලා ; ......"**

ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් නොදෙන ලෙස අපට අනුශාසනා කරන්නාවූ දෙවියන්වහන්සේ, එසේ අප උන්වහන්සේට දුක් ගෙන දෙන්නාවූ අයුරු කිහිපයක්, **එපීස 4:25-31** දක්වා සඳහන් කර ඇත.

ඒවා දෙස බලන අතර ඒවායෙන් බොහොමයක් අපගේ මුඛයෙන් කරන්නාවූ පාප බව ඔබට පෙනෙනු ඇත. ඒවානම්,

| | | |
|---|---|---|
| **බොරුකීම** | - | **එපීස 4:25** |
| **දුෂ්‍ය කථාවල යෙදීම** | - | **එපීස 4:29** |
| **අපහාස කිරීම** | - | **එපීස 4:31** |

දේව දරුව, ඔබගේ මුඛයෙන් ශුද්ධාත්මයාණන්වහන්සේට දුක් දීම වහාම අතහරින්න. කිසිවිටක **බොරු නොකියන්න.** කිසි අවස්ථාවක **දුෂ්‍ය කථාවල නොයෙදෙන්න,** කිසි කෙනෙකුට **අපහාස නොකරන්න.** අදම ඔබගේ මුඛයෙන් නික්මෙන වචන පාලනය කිරීම ශුද්ධාත්මයාණන් - වහන්සේට භාර දෙන්න !!

(ii) **ආත්මයාණන්වහන්සේ නිවා දැමීම - 1 තෙස 5:19**

**1 තෙස 5:19 :- "ආත්මයාණන්වහන්සේ නොනිවල්ලා."**

අප ආත්මයාණන්වහන්සේ නිවා දමන්නේ කෙලෙසද කියා යමෙක් ප්‍රශ්න කිරීමට හැක. මාගේ පිළිතුර වන්නේ, අප අපගේ මාංසයේ හඬට කීකරුවී, ශුද්ධාත්මයාණන් - වහන්සේගේ හඬට සවන් නොදෙනවිට අප උන්වහන්සේව නිවාදමන බවයි.

මාගේ ප්‍රේමවන්ත දේව දරුව, **සැමවිටම ශුද්ධාත්මයාණන් - වහන්සේගේ හඬට කීකරු වන්න !! කිසිවිටක ආත්මයාණන් - වහන්සේ නොනිමන්න !!**

(iii) **ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණවීම ප්‍රතික්ෂේප කිරීම**

බොහෝ කිතුනුවන් ශුද්ධාත්මයාණන්වහන්සේගේ දීමනා ලැබීමට මහත් ආශාවක් දක්වන නමුත්, උන්වහන්සේගෙන් පිරීම ප්‍රතික්ෂේප කරති. ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් නොපිරුනු ජීවත ගතකරමින් සෑහීමට පත්ව සිටිති.

**දේව දරුව, ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරෙමින් පවතිනවාද ? එසේ නොමැති නම් පිපාසා ඇතිව දෙවි සමිඳුන් වෙත පැමිණ, ඔබව ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පුරවන මෙන් උන්වහන්සේට යදින්න. ඔබ පිරෙන තෙක්ම යදින්න !!! පිරෙන තෙක්ම දෙවියන්වහන්සේට කන්නලව් කරන්න !!!**

5. **<u>ආත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටින කෙනෙකුගේ හැසිරීම - එපීස 5:19-21</u>**

**එපීස 5:19-21** දක්වා ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණාවූ කෙනෙකුගේ ජීවිතයෙන් ප්‍රකාශ විය යුතු ලක්ෂණ පහක් සඳහන් වේ. මේවාද ඊට අමතරව ක්‍රියා පොතේ ද අප දකින්නාවූ ලක්ෂණ කිහිපයක් දෙස ද අප බලමු.

දේව දරුව, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවී, මෙම හැසිරීම් රටාව ඔබගේම කරගන්න.

(i) **සැබෑ නමස්කාරයේ යෙදීම - එපීස 5:19**

**එපීස 5:19 :- ".....නුඹලාගේ <u>සිත්වලින්</u> ස්වාමීන් - වහන්සේට ගායනාද ගීතිකාද කරමින්."**

මෙම පදයේ 'සිත්වලින් ' යන්නෙන් අදහස් වන්නේ,

(a) ගීතිකා ගායනා කරන අතර, ගායනයේ සහ සංගීතයේ අලංකාරයට සීමා නොවී, ගයන්නාවූ වචන ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණවූ, හදපත්ලෙන් නැගී එන්නාවූ නමස්කාරයක් ලෙස දෙවියන් - වහන්සේට පිදීම යන්නයි.

දේව දරුව, ඔබ නමස්කාරයේ යෙදෙන අතර, කිසිම දෙයකට හෝ කිසිම කෙනෙකුට, ඔබගේ අවධානය ඇද ගැනීමට ඉඩ නොදෙමින්, ආත්මයෙන් සහ සැබෑකමින් සමිඳුන්ට නමස්කාර කරන්න.

**යොහන් 4:24 :- "දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑ කමෙන්ද නමස්කාර කළ යුතු යයි කී සේක."**

(b) වෙන වැඩ වල යෙදෙන විට පවා, සිත්වලින් (හදවතින්) සමිඳුන්ට ගී ගැයීම.

මා ඔබට යෝජනා කරන්නේ, මේ අරුත් දෙකම භාරගනිමින්, දේව නමස්කාරය ඔබගේ ජීවිතයේ නිරන්තරයෙන්ම සිදුවන්නාවූ දෙයක් කර ගැනීමට කියාය.

(ii) **සැබෑ සහභාගිකම භුක්ති විඳීම - එපීස 5:19**

**එපීස 5:19 :- "ගීතිකා වලින්ද, කවි වලින්ද, ආත්මික ගී වලින්ද, එකිනෙකාට කථාකොට, ....."**

මෙයින් අදහස් වන්නේ කිතුනු අප එකතු වූ විට කථාකිරීම අතහැර දමා ගායනා යනාදියේ යෙදීම නොවේ. එයින් අදහස් වන්නේ, ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව අප එකතුවූ විට, දෙවියන්වහන්සේට ප්‍රසන්නවූ කථා මෙන්ම, එක්ව උන්වහන්සේට ප්‍රශංසා ගී ගැයීම ස්වභාවයෙන්ම අප මුවින් නික්මිය යුතු බවයි.

මේ මගින් කිතුනුවන් අතර සැබෑ සහභාගිකම වර්ධනය වනවා ඇත.

(iii) **සියල්ලේදී දෙවියන්වහන්සේට තුති පිදීම - එපීස 5:20**

**එපීස 5:20 :- " අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන්වහන්සේට නිතරම ස්තූති කරපල්ලා."**

මේ පිළිබඳව **කොලො 3:17** සහ **1 තෙස 5:18** දෙස බලමු.

**කොලො 3:17 :- "නුඹලා ..... මොකක් කරතත්, සියල්ලම ස්වාමීවූ යේසුස්වහන්සේගේ නාමයෙන් කරමින්, උන්වහන්සේ කරණකොටගෙන පියවූ දෙවියන්වහන්සේට ස්තූති කරපල්ලා."**

**1 තෙස 5:18 :- " සියල්ලේදී ස්තූති කරපල්ලා."**

(iv) **ක්‍රිස්තුස්වහන්සේට යටත්වීම - එපීස 5:21**

**එපීස 5:21 :- " ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි භය ඇතුව...."**

ආත්මයාණන්ගෙන් පූර්ණවූ කෙනෙකුගේ මෙහි සඳහන්වන හතරවන ලක්ෂණය වන්නේ, යේසුස්වහන්සේට අකීකරුවීමට ඔහු තුළ ඇත්තාවූ භයයි.

එබැවින් ඔහු, යේසුස්වහන්සේට යටත් වී, උන්වහන්සේට තම ජීවිතයේ ස්වාමීත්වය භාරදී, උන්වහන්සේට කීකරුවී ජීවත් වෙයි.

(v) **එකිනෙකාට යටත් වීම - එපීස 5:21**

**එපීස 5:21 :- ".....එකිනෙකාට යටත් වෙයල්ලා."**

මනුෂ්‍යවූ අප ස්වභාවයෙන්ම අන් අයට යටත්වීමට අකමැති වන්නෙමු. එබැවින් 'එකිනෙකාට යටත් වීම' අපට අපහසු වේ. මෙනමුත් අප ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව, යේසුස්වහන්සේට යටත්වූ විට, එකිනෙකාට යටත්වීම, අපගේ ස්වභාවය වනවා ඇත.

(vi) **ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් යුක්තව සේවය කිරීම - ක්‍රියා 2:4, 3:1-11**

පෙන්තකොස්ත දවසේ, පේතෘස් සහ යොහන් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණු බව අප දනිමු **(ක්‍රියා 2:4).** මෙම පූර්ණවීමට ඇතුල්වූ ඔවුන්, මව්කුස පටන් කොරව සිටි මනුෂ්‍යයෙක් සුව කිරීම මගින් සේවය උදෙසා බලය ලැබූ බව අපට **ක්‍රියා 3:1-11** පෙන්වාදෙයි.

(vii) **ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම - ක්‍රියා 7:1-60**

ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණව සිටි ස්තේපන් **(ක්‍රියා 6:3)** උන්වහන්සේගේ බලයෙන්ද පූර්ණව සිටියේය **(ක්‍රියා 6:8).** ඔහුව ගල් ගසා මරණ ලද අවස්ථාවේ **කුරුසිය පිට යේසුස්වහන්සේ වදාළ 'වචන දෙකකට' සමාන වචන ප්‍රකාශ කරමින්, ඔහු තම ජීවිතය පිදුවේය (ක්‍රියා 7:59,60).**

(viii) **යක්ෂයාගේ බලය බිඳ දැමීම - ක්‍රියා 13:9-12**

ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පිරුණාවූ පාවුල් **(ක්‍රියා 13:9)** යක්ෂයාගේ බලයෙන් ඔහුට විරුද්ධවූ එලිමස්ව කලකට අන්ධ වීම උදෙසා යක්ෂයාගේ බලය ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් බිඳ දැමුවේය.

දේව දරුවෙනි, අප සැම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වෙමු.

දේව භය ඇතිව, දෙවි සමිඳුන්ව නමදිමු.

උන්වහන්සේට තුති ප්‍රශංසා පුදමු.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් සේවයේ යෙදෙමු.

රෝගීන් සුව කරමු, යක්‍ෂයාගේ බලය බිඳිමු.

යේසුස්වහන්සේගේ අඩි පාරේ යමු.

**එසේ කිරීම උදෙසා දෙවි ස්වාමීන්වහන්සේ,**

**පිපාසා ඇත්තාවූ සැම දෙන**

**ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ කරන සේක්වා !!**

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය



# ගැළවීම

# නොමිලේ ලැබෙන අමිල ත්‍යාගය

**හැඳින්වීම**

මනුෂ්‍ය වූ අප සැම සාමාන්‍යයෙන් පිළිගන්නාවූ ද, බොහෝ විට අත්දකින්නාවූද ''සත්‍යයක්'' වන්නේ, **'වටින්නාවූ ඕනෑම දෙයක් ලබා ගැනීම උදෙසා, අනිවාර්යයෙන්ම වැයවීමක්, කැපවීමක් හෝ පරිත්‍යාගයක් හෝ අධික මිලක් වැනි දෙයක් ගෙවීම අත්‍යවශ්‍යය වන බවයි.**

නිදසුනක් වශයෙන් වෛද්‍යවරයෙක් වීමට අපේක්ෂා කරන්නාවූ තරුණයෙකුට, එම ඉලක්කය කරා ලඟාවීමට මහත් කැපවීමෙන් තමාගේ අධ්‍යාපනය උදෙසා, තම කාලය වැය කිරීමට සිදුවේ. එලෙසම ඕනෑම ක්ෂේත්‍රයක ඉහල මට්ටමක් කරා යෑම උදෙසා බොහෝ දේ පරිත්‍යාග කිරීමට හෝ තමා ආස කරන්නාවූ සමහර දේ අතහැරීමට අපට සිදුවේ. එබැවින් අපට යමක් නොමිලේ ලැබෙන බව, අසන්ට ලැබුනු විට, අප තුළ බොහෝ විට ඇතිවන්නේ, ඒ පුවත ගැන විශ්වාසයක් නොව සැකයකි.

මාගේ ආදරනීය සහෝදරයා/ සහෝදරී මේ 'පොත් පිංච' මා ලියන්නේ ඔබට ඇදහීමට බැරි තරම් පුදුම ආරංචියක් ඔබට කියා දීමටයි. එනම් මනුෂ්‍ය ජීවිතයේ අපට ලබා ගත හැකි, වඩාත්ම වටින්නාවූ, **අමිල තෑග්ග ඔබට නොමිලේ ලබා ගත හැකි බවයි.**

එබැවින් මෙම ත්‍යාගය ලබා ඇත්තාවූ මා, ඉතා ඕනෑකමින් ඔබගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ වටිනා කාලයෙන් අඩහෝරාවක් වැයකර, විවෘත හදවතකින් සහ මනසකින්, මේ පොතේ අවසානය දක්වා කියවීමටයි.

## 1. නවීන සමාජයේ පවතින සමහර සෘණාත්මක ලක්ෂණ

### (i) දැනුමේ වර්ධනය සහ මිනිස් හැසිරීමේ පරිහානිය

අප අද ජීවත්වන්නේ, මිනිසාගේ දැනුම ඉතා සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ ලෝකයකය. තාක්ෂණික දියුණුව අද කෙතරම් සීග්‍රයෙන් වර්ධනයවේද යත්, වර්තමාන

ලෝකයේ තිබෙන්නාවූ වඩාත්ම නවීන ජංගම දුරකථනයක් අප අද මිලදී ගතහොත්, තව වසරක ඇවෑමෙන් එයට වඩා බොහෝ සේ දියුණු වූ දුරකථනයක් ඊට වඩා අඩු මිලකට ගතහැකි වනු නොඅනුමානය.

මේ අයුරින් ඉමහත් වේගයකින් මිනිසාගේ දැනුම වර්ධනය වන්නාවූ ලෝකයේ, මිනිසාගේ සදාචාරාත්මක භාවයේ, අපට බොහෝ විට පෙනෙන්නේ, වර්ධනයක් නොව පිරිහීමකි. මිනිස් ශිෂ්ඨාචාරය දියුණුවීම සමඟ, මිනිස් හැසිරීමේ ද දියුණුවක් අපට අපේක්ෂා කළ හැකි නමුත්, නවීන සමාජය අපට පෙන්නුම්කරන්නේ මීට හාත්පසින්ම වෙනස්වූ තත්වයකි.

**'දියුණු වූ වර්තමාන සමාජයේ'** අසාධාරණය, වංචාව, සොරකම, අල්ලස් සහ දූෂණ වැනි දේ වල වර්ධනයක් මිස අඩුවීමක් අප නොදකින්නෙමු. මාගේ ආදරණීය සහෝදරයා/ සහෝදරී, මෙයට හේතුව කුමක්ද කියා, ඔබ ඕනෑකමින් සිතා තිබෙනවාද? ඔබ මෙය ගැන සිතා තිබේ නම්, සමහරවිට මෙසේ සිදුවන්නේ, මනුෂ්‍යයාගේ ස්වභාවයෙන්ම ඔහුගේ අභ්‍යන්තරයෙන් නැතහොත් හදවතෙන් පැනනැගෙන්නාවූ හේතු නිසා බව ඔබ නිගමනය කරන්ට පුළුවන.

ඉහත සඳහන් අයුරින්, දැනුම අතින් සීග්‍රයෙන් වර්ධනය වන ලෝකයේ, මනුෂ්‍යයාගේ හැසිරීමේ පිරිහීමට හේතුව සහ **එම ප්‍රශ්නයට විසඳුමක්ද** මෙම 'පොත් පිංච' මගින් ඔබට ලැබෙනු ඇතැයි මම විශ්වාස කරමි.

## (ii) <u>යහපත සහ අයහපත අතර ගැටුමෙන් අයහපත ජයගැනීමේ ප්‍රවණතාවය</u>

දියුණු වෙමින් පවතින්නාවූ මිනිස් සමාජයේ නිරන්තරයෙන්ම පවතින්නාවූ එක් ගැටළුවක් වන්නේ, හොඳ සහ නරක, යහපත සහ අයපත, සාධාරනත්වය සහ අසාධාරනත්වය වැනි දේ අතර ඇත්තාවූ ගැටුමයි. මෙයට මූලික හේතුවක් ලෙස අප දකින්නේ, සමාජයේ ඉහල මං පෙත්තක් කරා නැගීමට සමාජයේ අති බහුතරයක් දරන්නාවූ දැඩි උත්සාහයයි.

තමාගේ ජීවිතය ඉහල ඉලක්කයක් වෙත ගෙන යෑමට වෙර දැරීම

අප කවුරුත් අගය කළ යුතු ගුණාංගයකි. මෙනමුත් මෙය තුළින් ඇතිව තිබෙන්නාවූ ඉතා අහිතකර ප්‍රතිඵලයක් අප දකින්නෙමු. එනම්, තමාගේම ඉලක්කය ඉටුකර ගැනීම උදෙසා, **'වැරදි ක්‍රම'** භාවිතා කරන්නාවූ, අන් අයගේ අයිතිවාසිකම් නොසලකන්නාවූ, ඉතාමත් ආත්මාර්ථකාමීව ක්‍රියා කරන්නාවූ සමූහයක් බිහිවීමයි. මෙය හේතුකොටගෙන මනුෂ්‍යයන් අතර සහයෝගය වෙනුවට තරඟකාරීකම වැඩිවෙමින් පවතින්නාවූ තමාගේ **'දියුණුව'** ගැන පමණක් සිතන්නාවූ මනුෂ්‍යයන්ගේ සංඛ්‍යාව ඉතා වේගවත්ව වැඩිවෙන්නාවූ සමාජයක් අද නිර්මාණය වෙමින් පවතියි.

මෙම ඉතා අහිතකර තත්වය නිසා අද අප සමාජයේ දකින්නාවූ අයහපත් ප්‍රතිඵල කීපයක් පහත සඳහන් වේ.

(i) නැති බැරි අයගෙන් ඇති හැකි අය අයුතු ප්‍රයෝජන ගැනීම
(ii) විවිධ අරමුණු ඉටු කර ගැනීම උදෙසා, බොහෝ දෙනා අල්ලස් දීමට පෙළඹීම.
(iii) තමාගේ උසස් වීම තකා, අන් අය පාවා දීම සහ අසාධාරන දේ කිරීම ප්‍රචලිත වීම.
(iv) මනුෂ්‍යයන් තම තත්වය, බලය සහ මිල මුදල් අයුතු ලෙස භාවිතා කිරීම.

ඉහත සඳහන් හේතු නිසා, සමාජය තුළ යහපත සහ අයහපත අතර ගැටුමෙන්, අද බොහෝවිට ජය ගන්නේ අයහපතයි.

මාගේ ආදරණීය සහෝදරයා සහෝදරී, මෙලෙස අයහපත ජයග්‍රහණය කරන්නාවූ සමාජයේ වෙනසක් ඇති කිරීමට ඔබට නොහැකියයි ඔබ සිතනවාද?

**සැබවින්ම ඔබට එසේ කළ හැකි බව අපගේ විශ්වාසයයි.**

## 2. ඉහත සඳහන් සෘණාත්මක ලක්ෂණ සමාජයේ ඇතිවීමට මූලික හේතු

නවීන සමාජයේ පවතින්නා වූ සෘණාත්මක ලක්ෂණ දෙස අපගේ අවධානය යොමු කළ විට අප දකින්නේ, ඉහත සඳහන් ලක්ෂණ

සමග තවත් බොහෝ අහිතකර ලක්ෂණ ලෝකයේ සෑම රටකම දක්නට ඇති බවයි.
ඒවායින් සමහරක් පහත සඳහන්වේ.

(i) මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම.
(ii) ඉතා සුළු හේතූන් මත මිනිස් ඝාතන සිදුවීම.
(iii) ස්ත්‍රී දූෂණ වැඩිවීම.
(iv) ළමා අපචාර වැඩිවීම.
(v) ගබ්සා කිරීම් වැඩිවීම.
(Vi) දික්කසාද වැඩිවීම.
(Vii) සමලිංගික සම්බන්දකම් සහ විවාහයන් ප්‍රචලිත වීම.
(viii) සමාජයේ සෑම මට්ටමකම සොරකම්, මැරකම් සහ වංචාව වැඩිවීම.
(ix) මැර කල්ලි බලවත්වීම.
(x) ජනතාවගෙන් බහුතරයක්, තමා අසුනොවේ යයි සිතන අවස්ථාවන්හිදී, රටේ නීති කැඩීම.
(xi) බොරු කීම **'ඉතා සුළු දෙයක්'** ලෙස සැලකීමට සමාජය පුරුදුවීම.

ප්‍රිය මිතුර, මෙම ඉතා ඛේදජනක, ගෝලීය තත්වය ගැඹුරින් අධ්‍යයනය කර, **එයට හේතුව ඔබට සොයා ගැනීමට හැකිනම්, ඔබ විසින් ලෝක ප්‍රජාවට කරනු ලබන්නේ මහඟු සේවයකි.** මෙම හේතුව සොයාගෙන, **එයට විසඳුමක් ඔබට සපයා දීමට හැකිනම්, ඔබ මනුෂ්‍ය වර්ගයාට කරන්නාවූ සේවය අමිල සේවයක් ලෙස සඳහන් කිරීම නිවැරදි වේ.**

එබැවින් මා මෙය කියවන ඔබට ඇරයුම් කරන්නේ, ඉහත සඳහන් ගෝලීය තත්වයට හේතුව විමසා බැලීමට මා සමග එකතු වන ලෙසයි.

මේ විමසා බැලීම මා අරඹන්නේ, අප වෙසෙන්නා වූ මේ ලෝකය ඉබේම ඇති නොවුන බවත්, මෙම ලෝකය මෙන්ම මනුෂ්‍ය වර්ගයාද මැව්වාවූ සර්වබලධාරී දෙවි කෙනෙක් සිටින බවත් උපකල්පනය කරමිනි. මෙය සත්‍යයක් බව ඔබ පිළිගන්නේ නම්, අද ලෝකයේ පවතින ඛේදජනක තත්වයට හේතු සමහරක් පහත

සඳහන් ඒවා විය හැකි බව අපට නිගමනය කළ හැකිවේ.

(i) මැවුම්කාර දෙවියන්වහන්සේ, උන්වහන්සේ විසින් මවන ලද මනුෂ්‍යයා ක්‍රියා කරන අන්දම ගැන නොසලකන්නාවූ දෙවි කෙනෙකි.

(ii) මැවුම්කාර දෙවියන්වහන්සේ, මනුෂ්‍යයා ගේ තත්වය හොඳහැටි දන්නා නමුත්, උන්වහන්සේ එම තත්වයට විසඳුමක් ලබාදීමට හැකියාවක් නොමැති දෙවිකෙනෙකි.

(iii) මැවුම්කාර දෙවියන්වහන්සේ මැව්වාවූ මනුෂ්‍යයාව නොමග හැරීම උදෙසා ක්‍රියාකරන්නාවූ ද, දෙවියන්වහන්සේට විරුද්ධවූද, බලවේග මෙලොව ක්‍රියාත්මක වන අතර, එම බලවේග පරාජය කිරීමට දෙවියන්වහන්සේට බලය නැත.

(iv) **මැවුම්කාර දෙවියන්වහන්සේ සර්වබලධාරී බැවින් උන්වහන්සේට මෙම තත්වය වෙනස් කළ හැකි නමුත්, උන්වහන්සේ සර්ව සාධාරන වන බැවින් උන්වහන්සේ අපට සිතාගත නොහැකි තරම් පුදුමාකාර විසඳුමක් මනුෂ්‍යයාට ලබාදී තිබේ.**

මාගේ ප්‍රේමණීය සහෝදර සහෝදරී, මාගේ විශ්වාසය වන්නේ, ඉහත සඳහන් විවිධ මත අතුරෙන්, අංක (iv) ලෙස සඳහන් නිගමනය වඩාත්ම නිවැරදි බවයි. එම විශ්වාසය නම්, **මැවුම්කාරවූ, සර්ව බලය ඇත්තාවූ, සර්ව සාධාරනවූ, මනුෂ්‍යයාට අතිශයින් ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, සෑම මනුෂ්‍යයෙකුට මෙලොව තිබෙන්නාවූ 'සෑම ප්‍රශ්නයකින්ම මුදවා ගැනීම උදෙසා - අමිල තෑග්ගක් අපට නොමිලේ ලබා දීමට බලාසිටින්නාවූ' දෙවිකෙනෙක් වන බවයි.**

## 3. <u>ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප සැමට නොමිලේ ප්‍රදානය කිරීමට සූදානම්ව සිටින්නාවූ අමිල තෑග්ග</u>

## (i) <u>මනුෂ්‍ය සංහතියේ තුඩුදෙන ප්‍රශ්නය</u>

සර්වබලධාරී, සර්වසාධාරන, මහෝත්තමවූ, ප්‍රේමයේ දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ **'ස්වරූපයෙන් සහ සමානත්වයෙන්'** මනුෂ්‍යයා මැවූ සේක. **(උත්පත්ති 1:26)** උන්වහන්සේ සතුටින්, සමාදානයෙන් සහ තෘප්තියෙන් පිරුනාවූ ජීවිතයක් ගත කිරීම උදෙසා, මනුෂ්‍යයාට අවශ්‍යවන්නාවූ සෑම දෙයක්ද, ආරම්භයේදී සැපයූ සේක.

දෙවියන්වහන්සේ විසින්ම නිර්මාණය කරන ලද්දාවූ, **'දැකීමට ප්‍රියවූ කෑමට හොඳවූ සියලු ගස්වලින්'** සමන්විත වූ අති අලංකාර උයනක්, නිවසක් ලෙස මනුෂ්‍යයාට උන්වහන්සේ ප්‍රදානය කළ සේක. **(උත්පත්ති 2:9)** එබැවින් මනුෂ්‍යයා ආරම්භයේදී විසුවේ, රසවත් පෝෂ්‍යදායී ආහාර නොඅඩුවූ, දූෂණයෙන් තොරවූ, අති පිරිසිදු පරිසරයක් තුළ විය. දෙවි සමිඳුන් මනුෂ්‍ය වර්ගයාට මෙන්ම පොළොවේ සියලු මෘගයන්ට අවශ්‍ය ආහාරද සපයා දුන් සේක.

**උත්පත්ති 1:29,30:- " [29] තවද දෙවියන්වහන්සේ: බලව, මුළු පොළෝතලයෙහි ඇති බීජ දරන සියලු පලාද, බීජ දරන ඵල ඇති සියලු වෘක්ෂයන්ද නුඹලාට දුනිමි; එය නුඹලාට ආහාර පිණිස වන්නේ ය. [30] පොළොවේ සියලු මෘගයන්ටත් ආකාශයේ සියලු පක්ෂීන්ටත් පොළොව පිට බඩගා යන පණ ඇති සියලු සතුන්ටත් ආහාර පිණිස සියලු නිල් පලා දුනිමියි කීසේක."**

දෙවියන්වහන්සේ ඉහත සඳහන් ආහාර උන්වහන්සේගේ මුළු මැවිල්ලට සපයා දුන් බැවින්, මුළු මැවිල්ල තුළ 'බිය සහ සැක' වැනිදේ නොතිබුණි. මනුෂයා සහ මැවුම්කාර දෙවියන්වහන්සේ අතරද, මනුෂ්‍යයා සහ සත්ව ලෝකය අතරද, මනුෂ්‍යයා සහ සොබාදහම අතරද, පැවතුනේ අති යහපත් සබැඳියාවකි.

දෙවියන්වහන්සේට එරෙහිව සිටින යක්ෂයා, උන්වහන්සේ මැව්වාවූ සුන්දර ලෝකයේ, මනුෂ්‍යයාට උන්වහන්සේ විසින් දෙන ලද්දාවූ **ආශිර්වාද සොරාගැනීමටත්,** උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ **සම්බන්දකම නැතිකර දැමීමටත්,** මනුෂ්‍යයාගේ **අනාගතය විනාශකර දැමීමටත්,** ක්‍රියාත්මක විය.

**යොහාන් 10:10:- " සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය......"**

යක්ෂයා බොරුවෙන් සහ වංචාවෙන් මනුෂ්‍යයා මුලාකොට, දෙවියන්වහන්සේට අකීකරු වීමට මනුෂ්‍යයාට සැලසුවේය. මනුෂ්‍යයාගේ මේ අකීකරුකමේ ප්‍රතිඵලය වූයේ, මනුෂ්‍යයා දෙවියන්වහන්සේ දුන්නාවූ උයනින් නෙරපා දමනු ලැබීම, දෙවියන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර තිබුනාවූ සම්බන්දකම කැඩීයාම, සහ සදාකාල විනාශය මනුෂ්‍යයාට හිමිවීමයි.

මීට අමතරව, තව ඛේදජනක දෙයක් මනුෂ්‍යයාට සිදුවිය. අප කලින් දුටු ආකාරයට මනුෂ්‍යයා මවන ලද්දේ 'දෙවියන්වහන්සේගේ ස්වරූපය සහ සමානත්වය' ඇතිවය. එබැවින් **මනුෂ්‍යයා තුළ දෙවියන්වහන්සේගේ ස්වභාවය රජකම් කළේය.** නමුත් මනුෂ්‍යය යක්ෂයාට රැවටී, යක්ෂයාට කීකරු වූ විට මනුෂ්‍යයා, දෙවියන්වහන්සේගේ ස්වභාවය අතහැර යක්ෂයාගේ ස්වභාවය පැළඳගත්තේය. **එදා පටන් මනුෂ්‍යයා තුළ රජකම් කරන්නේ යක්ෂයාගේ ස්වභාවයයි.**

**අප ප්‍රථමයෙන්ම ඔබට පෙන්වා දුන්නාවූ, මිනිස් හැසිරීමේ පරිහානියද , යහපත සහ අයහපත අතර ගැටුමේදී අයහපත ජයගැනීමේ ප්‍රවනතාවයද සීග්‍රයෙන් වර්ධනය වන්නාවූ ගෝලීය තත්ත්වයක් අද ඇතිව තිබෙන්නේ, මනුෂ්‍යයා තුළ ක්‍රියාකරන්නාවූ යක්ෂයාගේ ස්වභාවය හේතුවෙනි.**

මනුෂ්‍යයා යක්ෂයාට කීකරුවීමෙන් පසුව, මෙලොව උපදින සෑම මනුෂ්‍යයෙක්ව ලොවට බිහිවන්නේ, යක්ෂයාගේ ස්වභාවට නොහොත් පාපිෂ්ඨ ස්වභාවයකින් යුතුවය. මෙලොව උපත ලබන සෑම මනුෂ්‍යයෙක්ම උපදින්නේ, පව්කාර ස්වභාවයක් සහිතව බැවින්, පවින් තොර ජීවිතයක් ගත කිරීමට කිසි මනුෂ්‍යයෙකුට නොහැක. එමෙන්ම කිසිම මනුෂ්‍යයෙකුට 'පාපිෂ්ඨ' නොහොත් 'වැරදි' දේ කිරීමට කිසිවෙක් ඉගැන්වීම අවශ්‍ය නොමැත. තමා තුළ සහජයෙන්ම ඇත්තාවූ පාපිෂ්ඨ ස්වභාවය නිසා, සෑම මනුෂ්‍යයෙක්ම පාපයට ගොදුරු වෙයි. මෙම හේතුව නිසාම ඉතා බිලිඳු වයසේ දරු දූරියන්ට වැරදි දේ කිරීමට කිසි කෙනෙක් ඉගැන්වීම අනවශ්‍ය බව, අප සැමදෙන අත්දැකීමෙන් දනිමු.

මාගේ ප්‍රේමනීය සහෝදරයා, සහෝදරී **අප සැම තුළ ඇත්තාවූ, පාපිෂ්ඨ ස්වභාවයෙන් ගැළවෙන්නේ කෙසේද?** යන්න මුළු මනුෂ්‍ය සංහතියට තිබෙන්නාවූ විශාලතම ප්‍රශ්නයයි.

## (ii) <u>දෙවියන්වහන්සේ නොමිලේ ලබා දී ඇත්තාවූ විසඳුම</u>

අපව මැව්වාවූ දෙවියන්වන්සේ බොරු නොකියන්නාවූ වෙනස් නොවන්නාවූ දෙවියන්වහන්සේ වන සේක. ප්‍රේමයෙන් පරිපූර්ණ වූ උන්වහන්සේ නොවෙනස්වන බැවින්, මනුෂ්‍යයා උණ්වහන්සේට අකීකරු වූ නමුත් මනුෂ්‍ය්‍යා වෙත උන්වහන්සේගේ ප්‍රේමය කිසිසේත් අඩු නොවූ සේක.

එම ප්‍රේමය නිසා, දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ උන්වහන්සේ සහ මනුෂ්‍යයා අතර ආරම්භයේදී තිබූනාවූ සම්බන්ධකම නැවත ඇතිකර ගැනීමයි.

දෙවියන්වහන්සේ ප්‍රේමයේ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේ ඇති ශුද්ධ වූ දෙවියන්වහන්සේ වනසේක. එබැවින් ශුද්ධ වූ නොහොත් කිසි පාපයක් නැත්තාවූ උන්වහන්සේට 'පව්කාර මනුෂ්‍යයා' හා සමඟ සම්බන්ධකමක් ඇති කර ගැනීමට නොහැකි වේ.

එපමණක් නොව, උන්වහන්සේ සර්ව සාධාරන වූ දෙවියන්වහන්සේ වන සේක. එබැවින් පව්කාර මනුෂ්‍යයාගේ පාපය විනිශ්චය කිරීමට සහ නිසි දඬුවම් ඔහුට ලබා දීමට දෙවියන්වහන්සේ බැඳී සිටින සේක.

මාගේ ප්‍රේමනීය සහෝදරයා/සහෝදරී මෙම 'විසඳුමක් නොමැති ප්‍රශ්නයට' දෙවියන්වහන්සේ ලබා දී ඇත්තාවූ විසඳුම අපට සිතා ගැනීමට බැරි තරම් පුදුමාකාර වේ. කිසිම මනුෂ්‍යයෙකුට පාපයෙන් සම්පූර්ණයෙන්ම මිදී ජීවත්වීමට නොහැකි බව දන්නාවූ උන්වහන්සේ, සැම මනුෂ්‍යයෙකුට හිමි වන්නාවූ **'පාපයේ කුලිය නොහොත් මරණය'** විඳීමට උන්වහන්සේ එකම පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලොවට එවූසේක. උන්වහන්සේ පවින් තොර ජීවිතයක් ගත කර, අපගේ පව් උදෙසා, උන්වහන්සේගේ ජීවිතය කල්වරි කුරුසියේදී පිදූසේක.

**රෝම 5:8 :- "නුමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම <u>අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය.</u>"**

දෙවි සමිඳුන් ඔබ සහ මා වෙනුවෙන් කළාවූ මෙම පූජාව අදහමින්, යේසුස්වහන්සේට තම ජීවිතය භාරකරන්නාවූ සැමදෙනාට, දේව දරුකමට ඇතුල්වීමට දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇතිසේක.

**යොහන් 1:12 :- "නුමුත් යම් පමණ දෙනෙක් උන්වහන්සේ පිළිගත්තෝද, එනම් උණ්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගන්නෝද, <u>ඔවුන්ට දෙවියන්වහන්සේගේ දරුවන් වෙන්ට උන්වහන්සේ බලය දුන්සේක.</u>"**

මාගේ සෙනෙහෙවන්ත සහෝදරයා/ සහෝදරී දෙවියන් වහන්සේ ඔබ ඉදිරියේ තබන්නාවූ මෙම පොරොන්දුව දෙස විමසිල්ලෙන් බලන්න.

උන්වහන්සේ මෙහි පොරොන්දු වන්නේ, උන්වහන්සේගේ දරුවන්වීමට අපට බලය දෙන බවයි. එනම් 'දේව ස්වභාවය' අප තුළ අලුතෙන් ඇති කරන්ට යන බවයි. අප තුළ පවතින්නාවූ 'යක්ෂයාගේ නොහොත් පාපයේ ස්වභාවය' ඉවත් කර, ඒ වෙනුවට දේව දරුකම අපට දී, දේව ස්වභාවට අප තුළ අලුතින් ඇති කරන බවයි.

**2 කොරින්ති 5:17 :- "එබැවින් යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. <u>පරණ දේ පහව ගියේය; මෙන්න, සියල්ලම අලුත් වී තිබේ.</u>"**

ප්‍රේමයේ දෙවියන්වහන්සේ අප තුළ ක්‍රියාකරන්නාවූ අශුද්ධ බලවේග පහකර දමා, අපව ඇතුලාන්තයෙන් වෙනස්කරන බව මම ඒකාන්තයෙන්ම දන්නේ, මීට වසර 44 ට පෙර උන්වහන්සේ මේ මහත් හාස්කම මගේ ජීවිතයේ කළ නිසාය. එබැවින් මාගේ මුළු හදවතින්, මා ඔබට ඇරයුම් කරන්නේ, පහත සඳහන් අයුරින් ක්‍රියා කරන ලෙසය.

**1 නි පියවර** - ඔබ තුළ ක්‍රියාකරන්නාවූ 'පාපිෂ්ඨ ස්වභාවය'

හේතුකොටගෙන, ඔබ දැන හෝ නොදැන කළා වූ **සියලු පාප ගැන පසුතැවිලි වී, දෙවියන්වහන්සේගෙන් ඒවාට සමාව ලබාගන්න.**

**2 නි පියවර** - යේසුස්ක්‍රිස්තුස්වහන්සේට ඔබගේ ජීවිතය භාරදී, දෙවියන්වහන්සේගේ දරුකමට ඇතුල් වන්න.

**3 නි පියවර** - දෙවියන්වහන්සේගේ දරුවකු සේ **උන්වහන්සේට කීකරුව ද විශ්වාසවන්තවද ජීවත්වීමට තීරණය කරන්න.**

ඔබ මෙසේ කරන විට, ඔබට අසීමිත ලෙස ප්‍රේමකරන්නාවූ දෙවියන්වහන්සේ, ඔබව උන්වහන්සේගේ දරුවෙක් ලෙස බාරගෙන, එඬේරෙකු මෙන් ඔබව ගෙන යනසේක.

**ගීතාවලිය 23:1-6 "1 ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය; මට හිඟයක්**
**නොවන්නේය. 2 උන්වහන්සේ නිල් ගොදුරු බිම්වල මා ලගින්ට**
**සලස්වනසේක. නිශ්චල වූ දිය අසලින් මා ගෙනයනසේක. 3 උන්වහන්සේ**
**මාගේ ආත්මය ප්‍රාණවත් කරනසේක;..... ධර්මිෂ්ඨකමේ මාවත්වල මා**
**ගෙනයන සේක..........5 මාගේ හිස තෙලින් ආලේප කළ සේක; මාගේ**
**කුසලාන උතුරා යයි. 6 සැබවින් යහපතකමත් කරුණාවත් මාගේ ජීවිතයේ**
**සියලු දවස්වල මා අනුව එන්නේය. මම සදාකල්ම ස්වාමීන්ගේ ගෘහයෙහි**
**වාසය කරන්නෙමි.**

ඉහත සඳහන් අයුරින් දෙවියන්වහන්සේ ඔබට ලබාදෙන්නාවූ අමිල තෑග්ග, උන්වහන්සේට කැපවී අදම නොමිලේ ලබාගන්න. එසේ ලබා ගැනීම උදෙසා, පහත සඳහන් යැදුම අවංකව දෙවි සමිඳුන්ට පුදන්න.

*ප්‍රේමණීය දෙව්පියාණනි, ඔබ වහන්සේ මා උදෙසා කළ ඇති පූජාව අද දින මා තේරුම් ගත්තෙමි. යේසුස් වහන්සේ මාගේ පාපයේ දඬුවම කුරුසියේ ගෙවූ බව මම අද දින දැන ගත්තෙමි. යේසුනි, මාගේ පව් උදෙසා කුරුසියේ මැරුණාට ස්තූතියි. මාගේ ගැලවුම් කාරයාණන් හා ස්වාමීන් හැටියට ඔබ පිළිගනිමි. මාගේ ජීවිතය භාරගෙන ඔබගේ කැමැත්ත අනුව මා හැඩ ගැස්සුව මැනව. ආමෙන්.*

මෙම පුදුමාකාර ශුභ ආරංචිය, අන් අය සමගත් බෙදාගන්න.

**එසේ කිරීමට, ඔබගේ දෙව් පියාණන්වහන්සේ ඔබට ශක්තිය සහ ධෛර්යය දෙන සේක්වා !!**